# වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් 2015
# Annual Performance Report & Accounts 2015

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
Ministry of Mahaweli Development & Environment

## දැක්ම

**සෞඛ්‍ය සම්පන්න සහ**
**සුබදායී තිරසාර පරිසරයක් ලබාදීම**

## මෙහෙවර

**වර්තමාන සහ අනාගත පරම්පරාවන්ගේ සුභ සිද්ධිය උදෙසා**
**ධරණීය සංවර්ධනයක් ඇති කිරීම සඳහා වන ජාතික කැපවීම සහතික කරනු වස්**
**පරිසර හා ස්වභාවික සම්පත් කළමනාකරණයට නායකත්වයක් ලබා දීම**

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්ය භාරය

- ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා උපයෝගී කර ගැනීම පිණිස පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් පරිසර හා ස්වභාවිත සම්පත් ක්ෂේත්‍ර තුල ඇති ගැටළු හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත් සංරක්ෂණයට අදාලව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අදාල පාර්ශ්වකරුවන්ට දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත් සංරක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳ උපාය මාර්ගික පරිසර ඇගයීම් සිදු කිරීම

- සංවර්ධන ක්‍රියාවලියේ දී පරිසර තිරසාර බව තහවුරු කිරීම් වස් පරිසර ප්‍රතිපත්තියට අනුකූලව අනිකුත් ක්ෂේත්‍ර ප්‍රතිපත්ති සැකසීමට පියවර ගැනීම

- එක් පාර්ශ්වයක් ලෙස ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති බහු පාර්ශ්වික පාරිසරික සම්මුතීන්ගෙන් පැන නගින ශ්‍රී ලංකාව විසින් ඉටු කළ යුතු ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම තහවුරු කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත් වලට අනුකූල වූ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි උපාය මාර්ග හා ක්‍රියාකාරී සැළසුම් පිළියෙළ කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාල නව ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම පිණිස නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාල පසු විපරම් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම සහ පසු විපරමෙන් ලැබෙන තොරතුරු මත පරිසර කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමෝපායයන් යෙදීම

- ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, තොරතුරු විශ්ලේෂණය කිරීම, එම තොරතුරු මහජනතාව ඇතුළු අදාල අංශ වලට යොමු කිරීම

- යහපත් වූ පරිසර කළමනාකරණයක් සඳහා රාජ්‍ය සහ දේශපාලන අංශ වල කැපවීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත් වලට අදාල ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සහ වෙනත් ප්‍රධාන පාරිසරික ක්‍රියාදාමයන් පිළිබඳව ජාතික මට්ටමෙන් ජනතාව දැනුවත් කිරීම

- පරිසර හා ස්වභාවික සම්පත් වලට අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන්නන් සහ අනිකුත් පාර්ශ්වකරුවන්ගේ ධාරිතාවය ශක්තිමත් කිරීම

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
- මධ්‍යම පරිසර අධිකාරිය
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
- රාජ්‍ය දැව සංස්ථාව
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
- ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යාංශය
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය
- උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
- මොරගහකන්ද සහ කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය
- මහවැලි ජල සම්පත් සුරක්ෂිත හා ආරක්ෂණ වැඩ සටහන

පටුන                                                                                    පිටු අංකය


දැක්ම සහ මෙහෙවර ii
අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්ය භාරය iii
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන iv
පටුන v

**1.** හැඳින්වීම **1**

**2.** **2015** වර්ෂයේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ඉටුකරනු ලැබූ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය **2**

**2.1** සැමට පිවිතුරු වාතය **3**
2.1.1 වාහන වායු විමෝචන පරීක්ෂණ (VET) වැඩසටහන අධීක්ෂණය 3
2.1.2 වායු කළමනාකරණ කේන්ද්‍රය සවිබල ගැන්වීම හා වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 3
**2.2** ශාක සත්ව හා පරිසර පද්ධති සුරැකීම **4**
2.2.1 ජානමය සම්පත්වලට ප්‍රවේශවීම සහ ඉන් ජනිතවන ප්‍රතිලාභයන් සමානව බෙදීයාම 4
2.2.2 ජෛව සම්පත් සංරක්ෂණය 4
2.2.3. කෘෂි ජෛව විවිධත්වය 6
2.3 දේශගුණ විපර්යාස මගින් ඇතිවන අභියෝගයන්ට මුහුණදීම 7
**2.3.1** දේශගුණ විපර්යාස සඳහා ජාතික අනුහුරු ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම **7**
**2.3.2.** දේශගුණ විපර්යාස පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම **8**
**2.3.3.** දේශගුණ විපර්යාස පිළිබදව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය **(UNFCCC)** ක්‍රියාත්මක කිරීමේ ලේකම් කාර්යාලය හා කියතෝ සන්ධානය සමග සම්බන්ධීකරණය **8**
**2.3.4** දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික කමිටු පැවැත්වීම **8**
**2.3.5** හරිත ලංකා වැඩසටහනේ මෙහෙවර **3** (දේශගුණ විපර්යාස පිළිබඳ අභියෝග ජයගැනීම) **10**
**2.3.6** ශ්‍රී ලංකාවේ යෝජිත ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන් **(INDCs)** පිළියෙල කිරීම **10**
**2.3.7** ශ්‍රී ලංකාවේ පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය **(CDM)** සඳහා වූ ජාතික බලාත්මක අධිකාරිය **(DNA)** ලෙස නව පවිත්‍ර සංවර්ධන ව්‍යාපෘති ඇගයීම හා අනුමත කිරීම **10**
**2.3.8** ග්‍රිඩ් විමෝචන සාධකය ප්‍රකාශයට පත් කිරීම **(Grid Emission Factor)** **11**
**2.3.9** ජාතික යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම **(NAMAs)** **11**
**2.3.10** ශ්‍රී ලංකාවේ මහවැලි ගංගාද්‍රෝණි ආශ්‍රිත ගොවි ජනපද වල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම්වලට අනුහුරුකරවීමේ ව්‍යාපෘතිය. **11**
**2.3.11.** ශ්‍රී ලංකාවට හයිඩ්රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් *(HCFC)* ආනයනය සහ පරිභෝජනය පාලනය කිරීම **13**
***2.3.12*** අමාත්‍ය මණ්ඩල සංදේශ - ***2015*** **14**
**2.4** වෙරළ තීරය හා අවට මුහුද ඥනාන්විත ලෙස පරිහරණය **15**
**2.5** වගකීමෙන් යුතු ඉඩම් පරිහරණය **15**
*2.5.1* භූමි හායනය වැලැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ජාතික මෙහෙයුම් කමිටුව **15**
*2.5.2* ජගත් කාන්තාරකරණය වැළැක්වීමේ දිනය සැමරීම *2015 17* ජූනි **15**
2.5.3 " වන රෝපා"ජාතික රුක් රෝපණ මාසය 2015 ඔක්තෝබර් **16**
*2.5.4* අමාත්‍ය මණ්ඩල සංදේශ - ***2015*** **16**
**2.6** කසලින් තොර වටපිටාවක් **17**
**2.6.1** ශ්‍රී ලංකාව තුල පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් **(PCBC)** අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අඩංගු උපකරණ පරිසර

හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කරලීමේ ව්‍යාපෘතිය 17
**2.6.2** ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයන් තුල පිහිටි විද්‍යාගාරයන්හි භාවිතා කළ හා කල් ඉකුත්වූ රසායන අපද්‍රව්‍ය බැහැර කරලීම හා පරිසර හිතකාමී කළමනාකරණය 18
*2.6.3* දිගුකල් පවත්නා කාබනික දූෂ්‍ය (POPs) පිළිබඳ වූ ස්ටොක්හෝම් සම්මුතියේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NIP) යාවත්කාලින කිරීමේ ව්‍යාපෘතිය 18
**2.6.4** ශ්‍රී ලංකාව තුළ පොලිබ්‍රෝමිනේටඩ් ඩයිෆීනයිල් ඊතර්ස් නැමැති රසායනිකය කළමනාකරණය හා ක්‍රම ක්‍රමයෙන් පරිසරයෙන් බැහැර කිරීම පිළිබඳව නොවැ. 27 වන දින වෝටර්ස් එජ් හෝටල් පරිශ්‍රයේ දී පවත්වන ලද එක්දින වැඩමුළුව 21
**2.6.5.** රසදිය පිළිබඳ මීනමාතා සම්මුතිය අත්සන් කිරීම සහ අපරානුමත කිරීම 21
**2.7** සැමට සැමදා ජලය 21
*2.7.1* පවිත්‍ර ගංගා වැඩසටහන 21
**2.8** සෞඛ්‍ය හා සමෘද්ධිය උදෙසා හරිත නගර 23
**2.9** කර්මාන්ත හරිතකරණය 25
**2.9.1** හරිත ගිනුම්කරණය ශ්‍රී ලංකාව තුල ස්ථාපිත කිරීම 25
**2.9.2** ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම 26
**2.9.3** ශ්‍රී ලංකා ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය යටතේ හරිත වාර්තාකරුවන්ගේ ධාරිතා වර්ධනය 26
**2.9.4** ජාතික හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය සහ මාර්ගෝපදේශ සැදීම 26
**2.9.5** සුපිරිසිදු නිෂ්පාදන ප්‍රතිපත්තිය හා සම්පත් කාර්යක්ෂමතා ප්‍රවර්ධනය 27
**2.9.6** **SWITCH– Asia** තිරසර පරිභෝජන නිෂ්පාදන ව්‍යාපෘතිය 27
*2.9.7* රසායනික කළමනාකරණය හා දැනුවත් කිරීම 28
**2.10** නිවැරදි තෝරා ගැනීම සඳහා දැනුම 29
**2.10.1** සොබා සඟරාව 29
2.10.2 පුස්තකාලය සඳහා ප්‍රකාශන සහ පොත්පත් මිළට ගැනීම 29
2.10.3 පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 29
2.10.4 ජගත් පරිසර දිනය සැමරීම - 2015 29
**2.10.5** පරිසර අධ්‍යාපනය හා දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය 30
**2.10.6** රේගු නිළධාරීන්ගේ ධාරිතා වර්ධන වැඩමුළු 31
**2.10.7** ශිතකරණ සහ වායුසමීකරණ සේවා කිරීමේදී පරිසරයට වඩාත් උචිත වූ ක්‍රමවේදයන් පිළිබඳ එම ක්ෂේත්‍රයේ නියැලී කාර්මිකයින් පුහුණු කිරීමේ වැඩමුළු පැවැත්වීම 31
**2.10.8** දැනුවත් කිරීමේ වැඩසටහන් 31

**3** ජාත්‍යන්තර සහයෝගිතාවය 32

*4.* මූල්‍ය විශ්ලේෂණය සහ ගිණුම් සාරාංශය 35

**5. 2015** වර්ෂය තුල අමාත්‍යාංශය යටතේ ඇති ආයතන අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය 43

**5.1** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව 43
**5.1.1** හැදින්වීම 43
**5.1.2** ප්‍රධාන වගකීම් 43
**5.1.3** ප්‍රධාන අභියෝග 43
**5.1.4** ප්‍රගතිය : **2015** 44
**5.1.5** දෙපාර්තමේන්තු අයවැය පිළිබඳ කාර්ය සාධනය - **2015** 45
**5.1.6** ආදායම රැස් කිරීම 45
**5.1.7** අමාත්‍ය මණ්ඩල සංදේශ, නීතී හා රෙගුලාසි 45
**5.2** වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 46
**5.2.1** හැඳින්වීම 46
**5.2.2** අරමුණු 46
**5.2.3** ප්‍රධාන වගකීම් 46
**5.2.4** ප්‍රධාන අභියෝග 47

5.2.5 ප්‍රධාන කාර්යය සාධනය : 2015 ජනවාරි – 2015 දෙසැම්බර් දක්වා 47
5.2.6 කැබිනට් පත්‍රිකා 49
5.3 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය 50
5.3.1 සමස්ත මූල්‍ය ප්‍රගතිය 50
5.3.2 මහවැලි ව්‍යාපෘති 50
5.3.2.1 මහවැලි ඒකාබද්ධ ව්යාපෘතිය 50
5.3.2.2 බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය 51
5.3.2.3 රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යපෘතිය 52
5.3.2.4 වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යපෘතිය - *L* කලාපය 53
5.3.2.5 මහවැලි ගැටඹේ හං ඉවුර ආරක්ෂාකිරීමේ වැඩසටහන 53
5.3.2.6 හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම 54
*5.3.3* නඩත්තු සහ සංවර්ධනය 54
5.3.3.1 වාරිමාර්ග පද්ධතිය නඩත්තුව 55
5.3.3.2 ඉඩම් ප්‍රදානය 55
5.3.3.3 කෘෂි කාර්මික හා පශු සම්පත් සංවර්ධනය 55
5.3.3.4 ආයතනික සංවර්ධනය 57
5.3.3.5 වන හා පරිසරය 58
5.3.3.6 ව්‍යාපාර සංවර්ධනය 59
5.3.4. කාර්ය සාධක දර්ශක 59
5.3.5 .2016 වසර සඳහා සංවර්ධන ප්‍රමුඛතා 60
5.3.6. 2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන 60
5.4 මධ්‍යම පරිසර අධිකාරිය 61
5.4.1 පරිසර බලපෑම් ඇගයීම / මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම 61
5.4.2 ස්වභාවික සම්පත් කළමනාකරණය 61
5.4.3 තෙත්බිම් කළමනාකරණය සහ ලෝක තෙත් බිම් දිනය සැමරීම 62
5.4.4 කැළණි ගංගා ද්‍රෝණිය කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය 62
5.4.5 දිස්ත්‍රික් පාරිසරික පැතිකඩ නිර්මාණය 62
5.4.6 ශ්‍රී ලංකාව තුල මදුරුවන් පාලනය සඳහා නව විකල්ප සෙවීම 63
5.4.7 ජාත්‍යන්තර පරිසර ඉගෙනුම් මධ්‍යස්ථානය 63
5.4.8 පාරිසරික කළමනාකරණ හා සැලසුම්කරණ සඳහා වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 63
5.4.9 නව කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම 63
5.4.10 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම 64
5.4.11 ලැයිස්තුගත කොට නැති ක්‍රියාකාරකම් සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම 64
5.4.12 ජාතික හරිත සම්මාන වැඩ සටහන 64
5.4.13 උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාලව රෙගුලාසි ක්‍රියාත්මක කිරීම 65
5.4.14 විමෝචන දත්ත ලේඛනය සැකසීම හා යාවත්කාලීන කිරීම 65
5.4.15 ජල තත්ව පසුවිපරම් කිරීම 65
5.4.16 ජාතික රුක්රෝපණ වැඩ සටහන "වනරෝපා " 67
5.4.17 ලෝක පරිසර දිනය සැමරීම 67
5.4.18 පැමිණිලි මෙහෙයවීම 67
5.4.19 " පිළිසරු" ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය 67
5.4.20 "ග්‍රීන් පාක්" කසළ කළමනාකරණ මධ්‍යස්ථානය 68
5.4.21 පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය 68
5.4.22 ජාතික පරිසර නියමු වැඩ සටහන 69
5.4.23 මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය ශක්තිමත් කිරීම 69
5.4.24 අමාත්‍ය මණ්ඩල සංදේශ - 2015 69
5.4.25 මූල්‍ය ඇස්තමේන්තුව සහ ප්‍රගතිය - 2015 70
5.5 සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය 71
5.5.1 ආයතනයේ ධාරිතා වර්ධනය 71
5.5.2 හදිසි තෙල් විසිරීම පිළිබඳ ජාතික සැලැස්ම ක්‍රියාවට නැංවීම 71

**5.5.3** සමුද්‍ර දූෂණය අවම කිරීම 71
**5.5.4** මූල්‍ය වෙන් කිරීම සහ ප්‍රගතිය 76
**5.6** ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය 77
**5.6.1** පරිසර හිතකාමී මැණික් ගැරීමේ ක්‍රමවේදයන් පවත්වා ගෙන යාම. 77
5.6.2 මැණික් සහ ස්වර්ණාභරණ සඳහා ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත වෙළඳපළ අවස්ථා ජය ගැනීම දැනුවත් කිරීමේ වැඩ සටහන් හා ප්‍රදර්ශන 77
*5.6.3* ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් සහ උසස් තාක්ෂණයෙන් යුතු මැණික් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට නියමිතය. 78
5.6.4 විදේශීය වෙළඳපලට පිවිසීමට අපේක්ෂිත ආයෝජකයින් සඳහා අතදීම. 78
*5.6.7* ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ගිණුම් 79
**5.7** රාජ්‍ය දැව සංස්ථාව 80
**5.7.1** වාර්ෂික ප්‍රගති සමාලෝචන වාර්තාව සහ ගිණුම් - 2015 80
**5.7.2** වෙනත් වැඩ සටහන් 80
5.8 භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය 81
5.8.1 භූ විද්‍යා සිතියම් මුද්‍රණය කිරීම 81
5.8.2 චාතුර්ථික සිතියම් ( වෙරළබඩ කළාපය) වැඩසටහන 81
5.8.3 පාංශු භූ රසායන සිතියම් වැඩසටහන 81
5.8.4 වාර්ෂික ඛණිජ ග්‍රන්ථය - 2014 සහ 2015 81
5.8.5 පළාත් ඛණිජ සමීක්ෂණ සහ පළාත් ඛණිජ සිතියම් 82
5.8.6 අබලන් වූ විදුම් පෙට්ටි ප්‍රකෘතියට පත්කිරීම සහ ගබඩා කිරීම 82
5.8.7 භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ පුස්තකාලය වැඩිදියුණු කිරීම 83
5.8.8 පාෂාණවිද්‍යා රසායනාගාරය 83
5.8.9 විශ්ලේෂණාත්මක රසායනාගාරය 83
5.8.10 පර්යේෂණ වැඩසටහන් 83
*5.8.11* සේවාදායක ප්‍රතිචාර ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් ( ආදායම් උත්පාදක) 83
5.8.12 අනෙකුත් ක්‍රියාකාරකම් 84
5.8.13 මූල්‍ය කාර්ය සාධනය 85
**5.9** මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය 86
5.9.1 මැණික් ක්ෂේත්‍රයේ පර්යේෂණ ප්‍රගතිය 86
**5.9.2** පුහුණු ක්‍රියාකාරකම්හි ප්‍රගතිය 89
**5.9.3** මානව සම්පත් අංශයේ ප්‍රගතිය 92
5.9.4 මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් 92
5.10 ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය 93
**5.10.1** මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය - 2015 93
5.10.2 උපදේශක අංශය 94
**5.10.3** ඉදිකිරීම් අංශය 96
5.10.4 අන්තර්ජාතික අංශය 96
5.10.5 සම්මාන 96
**5.11** මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය 97
**5.11.1** මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියට අදාල මූලික කාර්යයන් 97
**5.11.2** කළුගඟ ජලාශ ව්‍යාපෘතියේ ප්‍රධාන නිර්මිතයන් 98
**5.11.3** මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය 101
**5.11.4** කළුගඟ ව්‍යාපෘතිය 103
**5.11.5** මූල්‍ය ක්‍රියාකාරිත්වය 105
**5.11.6** කැබිනට් තීරණ 106
**5.12** උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය- (පෙර ආර වැඩ - Head works) 107
**5.12.1** හැඳින්වීම 107
**5.12.2** ප්‍රධාන අභිලාශයන් -2015 107
**5.12.3** අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 108

| | | |
|---|---|---|
| 5.13 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) | **109** |
| 5.13.1. | හැදින්වීම | **109** |
| 5.13.2 | උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතිය : අදියර **- 1** (NCPCPPhase 1) | **109** |
| 5.13.3 | උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතිය : අදියර **-** 2(NWPCP Phase 2) | **110** |
| 5.13.4 | ව්‍යාපෘති අංග පිළිබඳ කෙටි විස්තරයක් (Project Activities) | **111** |
| 5.13.5 | ව්‍යාපෘති කටයුතු 2015 දී ලබාගත් ප්‍රගතිය | **115** |
| 5.13.6 | කැබිනට් පත්‍රිකා | **119** |
| 5.13.7 | අවසාන ගිණුම් | **119** |

## 1. හැඳින්වීම

වර්තමාන වර්ෂයේ මැද භාගයේ දී ඊට පෙර වර්ෂයේ දී අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම රජයේ සියළුම ආයතන විසින් ඉටු කළ යුතු වගකීමකි. මෙම අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා ජල සම්පත් කළමනාකරණය, පරිසර කළමනාකරණය හා ස්වභාවික සම්පත් සංරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා ප්‍රමුඛත්වය දරණ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය "2015 වාර්ෂික කාර්ය සාධනය හා ගිණුම්" යන නමින් මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලබයි. මෙම වාර්තාව මගින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් හා ක්‍රියාකාරකම්වල අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය ඉදිරිපත් කරනු ලබන අතර අමාත්‍යාංශයට අනුබද්ධ සියළුම පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් සකසන ලද "හරිත ලංකා" සහ "පුනරුදය" වැඩ සටහන්වල එක් එක් මෙහෙවර තේමාන්විත ක්ෂේත්‍ර යටතේ 2015 වර්ෂයේ දී අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය මෙහි දක්වා ඇත.

තිරසර සංවර්ධනය සඳහා වූ ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ සියළු ප්‍රතිපත්ති වලට අනුගත වන පරිදි ශ්‍රී ලංකාවේ පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයන් හි පවතින බාධක හා අභියෝග ජය ගැනීම සඳහා ප්‍රගති වාර්තාකරණ කාල සීමාව තුලදී අමාත්‍යාංශයෙන් හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන මගින් ව්‍යාපෘති හා වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. ජාතික ආර්ථික සංවර්ධන ප්‍රතිපත්තියෙහි සඳහන් අභිමතාර්ථයන් ළඟා කර ගැනීම අරමුණු කර ගනිමින් පරිසර ආරක්ෂණය සහ කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ වැඩ සටහන් සැකසීමත් එම ප්‍රතිපත්ති සහ වැඩ සටහන් උපක්‍රමික ලෙස ක්‍රියාවට නැංවීමත් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ආරම්භ කර ඇත.

2015 වර්ෂයේ දී ගන්නා ලද තීරණයක් මත අමාත්‍යාංශ නාමය වෙනස් කළ හෙයින් එහි කාර්ය භාරය ද පුළුල් විය. ඒ අනුව මහවැලි අධිකාරිය සහ ඒ යටතේ ක්‍රියාත්මක වන ජල කළමනාකරණ, කෘෂි සංවර්ධන හා පරිසර සංරක්ෂණ වැනි ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් මෙම අමාත්‍යාංශයේ විෂය පථයට එක් විය.

## 2. 2015 වර්ෂයේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ඉටුකරනු ලැබූ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් "හරිත ලංකා වැඩසටහන" නමින් නව වැඩසටහනක් 2009 වර්ෂයේ ජූනි මස ආරම්භ කළ අතර මෙම ක්‍රියාකාරී සැළසුමෙහි මූලික අරමුණ වූයේ ආර්ථික, සමාජීය, සංවර්ධන වැඩසටහන් වලට බාධා පමුණුවන මෙතෙක් අවධානයට ලක් නොවූ තීරණාත්මක පාරිසරික ගැටළුවලට අදාළව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමයි. හරිත ලංකා වැඩසටහන යටතේ සකස් කරන ලද ක්‍රියාකාරී සැලසුමෙහි ප්‍රධාන මෙහෙවර / තේමාන්විත ක්ෂේත්‍ර 10 ක්අඩංගු වන අතර ඒවා නම් සැමට පිවිතුරු වාතය, ශාක, සත්ව හා පරිසර පද්ධති සුරැකීම, දේශගුණ විපර්යාස අභියෝග ජයගැනීම, වෙරළ තීරය හා මුහුද ඥානාන්විත ලෙස පරිහරණය කිරීම, වගකීමෙන් යුතුව ඉඩම් පරිහරණය කිරීම, කසළින් තොර වටපිටාවක්, සැමට සැමදා ජලය, සෞඛ්‍යය හා සමෘද්ධිය උදෙසා හරිත නගර, කර්මාන්ත හරිතකරණය සහ නිවැරදි තෝරා ගැනීම සඳහා දැනුමය. මෙම ක්‍රියාකාරී සැළැස්ම සකස් කිරිමෙහි ලා අදාල අමාත්‍යාංශ, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශය යන සියල්ලෙහිම සාමූහික දායකත්වයක් සැපයූ අතර මෙහිදී තිරසරභාවය යන්න හුදෙක් සංකල්පයකට පමණක් සීමා නොවී එය යථාර්ථයක් බවට පත්කිරීමෙහිලා සියළුම සාමාජිකයින් ගෙන් ලැබුණු දායකත්වය අතිවිශාලය. මෙම ක්‍රියාකාරී සැළැස්ම කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ඉලක්ක ගණනාවකින් යුතුවන අතර එය 2009 සිට 2016 දක්වා වූ කාලය තුළ ක්‍රියාත්මක වීමට නියමිත අතර මේ සඳහා පරිපූර්ණ වූත්, මැනිය හැකිවූත් ළඟා කරගත හැකිවූත්, උපාය මාර්ග 82 ක්ද, ක්‍රියාකාරකම් 375 ක්ද ඇතුලත්ය. මෙම වැඩසටහන අමාත්‍යාංශ 36 ක් හා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන 70 ක් ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලැබේ. අමාත්‍යාංශය අනෙකුත් අදාළ පාර්ශවකරුවන් හා එක්ව ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් එක් එක් මෙහෙවර / විෂය පථය යටතේ ප්‍රගතිය වාර්තා කරන කාළසීමාව තුල දී ඉටුකරන ලද ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

තිරසාර පරිසරයක් ඇති කිරීම හා පරිසර ගැටළු අවම කිරීමේ අරමුණින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේ දී "පුනරුදය" නමින් පරිසර සංරක්ෂණ ජාතික වැඩ සටහන් දියත් කළ අතර එය ජනාධිපති කාර්යාලය මගින් සම්බන්ධීකරණය කරනු ලබයි. 2016 සිට 2018 කාලය දක්වා පිළියෙළ කරනු ලැබූ මෙම ජාතික වැඩ සටහන පිළියෙළ කිරීමේ දී වර්තමාන පාරිසරික ගැටළු හා ඒ හා බැඳි අනෙකුත් ගැටළු හඳුනා ගන්නා ලද අතර ප්‍රමුඛත්වය දී කටයුතු කළ යුතු අංශ හඳුනා ගන්නා ලදී. මෙම තුන් අවුරුදු ක්‍රියාත්මක සැලැස්ම සඳහා භෞතික මූල්‍ය ඉලක්කයන් හඳුනා ගන්නා ලද අතර ඒවා 2015 ඔක්තෝම්බර් මස සිට 2018 වර්ෂය තෙක් ක්‍රියාත්මකයි. මෙම වැඩ සටහන්හි මූලික අරමුණු වන්නේ (අ) තිරසර කසළ කළමනාකරණයක් තුලින් නිකසල ජීවන පරිසරයක් නිර්මාණය කිරීම, (ආ) ශ්‍රී ලංකාවේ තිරසර පැවැත්ම සඳහා අවශ්‍ය වන සම්පත සංරක්ෂණය හා සංවර්ධනය කිරීම, (ඇ) ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් තිරසර උපයෝජනය, සංරක්ෂණය හා කළමනාකරණය තුලින් ජීවනප්‍රිය පරිසර පද්ධතියක් ඇති කිරීම, (ඇ) ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය හා තිරසර කළමනාකරණය, (ඉ) පරිසර සංරක්ෂණය පිළිබඳ මහජනතාව සවිඥාණිකව සවිබල ගැන්වීම, (ඊ) පරිසර සංරක්ෂණ කටයුතු කළමනාකරණයට අවශ්‍ය මෙවලම් සහ විධාන සඳහා ඒකීය ආයතනික පද්ධතියක් ස්ථාපිත කිරීම

## 2.1 සැමට පිවිතුරු වාතය

කාර්මීකරණය ව්‍යාප්තවීම, වාහන ගමනාගමනය, තාප විදුලි බලය උත්පාදනය හා ශීඝ්‍ර නාගරීකරණයෙහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ අසල්වැසි ආසියානු රටවල් මෙන් වායුවල ගුණාත්මකභාවය පිළිබඳ උග්‍ර ගැටළුවක් මෙතෙක් අත්නොවිදීමට ශ්‍රී ලංකාව භාග්‍යවන්ත වී ඇත. සම්පූර්ණ විමෝචන ප්‍රමාණයෙන් 55 % -60 % ක පමණ ප්‍රතිශත දායකත්වයක් මෝටර් රථවාහන විමෝචනයෙන් සිදුවන අතර එය ශ්‍රී ලංකාවේ වායු දූෂණය කෙරෙහි සැළකිය යුතු දායකත්වයකි. වෙනත් විමෝචන ප්‍රභව වන කර්මාන්තවලින් සිදුවන විමෝචනය 20 % -25 % ක පමණ ප්‍රතිශතයක් හා ගෘහස්ථ වායු විමෝචනය 20 % ක පමණ ප්‍රතිශතයක් වේ.

ශ්‍රී ලංකාවේ මුළු ඉන්ධන පරිභෝජනයෙන් 60 % ක පමණ ප්‍රතිශතයක් ප්‍රවාහන අංශය සඳහා භාවිතවේ. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ ඉහල වායු දූෂණයක් ඇති බවට හඳුනාගෙන ඇති අතර ඒ අතරින් කොළඹ නගරය ප්‍රමුඛ ස්ථානයක් ගනී. ඊට අමතරව මහනුවර නගර ප්‍රදේශය, ගාල්ල, කුරුණෑගල සහ පුත්තලම ද මෙවැනිම ඉහළ වායු දූෂණයක් ඇති ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත. 'සැමට පිරිසිදු වාතය' යන මෙහෙවර යටතේ පරිසර අමාත්‍යාංශය මගින් සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහතින් දැක්වේ.

වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන නාගරික ප්‍රදේශවල වායුවල ගුණාත්මකභාවය පාලනය කිරීමේදී ප්‍රධාන ස්ථානයක් ගනී.

### 2.1.1 වාහන වායු විමෝචන පරීක්ෂණ (VET) වැඩසටහන අධීක්ෂණය

වාහන වායු විමෝචනය කොළඹ හා අනෙකුත් නාගරික ප්‍රදේශ වල වායු දූෂණය ඉහල නංවන ප්‍රධාන ප්‍රභවය වේ. ශ්‍රී ලංකා රජය විසින් 1980 අංක 47 දරන, ජාතික පාරිසරික පනත යටතේ විමෝචන පාලන රෙගුලාසි 2003 ජුනි 30 දින ගැසට් කරන ලදී. තවද 2008.07.09 දිනැති අංක 1557/14 දරන ගැසට් පත්‍රය මගින් ඉහත රෙගුලාසි සංශෝධනය කරන ලදි. මෙම රෙගුලාසි විවිධ වාහන කාණ්ඩ සඳහා උපරිම විමෝචන මට්ටම් සඳහා සකස් කර ඇත. වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන රාජ්‍ය - පුද්ගලික අංශ දෙකෙහිම හවුල්කාරීත්වය සහිත වැඩසටහනක් වන අතර, වාහන වායු විමෝචන පරීක්ෂණ (VET) සහතික නිකුත් කිරීම සඳහා ගිවිස ගෙන ඇති ක්ලීන්කෝ ලංකා (පුද්ගලික) සමාගම හා ලාෆ් ඉකෝ ශ්‍රී (පුද්ගලික) සමාගම යන පුද්ගලික අංශයේ සමාගම් 2ක් සමඟ කේන්ද්‍ර ගත වී ඇත. ශ්‍රී ලංකාවේ සියළුම පලාත් වල වාහන සඳහා වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා වාහන වායු විමෝචන පරීක්ෂණ සහතිකය ලබා ගැනීම අනිවාර්ය කර ඇත. කෙසේ වෙතත් නවීන වාහන, ලියාපදිංචි දිනයේ සිට වසරක් යන තුරු මෙම පනතින් නිදහස් කර ඇත.

වායු සම්පත් කළමනාකරණ සහ අන්තර් ජාතික සබඳතා අංශය වාහන වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලෙහි මූල්‍ය ප්‍රතිපාදන සමග වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩ සටහන නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම පසුගිය වසර කිහිපය තුළ සිදුකරන ලදි. කෙසේ වෙතත්, පුහුණු කාර්ය මණ්ඩලයන් හි හිඟකම හේතුවෙන් 2015 වසරේ දී ඉහත වැඩසටහන ක්‍රියාත්මක නොවීය. එබැවින්, වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන අධීක්ෂණය කිරීම සඳහා අමාත්‍යාංශයේ සහ මධ්‍යයම පරිසර අධිකාරියෙහි නිලධාරීන් ඇතුළත් විශේෂ විමර්ශන කණ්ඩායමක් ස්ථාපිත කිරීමට මෙම අංශය කටයුතු කරන ලදි.

### 2.1.2 වායු කළමනාකරණ කේන්ද්‍රය සවිබල ගැන්වීම හා වාහන වියු විමෝචන පරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- මධ්‍යම සහ ඌව පළාත් (නුවර එළිය සහ බදුල්ල) ආවරණය වන පරිදි රථ වාහන සහ පරිසර පොලිස් නිලධාරීන් සඳහා වාහන විමෝචන පරීක්ෂණ වැඩසටහන හා වායු තත්ව කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් 2015 ජූලි මස 9 සහ 10 දෙදින තුල පවත්වන ලදී.

- ගම්පොල, නුවරඑළිය සහ ගාල්ල අධ්‍යාපන කළාපයන් හි පවතින පාසල් කේන්ද්‍ර කර ගනිමින් වායු තත්ව කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් 2015 සැප්තැම්බර් මස 10, 11 සහ 17 දිනයන් තුළදී පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 400 දෙනෙකු සහභාගීත්වයෙන් පවත්වන ලදි.

- වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩ සටහන අධීක්ෂණය කිරීම සඳහා විශේෂ පරීක්ෂණ කණ්ඩායමක් ස්ථාපිත කිරීමේ වැඩසටහනෙහි එක් දින වැඩමුළුවක්(දේශන) අමාත්‍යාංශ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් 15 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2015 නොවැම්බර් 24 දින අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.
- ඉහත වැඩසටහනෙහි ප්‍රායෝගික සැසිය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි - වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල සමග එක්ව 2015 දෙසැම්බර් මස 31 වැනි දිනදී පවත්වන ලදි. අමාත්‍යාංශය විසින් ස්වාධීන අනුකූලතාමත සිදුකරනු ලබන වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩ සටහන අධීක්ෂණ කටයුතු 2016 මාර්තු මස සිට ආරම්භ කරනු ඇත.
- හරිත ලංකා වැඩසටහන මෙහෙවර 1 ලෙස - "සැමට පිරිසිදු වාතය", වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රය මගින් සකස් කරන ලද පිරිසිදු වායු 2015 ක්‍රියාකාරී සැලැස්ම (CA2015AP) මත පදනම්ව සකස් කරන ලදී. ඒ අනුව පිරිසිදු වායු 2015 ක්‍රියාකාරී සැලැස්ම ඊලඟ දශකයේ ජාතික අවශ්‍යතාවයන්ට අනුකූලව යාවත්කාලීන කිරීම සහ හරිත ලංකා වැඩසටහන මෙහෙවර 1 'ත්‍රෛයි වාර්ෂික මධ්‍ය කාලීන හා පරිසර සංරක්ෂණ වැඩසටහන' සහ 'අමාත්‍යාංශ ආයතනික සැලැස්ම 2016-2020' අනුව යාවත්කාලීන කිරීම යන කරුණු 2 ඉටු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් ඇති විය.

  ඒ අනුව, වායු සම්පත් කළමනාකරණය සහ අන්තර්ජාතික සබඳතා අංශය පිරිසිදු වායු 2025 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ හරිත ලංකා වැඩසටහන යාවත්කාලීන කිරීම සඳහා පාර්ශවකරුවන් 50 කගේ සහභාගීත්වයෙන් නේවාසික වැඩමුළුවක් 2015 දෙසැම්බර් 9 -11 යන තෙදින තුල තුල්හිරියේදී පවත්වන ලදි. මෙම වැඩමුළුව සාර්ථකව නිම වූ අතර, හරිත ලංකා වැඩසටහන මෙහෙවර 1 2016-2020 වර්ෂය දක්වා යාවත්කාලීන කරන ලදී. තවද පිරිසිදු වායු 2025 ක්‍රියාකාරී සැලැස්ම සකස්කරමින් පවතියි.
- විවෘත දහනය නිසා නිසා ඇතිවන පරිසර හා සෞඛ්‍යය බලපෑම් තක්සේරු කිරීමට සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලද අතර 2015 වසර අවසන් වන විට එහි අතුරු වාර්තාව ඉදිරිපත් කර ඇත.
- වායු සම්පත් කළමනාකරණය සහ අන්තර්ජාතික සබඳතා අංශය, ක්ලීන් එයා ශ්‍රී ලංකා සමඟ එක්ව තෝරා ගන්නා ලද ප්‍රදේශයන් 4 ක, එය ඇවිදීම සඳහා කොපමණ හිතකාමීදැයි පරීක්ෂා කිරීමට සමීක්ෂණ 4 ක් සහ මෝටර් රථ භාවිතා නොකර සිදුකරනු ලබන ප්‍රවාහන විධි සහ යටිතල පහසුකම් පිළිබඳ පරිශීලක මතය සහ අවබෝධය පිරික්සීමේ සමීක්ෂණයක් කොළඹ පුරහල, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මාලබේ සහ කඩුවෙල ප්‍රදේශයන් ආශ්‍රිතව සිදු කරන ලදි.

## 2.2 ශාක සත්ව හා පරිසර පද්ධති සුරැකීම

### 2.2.1 ජානමයසම්පත් වලට ප්‍රවේශ වීම සහ ඉන් ජනිත වන ප්‍රතිලාභයන් සමානව බෙදී යාම

ජානමය සම්පත් වලට ප්‍රවේශ වීම සහ ඉන් ජනිත වන ප්‍රතිලාභයන් සමානව බෙදී යාම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ Material Transfer Agreement කෙටුම්පත් කිරීම. පාරම්පරික දැනුම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය මූලික කටයුතු කරන ලදි.

### 2.2.2 ජෛව සම්පත් සංරක්ෂණය

ජෛව විවිධත්ව සම්මුතිය පිළිබඳ ලේකම් කාර්යාලය මගින් ඊසාන දිග ඉන්දියන් සාගර කලාපයේ සමුද්‍රීය පරිසර පද්ධතීන් හි පාරිසරික සහ ජෛවීය වශයෙන් සංවේදී සාගර ප්‍රදේශ විග්‍රහ කිරීම සඳහා පහසුකම් සලසාදීමේ අරමුණින් එක් දින පුහුණු වැඩසටහනක් 2015 මාර්තු මස 22 දින හා පස්දින කලාපීය වැඩමුළුවක් දේශීය සහ ජාත්‍යන්තර විද්වතුන්ගේ සහභාගිත්වයෙන් 2015 මාර්තු මස 22 සිට 27 දක්වා කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී පවත්වන ලදි. මෙම වැඩසටහන මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය, දකුණු ආසියාතික සහයෝගිතා පරිසර වැඩසටහන (SACEP) සහ බෙංගාල බොක්කේ පුළුල් සමුද්‍රීය පරිසර පද්ධති පිළිබඳ ව්‍යාපෘතියේ (BOBLE) සහභාගිත්වයෙන් පවත්වන ලදි.තවද මෙම කලාපීය වැඩමුළුව සඳහා ජපානයේ ජෛව විවිධත්ව අරමුදල මගින් මූල්‍ය පහසුකම්ද පොදු රාජ්‍ය මණ්ඩලීය ඔස්ට්‍රේලියානු විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ පිළිබඳ සංවිධානය (CSIRO) මගින් ඊසාන දිග ඉන්දියන් සාගර කලාපයේ වාර්තාව පිළියෙල කිරීමට අවශ්‍ය

තාක්ෂණික සහය ලබාදීම ද සිදු කරන ලදී. මෙහිදී සාගර පරිසර පද්ධති, ජීවීන් සහ ජීවී වාස භූමි පිළිබඳ භෞතික මෙන්ම සමුද්‍රීය විද්‍යාත්මක තොරතුරු විශ්ලේෂණය කරන ලද අතර සමුද්‍ර කලාපයේ ජෛව විද්‍යාත්මකව සහ පරිසර විද්‍යාත්මකව ඇති වැදගත් පරිසර පද්ධති හඳුනා ගැනීම සිදු කරන ලදී.

"ජෛව සුරක්ෂිතතාවය පිලිබඳ කාටිජිනා සම්මුතියට අනුගතව ක්‍රියාවට නංවන ජාතික ජෛව සුරක්ෂිතතා මූලාකෘතිය ක්‍රියාවට නැංවීමේ ව්‍යාපෘතිය" ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ ක්‍රියාවට නැංවීමේදි ඇතිවිය හැකි ගැටළු පිළිබඳව ඉදිරිපත් කිරීම සහ සාකච්ඡාවට ගනිමින් ඒ පිළිබඳ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සහ ඔවුන්ගේ අදහස් කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමේ අරමුණින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වල පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් 2015 මැයි මස 19 වන දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදි වැඩමුළුවක් පවත්වන ලදි. ජාන විකරනය කරන ලද ජීවීන් මගින් ජෛව විවිධත්වයට සහ මහජන සෞඛ්‍යයට ඇතිවිය හැකි බලපෑම අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වේ. මෙහිදී දැනුවත් කිරීම්, විද්‍යාගාර වැඩිදියුණු කිරීම (ජාන විකරණය කළ ජීවීන් හඳුනා ගැනිමට අවශ්‍ය) ආදිය සිදු කිරීමට යෝජිතය.

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය හා රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨය එක්ව ජෛව තාක්ෂණය හා ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ ප්‍රායෝගික භාවිතයේ ඇති අවධානම තක්සේරුකරණය සහ කළමණාකරණය කිරීම සඳහා දකුණු පළාතේ උසස් පෙළ විද්‍යා, කෘෂි විද්‍යා, තාක්ෂණ ආදි විෂය ධාරාවන් උගන්වන ගුරුවරුන් දැනුවත් කිරීමේ සාකච්ඡාවක් 2015.10.23 දින රුහුණු විශ්ව විද්‍යාලයේදි පවත්වන ලදි.

ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ කාටජිනා සම්මුතියට අනුගතව ක්‍රියාත්මක වන රටවල් විසින් පිළියෙල කල යුතු තුන්වන ජාතික තත්ව වාර්තාව සකස් කිරීමට පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය විසින් පියවර ගන්නා ලදී. ඒ අනුව අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කර ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වාර්තාවක් පිළියෙල කිරීම සඳහා විද්වත් අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා වූ වැඩමුළුවක් 2015.12.22 දින රාජගිරිය බැංකු විදූ පියසේදි පවත්වන ලදි.

අන්තර්ජාතික ජෛව විවිධත්ව දින සැමරුම සෑම වසරකම මැයි මස 22වන දිනට යෙදී ඇත.ජෛව විවිධත්ව සම්මුතියේ පාර්ශ්වකාර රාජ්‍ය ආයතනය ලෙසින් මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය 2015 මැයි මස 22 වන දින ජෛව විවිධත්ව දින සැමරුම උත්සවාකාරයෙන් සමරනු ලැබීය. මෙවර තේමාව වූයේ " තිරසර සංවර්ධනය උදෙසා ජෛව විවිධත්වය යන්නයි". මෙම තේමාව මුල් කර ගනිමින් වස විසෙන් තොර ආහාර රටාවකට ජනතාව හුරු කරලීම උදෙසා අප ආයතනය එක්ව ක්‍රියාත්මක කරනු ලබන " මානව පෝෂණය සහ ජීවනෝපාය සඳහා ජෛව විවිධත්වය යොදා ගැනීම "යන ව්‍යාපෘතිය මගින් බත්තරමුල්ල මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ යාබඳ පරිශ්‍රයේ පිහිටි හෙළ බොජුන් හළ උත්සවාකාරයෙන් අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරනු ලැබීය. මීට සමගාමීව රාජ්‍ය ආයතන නිලධාරීන් සඳහා "ජෛව විවිධත්වය සහ සංවර්ධනය " පිළිබඳ ආරාධිත දේශනයක් ආචාර්ය සිරිල් විජේසුන්දර මහතා විසින්ද " මානව පෝෂණය සහ ජෛව විවිධත්වය " පිළිබඳ දේශනයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආහාර පර්යේෂණ ඒකකයේ අංශ ප්‍රධානි ආචාර්ය කේ.එච්.සාරානන්ද මහතා විසින් පවත්වනු ලැබීය.

2016 වසරේ ජාතික රතු දත්ත ලේඛණය එළි දැක්වීමේ වගකීම ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය සතු වන අතර එයට උරදීමක් ලෙස ආරම්භක වැඩමුළුවක් 2015 ජුනි 16 දින ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනයේදී පවත්වන ලදී. මෙහිදී ශාක සහ සත්ව විශේෂ පිළිබඳ විද්වතුන් සහභාගි වූ අතර ඔවුන්ගේ වටිනා අදහස් ද මෙහි දී එකතු විය.

ශ්‍රී ලංකාවේ බොහෝ ශාක විශේෂ පරාගනය කරමින් ඵලදැරීමට උපකාරී වන පරාගකාරක කෘමි විශේෂයක් වන බඹරාගෙන් සිදු වන අනතුරු වලක්වාලමින් ඔවුන් සංරක්ෂණය කිරීමේ අරමුණින් කඳුකර තේවතු සේවකයින් දැනුවත් කිරීමේ එක් දින වැඩමුළුවක් 2015 ඔක්තොම්බර් 30 දින තලවකැලේ තේ පර්යේෂන ආයතනයේදී පවත්වන ලදි. මෙහිදි බඹරුන්ගෙන් සිදුවන අනතුරු බොහෝමයක් සිදුවනුයේ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් බැවින් එය වළක්වාගත හැකි ආකාරයන් පිළිබඳව මෙහිදී අවධානය යොදු විය.

ලොව සියලූම ජෛව විවිධත්ව සම්මුතියේ පාර්ශ්වකාර රටවල් දෙසැම්බර් 11 වන දින කඳුකර දින සැමරුම සිදු කරනු ලබයි. 2015 වසරේ තේමාව වූයේ වඩාත් හොඳ ජීවනෝපායක් සඳහා කඳුකර නිෂ්පාදන දිරිගැන්වීමයි. මෙහිදී ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය විසින් මේ සඳහා දෙදින වැඩමුළුවක් කිතුල්ගල Adventure Base Camp හි පවත්වන ලදි. මෙහි ප්‍රධාන අරමුණ වූයේ විදේශ මෙන්ම දේශීය සංචාරකයින් පරිසර සංචාරය සඳහා යහපත් අයුරින් යොමු කරමින් කඳුකර ප්‍රදේශයන්හි ස්වාභාවික සෞන්දර්ය ආස්වාද ලෙස විදීමට ඉඩ සලස්වා ඒ තුලින් අදාල ජීවනෝපාය මාර්ගයන් සවිබල ගැන්වීමයි.

අනුරාධපුරය දිස්ත්‍රික්කයේ පුරාජෛව විවිධත්වය සහ වර්ථමාන ජෛව විවිධත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2015 දෙසැම්බර් 16 දින රජරට විශ්ව විද්‍යාලයේදි සිදු කරන ලදී. මෙහිදී අනුරාධපුරය දිස්ත්‍රික්කයේ පුරාජෛවවිවිධත්වය පිළිබඳ වගකිව යුතු රාජ්‍ය ආයතන, ප්‍රාදේශිය ලේකම්වරු, විශ්ව විද්‍යාල සිසුන් සහභාගි විය. මෙහිදී අනුරාධපුර පුරා ජෛව විවිධත්වය සහ වර්තමාන ජෛව විවිධත්වය පිළිබඳ ලියැවුණු පොත හා පුරාජෛව විවිධත්වය පිළිබඳ ක්‍රියාකාරි සැලැස්ම හඳුන්වා දෙන ලදි.

පුරාජෛවවිවිධත්ව සංචරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2015 දෙසැම්බර් 23 දින බුන්දල ජාතික උද්‍යානයේදී පවත්වන ලදි. මෙම වැඩමුළුව බුන්දල ජාතික උද්‍යානයේ සංචාරක මාර්ගෝපදේශකයන්, සංචාරක ජීප් රථ රියදුරන්, වන ජීවී නිලධාරින් සඳහා සිදු කරන ලදි. මෙහිදි බුන්දල පතිරාජවෙල පුරාජෛවවිවිධත්ව ස්ථානය පිළිබඳව මෙන්ම පුරාජෛවවිවිධත්වය පිළිබඳ දැනුවත් කිරීමක්ද සිදු කරන ලදි. මෙම වැඩමුළුවේ ප්‍රධාන අරමුණ වූයේ සංචාරක කර්මාන්තය සඳහා පුරාජෛව විවිධත්වය ප්‍රචලිත කිරීමයි.

ආගන්තුක ආක්‍රමණකාරි ජීවින් ඇතුළුවීම සහ පැතිරීම පාලනය සඳහා වන ධාරිතා වර්ධන ව්‍යාපෘතිය යටතේ නීති රාමුව සැකසීම, ඒකාබද්ධ ආයතනික රාමුවන් ස්ථාපිත කිරීම, වඩාත් සුදුසු මූල්‍යමය වශයෙන් ඵලදායි පාලන ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම ආදි කරුණු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම, ආක්‍රමණකාරි ජීවින් පැතිරීම පාලනය සහ කළමණාකරණය පිළිබඳ දෙදින නේවාසික වැඩමුළුවක් පැවැත්වීම, එලෙසම පරිසර පද්ධති ප්‍රවේශය, අවධානම් තක්සේරුව මගින් ආගන්තුක ආක්‍රමණකාරි ශාක සහ සත්ත්ව පිළිබඳ ජාතික ලැයිස්තුව සැකසීම සහ මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩමුළුව පැවැත්වීම සිදු කරන ලදි.

ජෛව විවිධත්වය පිළිබඳ පර්යේෂණ අත්පොත සහ ජෛව විවිධත්ව රක්ෂිත ප්‍රදේශ පිළිබඳ පොත සකස් කිරීම කරන ලදි.

- ජෛව විවිධත්ව සමීක්ෂණ සහ පර්යේෂණ

ශාක සහ සත්ව විශේෂ සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ සිදු කරන ලද අතර මෙහිදී විවෘත බීජක හා ආවෘත බීජක ශාක විශේෂ පිළිබඳවත්, සාගර සහ භෞමික ශාක විශේෂ පිළිබඳ පර්යේෂණ මෙන්ම පුරාජෛව විවිධත්වයට අදාළ පර්යේෂණ සිදු කරන ලදි.

### 2.2.4. කෘෂි ජෛව විවිධත්වය

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එක්ව මිල්ලනිය ගම තුල කෘෂි ජෛව විවිධත්ව පොළක් 2015 පෙබරවාරි 17 සිට 24 දින දක්වා පවත්වන ලදි. මෙහි ප්‍රධාන අරමුණ වූයේ පාරම්පරික කෘෂි භෝග ගම තුල කොපමන භාවිතා වන්නේද යන්න විමසා බැලීම, එම භාවිතා වන භෝග ග්‍රාමීය ජනයා අතර හඳුන්වා දීම සහ සංරක්ෂණය කර ප්‍රචලිත කිරීම වේ.

## 2.3 දේශගුණ විපර්යාස මගින් ඇතිවන අභියෝගයන්ට මුහුණදීම

වසර දෙසීයකට වැඩි කාලයක් ගල් අඟුරු සහ ඛණිජ තෙල් වැනි පොසිල ඉන්ධන දහනය හා වනාන්තර එළි කිරීම ''හරිතාගාර වායු'' වායු ගෝලයේ කැපී පෙනෙන ලෙස ඉහළ යාමට හේතු විය.

හරිතාගාර වායු ජීවය පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය වේ. මන්දයත් එකී වායු මගින් පෘථිවි පෘෂ්ඨය උණුසුම්ව තබා ගැනීමට උපකාර වීමයි. නමුත් වායු ගෝලයේ මෙම වායුන් හි සාන්ද්‍රණය ඉහළ යමින් පැවතීම නිසා පෘථිවියේ උෂ්ණත්වය පසුගිය කාලයේ පැවති තත්ත්වයට වඩා අඛණ්ඩ වැඩිවීමක් දක්නට ලැබේ. මෑත දශකවල පෘථිවියේ උෂ්ණත්වය ඉහළ යාමට බොහෝ සෙයින් බලපා ඇත්තේ මිනිස් ක්‍රියාකාරකම් වල ප්‍රතිපලයන්ය.

මුහුදු ජල මට්ටම ඉහළ යාම, ඉහළ උෂ්ණත්වයන්, නිතර නිතර හා දීර්ඝ කාලීනව පවතින නියඟය, ඉහළ තීව්‍රතාවයක් සහිත වර්ෂාපතනය හා ඉහළ අකුණු සැර ක්‍රියාකාරිත්වයට පෘථිවිය උණුසුම් වීම ආදිය ගෝලීය උණුසුම් වීමේ ප්‍රතිඵලයන්ය. මෙලෙස ඇතිවන දේශගුණික විපර්යාස හේතුවෙන් වෙරළබඩ ප්‍රදේශ වලට, ජාතික ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍රවලට හා මානව සෞඛ්‍යයට සැළකිය යුතු ලෙස බලපෑම් ඇති කරයි.

සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස හා දිවයිනක් ලෙස ශ්‍රී ලංකාව විශේෂයෙන් මෙම බලපෑම් වලට පහසුවෙන් පාත්‍ර වේ. දේශගුණ විපර්යාස ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් වලට, ආර්ථික ක්‍රියාවලින්ට හා මිනිසුන්ගේ යහ පැවැත්මට විශාල ලෙස බලපෑම් ඇති කරයි. දේශගුණ විපර්යාස ශ්‍රී ලංකාව කෙරෙහි දක්වන බලපෑම පිළිබඳ කර ඇති අධ්‍යනයන් තුළින් පසුගිය වසර 20 තුල මෙරට අදායම් ඉහළ දැමීම හා දුප්පත්කම අවම කිරීම තුළින් අත්කර ගත් කැපී පෙනෙන ජයග්‍රහණ වලට එම දේශගුණ විපර්යාස වල බලපෑම් තර්ජනයක් එල්ල කරන බව හඳුනාගෙන ඇත. දැනට සිදු කරන ලද මූලික පර්යේෂණ හා ප්‍රක්ෂේපන මගින් ශ්‍රී ලංකාව විශාල වශයෙන් හා විවිධාකාර ඉහළ අවධානම් තත්ත්ව වලට හා බලපෑම් වලට පාත්‍ර වන බව පෙනී යයි.

පරිසර අමාත්‍යාංශයේ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය, මෙරට ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රයට දේශගුණ විපර්යාස වලින් සිදු වන අභියෝග වලට මුහුණදීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය පිහිටුවීමේ මූලික අරමුණ වනුයේ දේශගුණ විපර්යාස හා බැඳුණු ප්‍රතිපත්ති හා සැලසුම් නවතම පර්යේෂණ ප්‍රතිඵල වලට අනුකූල වන පරිදි යථාවත් කිරීමයි. හරිත ලංකා ක්‍රියාකාරී සැලැස්මෙහි දේශගුණ විපර්යාස අභියෝග ජය ගැනීම නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

### 2.3.1 දේශගුණ විපර්යාස සඳහා ජාතික අනුහුරු ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

ජාතික අනුහුරු සැලැස්ම **(National Adaptation Plan)** සකස් කිරීම ආරම්භ කරන ලද්දේ 2014 වර්ෂයේදීය. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ අනුහුරු ධාරිතාව සහ ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය කිරීම තුලින් දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑමට ලක්වීම අවම කිරීමයි. ජාතික අනුහුරු ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ උපදේශක සේවාව ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය **(Institute of Policy Studies)** වෙත ලබාදී ඇත.

කෘෂිකර්ම (20.01.2015), ජල(27.01.2015), පරිසර පද්ධති හා ජෛව විවිධත්ව (30.01.2015),සංචාරක ව්‍යාපාරය හා පොදු විනෝදාත්මක කටයුතු (30.01.2015), සෞඛ්‍යය හා ආපදා (10.01.2015),මානව ජනාවාස හා යටිතල පහසුකම් (13.02.2015), කර්මාන්ත, බලශක්ති සහ ප්‍රවාහන (20.02.2015) හා අපනයන, කෘෂිකර්ම හා වැවිලි (24.02.2015) යන අංශ සඳහා වැඩමුළු 7 පවත්වා ඇත. ජාතික අනුහුරු ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා වැඩමුළුවක් 10.03.2015 දින පවත්වන ලදී. මෙම ක්‍රියාකාරී සැලැස්මේ පළමු කෙටුම්පත සකස් කරන ලදී. අනුගත වීම පිළිබඳ ජාතික විද්වත් කමිටු රැස්වීමේදී මෙම කෙටුම්පත සඳහා විශේෂඥයන්ගේ අදහස් ලබා ගන්නා ලදී. පළමු කෙටුම්පත සකස් කර, අදහස් හා යෝජනා සඳහා ජාතික විද්වත් කමිටුවේ පාර්ශ්වකරුවන් හා සාමාජිකයන් අතර බෙදා දෙන ලදී. අවසන් වැඩමුළුව පැවැත්වූ අතර, අදහස් හා යෝජනා අනුව අවසන් කෙටුම්පත සකස් කරන ලදී. අවසන් කෙටුම්පත අවශ්‍ය අනුමැතිය සඳහා ප්‍රකාශන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.

### 2.3.2.දේශගුණ විපර්යාස පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

ජෛව විවිධත්වය සහ දේශගුණික විපර්යාස පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් ගම්පහ උද්භිද උද්‍යානයේදී 18.11.2015 දිනද, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේදී 07.12.2015 දිනද පවත්වන ලදී. තවද "දේශගුණික විපර්යාස අභියෝගතා - පැරිස් රාජ්‍ය නායක සමුළුවෙන් පසු" පිළිබඳ මාධ්‍ය ආයතන දැනුවත් කිරීමේ වැඩමුළුව 21.12.2015 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී.

### 2.3.3. දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC) ක්‍රියාත්මක කිරීමේ ලේකම් කාර්යාලය හා කියතෝ සන්ධානය සමග සම්බන්ධීකරණය

දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ පාර්ශවකරුවෙකු වශයෙන් අවශ්‍ය අවස්ථා වලදී කාලීන වාර්තා සහ දත්ත යොමුකිරීමට එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) සහ කියතෝ සන්ධානයේ ජාතික කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙස අප අමාත්‍යාංශය බැදී සිටියි. එම සම්මුතියේ ADP, SBI, SBSTA වැනි UNFCCC සම්මුතිය යටතේ වූ විවිධ ආයතන වලින් කෙරෙන ඉල්ලීම් වලට අදාලව තොරතුරු සැපයීම ප්‍රධාන අවශ්‍යතාවයකි.

- දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ ලේකම් කාර්යාලයට අවශ්‍ය වාර්තා සැපයීම

20 වන පාර්ශවකරුවන්ගේ රැස්වීම සඳහා අවශ්‍ය ජාතික වාර්තා සකස් කරන ලදී. රාමුගත සම්මුතියට හා UNEP ජාතික කේන්ද්‍රීය ස්ථානයක් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කරන ලදී. විවිධ දේශගුණික කලාප සඳහා කෘෂිකර්ම පද්ධති හා සම්බන්ධ ගැටළු පිළිබඳ මූල් වාර්තාව සකස් කරන ලදී.කියෝතෝ සන්ධානයේ දෙවන කාල පරිච්ඡේදය සඳහා කැමැත්ත පළකිරීමට කැබිනට් පත්‍රිකාවක් සිංහල භාෂාවෙන් සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. කියෝතෝ සම්මුතියේ දෙවන ධුර කාලය සඳහා වූ කැබිනට් පත්‍රිකාව ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන ලදී. විවිධ දේශගුණික කලාප කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ගැටළු විද්‍යාත්මක සහ තාක්ෂණික උපදෙස් සඳහා වන අනුබද්ධිත ආයතනය (SBSTA) වෙත ඉදිරිපත් කරන ලදී. කියෝතෝ සන්ධානයේ දෙවන කාල පරිච්ඡේදය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී.

- දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ 20 වන පාර්ශවකරුවන්ගේ රැස්වීම සඳහා සූදානම් වීම

දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ 20 වන පාර්ශවකරුවන්ගේ රැස්වීමේ තීරණ අධීක්ෂණය කරන ලදී. ජාත්‍යන්තර දේශගුණික විපර්යාස පිළිබඳ සාකච්ඡා සටහනක් සකස් කර විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. 2015 ගිවිසුම මත සටහන සකස් කරන ලදී. 2015 ජර්මනියේ බොන් හි පැවති දේශගුණික විපර්යාස පිළිබඳ සමුළුවට සහභාගිවීම සඳහා යෝජිත නාමාවලිය යෝජනා සකස් කර ලියාපදිංචිය සිදු කරන ලදී. COP 21 සමුළුව සඳහා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහභාගිත්වය ස්ථිර කරන ලදී.

### 2.3.4 දේශගුණ විපර්යාස පිලිබඳ ජාතික කමිටු පැවැත්වීම

- දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව පැවැත්වීම

දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය ආයතන නියෝජනය කෙරෙන කමිටුවකි. මෙය ස්ථාපිත කිරීමේ ප්‍රධාන පරමාර්ථය වූයේ දේශගුණ විපර්යාස පිළිබඳ ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම අදාල ආයතන වල ප්‍රතිපත්ති තුලට ඇතුලත් කර ගැනීමයි. දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටු ආරම්භක රැස්වීම 06.10.2015 දින පවත්වන ලදී.

- දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික විශේෂඥ කමිටුව පිහිටුවීම

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ප්‍රකාශිත ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්ති සහ අනුවර්තන උපායන් පදනම් කර ගනිමින් දේශගුණ විපර්යාස අංශය දැනට ජාතික දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම ආරම්භ කර ඇති අතර එම ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා උපදෙස් ලබා ගැනීම සහ ශ්‍රී ලංකාව තුල දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම්වලට අනුවර්තනය වීම සඳහා උපදෙස් ලබා ගැනීමට 2012 සැප්තැම්බර් මස දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික විශේෂඥ කමිටුවක් පිහිටුවන ලදී.

දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික විශේෂඥ කමිටුවේ පරමාර්ථ.

- ✓ දේශගුණ විපර්යාස සඳහා රටේ ප්‍රවනතාව කලින් කලට දැනුවත් කිරීම සහ ඒ පිලිබඳ සංවේදීතාව වැඩි කිරීම.
- ✓ දේශගුණ විපර්යාස නිසා ජනතාවට සහ ඔවුන්ගේ ජීවනොපයන් සහ පරිසර පද්ධති සඳහා ඇති අහිතකර බලපෑම් අවම කිරීමට සහ මගහැරවීමට අනුවර්තන ක්‍රියාමාර්ග ගැනීම.
- ✓ තිරසාර සංවර්ධනයේදී හරිතාගාර වායු විමෝචනය අවම කිරීම.
- ✓ තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය දියුණු කිරීම.
- ✓ සමාජයේ පවතින දේශගුණ විපර්යාස වලට සම්බන්ධ විවිධ මුහුණුවරවල් ඇති ගැටළු පිලිබඳ දැනුම වැඩි දියුණු කිරීම සහ තීරණ ගැනීම්වලදී දූරදර්ශි තෝරාගැනීමක් කිරීමට ධාරිතාව වර්ධනය කිරීම.
- ✓ දේශගුණ විපර්යාස වල බලපෑම් වලට කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස මුහුණ දීමට රටේ ධාරිතාව වැඩි කිරීම.
- ✓ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දේශගුණ විපර්යාස සම්බන්ධ ගැටළු ඇතුලත් කිරීම.

දේශගුණ විපර්යාසවලට අනුවර්තනය වීමට අදාල ගැටළු සඳහා මගපෙන්වීම් ලබාගැනීමේ අරමුණින් දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ පස්වන ජාතික විශේෂඥ කමිටු රැස්වීම 2015.**05.19** වන දින පැවැත්විය. දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික විශේෂඥ කමිටුව හා දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ජාතික විශේෂඥ කමිටුව අතර ඒකාබද්ධ රැස්වීමක් පවත්වන ලදී.

- දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ජාතික විශේෂඥ කමිටුව පිහිටුවීම **(NECCC - Mitigation)**

ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා ක්‍රියා කිරීමේ දී ඇතිවන ගැටළු වලදී මග පෙන්වීම සඳහා දේශගුණික විපර්යාස අංශය මගින් දේශගුණික විපර්යාස අවම කිරීමපිලිබඳ ජාතික විශේෂඥ කමිටුවපිහිටුවන ලදී.

දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා ජාතික විශේෂඥ කමිටුවෙහි අරමුණු පහත ලෙස වෙයි.

- ✓ දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ජාතික සංවර්ධන ක්‍රියාදාමයට අනුකූලව දේශගුණික විපර්යාස අවම කිරීමේ ගැටලු පිලිබඳ මග පෙන්වීම.
- ✓ දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ප්‍රතිපත්ති, උපාය මාර්ග, ක්‍රියාකාරකම් සහ නීතිමය මෙවලම් සැදීමට මග පෙන්වීම
- ✓ දේශගුණ විපර්යාස පිලිබඳ ජාත්‍යන්තර කථිකාවතෙහි දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ රටෙහි තත්වය සකස් කිරීමට මග පෙන්වීම
- ✓ දේශගුණ විපර්යාස පිලිබඳ ජාත්‍යන්තර කථිකාවතට අනුව රටෙහි දේශගුණික විපර්යාස අවම කිරීමට ජාතික වශයෙන් යෝග්‍ය දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා ක්‍රියාකාරකම් සකස් කිරීම. **(NAMAs)**
- ✓ දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ක්‍රියාකාරකම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම උදෙසා මග පෙන්වීම
- ✓ පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රනය සහ කියොතෝ සන්ධානය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රන ක්‍රියාකිරීමට මග පෙන්වීම
- ✓ විදේශ ආධාර යටතේ ඇති විදේශ ආධාර ලබන දේශගුණ විපර්යාස අවම කිරීමේ ව්‍යාපෘති සමාලෝචනය කිරීම

දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ක්‍රියාකාරකම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම උදෙසා මග පෙන්වීම අරමුණු කොටගෙන දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ 6 වන ජාතික විශේෂඥ කමිටු

(NECCC - Mitigation) රැස්වීම 2015.03.17 දින පැවැත්වූ අතර 2015.05.14 දින විශේෂ රැස්වීමක් පවත්වන ලදී. 7 වන ජාතික විශේෂඥ කමිටු(NECCC - Mitigation) රැස්වීම 2015.05.25දින පවත්වන ලදී. රෙදිපිළි අපද්‍රව්‍ය පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා අනු කමිටුවක් රැස්වීමක් 2015.07.16 දින පැවැත්වන ලදී. දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ හා අවම කිරීම පිළිබඳ ඒකාබද්ධ ජාතික විශේෂඥ කමිටු රැස්වීමක් පවත්වන ලදී.

### 2.3.5 හරිත ලංකා වැඩසටහනේ මෙහෙවර 3 (දේශගුණ විපර්යාස පිළිබඳ අභියෝග ජයගැනීම)

හරිත ලංකා වැඩසටහන (NAPHLP) සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම පරිසර අමාත්‍යාංශය විසින් සියලු සංවර්ධන වැඩසටහන්වල තිරසාර බව සහතික කිරීමට සකස් කරන ලදී. තිරසාර සංවර්ධනය සඳහා වූ ජාතික සභාවේ (NCSD) 2009 පළමු රැස්වීමේදී අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ හඳුන්වාදෙන ලදී. මෙම වැඩසටහන 2009 - 2016 කාල පරාසයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

අවසාන කෙටුම්පත පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් සකස් කරන ලදී. මෙම අවසාන කෙටුම්පත සමාලෝචනය කර සම්පාදනය සඳහා ප්‍රතිපත්ති සැලසුම් අංශය වෙත ඉදිරිපත් කර ඇත. ජාතික පාරිසරික ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ වැඩමුළුවක් පවත්වන ලදී.

### 2.3.6 ශ්‍රී ලංකාවේ යෝජිත ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන්(INDCs) පිළියෙල කිරීම

එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ බැඳීමට අනුව 2015 ගිවිසුම සඳහා ශ්‍රී ලංකාවේ යෝජිත ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන්(INDCs) පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම, එහි ප්‍රගතිය අධීක්ෂණය සහ ඒ පිළිබඳව රාමුගත සම්මුති ලේකම් කාර්යාලයට වාර්තා කිරීම ආදී කටයුතු සිදු කෙරේ.

ශ්‍රී ලංකාවේ යෝජිත ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන් (INDCs) පිළියෙල කිරීම සඳහා තොරතුරු පත්‍රිකාව හා සහතික කිරීමේ ලිපිය UNEP/GEF වෙත ඉදිරිපත් කර ඇත. ව්‍යාපෘති සංකල්පය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. තත්ත්ව වාර්තාව සකස් කිරීම හා ක්ෂේත්‍ර හඳුනා ගන්නා ලදී. ව්‍යාපෘතිය සඳහා උපදේශකවරුන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පල කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශකවරු දෙදෙනෙක් බඳවා ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ යෝජිත ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන් (INDCs) පිළියෙල කිරීම සඳහා මූලික උපදේශන කමිටු 3 ක් හා පාර්ශවකරුවන් සමග වැඩමුළුවක් පවත්වන ලදී. උපදේශන කමිටු රැස්වීම් 12 ක් හා අභ්‍යන්තර සාකච්ඡා 9 ක් පවත්වන ලදී. ශ්‍රී ලංකාව සඳහා, යෝජිත ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන් (INDCs) පිළියෙල කිරීමේ වාර්තාව 2015.10.22 දින දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC) ක්‍රියාත්මක කිරීමේ ලේකම් කාර්යාලය වෙත භාරදෙන ලදී. ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් විශේෂ රැස්වීමක් පවත්වන ලදී. ක්‍රියාකාරී සැලැස්ම තවදුරටත් සකස් කිරීම සඳහා අභ්‍යන්තර සාකච්ඡා 2 ක් පවත්වන ලදී.

### 2.3.7 ශ්‍රී ලංකාවේ පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය (CDM) සඳහා වූ ජාතික බලාත්මක අධිකාරිය ලෙස නව පවිත්‍ර සංවර්ධන ව්‍යාපෘති ඇගයීම හා අනුමත කිරීම (DNA)

එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ වූ රාමුගත සම්මුතියේ විධායක කමිටුවෙහි අරමුණු ඉටු කිරීම සඳහා 1997 ජපානයේ කියෝතෝ හිදී එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ වූ රාමුගත සම්මුතියේ විධායක කමිටුවෙහි සාමාජිකයන් සමග පැවැත්වූ තුන් වන සමුළුවේදී නීතියෙන් බැඳී ඇති ගිවිසුමක් ඇති කරගන්නා ලදී. කියෝතෝ සම්මුතිය යටතේ, කාර්මික රටවල් 2008 - 2012 කාලය අතරතුර ඔවුන්ගේ මිශ්‍ර හරිතාගාර වායු විමෝචනය 1990 දී ඔවුන්ගේ වායු විමෝචන හා සැසඳීමේදී එම මට්ටමෙන් අවම අගයෙන් 5% ප්‍රමාණයක් අඩුකරගත යුතු වේ.2002/04/24 දින අංක 02/0392/116/004 දරන කැබිනට් තීරණය අනුව 2002 සැප්තැම්බර් 03 දින ශ්‍රී ලංකා රජය කියෝතෝ සම්මුතියට එකඟ වන ලදී.පරිසර අමාත්‍යාංශය එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ වූ රාමුගත සම්මුතියේ විධායක කමිටුවෙහි සහ කියෝතෝ සම්මුතියේ කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කරේ.

පවිත්‍ර සංවර්ධන ව්‍යාපෘති වල ජාතික බලාත්මක අධිකාරිය ලෙස පවිත්‍ර සංවර්ධන ව්‍යාපෘති වලට අනුමැතිය ලබා දීම සිදු කල යුතු අතර එය ජාතික බලාත්මක අධිකාරියේ මූලික වගකීමක් වන අතර එසේ අනුමැතිය ලබා දීමේදී එම ව්‍යාපෘතීන් රටෙහි තිරසාර සංවර්ධන අරමුණු කරා ලඟා වීමට දායක වන්නේ කෙසේදැයි තීරණය කල යුතුය.

### 2.3.8 ග්‍රිඩ් විමෝචන සාධකය ප්‍රකාශයට පත් කිරීම (Grid Emission Factor)

ග්‍රිඩ් විමෝචන සාධකය යනු විදුලි බලය උත්පාදනයේදී එක් ඒකකයකින් විමෝචනය වන $CO_2$ ප්‍රමාණයයි. විවිධ ශක්ති බලාගාර ප්‍රධාන ජාලයට විදුලිය සපයනු ලැබේ. මෙම බලාගාර ගල් අඟුරු, ඩීසල්, ජල විය හැක. අවසන් පාරිභෝගිකයා විසින් පරිභෝජනය කරන මෙම විදුලිය එම විදුලි ප්‍රභව වල එකතුවකින් ජනනය වූවක් බවට උපකල්පනය කරනු ලබන අතර එමගින් විවිධ $CO_2$ මට්ටම් විමෝචනය කෙරේ.

### 2.3.9 ජාතික යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම (NAMAs)

2007 බාලි නුවර දී පැවති එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ පාර්ශවකරුවන්ගේ 13 වන රැස්වීමේදී පළමු වරට මෙම සංකල්පය ඉදිරිපත් කෙරුණ අතර 16 වන රැස්වීමේදී මේ පිලිබඳව තීරණය කරන ලදී.

ඒ අනුව එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි පාර්ශවකරුවෙකු ලෙස ශ්‍රී ලංකාව ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම බලශක්ති සහ ප්‍රවාහන ක්ෂේත්‍ර 2 සඳහා ආරම්භ කරන ලදී.

- බලශක්ති අංශය සඳහා ජාතික යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම

ගෝලීය පරිසර පහසුකම් (GEF) ව්‍යාපෘතිය මගින් මූල්‍යමය ආධාර සපයමින් බලශක්ති උත්පාදනය හා අවසන් පරිභෝජන ක්ෂේත්‍රය සඳහා ජාතික යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් (NAMA) සකස් කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) මගින් විධායක බල ආයතනය ලෙස බලශක්ති අමාත්‍යාංශය නම් කරන ලද අතර ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මෙහි 4 වන ව්‍යාපෘති කොටස වන මැනිය හැකි, වාර්තාකළ හැකි හා සාක්ෂාත්කරණය (Measurable, Reportable, Verifiable) කිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ, දේශගුණ විපර්යාස අංශය යටතේ ක්‍රියාවට නැංවේ.

- ප්‍රවාහන අංශය සඳහා ජාතික යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම

2015 වර්ෂයේදී, ප්‍රවාහන අමාත්‍යාංශය සමග රැස්වීමක් පවත්වන ලදී. දැනට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ - සහශ්‍ර සංවර්ධන ඉලක්ක වැඩසටහන හා KPMG, India යන ආයතන දෙක බස් සීඝ්‍රගාමී භූවමාරු (Bus Rapid Transit) ව්‍යාපෘතිය සඳහා විදුලියෙන් ක්‍රියාත්මක වන බස් හඳුන්වා දීම සඳහා ජාතික යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාවලියක් සකසමින් පවතී. මෙම යෝජනාවලිය සැකසීම සඳහා අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යාංශය සමග උපදේශන පවත්වමින් සිටී.

### 2.3.10 ශ්‍රී ලංකාවේ මහවැලි ගංගාද්‍රෝණි ආශ්‍රිත ගොවි ජනපද වල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම්වලට අනුහුරුකරවීමේ ව්‍යාපෘතිය.

- ඉටුකිරීමේ ආයතනය - දේශගුණ විපර්යාස අංශය, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
- ක්‍රියාත්මක කිරීමේ ආයතනය - ලෝක ආහාර සංවිධානය

- අරමුදල – ඇමරිකානු ඩොලර් **7,989,727**

- ඉලක්කගත ප්‍රදේශ – නුවරඑළිය දිස්ත්‍රික්කය - වලපනේ ප්‍රා.ලේ.කො.
  පොළොන්නරුව දිස්ත්‍රික්කය – මැදිරිගිරිය ප්‍රා.ලේ.කො.සහ ලංකාපුර ප්‍රා.ලේ.කො.

- ප්‍රතිලාභීන් - ගොවි පවුල් **14,000**

- අරමුණ - මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වනුයේ මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ගොවි ජනපදවල වැසි දියෙන් යැපෙන කෘෂිකාර්මික ප්‍රජාව ඵලදායී භූමි සහ ජල සම්පත් කළමනාකරණය තුලින් විවිධාංගීකරණය වූ තිරසාර ජීවනෝපායන් සඳහා යොමුකර, දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් වලට අනුහුරු වීම සිදුකර ඔවුන්ගේ ජීවන රටාවන් ශක්තිමත්ව ගොඩනැංවීමයි.

- ප්‍රධාන පරමාර්ථ - මහවැලි ගංගා ද්‍රෝණියේ අනතුරට භාජනය විය හැකි ප්‍රදේශ වල ගොවි ජනතාව දේශගුණ විපර්යාස නිසා ප්‍රේරණය වන වර්ෂාපතන වෙනස්වීම් නිසා ඇතිවන ප්‍රතිපල ආහාර සුරක්ෂිතත්ව සහ ජීවනොපයන් කෙරෙහි බලපෑම් අවම කිරීම.

- ක්‍රියාකාරකම් – දේශගුණ විපර්යාස අභියෝග හමුවේ සාර්ථකව මුහුණදීම සඳහා කෘෂිකාර්මික ජීවනෝපායන් ශක්තිමත් කිරීම තුළින් ව්‍යාපෘති බල ප්‍රදේශ තුල වැසිදිය භාවිතයෙන් කෘෂිකර්මාන්තයෙහි යෙදෙන ගොවි ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීමසහ ඔවුන් සඳහා ප්‍රශස්ත ජීවන රටාවක් ඇතිකිරීම

  ක්‍රියාකාරකම් **2** - දේශගුණ විපර්යාස හමුවේ සාර්ථකව මුහුණදීමට හැකි ගොවි ප්‍රජාවක් ඇති කිරීම උදෙසා උචිත සේවාවක් ලබා දිය හැකි පරිදි ග්‍රාමීය, ප්‍රාදේශීය හා කලාපීය ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම

- ව්‍යාපෘතිය අමාත්‍ය මණ්ඩලය විසින් **2013** වර්ෂයේ දී අනුමත කරන ලදී

- **2015** වර්ෂයේ ක්‍රියාකාරකම් -

  - ✓ **2015** වසරේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම සෑදීම.
  - ✓ **2015** පෙබරවාරි මාසය තුල ව්‍යාපෘතියේ ආරම්භක වැඩමුළු දෙකක් වලපනේ සහ මැදිරිගිරිය ප්‍රා.ලේ.කො. තුල පැවැත්වීම.
  - ✓ **2015** අප්‍රේල් මාසය තුල ව්‍යාපෘතියේ දෙවන මෙහෙයුම් කමිටු රැස්වීම සහ වලපනේ පළමු ප්‍රාදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණ කමිටුවේ රැස්වීම පැවැත්විය.
  - ✓ **2015** මැයි මාසය තුල ජාතික ව්‍යාපෘති කළමනාකරණ කමිටුව පැවැත්වීම.
  - ✓ ජූනි මාසය තුල ක්‍රියාකාරකම් අංක **1.1.5** යටතේ මැදිරිගිරිය ප්‍රදේශයේ ගොවි පවුල් සඳහා වල් කපන යන්ත්‍ර **69**ක් සහ උපකරණ කට්ටල **30**ක් බෙදා දෙන ලදී. ක්‍රියාකාරකම් අංක **2.2.2** යටතේ මීගොල්ලෑව වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොන්ත්‍රාත්තුව භාරදෙන ලදී.
  - ✓ ජූලි මාසය තුල මැදිරිගිරිය සහ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල ප්‍රාදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණක මිටුවේ පළමු රැස්වීම පැවැත්වීම.
  - ✓ ව්‍යාපෘතිය සඳහා මුල්‍ය සහ පරිපාලන නිලධාරීවරයකු පත් කිරීම.
  - ✓ අගෝස්තු මාසය තුල ක්‍රියාත්මක අංක **2.2.3** යටතේ ජල කළමනාකරණය පිලිබඳ දැනුවත්වීමේ වැඩමුළුවක් මැදිරිගිරියේදී පැවැත්වීම.
  - ✓ ව්‍යාපෘති කළමනාකරු පත්කිරීම.
  - ✓ සැප්තැම්බර් මාසයේදී ක්‍රියාකාරකම් අංක **1.2.7, 1.2.8.** සහ **1.2.11** යටතේ වලපනේදී පාංශු සංරක්ෂණය පිලිබඳ වැඩමුළු පැවැත්වීම.
  - ✓ ව්‍යාපෘති සම්බන්ධිකරණ නිලධාරීන් දෙදෙනෙකු පත්කිරීම.
  - ✓ **2015** ඔක්තෝම්බර් මාසයේදී කාර්යාලීය උපකරණ මිලදීගන්නා ලදී (ෆොටෝ කොපි මැෂින් **3**ක්, මල්ටි මීඩියා **3**ක් සහ ප්‍රින්ටරයක්).
  - ✓ දෙසැම්බර් මාසයේ ප්‍රගතිය

- ක්‍රියාකාරකම් අංක 1.1.1 සහ 1.1.3 යටතේ වලපනේ, මැදිරිගිරිය සහ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ තුල මූලික සමීක්ෂණය සහ ආහාර පරිභෝජන රටාවන් පිලිබඳ දර්ශකයක් සැදීම සඳහා අත්තිකාරම් මුදලක් ලබාදීම.
- ක්‍රියාකාරකම් අංක 1.1.5 යටතේ කැති සහ අලවංගු 10,000ක් සහ උදළුතල මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලබාදීම.
- ක්‍රියාකාරකම් අංක 1.1.9 යටතේ ගෙවතු සඳහා හඳුනාගත් පැලවර්ග මිලදී ගැනීම සඳහා මුදල් ලබාදීම.
- ක්‍රියාකාරකම් අංක 1.1.10 යටතේ මැදිරිගිරිය සහ ලංකාපුර ප්‍රා.ලේ.කො. සඳහා වැසි ජලටැංකි ස්ථාපනය කිරීම සඳහා මුදල් ලබාදීම.
- ක්‍රියාකාරකම් අංක 1.1.5 යටතේ වලපනේ අඹගස්පිටිය මහඇල, තිරිවානාමඩිත්තවැව සහ අස්වල්පොළඇල මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා අත්තිකාරම් ලබාදීම.
- ක්‍රියාකාරකම් අංක 2.1.4 යටතේ වලපනේ ප්‍රදේශයේ අපදා කළමනාකරණ සිතියම් සැදීම සඳහා අත්තිකාරම් ලබාදීම.
- ක්‍රියාකාරකම් අංක 2.2.2 යටතේ වලපනේ ප්‍රදේශයේ අට්ටාලකුඹුරඇල, සියඹලාකුඹුරඇල, යෝඹුවල්තැන්නඇල සහ මාඋස්සාඇල ප්‍රතිසංස්කරණය, මැදිරිගිරිය ප්‍රදේශයේ මීගොල්ලෑවවැව ප්‍රතිසංස්කරණය සහ ලංකාපුරවැව් ප්‍රතිසංස්කරණය සඳහා අත්තිකාරම් ලබාදීම.

## 2.3.11. ශ්‍රී ලංකාවට හයිඩ්රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් *(HCFC)* ආනයනය සහ පරිභෝජනය පාලනය කිරීම

ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍යන් සඳහා වූ මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධානයන්ට අනුකූලව හයිඩ්රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් සහ ඒවායේ මිශ්‍රිත කාරක ආනයනය සඳහා වාර්ෂික කෝටා ක්‍රමයක් එහි පාර්ශව රටවලට හඳුන්වා දී තිබේ. ඒ අනුව මොන්ට්‍රියල් සන්ධානයේ ශ්‍රී ලංකාවේ කේන්ද්‍රීය ආයතනය වශයෙන් මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකය 2016ට හිමි කෝටා සහතිකපත් ආනයනකරුවන් වෙත ලබාදීම සඳහා රැස්වීමක් 2015 දෙසැම්බර් මස 3 වන දින මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ "සජ්ත පරිසර මණ්ඩපයේ දී"ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබීය.

- ශ්‍රී ලංකාවේ ශීතකාරක ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන පිහිටුවීම

HCFC ශීතකාරකය භාවිතයෙන් බැහැරකිරීමේ කළමනාකරණ සැලැස්මට අනුව HCFC ආනයනය පාලනයට යටත්වන අතර ජාතික ඕසෝන් ඒකකය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා සහයෝගීතාවයෙන් මොන්ට්‍රියල් සන්ධානයේ බහුපාර්ශවීය අරමුදල යටතේ ශීතකාරක පවිත්‍ර කිරීමේ මධ්‍යස්ථාන 8ක් මුළු රටම ආවරණය වන පරිදි තාක්ෂණික හා වෘත්තීය පුහුණු ආයතනයන් හි ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

මෙහි පළමුවැන්න 2015 අන්තර ජාතික ඕසෝන් දින සැමරුම් ජාතික උත්සවයට සමගාමීව මොරටුව ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පිහිටවනු ලැබීය.

ශීතකරණ හා වායු සමීකරණ ක්ෂේත්‍රයන්හි භාවිතා කරන ලද ශීතකාරක, අතිපිරිසිදු (නොඉදුල්) තත්ත්වයට පත් කිරීම ප්‍රධාන අරමුණ කොට ගනිමින් මෙම මධ්‍යස්ථාන පිහිටුවීමට බලාපොරොත්තු වේ. තවද මෙමගින් පහත අරමුණු ද සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වේ. ශීතකාරක පවිත්‍ර කිරීමේ ක්‍රියාවලිය පරිසර සංරක්ෂණයට මෙන්ම වත්මන් ආර්ථිකමය ප්‍රතිලාභ රැසක් හිමිකර දීමට ද ඉවහල් වේ.

- ✓ ශීතකරණ හා වායුසමීකරණ යන්ත්‍ර සේවා හා නඩත්තු කිරීමේ දී වායුගෝලයට මුදා හරින ශීතකාරක විමෝචනයන් අවම කිරීම.
- ✓ මෙම පද්ධතීන් මගින් ශීතකාරක පිරිසිදු කිරීම.
- ✓ පිරිසිදු කරනු ලැබූ ශීතකාරක නැවතත් පද්ධතීන්ට හඳුන්වාදීම තුලින් නව ශිතකාරක නිකුත් කිරීම අඩුකිරීමට හැකිවීම තුලින් ආනයනය ද සීමාකිරීමට එමගින් හැකි වේ. මෙමගින් HCFC ශිතකාරකය භාවිතයෙන් බැහැරකිරීමේ කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී අදාළ ඉලක්ක නියමිත කාලවකවානුවල දී සම්පූර්ණ කරගැනීමට ද මෙය ඉවහල්වනු ඇත.

ශීතකාරක පවිත්‍ර කිරීමේ මධ්‍යස්ථාන 8ට අනුයුක්ත උපදේශකවරුන් සහ එම ක්ෂේත්‍රයට අනුයුක්ත උපදේශකවරුන් සඳහා දෙදින වැඩමුළුවක් 2015 නොවැම්බර් මස 26-27යන දිනයන්හි මොරටුව ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ දී පවත්වනු ලැබීය.

- ශ්‍රී ලංකාවේ හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන් භාවිතය පිළිබඳ ජාතික සමීක්ෂණය සඳහා රැස්වීමක් **2015** මැයි මස **15** වන දින රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ දී පවත්වනු ලැබීය

හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන් ලෝකයේ වේගවත් වර්ධන හරිතාගාර ආවරණ වායුවක් වේ. වායුගෝලය හා මුසුවුණු හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන් වේගවත් ලෙස වැඩිවෙමින් පවතී. වායුගෝලයේ පවතින කාබන්ඩයොක්සයිඩ් හා සැසඳීමේ දී හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන්හි ගෝලීය උණුසුම්වීමේ ප්‍රවණතාවය සියයේ සිට දහස් ගුණයකින් පමණ බලසම්පන්න වන අතර ගෝලීය දේශගුණය කෙරෙහි ද අනිසි බලපෑම් ඇති කරයි. සාමාන්‍ය භාවිතයේ පවතින හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන් කාණ්ඩ අතර 134a, R404A, R407C, R507C, R410A, R152A යන කාණ්ඩයන් ගෝලීය උණුසුම්වීම කෙරෙහි වඩාත් බලසම්පන්න වේ.

ඒ අනුව මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකය මොන්ට්‍රියල් සන්ධානයේ කේන්ද්‍රීය ස්ථානය වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා එක්ව ශ්‍රී ලංකාවේ හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන් භාවිතය පිළිබඳ ජාතික මට්ටමේ සමීක්ෂණයක් සිදුකරන ලදී.

මෙම සමීක්ෂණයේ දී දත්ත රැස්කිරීම ප්‍රධාන මට්ටම් 3ක් යටතේ එනම් ආයතනික වශයෙන්, ආනයනකරුවන්ගෙන් හා ජාතික මට්ටමින් වශයෙන් අදියර 3ක් යටතේ සිදුකරන ලදී. මෙලෙස එක්රැස් කරගත් දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පිළියෙල කරගත් අවසන් වාර්තාව 2015 සැප්තැම්බර් මස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වෙත බාර දෙන ලදී.

### 2.3.12 අමාත්‍ය මණ්ඩල සංදේශ - *2015*

| අමාත්‍ය මණ්. පත්‍රිකා අංකය හා දිනය | ප්‍රධාන ක්‍රියාකාරකම | කැබිනට් තීරණ | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංකය: **15/1808/704/013**<br><br>දිනය: 2014/11/24 | "දේශගුණික අවදානම පිළිබඳ ජගත් සංසදයේ (Climate Vulnerable Forum) ශ්‍රී ලංකාව සාමාජිකත්ව ය ලබා ගැනීම" | (අ). සංදේශයේ 4 වන ඡේදයේ (I), (II) සහ (III) යෝජනා සඳහා අනුමැතිය දෙන ලදී.<br>අමාත්‍ය මණ්ඩල සංදේශය, ඡේදය 4<br>(I). දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ 21 වන පාර්ශවකරුවන්ගේ රැස්වීමේ දී මැනිලා පැරිස් ප්‍රකාශයට අත්සන් තැබීම සඳහා ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපතිතුමාට බලය පැවරීම<br>(II).දේශගුණික අවදානම පිළිබඳ වූ ජගත් සංසදයේ (Climate Vulnerable Forum) සාමාජිකත්වය ලබා ගැනීම<br>(III).දේශගුණික අවදානම පිළිබඳ වූ ජගත් සංසදයෙහි සාමාජික ගාස්තුව එම සංසදය විසින් තීරණය කරනු ලබන ආකාරයට අනුව 2017 වර්ෂයේ සිට ඉදිරියට වාර්ෂිකව ගෙවීම.<br>(ආ). තවද මෙම තීරණය සම්මත කරනු ලැබූ සේ සැලකීමටත්, ඒ අනුව අවශ්‍ය කටයුතු සඳහා අදාළ බලධාරීන් වෙත මෙම තීරණය දන්වා යැවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට බලය පැවරීමටත් තීරණය කරන ලදී. | ශ්‍රී ලංකාව, දේශගුණික අවදානම පිළිබඳ ජගත් සංසදයේ සාමාජිකත්වය ලබාගන්නා ලදී. මෙම සංසදය COP21 දී පැවැත්විණි. |
| අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංකය: **15/1199/604/011**<br>දිනය: 2015/06/27 | "කියෝතෝ සන්ධානයෙහි (Kyoto Protocol) දෙවන ධූර කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවේ එකඟතාව ප්‍රකාශ කිරීම" | (අ). සංදේශයේ 09 වන ඡේදයේ සඳහන් නිර්දේශය සඳහා අනුමැතිය ලබාදීම.<br>අමාත්‍ය මණ්ඩල සංදේශය, ඡේදය 9<br>එම නිසා, අමාත්‍ය මණ්ඩල සංදේශයේ 06, 07 හා 08 සඳහන් කරුණු අනුව ශ්‍රී ලංකා රජය කියෝතෝ සන්ධානයෙහි දෙවන දුර කාල සීමාවට එකගතාවය ප්‍රකාශ කිරීම නිර්දේශ කොට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.<br>(ආ). මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණ වල අවසන් ඡේදය සැලකිල්ලටගෙන, එහි දක්වා ඇති පරිදි, කාබන් අරමුදල ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියම කිරීම. | කියෝතෝ සන්ධානයේ දෙවන කාල පරිච්ඡේදය සඳහා කැබිනට් පත්‍රිකාවක් කැබිනට් අමාත්‍යාංශ අනුමැතිය සඳහාඉදිරිපත් කරන ලදී. කියෝතෝ සන්ධානයේ දෙවන කාල පරිච්ඡේදය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී. |

## 2.4 වෙරළ තීරය හා අවට මුහුද ඥානාන්විත ලෙස පරිහරණය

මෙම මෙහෙවර යටතේ සාගර හා වෙරළ ක්ෂේත්‍ර වලට අදාල ප්‍රධානතම පාර්ශ්වකරුවන් (වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව) හා අනෙකුත් අදාල ආයතනයන් සමඟ සම්බන්ධීකරණය මගින් කටයුතු ක්‍රියාත්මක වේ. මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කරන අවස්ථාවේ දී මෙහි ප්‍රධාන උපාය මාර්ගයන් මෙම අමාත්‍යාංශය යටතට ඇතුලත් නොවූ අතර එම ක්‍රියාකාරකම් 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

අදාළ උපාය මාර්ගයන් අනුව වෙරළ ඛාදනය සංරක්ෂණය කිරීම සඳහා වූ ක්‍රියාවන් යටතේ මාරවිල වෙරළේ වැලි පෝෂණය දෙවන අදියරට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශයක් මෙම අමාත්‍යාංශයේ සහයෝගයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම. එසේම වෙරළ සංරක්ෂණ කටයුතු සඳහා වූ විශේෂිත කමිටු සඳහා වෙනම වරාය නගර ව්‍යාපෘතියට අදාළ කමිටු සඳහා මෙම අමාත්‍යාංශයේ නිලධාරින්ගේ නියෝජනය ලබා දෙන ලදී.

එසේම මෙම ක්ෂේත්‍රයට අදාල පාර්ශ්වකරුවන් පිළිබඳ මහජනතාව විසින් විටින් විට ඉදිරිපත් කරන්නා වූ ගැටළු සම්බන්ධව මෙම අමාත්‍යාංශය මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියාකර එම ගැටළු සමතයකට පත් කිරීම සිදු කරයි.

## 2.5 වගකීමෙන් යුතු ඉඩම් පරිහරණය

### *2.5.1* භූමි හායනය වැලැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාකත්මක කිරීමේ ජාතික මෙහෙයුම් කමිටුව

එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැලැක්වීමේ සම්මුතියට අනුව ශ්‍රී ලංකාවේ භූමි හායනය වැලැක්වීම සහ නියඟයෙන් වන හානිය අවම කිරීම සඳහා 2002 වර්ශයේදී සකස් කර තිබූ ජාතික ක්‍රියාකාරී වැඩසටහන සම්මුතියේ දස අවුරුදු (2008-2018) උපායමාර්ග වලට අනුකූලව 2014 වර්ෂයේදී යාවත්කාලීන කරන ලදී. මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය, පසුවිපරම හා ඇගයීම සිදුකිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සභාපතිත්වයෙන් යුත් ජාතික මෙහෙයුම් කමිටුවක් 2015 ජූලි මස ස්ථාපිත කරන ලදී.

### *2.5.2* ජගත් කාන්තාරකරණය වැළැක්වීමේ දිනය සැමරීම *2015 17* ජූනි

සෑම වසරකම ජූනි මස 17 වන දින ලොවපුරා මෙම ජගත් කාන්තාරකරණය වැළැක්වීමේ දිනය සමරනු ලබන අතර මෙවර එහි තේමාව වූයේ "තිරසාර පරිභෝජන රටාවන් මගින් ආහාර සුරක්ෂිතභාවය උදෙසා පස වෙනුවෙන් නිවැරදි ආයෝජනයක් සිදු කරමු" යන්නයි. පස හා කෘෂිකර්මාන්තය සැලකිල්ලට ගනිමින් ආහාර සුරක්ෂිතතාවයට දායකත්වය දෙන හා ඊට අදාළ පරිසර තත්වයන්ට සෘජුවම මුහුණ දෙන ගොවි ප්‍රජාව වෙත පස වෙනුවෙන් සිදු කළ යුතු නිවැරදි හා තිරසාර යෙදවුම් පිළිබඳ අවබෝධයක් ලබාදීමත් පස නිසරුවීමේ ප්‍රධානතම සාධකයක් වූ භූමි හායනය අවම කරගනිමින් සරුසාර පසක් ගොඩනැගීම තුළින් ආහාර සුරක්ෂිතතාවය තිරසාරව පවත්වා ගැනීමට ලෝක ප්‍රජාවගේ අවධානය යොමු කරවීමත් මෙහි ප්‍රධාන අරමුණු විය.

මෙවර ජගත් කාන්තාරකරණය වැළැක්වීමේ දින ප්‍රධාන වැඩසටහන පරිසර රාජ්‍ය අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමග ඒකාබද්ධව 2015 ජූනි මස 17 වන දින වැලිඔය සම්පත්නුවර, මහවැලි අධිකාරියේ පුහුණු මධ්‍යස්ථානයේ දී මහවැලි "එල්" කලාපයේ ගොවි සංවිධානවල ගොවීන් 150 දෙනෙකුගේ පමණ සහභාගීත්වයෙන් "ගොවි කතිකාවක්" ලෙස පැවැත්විනි.

එහිදී "තිරසාර පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා ඒ සඳහා උපක්‍රම" සහ "කෘෂි ජෛව විවිධත්වය ප්‍රවර්ධනය තුළින් අහාර සුරක්ෂිතතාවය හා පාංශු සංරක්ෂණය තහවුරු කිරීම" සම්බන්ධයෙන් දේශණ පැවැත්වූ අතර "ආහාර සුරක්ෂිත හෙටක් සඳහා පස වෙනුවන් නිවැරදි ආයෝජනයන් සිදු කරමු " යන මාතෘකා යටතේ විවෘත සාකච්ඡා වාරයක් සිදු කෙරිණි. මෙම වැඩසටහන සඳහා සහභාගී වූ ප්‍රදේශයේ

ගොවි සංවිධාන නියෝජිතයන් විසින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී ඔවුනට පැනනැඟී ඇති ගැටළු රාශියක් විද්වත් මඩුල්ල වෙත ඉදිරිපත් කරනු ලදුව ඒවා සාකච්ඡාවට බඳුන් විය.

වැඩසටහන අවසානයේදී පැමිණ සිටි ගොවි නියෝජිතයන් සඳහා කෘෂි උපකරණ හා පළතුරු පැළ බෙදා දෙන ලදී.

### 2.5.3 " වන රෝපා"ජාතික රුක් රෝපණ මාසය 2015 ඔක්තෝබර්

ඉදිරි වසර තුනක කාලය තුළ රටේ වනආවරණය 32% ක් දක්වා වැඩි කරගැනීමේ ඉලක්කය සපුරා ගැනීම පිණිස, රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශවකරුවන් විසින් ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික වැඩසටහන් යටතේ විශේෂ ක්‍රියාකාරකමක් වශයෙන් රුක් රෝපණය විධිමත් පරිදි හඳුන්වා දීම පිණිස "වන රෝපා" ජාතික රුක්රෝපණ වැඩසටහන 2015 ඔක්තෝම්බර් මාසය තුළ ආරම්භ කිරීමට 2015.09.25 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

මෙහිදී පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ දිස්ත්‍රික් වන නිළධාරීන් සහ මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් ප්‍රධානීන් වෙත උපදෙස් මාලාවක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මඟින් ලබාදුන් අතර පරිසර චක්‍රලේඛයක් මගින් සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් සහ රාජ්‍ය සමාගම්වල සභාපත්වරුන් ට 2015 ඔක්තෝම්බර් මාසය තුළ "වන රෝපා" ජාතික රුක්රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කලයුත්තේ කෙසේද යන්න උපදෙස් ලබා දෙන ලදී.

ඒ අනුව හරිත ශ්‍රී ලංකාවක් බිහි කිරීම යන දැක්ම සහ "වන ආවරණය රහිත නිසරු බිම් තීරුවල වන උයන් නිර්මාණය කිරීම" යන තේමාව යටතේ 2015 වසරේ ඔක්තෝම්බර් මාසය තුළ දිවයින පුරා රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශයට අයත් සියළුම ආයතන නිළධාරි මහත්ම මහත්මීන්ගේ සහභාගිත්වයෙන් 2015. 10. 11 වන දින ගම්පොල නවදෙවිටහිදී මෙම ජාතික වැඩසටහනේ ප්‍රධාන උත්සවය පැවැත්වූ අතර එහිදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් අක්කර 3.5 ක පළතුරු, ඖෂධ, කොස්, කිතුල් හා අලංකරන පැල 1450 ක් සිටුවන ලදී. තවද එම උත්සවයට සහභාගීවූවන්ට පළතුරු පැල 2000ක් ද බෙදාදෙන ලදී.

### *2.5.4* අමාත්‍ය මණ්ඩල සංදේශ - *2015*

| කැබිනට් පත්‍රිකා අංක සහ ඉදිරිපත් කල දිනය | මාතෘකාව | කැබිනට් තීරණය | වර්තමාන තත්වය |
|---|---|---|---|
| **15/1064/604/009 2015/05/26** | ගිරිනෝප්ස්වල්ලා ශාක විශේෂය අපනයනය විධිමත් කිරීම සඳහා සකස් කරන ලද නියෝග ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම | නිළධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාගන්නා ලදී | ගිරිනෝප්ස්වල්ලා ශාක විශේෂය අපනයනය විධිමත් කිරීම කිරීම සඳහා සාදන ලද නියෝගවල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පිටපත් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත |
| **15/1516/704/008 2015/09/18** | මාරවිල, තලවිල වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා වැලි පෝෂණය කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර | මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ ලබාගෙන ඒ අනුව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ කෙටුම්පත් 2015.10.28 දින ලබා දෙන ලදී | මෙම ව්‍යාපෘතිය සම්බන්දයෙන් පුළුල් අධ්‍යයනයක් සිදුකර තාක්ෂණික වාර්තාවක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම කමිටුවක් පත් කරන ලදී |
| **15/1267/704/001 2015/09/13** | වනරෝපා ජාතික රුක්රෝපණ වැඩසටහන | සෑම වසරකම ඔක්තෝබර් මසය වනරෝපා ජාතික රුක්රෝපණ මාසය ලෙස නම් කිරීමටත් 2015 ඔක්තෝම්බර් මාසයෙන් පටන් ගැනීමටත් කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී. | පළමු වනරෝපා වැඩසටහනේ ජාතික උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගම්පොළදී පවත්වන ලද අතර ඔක්තෝබර් මාසය පුරාම දිවයිනේ විවිධ රුක්රෝපණ වැඩසටහන් පවත්වන ලදී. |

## 2.6 කසලින් තොර වටපිටාවක්

### 2.6.1 ශ්‍රී ලංකාව තුල පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් (PCBC) *අපද්‍රව්‍ය* හා පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කරලීමේ ව්‍යාපෘතිය

ස්ටෝක්හෝම් සම්මුතියේ ශ්‍රී ලංකාවේ ජාතික කේන්ද්‍රීය ලක්ෂ්‍යය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වේ. ස්ටොක්හෝම් සම්මුතියේ ජාතික කේන්ද්‍රීය ලක්ෂය වන බැවින් ශ්‍රී ලංකාව තුල පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කරලීමේ ව්‍යාපෘතිය, ව්‍යාපෘති සකස් කිරීමේ මූලික අදියර සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය මත රජයේ දායකත්වය ඇමරිකන් ඩොලර් මිලියන 18.9 ක් ලෙස පෙන්වන ලදී. ගෝලීය පාරිසරික පහසුකම් යටතේ අවශ්‍ය මූල්‍යාධාර සපයන අතර එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන ආයතනයේ සහයෝගිතාවය යටතේ ශ්‍රී ලංකාව තුල පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කරලීමේ ව්‍යාපෘතිය ලෙස නම් කිරීමට අනුමැතිය ලබා ගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය 2015 සිට 2020 දක්වා වූ වර්ෂයන් තුල ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 4.725 ක් වන අතර එය රුපියල් මිලියන 660ක් පමණ වේ.

පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් මිශ්‍ර වූ හා අඩංගු වූ ට්‍රාන්ස්ෆෝමර් තුල අඩංගු ටොන් 1000ක අපද්‍රව්‍ය තෙල් අවම ප්‍රමාණයක් පරිසර හිතකාමී ආකාරයට බැහැර කර ලීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. මීට අමතරව, රට තුල පරිසර හිතකාමී ආකාරයට දැනට තිබෙන ප්‍රමාණයන් බැහැර කිරීම සඳහා පුද්ගලික හා රාජ්‍ය සහයෝගිතාවය තුලින් රෙගුලාසි හා ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීමේ අවස්ථාව පුළුල් කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කැරේ. පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය සංචිත හා පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අඩංගු උපකරණ වලින් සිදුවන නිකුත් කිරීම් පරිසර හිතකාමී ආකාරයට අඩු කිරීම හා ඉවත් කිරීම සඳහා පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් කළමනාකරණ පද්ධතියක් ගොඩ නැංවීමට අදාල ධාරිතා වර්ධනය හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතිය මගින් ඉලක්ක කරනු ලැබේ. එමනිසා ශ්‍රී ලංකාවද වසර 2025 වන විට පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් හා පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අඩංගු උපකරණ අප රට තුලින් තුරන් කිරීමෙන් දිගුකල් පවතින කාබනික දූෂක පිලිබඳ වූ ස්ටොක්හෝම් සම්මුතියට අදාල පාර්ශවකරුවෙකු ලෙස වගකීමෙන් බැඳී සිටීමේ අරමුණ ළඟා කර ගැනීමට උපකාරී වේ.

ප්‍රධාන ක්‍රියාකාරකම් :

- ව්‍යාපෘති වාර්තාව සම්පූර්ණ කිරීම
- ශ්‍රී ලංකාව තුල පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කරලීමේ ව්‍යාපෘතිය පිලිබඳ වූ වැඩමුළුවක් 2015 ජූනි මස 16 වෙනිදා පැවැත්වීම
- ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලැබීම
- ඉහත ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම හා ජාතික ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ පරිසරයට අහිතකර ද්‍රව්‍ය හා රසායනික කළමනාකරණය කිරීමේ වැඩසටහන පිළිබඳ වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම
- ශ්‍රී ලංකාව තුල පොලික්ලෝරිනේටඩ්බයිෆිනයිල්ස් තොග ගණනය කිරීම සම්බන්ධයෙන් වූ රැස්වීමක් 2015 දෙසැම්බර් 16 දින පවත්වන ලදී.

### 2.6.2 ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයන් තුල පිහිටි විද්‍යාගාරයන් හි භාවිතා කළ හා කල් ඉකුත්වූ රසායන අපද්‍රව්‍ය බැහැර කරලීම හා පරිසර හිතකාමී කළමනාකරණය

විශ්ව විද්‍යාලවල විද්‍යා, වෛද්‍ය, කෘෂි, පශු වෛද්‍ය හා දන්ත පීඨයන්හි විද්‍යාගාරයන්හි විශාල ප්‍රමාණයක් රසායන අපද්‍රව්‍ය පරිසර හිතකාමී නොවන ලෙස බැහැර කර ලීම හේතුවෙන් රසායන අපද්‍රව්‍යයන්ගේ විෂ සහිත බව , නොනැසී පවතින බව, ජෛව සාන්ද්‍රගතවීම හා ජෛව විශාලනය වීම මඟින් පරිසර හා මානව සෞඛ්‍යයට අහිතකර බලපෑම් සිදුවේ. එමනිසා රසායන ද්‍රව්‍යයන්ගේ කල් ඉකුත් වූ හා නොදන්නා තොග සංචිත හා රසායන අපද්‍රව්‍යයන් බැහැර කිරීම පසු විපරම් කිරීම දැඩිව අවශ්‍යතාවයක් වී ඇත. මීට අමතරව අනාවරණය වූ පරිදි කල් ඉකුත් වූ රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම, බැහැර කිරීම සඳහා නිශ්චිත පරිසර හිතකාමී ක්‍රමවේදයක් දැනටමත් නොමැත. මෙමගින් විද්‍යාගාරයන් හි අපද්‍රව්‍යයන් භූ ජලයට හා පසට එක්වීමෙන් /මිශ්‍රවීමෙන් පරිසරයට විශාල හානියක් සිදු කැරේ.

භාවිතා කළ, නොකළ හා නොදන්නා රාසායනය ද්‍රව්‍යයන් හා ද්‍රව්‍යයන් පරිසර හිතකාමී ආකාරයට බැහැර කරලීම පිළිබඳව තොග ගණනය කිරීමේ වාර්තාවක් සකස් කිරීමට අදාල පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් පැවැති 2015.09.03 දින පැවැති මූලික සාකච්ඡාවේ දී තීරණය විය. තවද, ප්‍රයෝගික පරීක්ෂණ සිදුකිරීමේදී භාවිතාවන රසායන ද්‍රවයන් අවම වන පරිදි ශ්‍රිලංකාව තුල විශ්වවිද්‍යාල වල විද්‍යාගාරයන් සඳහා රෙගුලාසි සකස් කිරීම, විද්‍යාගාරයන් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ අවධානය යොමු කරමින් විශ්ව විද්‍යාල තුල ක්‍රියාත්මක වන අධ්‍යාපන වැඩසටහන් ප්‍රති සංවිධානය කිරීමට සිදුකිරීමට කටයුතු කැරේ.

අඩංගු/මිශ්‍ර වූ උපකරණ හා ද්‍රව්‍යයන් හා රසායන අපද්‍රව්‍යයන් බැහැර කරලීම සඳහා ක්‍රමවත් ක්‍රමවේදයක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව 2015 දෙසැම්බර් මස 30 වන දින පැවැති රැස්වීමේදී සාකච්ජා විය. එහිදී රසායන ද්‍රව්‍ය මිලදී ගැනීමේ ප්‍රතිපත්තියක් හා වෙන් කරන ලද දත්ත ගබඩාවකට දත්ත ඇතුල් කිරීම සිදුකිරීමට හා විශ්ව විද්‍යාල වල විද්‍යාගාරයන් වලින් නිකුත් කරනු ලබන රසායන අපද්‍රව්‍ය බැහැර කර ලීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කිරීමට හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතිය ඇතිව රසායන ද්‍රව්‍ය විද්‍යාගාරයන් වල මනා භාවිතයන් හා ආරක්ෂිත මාර්ගෝපදේශ සකස් කිරීම සිදුකිරීමට නියමිතය. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, කාර්මික පර්යේෂණ ආයතය, රසායන ද්‍රව්‍ය ආනයනය කරනු ලබන කර්මාන්ත ශාලාකරුවන්ගේ නියෝජිතයින් හා හොල්සිම් ලංකා ආයතනයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් රසායනය අපද්‍රව්‍ය පිළිබඳව කළමනාකරණය සඳහා මර්ගෝපදේශ සකස් කිරීමට තිරණය විය.

### *2.6.3* දිගුකල් පවත්නා කාබනික දූෂ්‍ය (POPs) පිළිබඳ වූ ස්ටොක්හෝම් සම්මුතියේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NIP) යාවත්කාලින කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාව පාර්ශවකරුවකු වන දිගුකල් පවත්නා කාබනික දූෂක (POPs) පිළිබඳ වූ ස්ටොක්හෝම් සම්මුතියේ 7 වන වගන්තිට අනුව, ජාතික වගකීමක් ලෙස සලකා සම්මුතියේ සිදුවන සංශෝධනයන්ට අනුකූලව එම සංශෝධනයන් සිදු වී වසර 2 ක් ඉක්මවීමට ප්‍රථම ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NIP) යාවත්කාලීන කර සම්මුතියේ පාර්ශවකරුවන්ගේ රැස්වීම වෙත යොමුකිරීමට කටයුතු කිරීමයි. මෙහිදී ජාතික ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහා පවතින අවහිරතා පිළිබඳ සොයා බලා ඒවා නිවැරදි කිරීමට කටයුතු කෙරේ. ඒ යටතේ නවතම දිගුකල් පවත්නා කාබනික දූෂ්‍ය (POPs) කාරක පිළිබඳ ඉන්වෙන්ට්‍රි සකස් කිරීම, පැරණි දිගුකල් පවත්නා කාබනික දූෂ්‍ය (POPs)පිළිබඳ ඉන්වෙන්ට්‍රි යාවත්කාලීන කිරීම, දිගුකල් පවත්නා කාබනික දූෂ්‍ය (POPs) කළමණාකරණය සඳහා ක්‍රියාකාරී කණ්ඩායම් ස්ථාපනය කිරීම, පවතින නීතිමය හා ප්‍රතිපත්ති රාමුව පිළිබඳ අධ්‍යනය හා ආයතනික හැකියාවන් කළමණාකරණය, මේ සඳහා අදාල පාර්ශවකරුවන්ගේ සමන්විත සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම හා අවසානයේ දී දිගුකල් පවත්නා කාබනික දූෂ්‍ය (POPs) ලංකාවෙන් තුරන් කිරීමට අවශ්‍ය ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට බලාපොරොත්තු වේ.

**2015 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ප්‍රධාන ක්‍රියාකාරකම්**

- ජාතික උපදේශන කමිටුව ස්ථාපනය හා පහත දැක්වෙන රැස්වීම් වාර 7 ක් පැවැත්වීම.
  - ✓ ජනවාරි මස 26 වෙනි දින ප්‍රථම වරට ව්‍යාපෘතියේ ජාතික උපදේශණ කමිටු රැස්වීම
  - ✓ ව්‍යාපෘතියේ විශේෂඥයන්ගේ ප්‍රගථි සමාලෝචනය සඳහා මාර්තු මස 15 වැනි දින 2 වෙනි උපදේශන කමිටු රැස්වීම පැවැත්වීම.
  - ✓ ව්‍යාපෘතිය 2015 වර්ෂය අවසානය වනතෙක් පවත්වාගෙන යාමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට උපදේශණ කමිටුවේ 3 වෙනි වෙනි රැස්වීම ජුනි මස 25 වැනි දින පැවැත්වීම.
  - ✓ ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාරක විසින් පිලියෙල කරන කල ජාතික ක්‍රියාකාරී සැලැස්මේ කෙටුම්පත විමසා බැලීම හා ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචනය සඳහා අගෝස්තු මස 04 වැනි දින 4 වෙනි උපදේශන කමිටු රැස්වීම පැවැත්වීම.
  - ✓ ජාතික ව්‍යාපෘති සම්බන්ධිකාරක විසින් පිලියෙල කරන කල ඉන්වෙන්ට්‍රි තක්සේරු කිරීමේ වාර්ථාව හා POPs දැනුවත්කිරීමේ වැඩසටහනේ වැඩ සැලැස්ම පිලිබඳ ප්‍රගථි සමාලෝචනය සඳහා අගෝස්තු මස 25 වැනි දින 5 වෙනි උපදේශන කමිටු රැස්වීම පැවැත්වීම
  - ✓ ප්ලාස්ටික් හා පොලිතීන් කළමනාකරණය සඳහා අනුකමිටු 4ක් පිහිටුවීම හා POPs දැනුවත්කිරීමේ වැඩසටහන සඳහා මාධ්‍ය උපදේශකවරයකු පත්කර ගැනීම සඳහා ඔක්තොම්බර් මස 13 වැනි දින 6 වෙනි උපදේශන කමිටු රැස්වීම පැවැත්වීම

- ව්‍යාපෘතියේ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් 3ක් පහත දිනයන්ගේ පැවැත්වීම,
  - ✓ ජනවාරි 5 වෙනි දින PBDE රැස්වීම
  - ✓ ජනවාරි 19 වෙනි දින PBDE රැස්වීම
  - ✓ අප්‍රේල් 23 වෙනි දින PBDE රැස්වීම

- ප්‍රශ්ණාවලිය සකස් කිරීම හා දත්ත රුස්කිරීම.
  - ✓ සමාජ ආර්ථික දත්ත සමීක්ෂණය පෙබරවාරි මස 13 වෙනි දින ආරම්භ කිරීම.
  - ✓ චේතනාන්විත නොවන දිගුකල් පවත්නා කාබනික දූෂ්‍ය (UPOPs) පිළිබඳ දත්ත රැස්කිරීමට ගම්පහ හා කොළඹ දිස්ත්‍රික්ක වල පාරිසරික ආරක්ෂණ බලපත්‍රලාභී ( EPL) ආයතන සඳහා ප්‍රශ්නාවලි යොමු කිරීම හා දත්ත රැස්කිරීම.
  - ✓ පිගන් ගඩොල්, උපද්‍රවකාරී අපද්‍රව්‍ය, සෞඛ්‍ය ක්ෂේත්‍රෙය් ජනිත වන අපද්‍රව්‍ය සම්බන්ධ දත්ත රැස්කිරීමට ප්‍රශ්නාවලි යොමු කිරීම.
  - ✓ වාහන විමෝචන පරීක්ෂණ දත්ත මෝටර් රථ කොමසාරිස්ගෙන්ලබා ගැනීම.
  - ✓ සිගරට් හා සිගරට් ආශ්‍රිත නිෂ්පාදන සඳහා අදාල දත්ත රැස් කිරීම.
  - ✓ ආදාහනාගාර ආශ්‍රිත දත්ත රැස් කිරීම.
  - ✓ පරිසර ආරක්ෂණ බලපත්‍ර පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් දත්ත ලබා ගැනීම.
  - ✓ PFOs ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීමට අවශය ගිනි නිවීම් රසායනික හා සම්බන්ධ තොරතුරු සිවිල් ගුවන්සේවා අධිකාරියෙන්, ශ්‍රී ලංකාව ගුවන් හමුදාවෙන් හා ගුවන්තොටුපොල හා ගුවන්සේවා මගින් ලබා ගැනීම
  - ✓ PBDE ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීමට අවශය තොරතුරු අදාල ආයතන තුලින් ලබා ගැනීම
  - ✓ PCBs ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීමට අවශය දත්ත ලබා හැනීම සඳහා දීප ව්‍යාප්ත දත්ත සමීක්ෂණයක් පැවැත්වීම

- UNIDO ආයතනයේ කලාපීය අධ්‍යක්ෂ විසින් පවත්වන ලද රැස්වීම සඳහා මාර්තු මස 19 වෙනි දින සහභාගී වීම.

- PCBs ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීම සඳහා වෙල්ඩින් ආයතන හිමිකරුවන්ගෙන් දත්ත ලබා ගැනීමේ රැස්වීම අප්‍රේල් මස 23 වෙනි දින පැවැත්වීම.

- පරිසර හිතකාමී ලෙස PCBs තෙල් හා ආශ්‍රිත උපකරණ බැහැරකිරීමේ ව්‍යාපෘතියේ, ජාතික දියත් කිරීමේ වැඩමුළුව ජූනි මස 16 වෙනි දින UNIDO ආයතනයේ NIP ව්‍යාපෘතියේ කළමණාකාරිණී ආචාර්ය කාමිලා මහත්මියගේ සහ NIP ව්‍යාපෘති පාර්ශවකරුවන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත් වීම.

- ව්‍යාපෘතියේ 4 වෙනි රැස්වීම ජූනි මස 03 වෙනි දින පැවැත්විනි. එහිදී ව්‍යාපාතිය 2015 දෙසැම්බර් දක්වා දීර්ඝ කිරීමට හා යාවත්කාලීන කරන ලද ඉන්වෙන්ට්‍රි සාදා නිමකිරීම සඳහා දින නියම කිරීම සිදු කිරීම.

- ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද POPs ඉන්වෙන්ට්‍රි වලංගු කිරීමේ (Validation) වැඩමුළුව දෙස්/විදෙස් විශේෂඥයින්, උපදේශකවරුන්ගේ හා පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් මැයි මස 11 හා 12 වෙනි දෙදින පැවැත්වීය. එහිදී ඉන්වෙන්ට්‍රි සාදා නිම කිරීමට මාස 2 ක කාලයක් ලබා දිමට තීරණය විය.

- ව්‍යාපෘතියේ POPs පිළිබඳ සමාජ ආර්ථික විශ්ලේෂණ නිම කිරීම හා එය පාර්ශවකරුවන් වෙත පිළිගැන්වීම. UNIDO ආයතනයේ POPs පිළිබඳ විශේෂඥ ආචාර්ය වෙබර් මහතා විසින් අන්තරාසර්ග පද්ධතින් අවහිර කිරීමේ රසායනික (EDCs) හා POPs අතර ඇති සම්බන්ධය පිළිබඳ අමතර අධ්‍යනයක් සිදු කිරීමට සමාජ ආර්ථික දත්ත විශේෂඥ වෙත දන්වා සිටීම හා එම දත්ත රැස්කිරීම ආරම්භ කිරීම.

- ව්‍යාපෘතියේ යාවත්කාලීන කරන ලද ඉන්වෙන්ට්‍රි හා වාර්ථා UNIDO ආයතනය වෙත යොමු කිරීම හා 2016 වර්ෂය අවසානය තෙක් ව්‍යාපෘතිය දීර්ඝ කිරීමේ යෝජනාව එම ආයතනයට යොමු කිරීම. ව්‍යාපෘතිය දීර්ඝ කිරීමේ යෝජනාව UNIDO ආයතනය, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අනුමත කරන ලදී.

- ව්‍යාපෘතිය යටතේ මිලදීගත් XRF යන්ත්‍රය UNIDO ආයතනය විසින් අමාත්‍යාංශය වෙත අගෝස්තු මස 06 වෙනි දින බාරදෙන ලදී. එම යන්ත්‍රය මගින් පරිසරයේ පවතින හානිදායක විෂ රසායනික පරීක්ෂා කිරීම සිදු කිරීමට නියමිත අතර යන්ත්‍රය පරිහරණය කිරීමේ ක්‍රමවේදය පිළිබඳ පුහුනුවක් මොරටුව විශ්ව විද්‍යාලයේ ආචාර්ය ශාන්තා අමරසිංහ මහතා විසින් අමාත්‍යාංශය නිළධාරීන් වෙත ලබා දෙන ලදී.

- පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ පාරිසරික අධ්‍යන කේන්ද්‍රය හා එක්ව විවෘත කසල දහනය හා එහි බලපෑම් පිලිබඳ දැනුවත්කිරීමේ වැඩසටහනක් 2015 නොවැම්බර් මස 06 වෙනි දින පැවැත්වීම.

- POPs හා අනිකුත් රසායනික ද්‍රව්‍ය කලමනාකරණය සඳහා නීතිමය රාමුවක් පිහිටුවීම හා HS code නැවත විචාරය කිරීම පිළිබඳව රැස්වීම 2015 නොවැම්බර් මස 17 වෙනි දින පැවැත්වීම

- POPs ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NIP) සාදා නිම කිරීම සඳහා වැඩමුළුවක් නොවැම්බර් මස 20 වෙනි දින පවත්වන ලද අතර, ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිලිබඳ වාර්තාව තවදුරටත් වැඩි දියුනු කර ඉදිරිපත් කරන ලෙස උපදෙස් පාර්ශවකරුවන් විසින් ලබා දෙන ලදී. අදාල අදහස් හා යෝජනා ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාරක වෙත යොමුකරන ලද අතර ඔහු විසින් නියමිත දිනට යාවත්කාලීන කරන ලද වාර්තාව, අමාත්‍යාංශය වෙත ලබා නොදීම හේතුවෙන් දෙසැම්බර් මස 22 වෙනි දිනට සැලසුම් කර තිබූ 7 වෙනි උපදේශන කමිටු රැස්වීම 2016 ජනවාරි මස 14 වෙනිදා දක්වා දීර්ඝ කරන ලදී.

- පරිසර හිතකාමී ලෙස PBDEs කළමනාකරණය සඳහා වන කලාපීය වැඩමුළුව 2015 නොවැම්බර් මස 27 වෙනි දින චීනයේ බාසල්/ ස්ටොක්හෝම් සම්මුතියේ කලාපීය මධ්‍යස්ථානයේ සහභාගීත්වයෙන් ශ්‍රි ලංකාවේ දී පැවැත්වීම.

**2.6.4** ශ්‍රී ලංකාව තුළ පොලිබ්‍රෝමිනේටඩ් ඩයිෆීනයිල් ඊතර්ස් නැමැති රසායනිකය කළමනාකරණය හා ක්‍රම ක්‍රමයෙන් පරිසරයෙන් බැහැර කිරීම පිළිබඳව 2015.11.27 වන දින වෝටර්ස් එජ් හෝටල් පරිශ්‍රයේ දී පවත්වන ලද එක්දින වැඩමුළුව.

ස්ටොක්හෝම් සම්මුතියේ ජාතික කේන්ද්‍රීය ලක්ෂය වශයෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමත්‍යාංශය, කලාපීය ව්‍යාපෘතියක් වන “පොලිබ්‍රෝමිනේටඩ් ඩයිෆීනයිල් ඊතර්ස් (Polybrominated diphenyl ethers - PBDEs) කළමනාකරණය හා බැහැර කිරීම සඳහා වන අනු කලාපීය ක්‍රියාකාරී සැලැස්ම” බාසල්/ස්ටොක්හෝම් සම්මුතියේ අසියානු හා පැසිෆික් කළාපය සඳහා කේන්ද්‍රස්ථානය චීනයේ (Basel/Stockholm Convention’s Regional Centre for Asia and the Pacific(BCRC)/China) සහයෝගීත්වයෙන් හා ගෝලීය පාරිසරික පහසුකම් (Global Environmental Facility-GEF) යටතේ මේ වන විට දියත් කර ඇත. මෙම ව්‍යාපෘතිය 2016 වසරේ මැද භාගයේ දී දියත් කිරීමට නියමිත ය.

මෙම පොලිබ්‍රෝමිනේටඩ් ඩයිෆීනයිල් ඊතර්ස් නැමැති කාබනික රසායනික ද්‍රව්‍යය, ගිනි ගැනීම් වැලැක්වීමේ ද්‍රව්‍යයක් වශයෙන් ඉලෙක්ට්‍රොනික උපාංග නිෂ්පාදනයේ දී, ප්ලාස්ටික් බාහිර ආවරණ සඳහා, ඇතැම් රෙදි පිළි ඇතුළු බොහෝ නිෂ්පාදනයන් සඳහා විශාල වශයෙන් භාවිතා කරනු ලබයි. මෙම රසායනික ද්‍රව්‍යය ස්ටොක්හෝම් සම්මුතිය මගින් හඳුනාගෙන ඇති ඉතාමත් උග්‍ර විෂ සහිත දිඟුකල් පවත්නා කාර්මික රසායනික බාණ්ඩයට අයත් රසායනික ද්‍රව්‍යයක් වේ.

මේ සඳහා ජාත්‍යන්තර විශේෂඥ ආචාර්ය රොලන්ඩ් වෙබර් මහතා, තාක්ෂණික සහායිකා ෆැන්ග් ලියු මෙනවිය ඇතුළු දේශීය විශේෂඥයින් කිහිපදෙනෙකු හා ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල සම්පත්දායකයින් 20 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මේ පිළිබඳව විශේෂ දැනුවත් කිරීමේ හා පුහුණු වැඩමුළුවක් බාසල්/ස්ටොක්හෝම් සම්මුතියේ අසියානු හා පැසිෆික් කළාපය සඳහා කේන්ද්‍රස්ථානය/චීනය යේ (Basel/Stockholm Convention’s Regional Centre for Asia and the Pacific(BCRC)/China) දායකත්වයෙන් හා දකුණු ආසියානු කලාපීය සහයෝගීතා පරිසර වැඩසටහනේ (South Asia Co-operative Environment Programme - SACEP) මැදිහත් වීමෙන් හා සහභාගීත්වයෙන් 2016.11.27 වන දින වෝටර්ස් එජ් හෝටල් පරිශ්‍රයේ දී සාර්ථකව පවත්වන ලදී.

### 2.6.5 රසදිය පිළිබඳ මිනමාතා සම්මුතිය අත්සන් කිරීම සහ අපරානුමත කිරීම

රසදිය පිළිබඳ මිනමාතා සම්මුතියෙහි අරමුණු වන්නේ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් රසදිය හා රසදිය අඩංගු සංයෝග මගින් පරසිරයට හා මිනිස් සෞඛ්‍යයට සිදුවන බලපෑමෙන් ආරක්ෂා වීමයි මෙම සම්මුතිය සඳහා ශ්‍රී ලංකාව 2014 ඔක්තෝම්බර් 18 වන දින අත්සන් කරනු ලැබූ අතර මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මෙම සම්මුතියේ ජාතික කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරයි. මිනමාතා සම්මුතිය ශ්‍රී ලංකාව තුල අපරානුමත කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා ගෝලීය පාරිසරික පහසුකම් (GEF) මගින් එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ (UNIDO) තාක්ෂණික සහය මත ඇමෙරිකානු ඩොලර් ලක්ෂ දෙකක මුදලක් ලබාදීමට එකඟ විය.

## 2.7 සැමට සැමදා ජලය

### *2.7.1* පවිත්‍ර ගංගා වැඩසටහන

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් කැළණි ගංගා ද්‍රෝණියේ මානව ක්‍රියාකාරකම් මගින් වන බලපෑම අවම කිරීමේ අරමුණින් ඒ හා සම්බන්ධ සියලු පාර්ශවකරුවන් ගේ දායකත්වය ලබාගැනීම් උදෙසා පවිත්‍ර ගංගා වැඩ සටහන් නියමු ව්‍යාපෘතියක් ලෙස 1998 ආරම්භ කරන ලදී.
2015 දක්වා පවිත්‍ර ගංගා ව්‍යාපෘතියේ ප්‍රගතිය සැකෙවින් පහත පරිදි වේ.

- කැළණි ගංගා ද්‍රෝණියේ  පරිසර දූෂණ මූලාශ්‍ර  හා ඉඩම් පරිහරණ රටා හඳුනාගැනීම හා සිතියම් ගත කිරීම

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහය ඇතිව කැළණි ගංගා ද්‍රෝණියේ පරිසර දූෂණ මූලාශ්‍ර සහ ඉඩම් පරිහරන රටා සිතියම් ගත කොට ඇත. ඉහත අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ කැළණි ගංගා ද්‍රෝණියේ සැළසුම් කිරීමේ හා තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා පුළුල් GIS සහය ඇති තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමයි.

- ජල තත්ත්ව විශ්ලේෂණ වාර්තාවක් සකස් කිරීම සහ පරිශීලක පහසු අන්තර්ජාලය ආශ්‍රිත පරිගණක වැඩසටහනක් නිර්මාණය කිරීම

කැළණි ගංගා ද්‍රෝණියේ කාර්යක්ෂම ජල සම්පත් කළමනාකරණය අරමුණු කර ගනිමින් පරිසර රාජ්‍ය අමාත්‍යාංශය විසින් වසර 2004 සිට තෝරාගත් ස්ථාන 14ක ජල තත්වය පරීක්ෂා කරනු ලැබේ. තවද මෙම වාර්තා හා දත්තයන් විශ්ලේෂණය කිරීම සඳහා දත්ත පද්ධතියක් හා එම දත්ත උපයෝගී කරගෙන අන්තර්ජාල බිහිදොරක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ තාක්ෂණික සහය ඇතිව සකස් කර ඇත.

- ලෝක ජල දින සැමරීම - 2015

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හා එක්ව ලෝක ජල දින සැමරුම 2015 මාර්තු මස 22වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දී පවත්වන ලදී. එක් එක් වසර වලදී විවිධ තේමා යටතේ සමරනු ලබන ලෝක ජල දිනය මෙම වසරේ දී සමරනු ලැබුවේ ජලය හා තිරසර සංවර්ධනය යන තේමාව යටතේය. මෙම වැඩ සටහනේ අරමුණ වනුයේ ජල සංරක්ෂණය සඳහා තරුණ පිරිසගේ දායකත්වය ලබා ගැනීම සහ එම පිරිස අතර කතිකාවතක් ඇති කිරීමයි.





ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය තුල පවත්වන ලද ලෝක ජල දිනසැමරුම

- එක්සත් ජාතීන්ගේ සංවිධානය හා එක්ව ක්‍රියාත්මක වන EDM ව්‍යාපෘතිය

EDM ව්‍යාපෘතිය යනු ශ්‍රී ලංකාවේ ජල සම්පත වගකීම් සහගත ලෙස කළමනාකරණය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි.  පවිත්‍ර ගංගා වැඩ සටහනට මෙම ව්‍යාපෘතිය යටතේ වර්ෂ 2012 සිට සහය ලැබෙන අතර ඒ යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- ✓ පාසැල් සිසුන් 3400 කට ජල තත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම

- ✓ කසළ කළමනාකරණය සහ ජල දූෂණය පිළිබඳ ගෘහයන් 2000 ක් දැනුවත් කිරීම. කැළණි ගඟේ දූෂණය වැලැක්වීම සඳහා රජය හා සම්බන්ධ වී වැඩ කිරීමට ස්වේච්ඡා නිලධාරින් 100 ක් පත් කරන ලදී. මෙම ස්වේච්ඡා නිලධාරින් රජයේ විවිධ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන් සහ කැළණි ගඟ ආශ්‍රිත සංරක්ෂණ වැඩ සටහන් සඳහා යොදා ගන්නා ලදී

- ✓ කැළණි ගඟ ආශ්‍රිත පරිසර පද්ධතීන්ගේ දූෂණය අවම කිරීමට මහජනතාවගේ සහ අදාල ආයතනවල අවධානය යොමු කිරීම සඳහා බෝට්ටු සවාරියක් සංවිධානය කරන ලදී

- ✓ කැළණි ගගේ ජල තත්වය සුරක්ෂිත කිරීම සහ කර්මාන්ත ආශ්‍රිත ජල දූෂණය අවම කිරීම සඳහා අදාල රූපමය තොරතුරු ඇතුලත් විඩියෝ දෙකක් සිංහල හා දෙමළ යන මාධ්‍යයන් ගෙන් නිපදවා ඒවා සමාජ ජාල වන ෆේස්බුක් හා ට්විටර් වෙත මුදා හරින ලදී.

- ✓ නියමිත ප්‍රමිතියෙන් යුතු ජලය බීමට සපයා ගත නොහැකි පාසල් හඳුනා ගැනීම සඳහා ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් අවශ්‍යතා හඳුනාගැනීමක් සිදු කරන ලදී. මේ අනුව පාසැල් 13ක් හඳුනා ගන්නා ලද අතර එම පාසැල්වල සිටින 50000 ක් පමණ සිසු සිසුවියන්ගේ ප්‍රයෝජනය සඳහා ලීටර් 100 ටැංකි බෙදා දෙන ලදී.

- ✓ කැළණි ගඟ ආශ්‍රිත ජල දූෂණය අවම කිරීම සඳහා අදාල පළාත් පාලන ආයතන 10 ක නියෝජිතයන් සඳහා වැඩමුළු 8ත් පවත්වන ලදී. රාජ්‍ය පාලන ක්‍රමයේ පවතින බාධක හඳුනා ගන්නා ලද අතර ඒවාට විසඳුම් මෙහිදී යෝජනා කරන ලදී. මෙහිදී සියළුම පළාත් පාලන ආයතන වල ඇති පරිසර ගැටළුවලට වේගවත් වඩා නිවැරදි විසඳුම් ලැබෙන පරිදි සංගෘහිත පරිසර විසඳුම් සැලැස්මක් සකසන ලදී.

පළාත් පාලන ආයතන හා සම්බන්ධව පවත්වන ලද වැඩමුළු

- ✓ බස්නාහිර පළාත තුල කැළණි ගගේ දූෂණ තත්වය හා ජලයේ තත්වය පිලිබඳව අධ්‍යනයක් සිදු කරන ලදී.

## 2.8 සෞඛ්‍ය හා සමෘද්ධිය උදෙසා හරිත නගර

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශයේ පරිසර භෞතික සැලසුම්කරණය පිළිබඳ ආයතනික ප්‍රවර්ධන හා නියමු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒකාබද්ධ අරමුදලින් මේ සඳහා වැය කල මුදල මිලියන 8.5



- **දඹුල්ල ඉනාමළුවේ රත්හඳුන් උද්‍යානය**

ශ්‍රී ලංකාවේ ප්‍රථම රත්හඳුන් උද්‍යානය රත්හඳුන් (*Pterocarpus Santalinum)* පැළ 500 කින් සමන්විතව යුධ හමුදාවේ සහයෝගයෙන් හා මහත් පරිශ්‍රමයෙන් යුතුව දඹුල්ල ඉනාමළුවෙ හි ස්ථාපනය කරන ලදී

- **වියලි කලාපීය ඖෂධ උද්‍යානය**

එක දිස්ත්‍රික්කයකට එක් ආදර්ශ ඖෂධ උද්‍යානයක් වැඩසටහන යටතේ ප්‍රථම අදියර වශයෙන් ඖෂධ උයන් හරහා ජෛව විවිධත්වය කෙසේ සංරක්ෂණය කල හැකිද යන්න පිළිබඳ සිසුන් දැනුවත් කිරීමේ

වැඩසටහනක් පවත්වන ලදී. ඊට සමගාමීව වියළි කලාපීය ඖෂධ උයනක් මැදවච්චිය මධ්‍ය මහා විද්‍යාලයේ ස්ථාපිත කරන ලදී.

- **පොලොන්නරුවේ ඇහැල උද්‍යානය**

**පරාක්‍රම සමුද්‍රය අසල පොලොන්නරුව බැඳිවැව ප්‍රදේශයේ අක්කර 03ක ප්‍රදේශයේ ඇහැල ගස්*(Cassia Fistula)* 500 ක් රෝපණය කරමින් පාරිසරිකව සංවර්ධනය කරන ලදී.**

- **බලංගොඩ ප්‍රදේශයේ පරිසර හිතකාමීව අලංකරණය**

**බලංගොඩ නන්ද එල්ලාවල මාවත- නාගරික පරිසරයේ විචිත්‍රවත් පැල සිටුවීම මගින් අලංකාර කරන ලදී.**

- **රුහුණ විශ්ව විද්‍යාලයේ කුරුළු උයන**

**සුපසන්, ආකර්ෂණීය පරිසරයක් විශ්වවිද්‍යාලය තුල ස්ථාපනය කිරීමේ ආදර්ශයක් වශයෙන් කුරුළු උද්‍යානයක් සමග ස්වභාවික මංපෙතක් රුහුණ විශ්ව විද්‍යාලය තුල ස්ථාපනය කරන ලදී.**






- **භූ දර්ශන සැලසුම් සහිත උද්‍යානයක් ඉදිකිරීම**

  එළිමහන් රැස්වීම් හා උත්සව පැවැත්විය හැකි පරිදි තිරසර පරිසර කළමනාකරණ සාධක සහිතව බත්තරමුල්ලේ උද්‍යානයක් සංවර්ධනය කරන ලදී

- **පරිසර සංවර්ධනය සඳහා වන භෞතික සැලසුම් පිළිබඳ වැඩමුළුව**

**රාජ්‍ය ආයතනවල ගෘහ නිර්මාණ ශිල්පීන්, නගර සැලසුම් කරුවන්, පරිසර විශේෂඥයන්, විද්‍යාඥයන්, වගකිවයුතු ආයතන සහභාගිත්වයෙන් ශ්‍රී ලංකාව සඳහා භෞතික සැලසුම් සකස් කිරීමේ ශක්‍යතාව සෙවීම සඳහා තොරතුරු ගවේශණ වැඩමුළුව මෙහෙයවීම.**
වැඩමුළුවේ අවසන් නිර්දේශ, මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව යොමු කර සමෝදානය කිරීම
**බස්නාහිර පලාත් හා මහනගර අමාත්‍යාංශය ඉදිරිපත් කල මහනගර සැලසුම් කිරීමේදී සලකා බැලීම.**

- **තිරසර නගර සංවර්ධනය සඳහා වන වැඩමුළුව**

**නගර සංවර්ධනය කිරීම සඳහා පාලන අධිකාරීන්, භෞතික සැලසුම් කරුවන් සමඟ එක්ව තිරසර නගර සංවර්ධනය සඳහා පාරිසරික කලාප හඳුනාගනු වස් ජාතික වැඩමුළුවක් පැවැත්වීම. වැඩිදුර ක්‍රියාමාර්ග සඳහා එම වැඩමුළුවේ නිරීක්ෂණ මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කිරීම**

- **දැනුවත්කිරීමේ වැඩසටහන්**
  - ✓ ඇස්බැස්ටෝස් භාවිතය හා ඇස්බැස්ටෝස් සඳහා ආදේශක පිළිබඳව දැනුවත්කිරීමේ වැඩසටහනක් සිදු කරන ලදී.
  - ✓ පරිසර සංරක්ෂණය සමඟ සහජීවනය පිළිබඳ ආකල්පමය වෙනසක් ඇති කිරීම අරමුණු කරගෙන ප්‍රවීන පරිසර සන්නිවේදක හා ගීත රචක සුනිල් සරත් පෙරේරා ශූරීන්ගේ දායකත්වයෙන් පරිසර ප්‍රවර්ධන වැඩසටහනක් සිදුකරන ලදී.

- **පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය පිළිබඳ ජාතික වැඩමුළුව**

**රසායනික පොහොර භාවිතයේ අනිසි ප්‍රතිඵල හා පරිසර හිතකාමී කෘෂිකාර්මික ක්‍රම අනුගමනය කිරීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම**

## 2.9 කර්මාන්ත හරිතකරණය

### 2.9.1 හරිත ගිනුම්කරණය ශ්‍රී ලංකාව තුල ස්ථාපිත කිරීම

දැනට පවතින ක්‍රමවේදය අනුව ජාතික ආර්ථිකයට පරිසරයෙන් ලැබෙන දායකත්වය සහ ආර්ථික ක්‍රියාවලි නිසා පරිසරයට සිදුවන හානිය නිසා සිදුවන පාඩුව දල දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී නොසළකා හැරේ. මෙම කරුණ නිසා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී පරිසරය ආශ්‍රිත කරුණු නොසළකා හැරීමට ලක්ව ඇති අතර ඒ නිසා ස්වභාවික සම්පත් හායනයට ලක්ව ඇත. ස්වභාවික සම්පත් තුලින් ජාතික ආර්ථිකයට ලැබෙන දායකත්වය ගණනය කිරීම සහ එය දළ දේශීය නිෂ්පාදනයට ඇතුලත් කිරීමේ අරමුණින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් හරිත ගිණුම්කරණය තුලට එක්සත් ජාතීන්ගේ සංවිධානය පූර්ණ අනුග්‍රහය යටතේ ආර්ථික අගය යන සංකල්පය යටතේ පාරිසරික දායකත්වය ඇතුලත් කිරීමට යෝජනා කරන ලදී.

හරිත ගිණුම්කාරණය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

**i.** වන ක්ෂේත්‍ර තක්සේරු අධ්‍යයනය සම්පූර්ණ කරන ලදී

මෙහි පළමු පියවර ලෙස වසර 2010 දී මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ජාතික ආර්ථිකයට වන ක්ෂේත්‍රයෙන් ඇතිවන දායකත්වය ගණනය කිරීම ආරම්භ කරන ලදී. මෙහි ප්‍රධාන අරමුණ වූයේ පූර්ණ ආර්ථික අගය ගණනය කිරීම සහ එම අගයන් ජාතික ගිණුම් වලට ඇතුලත් කිරීමේ ක්ෂේත්‍ර ක්‍රියා පටිපාටියක් සැකසීමයි. මේ අනුව ශ්‍රී ලංකාවේ වන ක්ෂේත්‍රෙය් පූරෟණ ආර්ථික අගය රු. මිලියන 236,802 ලෙස ගණනය කොට ඇත.

**ii.** එක් එක් ක්ෂේත්‍රයන් සඳහා ක්‍රියාකාරී කණ්ඩායම් ස්ථාපිත කිරීම

ජලය, ධීවර, ඉඩම්, ඛණිජ සහ කසළ යන ක්ෂේත්‍ර පහ සඳහා ක්‍රියාකාරී කණ්ඩායම් ස්ථාපිත කරන ලදී. ජල ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම 2014.08.26 වන දින පවත්වන ලද අතර ධීවර ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම 2014.11.11 දින පවත්වන ලදී. ඉඩම් ක්ෂේත්‍රය සහා වූ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම2015.04.07 වන දින පවත්වන ලද අතර ඛණිජ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම 2015.05.26 වන දින පවත්වන ලදී. ධීවර ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී කමිටු රැස්වීම 2015.12.12 වන දින පවත්වන ලදී.

**iii.** හරිත ගිණුම්කරණ පිළිබඳ දැනුවත් කිරීමේ පත්‍රිකා මුද්‍රණය කිරීම


**iv.** වන ක්ෂේත්‍රෙය් තක්සේරු අධ්‍යයනය සහ හරිත ගිණුම්කරණය පිළිබඳ කරුණු ඇතුලත් දැනුවත් කිරීමේ පත්‍රිකා 3000 ක් මුද්‍රණය කරන ලදී.

- හරිත ගිණුම්කරණය පිළිබද ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම


හරිත ගිණුම්කරණය පිළිබද ධාරිතා වර්ධන වැඩසටහනක් 2015 ජූලි මස 28 වන දින පවත්වන ලදී.

- හරිත ගිණුම්කරණය පිලිබදව ප්‍රතිපත්ති ලුහුඩුවක් සකස් කිරීම

හරිත ගිණුම්කරණය පිළිබද ප්‍රතිපත්ති ලුහුඩුව ඇතුලත් පත්‍රිකා 2000 ක් මුද්‍රණය කරන ලදී.




හරිත ගිණුම්කරණය පිළිබද ප්‍රතිපත්ති




හරිත ගිණුම්කරණය පිළිබද දැනුවත්කිරීමේ පත්‍රිකාව

### 2.9.2 ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම

පරිසර රාජ්‍ය අමාත්‍යාංශය විසින් නිෂ්පාදන හා සේවා ක්ෂේත්‍රයන්හි තිරසර කාර්ය සාධනය වාර්තා කිරීම පිණිස වර්ෂ 2011 දී ජාතික හරිත වාර්තාකරන ක්‍රමවේදය ස්ථාපිත කරන ලදී .නිෂ්පාදන හා සේවා ක්ෂේත්‍රයන්හි තිරසර කාර්ය සාධනය සන්නිවේදනය කිරීම සඳහා ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය උපයෝගී කොට ගනී.

මෙම වැඩසටහනේ මූලික අරමුණ වනුයේ කර්මාන්ත හා සේවා සපයන්නන්ගේ තිරසර කාර්ය සාධනය ඇගයීමට ලක් කිරීමත් හා තිරසර කාර්ය සාධනය වාර්තා කිරීමේ ධාරිතා වර්ධනයත්ය. ජාතික හරිත වාර්තාකරණය යටතේ මේ වන විට නිෂ්පාදන හා සේවා ආයතන 120 ක් පමණ අනුගත වී ඇති අතර වාර්ෂික වාර්තා ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබයි. ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

### 2.9.3 ශ්‍රී ලංකා ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය යටතේ හරිත වාර්තාකරුවන්ගේ ධාරිතා වර්ධනය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් 2011 දී හරිත වාර්තාකරණ ක්‍රමවේදය ආරම්භ කරන ලදී. මේ වනවිට මෙහි පුද්ගලික ආයතන 120 ක් පමණ ලියා පදිංචි වී ඇති අතර ඔවුන්ගේ වාර්තාකරණය වැඩි දියුණු කිරීම සඳහා ධාරිතා වැඩ සටහන් පැවැත්වීමට තීරණය විය. ඒ අනුව මෙම ධාරිතා වැඩ සටහන් ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදයේ 1 හා 2 ස්ථරහි ලියා පදිංචි ආයතනවලට පැවැත්වීමට තීරණය විය. ඒ අනුව

- ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදයහි ස්ථර 2 හි ආයතනවල නිලධාරීන් දෙදෙනෙකු සඳහා ධාරිතා වැඩ සටහන් දෙකක් පවත්වන ලදී.
- ස්ථර පහේම සිටිනා හරිත වාර්තාකරුවන්ගේ ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා පුහුණු මොඩියුල ඇති කරන ලදී.
- ජාතික හරිතවාර්තාකරණ ක්‍රමවේදයේ වාර්තාකරණය සඳහා ලුහුඬු මාර්ගෝපදේශයක් සැකසීම

### 2.9.4 ජාතික හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය සහ මාර්ගෝපදේශ සැදීම

ශ්‍රී ලංකාවේ 2006 සිට දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී පාරිසරික බලපෑම සැලකිල්ලට නොගනී. හරිත ප්‍රසම්පාදනය යනු රජයේ භාණ්ඩ ජීවන චක්‍රය පාරිසරික බලපෑම සැලකිල්ලට ගනිමින් කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවලියක් වේ.

හරිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා කැබිනට් අනුමැතිය 2012 වසරේදී ලැබුණු අතර එහිදී විශේෂයෙන් දේශීය නිෂ්පාදන සඳහා ප්‍රමුඛ ස්ථානයක් සැපයීමටද තීරණය වුණි. මේ අනුව තිරසර සංවර්ධන අංශය විසින් 2015 වසරේදී අදාල පාර්ශවකරුවන් හා සම්බන්ධීකරණයෙන් හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්ති මූලික කෙටුම්පතක් සකස් කරන ලදී. මෙම මූලික කෙටුම්පත අදාල පාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම් වල අදහස් අනුව ප්‍රධාන තේමා අංශ නවයක් යටතේ වැඩි දුරටත් දියුණු කරන ලදී.

හරිත ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් තත්ත්ව විශ්ලේෂණ වැඩමුළු දෙකක් 25.02.2015, 23.03.2015 සහ 23.05.2015 යන දිනයන්හිදී ප්‍රධාන පාර්ශවකරුවන්ගේ දායකත්වයෙන් පවත්වන ලදී. එමෙන්ම කෙටුම්පත වැඩි දියුණු කිරීම සඳහා 23.05.2015 රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව සමඟ රැස්වීමක් පවත්වන ලදී.



හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය සැදීමට සංවිධානය කරන ලද වැඩමුළු

## 2.9.5 සුපිරිසිදු නිෂ්පාදන ප්‍රතිපත්තිය හා සම්පත් කාර්යක්ෂමතා ප්‍රවර්ධනය

වැවිලි ක්ෂේත්‍රය සඳහා සකසන ලද සුපිරිසිදු නිෂ්පාදන කෙටුම්පත වැඩි දියුණු කිරීම සඳහා කුඩා වැඩමුළු දෙකක් 2015.12.02 සහ 2015.08.21 යන දිනයන්හි දී පවත්වන ලදී
තිරසර නොවන පරිභෝජන රටා හේතුවෙන් ස්වාභවික සම්පත් කෙරෙහි ඇති ඉල්ලුම දිනෙන් දින වැඩි වෙමින් පවතී. එනමුදු සුපිරිසුදු නිෂ්පාදනය ක්‍රියාත්මක කිරීම මගින් සම්පත් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාවය වැඩිකර ස්වභාවික සම්පත් ක්ෂයවීම අඩු කර දූෂණය සහ නිෂ්පාදන පිරිවැය අවම කරගත හැකි බව ගෝලීයව පිළිගෙන ඇත. එමෙන්ම මෙය ජාත්‍යන්තර වෙළඳ පොළ තුළ තරඟකාරී වීම සඳහා කාර්මික හා සේවා අංශ සඳහා පහසුකම් සලසනු ඇත.
ඒ අනුව සුපුරිසිදු නිෂ්පාදනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ග 2005 වර්ෂයේ දී ජාතික සුපිරිසිදු නිෂ්පාදන මධ්‍යස්ථානය සියළු පාර්ශ්වකරුවන් හා එක්ව සකසන ලද මෙම සුපිරිසිදු නිෂ්පාදන ප්‍රතිපත්තියේ අරමුණ වන්නේ තිරසර සංවර්ධනය ළඟා කර ගැනීම පරිසර ගුණාත්මකබව වැඩි නිෂ්පාදන ඇති කිරීම, පරිසර කාර්යක්ෂමතාවය වැඩි කිරීම හා ජීවන තත්වය උසස් කිරීම හා දිළිඳුකම තුරන් කිරීමයි. සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වූ සුපිරිසිදු නිෂ්පාදන හා ජාතික උපාය මාර්ගය 2007 වර්ෂයේ දී සකසන ලද අතර සංචාරක ධීවර ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය 2008 වර්ෂයේ දීත්, කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා වූ ප්‍රතිපත්තිය සහ උපාය මාර්ගය 2010 වසරේ දී සකසන ලදී.
මේ යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් වසර 2015 දී සිදු කරන ලදී

- මෙහෙයුම් කමිටු රැස්වීම 29.12.2015යන දින පවත්වන ලදී.
- සුපිරිසිදු නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ පත්‍රිකාවක් මුද්‍රණය කරන ලදී.




කෙටුම්පත වැඩි දියුණු කිරීමට පවත්වන ලද කුඩා වැඩමුළු

## 2.9.6 SWITCH – Asia තිරසර පරිභෝජන නිෂ්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යුරෝපා සංගමය මගින් පරිසර රාජ්‍ය අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන අංශයේ ඉල්ලීම මත ප්‍රදානය කරනු ලැබූ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ප්‍රතිපත්ති සම්පාදකයින්, පාර්ශ්වකරුවන් සහ මහජනතාවගේ දැනුම සහ ධාරිතාව වර්ධනය කිරීමේ වසර 4 ක පුළුල් වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමයි.

මේ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මේ සඳහා ව්‍යාපෘති විශේෂඥ කණ්ඩායමක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන අංශය කේන්ද්‍රස්ථානය කරගනිමින් 2015 ජනවාරි මස 26 වන දින සිට ව්‍යාපෘති මෙහෙයුම් ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය සඳහා ව්‍යපෘති මෙහෙයුම් කමිටුව ස්ථාපිත කිරීම සහ ජාතික පාර්ශවකරුවන්ගේ රැස්වීමක් 2015.03.23 වන දින පවත්වන ලදී.

මෙම ව්‍යාපෘතිය පාලනය කරනු ලබන්නේ ප්‍රධාන අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන වලින් සැදුම් ලත් සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් සහ යුරෝපා සංගමයේ ශ්‍රී ලංකාව සහ මාලදිවයින් නියෝජිත ප්‍රධානි සම සභාපතිත්වය දරණ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් මගිනි.

මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් 2015 වසරේ දී සිදු කරන ලදී

ව්‍යාපෘතිය නිල වශයෙන් 2015.04.09 වන දින දියත් කරන ලදී

- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ඇතුළු පාර්ශවකරුවන් සමග රැස්වීම් රැසක් පවත්වන ලදී .
- පාර්ශවකරුවන් 200ක් පමණ හඳුනා ගන්නා ලදී
- උපදේශනය සඳහා අන්තර්ආයතන විද්වත් කමිටුවක් පත්කරගන්නා ලදී.
- ප්‍රථම මෙහෙයුම් කමිටු රැස්වීම 2015.05.06 වන දින පවත්වන ලදී
- දෙවෙනි මෙහෙයුම් කමිටු රැස්වීම 2015 දෙසැම්බර් මස 17 වන දින පවත්වන ලදී.
- තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය සම්බන්ධ ප්‍රතිපත්ති 46 ක් සමාලෝචනය කරන ලදී
- තිරසර පරිභෝජනය හා නිෂ්පාදන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අංශයන් ලෙස කිරි, තේ සහ සහල් නිෂ්පාදන ක්ෂේත්‍ර හඳුනාගන්නා ලදී.
- ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය ප්‍රමිතිකරණය සඳහා ප්‍රතිපත්ති රාමුවක්, ප්‍රතිපත්ති ක්‍රමවේදයක් හා ප්‍රතිපත්ති තෝරා ගැනීමේ උපකරණ සංවර්ධනය කිරීමේ දෙදින වැඩමුළුවක් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීම
- ප්‍රතිපත්ති පරිශෝධනය හා මූලික අධ්‍යනයන් සඳහා උපදේශකවරුන් බඳවා ගැනීමේ කටයුතු ආරම්භ කිරීම
- ව්‍යාපෘති විද්වත් කමිටුව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද වැඩසටහන්වලදී ඔවුන්ගේ දායකත්වය ලබා දීම
- තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන් හඳුනා ගැනීම



ප්‍රතිපත්ති පරිශෝධනකණ්ඩායම් ක්‍රියාකාරකම්



ආහාරපාන අංශයෙහි උප අංශයන් තෝරා ගැනීම

### 2.9.7 රසායනික කළමනාකරණය හා දැනුවත් කිරීම

මොන්ට්‍රියල් සන්ධානයට අනුව ඕසෝන් ක්ෂයකාරක රසායනිකයන් පාලනය කරමින් ඒ වෙනුවට පරිසර හිතකාමී රසායනිකයන් සහ තාක්ෂණයන් හඳුන්වාදෙමින් අනාගත තිරසාර ගෝලීය පාරිසරික අභිමථාර්තයන් අත්පත් කරගැනීමට මොන්ට්‍රියල් සන්ධානයේ පාර්ශව රටවල් අපේක්ෂා කෙරේ.

ඒ අනුව අනාගත පරපුර වෙනුවෙන් ඕසෝන් ස්ථරය සුරක්ෂිත කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන ශීතකරණ සහ වායුසමීකරණ ක්ෂේත්‍රයන් සඳහාද පරිසර හිතකාමී තාක්ෂණයන් කෙරෙහි වඩාත් නැඹුරුවීමට ගෝලීය කාර්මික ක්ෂේත්‍රය වැඩි අවධානයක් යොමු කර තිබූ කර්මාන්තයන්හිදී HCFC සහ HFC මූලික කරගත් ශීතකාරකයන් නිෂ්පාදන සහ සේවා සඳහා වැඩිවශයෙන් භාවිතා කරන බැවින් ඔවුන්ගේ කාර්යභාරයේදී මේ සඳහා අවධානය යොමු කිරීම ප්‍රධාන වේ. මෙම රසායනිකයන්ගේ විමෝචනයන් ඉතා අහිතකර ලෙස මෙම ගෝලීය උණුසුම්වීම සහ ඕසෝන් ස්ථරය ක්ෂයවීම කෙරෙහ් බලපෑම් ඇති කරන ලබයි.

හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන් 32 ගෝලීය උණුසුම්වීම කෙරෙහි අඩු ප්‍රවණතාවයක් දක්වන බැවින් එය විකල්පයක් ලෙස හඳුන්වාදීම සඳහා වූ වැඩමුළුව 2015 ජූනි 09 දින ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයදී පවත්වනු ලැබීය.

ඕසෝන් ක්ෂයකාරක විභවය ශුන්‍ය වූද ගෝලීය උණුසුම්වීමේ ප්‍රවණතාවය අඩු හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන් 32 කාර්යක්ෂම විකල්පයක් ලෙස හඳුන්වාදීමේ වැඩමුළුවක් ජාතික ඕසෝන් ඒකකය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා එක්ව පැවැත්වූ අතර මේ සඳහා වූ තාක්ෂණික දායකත්වය ඉන්දියාවේ ඩෙයිකන් එයාර් කන්ඩිෂනර්ස් ආයතනය මගින් ලබාදෙනු ලැබීය.

කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලී තාක්ෂණික සහ පරිපාලන නිළධාරීන් සඳහා ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍යයක් වන හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් බැහැර කිරීමේ වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2015.06 26 වන දින කටුනායක අපනයන සැකසුම් කලාපයේ දී පැවැත්වීම

ජාතික ඕසෝන් ඒකකය විසින් හඳුනාගෙන ඇති පරිදි ශ්‍රී ලංකාවේ කාර්මික ක්ෂේත්‍රයේදී ඔවුන්ගේ නිෂ්පාදන සහ සේවා සඳහා බහුල වශයෙන් හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන්වැනි ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය බහුල වශයෙන් භාවිතා කරනු ලබයි. එබැවින් මොන්ට්‍රියල් සන්ධානයට අනුව වර්තමානයේ ක්‍රියාත්මක වන හයිඩ්‍රොක්ලෝරොෆ්ලෝරොකාබන් බැහැර කරලීමේ වැඩ සටහන පිළිබඳව මොවුන් දැනුවත් කිරීම වැදගත් වේ.

මෙම වැඩමුළුව සඳහා අපනයන සැකසුම් කලාපයේ පිහිටි කර්මාන්ත ඉලක්ක කරගනිමින් පැවැත්වූ අතර මේ සඳහා තාක්ෂණික සහ පරිපාලන නිළධාරින් 110 ක් පමණ සහභාගි වූ අතර ශ්‍රී ලංකා රේගුව, ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව සහ ජාතික පැලෑටි නිරෝධායන ආයතනයේ නිලධාරින් විසින් හරවත් දේශන මාලාවක් පවත්වනු ලැබීය. මෙම වැඩමුළුව සඳහා සහභාගි වූ නිලධාරින්හට මොන්ට්‍රියල් සන්ධානය පිළිබඳව වැදගත් තොරතුරු මෙන්ම ඕසෝන් විද්‍යාව, දේශගුණ විපර්යාස හා පරිසර හිතකාමී විකල්ප තාක්ෂණයන් පිළිබඳ යාවත්කාලීන තොරතුරු එක්රැස් කර ගැනීමට අවස්ථාව සැළසිණි.

## *2.10* නිවැරදි තෝරා ගැනීම සඳහා දැනුම

### 2.10.1සොබා සඟරාව

ප්‍රවර්ධන හා පරිසර අධ්‍යාපන අංශය මගින් වර්ෂයකට දෙවරක් සොබා සඟරාව මුද්‍රණය කර බෙදා හරිනු ලැබේ. මෙහි පළමු කලාපය වසර මැද හා (ජූනි - ජූලි) දෙවන කලාපය වර්ෂ අවසානයේ (දෙසැම්බර් - ජනවාරි) මුද්‍රණය කෙරේ.

සඟරාවේ පිටපත් 2500 බැගින් 2015 වර්ෂයේ ජූනි මස මුද්‍රණය කළ අතර එහි දෙවන කලාපය 2015 දෙසැම්බර් මස මුද්‍රණය කර ඒ සඳහා උනන්දුවක් දක්වන අය, පරිසර සංවිධාන, විශ්ව විද්‍යාල, පාසැල් හා පුස්තකාල ආදී ආයතන අතර බෙදා හරින ලදී.

### 2.10.2 පුස්තකාලය සඳහා ප්‍රකාශන සහ පොත්පත් මිළට ගැනීම

පාඨකයන්ගේ කියවීමේ රුචිකත්වය ඉහළ නැංවීම සඳහා අමාත්‍යාංශයේ දැනට පවතින පොත්පත් හා සඟරා ප්‍රමාණය වැඩි කරන ලදී. මෙහිදී පරිසර දැනුම ඇතුළුව වර්තමාන ප්‍රවනතාවයන්ට අනුව නව පොත්පත් හා සඟරා මිළට ගැනීමෙන් පුස්තකාලයේ පොත් එකතුව විවිධාංගීකරණය කරන ලදී.

### 2.10.3 පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

මෙම අංශය මගින් 2015 වර්ෂයේ දී ජගත් පරිසර දිනය පදනම් කර ගනිමින් දිස්ත්‍රික්ක 05ක් ආවරණය වන පරිදි පරිසර අධ්‍යාපන හා ප්‍රවර්ධන වැඩසටහන් 05ක් පවත්වන ලදී.

### 2.10.4 ජගත් පරිසර දිනය සැමරීම - 2015

ජගත් පරිසර දිනය සැමරීමේ කේන්ද්‍රීය ආයනතය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වන අතර එම උත්සවය සංවිධානය කිරීමේ හා පැවැත්වීමේ කාර්යය ප්‍රවර්ධන හා පරිසර අධ්‍යාපන අංශය වෙත පැවරී ඇත. මෙවර ජගත් පරිසර දින තේමාව වශයෙන් (Seven Billion Dreams, One Planet, Consume with Care) "තිරසර භාවිතය, සුරකී මිහිතලය" යනුවෙන් සිංහලෙන් භාවිතා කරන ලදී. ඒ අනුව, ප්‍රධාන සැමරුම් උළෙල පොළොන්නරුව මැදිරිගිරියේ වටදාගෙය පරිශ්‍රයේ දී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහභාගිත්වයෙන් 2015 ජූනි 05 දින පවත්වන ලදී. මෙම ප්‍රධාන උත්සවය මහවැලි

සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, පරිසර රාජ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති අනෙකුත් ආයතන එක්ව සංවිධානය කරන ලදී.

ජගත් පරිසර දිනය තේමා කර ගනිමින් පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී

2015 ජුනි මස 05 හා 06 දිනයන්හි මැදිරිගිරිය ජාතික පාසල් පරිශ්‍රයේදී පාරිසරික ප්‍රදර්ශනයක් පවත්වන ලදී.

*ජාතික උත්සවයට සමගාමීව සිදු කරන ලද සංවර්ධන වැඩසටහන්*

අ. මැදිරිගිරිය මීගොල්ලෑව වැව ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන ඇරඹීම
ආ. මැදිරිගිරිය ජාතික පාසලේ පහසුකම් සංවර්ධනය
ඇ. මැදිරිගිරිය වටදාගෙය පිවිසුම් මාර්ගයට විදුලි පහසුකම් ලබා දීම
ඈ.දිස්ත්‍රක්කයේ අඩු පහසුකම් සහිත පාසල් තුනක් භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ අනුග්‍රහය යටතේ සංවර්ධනය කිරීම

*ප්‍රධාන උත්සවයට සමගාමීව සිදුකරන ලද ක්‍රියාකාරකම්*

අ. මැදිරිගිරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් පාසල් සඳහා පුස්තකාල පොත් බෙදා දීම
ආ. මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් ගොවීන් සඳහා ගොවි උපකරණ ලබා දීම
ඇ. පාසල් සිසුන් සහ ගොවීන් සඳහා පළතුරු පැළ ලබාදීම
ඈ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය යටතේ මැදිරිගිරිය වටදාගෙය ආශ්‍රිත ප්‍රදේශයේ රුක් රෝපන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

*ත්‍යාග හා සහතික ප්‍රදානය*

අ. ජගත් පරිසර දිනය වෙනුවෙන් දෙවන වරට සංවිධානය කරන ලද කෙටි චිත්‍රපට තරඟාවලිය වන සොබා චලන සිතුවම් කෙටි චිත්‍රපටි උළෙලේ ජයග්‍රාහකයන් සඳහා
ආ. පාසල් සිසුන්ගේ විරිඳු ගායනා හා ජන ගායනා තරඟ ජයග්‍රාහකයින් සඳහා

### *2.10.5 පරිසර අධ්‍යාපනය හා දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය*

පරිසර අධ්‍යාපනය හා ප්‍රවර්ධනය මගින් තිරසර ප්‍රාදේශීය සංවර්ධනය සඳහා 2014-2017 කාල සීමාව තුලදී ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරන ලද ව්‍යාපෘතියකි. ඒ අනුව, 2015 වර්ෂයේදී පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් සහ තිරසර සංවර්ධන පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී. මෙම වැඩසටහන් මගින් බදුල්ල, මාතලේ, පුත්තලම හා ගාල්ල යන ප්‍රදේශවල පුද්ගලයින් 600 ක් පමණ පුහුණු කරන ලදී.

ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය තුරන් කිරීම සඳහා වූ මොන්ට්‍රියල් සන්ධානයට අනුව ජාතික ඕසෝන් ඒකකය මගින් ඕසෝන් ක්ෂයකාර ද්‍රව්‍යක් වන හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් භාවිතයට ගැනෙන උපකරණ වෙනුවට ඕසෝන් හිතකාමී උපකරණ හඳුන්වාදීමට ගෙන තිබෙන අතර ඕසෝන් ස්ථරයට හානිකර හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් වල විමෝචන වායුගෝලයට එක්වීම අවම කරමින් ඕසෝන් ස්ථරය සුරැකීමට පියවර ගෙන තිබේ.

මොන්ට්‍රියල් සන්ධානය විසින් නිර්දේශිත ක්‍රියාකාරකම් වලට සමාන්තරව ජාතික ඕසෝන් ඒකකය විසින් මේවනවිට රාජ්‍ය අංශයේ මෙන්ම පුද්ගලික අංශයේද කාර්මික ක්ෂේත්‍රය දැනුවත් කිරීමට පියවර ගෙන තිබේ.

ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍යයක් වන හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් තවමත් ශීතකරණ හා වායුසමීකරණ ක්ෂේත්‍රයන්හි බහුල වශයෙන් භාවිතා වන බැවින් මෙම ක්ෂේත්‍රයන්හි නියැලී සේවා කාර්මිකයනට වඩාත් යහපත් දේ හඳුන්වා දෙමින් ඒ පිළිබදව ඔවුන්ගේ දැනුම වඩාත් පුළුල් කිරීම වැදගත්වේ. එබැවින් ශ්‍රී ලංකා රේගුව, ආනයන අපනයන පාලක දෙපාර්තමේන්තුව හා ආයෝජන

මණ්ඩලය වැනි ආයතන වල නිළධාරීන් මෙන්ම ආනයනකරුවන් සඳහා ධාරිතා වර්ධන වැඩමුළු පැවැත්වීම මගින් ආනයන පාලන යාන්ත්‍රණය නිරතුරුවම යාවත්කාලීන කිරීමට පියවර ගෙන තිබේ.

### 2.10.6 රේගු නිළධාරීන්ගේ ධාරිතා වර්ධන වැඩමුළු

අද වන විට ලෝකයේ බොහොමයක් පාරිසරික ප්‍රශ්න වලට මුල් වී තිබෙන්නේ දේශ සීමා මායිම් ස්වභාවය සහ ගෝලීය බලපෑමයි. මෙම පාරිසරික ප්‍රශ්න සඳහා කාර්යක්ෂම විසඳුම් ලබාදිය හැකි වන්නේ බහුපාර්ශවීය පාරිසරික ගිවිසුම් හරහා අන්තර්ජාතික සහයෝගීතාවය සහ වගකීම් බෙදාහදා ගැනීම තුලිනි.

ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය නිෂ්පාදනය සහ පරිභෝජනය යන ක්‍රියාවලීන් දෙකෙන්ම බැහැරවෙමින් ඕසෝන් ස්ථරය සුරැකීමේ අරමුණින් මොන්ට්‍රියල් සන්ධානය නම් වූ බහුපාර්ශවීය පාරිසරික ගිවිසුම බිහිවිය.

ශ්‍රී ලංකාව මේ වන විට ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍යයක් වන හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් බැහැර කරලීමේ කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කරමින් පවතින අතර ඉහත රසායනික ද්‍රව්‍ය බැහැර කරලීම 2013 ජනවාරි 1 වෙනි දින සිට ආරම්භ කරන ලදී. මෙම ඕසෝන් ප්‍රහීන කාරක ද්‍රව්‍ය රට තුලට ඇතුළුවීම වලකාලීමට ශ්‍රී ලංකා රේගුව වඩා වැදගත් මෙහෙයක නිරත වී සිටින බැවින් මේ පිළිබඳව රේගු නිළධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම වඩා වැදගත් බැවින් ජාතික ඕසෝන් ඒකකය විසින් රේගු නිළධාරීන් සඳහා ධාරිතා වර්ධන වැඩමුළුවක් 2015 නොවැම්බර් 24 වන දින රේගු මන්දිරයේදී පවත්වනු ලැබූ අතර මේ සඳහා මූල්‍යමය දායකත්වය එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන මගින් ලැබිණි.

### 2.10.7 ශීතකරණ සහ වායුසමීකරණ සේවා කිරීමේදී පරිසරයට වඩාත් උචිත වූ ක්‍රමවේදයන් පිළිබඳ එම ක්ෂේත්‍රයේ නියැලී කාර්මිකයින් පුහුණු කිරීමේ වැඩමුළු පැවැත්වීම

නවීන තාක්ෂණය භාවිතය පිළිබඳව ශීතකරණ සහ වායුසමීකරණ සේවා ක්ෂේත්‍රයේ නියැලී කාර්මිකයින් කාර්යක්ෂම ලෙස පුහුණු කිරීම මොන්ට්‍රියල් සන්ධානයේ බැඳීම් වලට අනුව සිදු කළ යුතුව තිබේ.

ඒ අනුව ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන සහ අනෙකුත් ඒ හා සම්බන්ධ ආයතන වලට අනුයුක්ත ශීතකරණ හා වායුසමීකරණ ක්ෂේත්‍රයේ උපදේශකවරුන් සහ කාර්මිකයින් කාලානුරූපීව පුහුණු කෙරෙන අතර මේ සඳහා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන යටතේ මූල්‍යාධාර ලබාදෙනු ලබයි. මෙලෙස තෙදින වැඩමුළු කිහිපයක් 2015 වසරේදී ජාතික ඕසෝන් ඒකකය රත්නපුර කාර්මික විද්‍යාලයේදී, අම්පාර වෘත්තීය පුහුණු අධිකාරියේදී මෙන්ම ත්‍රිකුණාමලය නාවික හමුදා නැව් තටාංගනයේදී පිළිවෙලින් 2015 පෙබරවාරි මස 25-27, අප්‍රේල් මස 8-10 සහ දෙසැම්බර් මස 19-21 යන දින වලදී පවත්වනු ලැබීය.

මෙම වැඩමුළු වලදී සාකච්ඡාවට බඳුන් වූ ප්‍රධාන කරුණු වූයේ;

- ඕසෝන් වියන පිළිබඳ තොරතුරු, ඕසෝන් වියන ක්ෂයවීම පිළිබඳව සහ දේශගුණික විපර්යාස වල බලපෑම
- හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් වෙනුවට විකල්ප ශීතකාරක හඳුන්වාදීම.
- අපවිත්‍ර හෝ අනෙකුත් දෑ මිශ්‍ර වූ ශීතකාරක හඳුනා ගැනීම.

### 2.10.8 දැනුවත් කිරීමේ වැඩසටහන්

දැනුවත් කිරීමේ වැඩසටහන් වල මූලික අරමුණ වන්නේ ඕසෝන් ස්ථරය ආරක්ෂා කිරීමේ අභිමථාර්තය මුදුන් පමුණුවා ගැනීම සහ අනෙකුත් ප්‍රතිලාභ ලෙස දේශගුණ විපර්යාස අවම කර ගැනීම සහ සෞඛ්‍ය සම්පන්න වායුගෝලීය පරිසරයක් අනාගත පරපුරට උරුම කර දීමයි.

ඉහත අරමුණු පෙරදැරි කරගනිමින් ජාතික ඕසෝන් ඒකකය විසින් විවිධ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් විද්වත් පිරිසකගේ දේශන ඇතුලත් දැනුවත් කිරීමේ වැඩමුළු ගණනාවක් පවත්වනු ලැබීය. මෙහිදී ඕසෝන් ස්ථරය පිළිබඳ විද්‍යාත්මක තොරතුරු, ඕසෝන් ස්ථරය විනාශවීම හා එමගින් ඇතිවන

බලපෑම, බහුපාර්ශවීය අරමුදල, දේශගුණ විපර්යාස හා ස්වභාවික ආපදා, ලෝක උරුම විටිනාකමක් ඇති වගුරු බිම් ආරක්ෂා කිරීම සහ ඊට අදාළ තොරතුරු පිළිබද දැනුවත් කිරීම් සිදු කරන ලදී.

2015 වර්ෂය තුලදී ජාතික ඕසෝන් ඒකකය මගින් විවිධ කණ්ඩායම් ඉලක්ක කරගනිමින් පවත්වනු ලැබූ දැනුවත් කිරීමේ වැඩමුළු පහත පරිදිවේ.

- **2015** මාර්තු **20** වන දින විද්‍යා විෂයය ගුරුභවතුන්, ගුරු උපදේශකවරුන් මෙන්ම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සදහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් දෙනියාය ජාතික පාසලේදී පවත්වනු ලැබීය.
- **2015** මාර්තු මස **27** වන දින රජයේ නිළධාරීන් සදහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගරයේදී පවත්වනු ලැබීය.
- **2015** මැයි **08** වන දින විද්‍යා විෂයය ගුරුභවතුන්, ගුරු උපදේශකවරුන් මෙන්ම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සදහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් වැල්ලවාය මල්වත්තාව ජාතික පාසලේදී පවත්වනු ලැබීය.
- **2015** මැයි **30** වන දින හිගුරක්ගොඩ අධ්‍යාපන කළාපයේ විද්‍යා විෂයය ගුරුභවතුන්, ගුරු උපදේශකවරුන් මෙන්ම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සදහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් මැදිරිගිරිය ජාතික පාසලේදී පවත්වනු ලැබීය.
- **2015** ජුනි **29** වන දින විද්‍යා විෂයය ගුරුභවතුන්, ගුරු උපදේශකවරුන් මෙන්ම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සදහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් නුවරඑළිය ශාන්ත සර්වේයර් පාසලේදී පවත්වනු ලැබීය.
- **2015** සැප්තැම්බර් **02** වන දින විද්‍යා විෂයය ගුරුභවතුන්, ගුරු උපදේශකවරුන් මෙන්ම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සදහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් බදුල්ල මධ්‍ය මහා විද්‍යාලයේදී පවත්වනු ලැබීය.
- **2015** නොවැම්බර් **19** වන දින දකුණු පලාත් සංචාරක කර්මාන්තය හා සම්බන්ධ නිළධාරීන් සදහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් ගාල්ල පලාත් සභා ශ්‍රවණාගාරයේදී පවත්වනු ලැබීය.

## 3 ජාත්‍යන්තර සහයෝගිතාවය

- ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බොහොමයක් පරිසර සම්මුතීන් ගේ කේන්ද්‍රස්ථානය වශයෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ක්‍රියා කරන අතර එහිදී අදාල සම්මුතීන් හි ලේකම් කාර්යාල සඳහා සෑම වසරකම රුපියල් මිලියන **20** ක පමණ දායකත්ව මුදලක් ගෙවීම සිදු කෙරේ. ඒ අනුව පසුගිය වසරේ ද එම මුදල **CBD, UNCCD, UNFCC, IUCN, BASEL** ඇතුළු සම්මුති ලේකම් කාර්යාල වලට ගෙවා ඇත **(20 M)**.
- බාසල්, රොටර්ඩෑම් සහ ස්ටොක්හෝම් සම්මුතීන් හි කේන්ද්‍රස්ථානය වශයෙන් පසුගිය වසරේ ජාතික සම්බන්ධීකරණ කමිටු රැස්වීම් **04** ක් පවත්වන ලදී,
- අන්තර්ජාතික වෙරළ පවිත්‍ර කිරීමේ දිනය පසුගිය වසරේ, සමුද්‍ර දූෂණ වැලැක්වීමේ අධිකාරිය සමඟ සැමරීමට කටයුතු කරන ලදී. එහිදී ශ්‍රී ලංකාවේ වෙරළ තීරය පවිත්‍ර කිරීම සිදු කෙරිණි.
- එක්සත් ජාතීන්ගේ හැටනම වන සමුළුව සඳහා ශ්‍රී ලංකාවේ පාරිසරික තත්ව වාර්තාව ඉදිරිපත් කරන ලදී.
- **GSP** සහනය ශ්‍රී ලංකාවට ලබා ගැනීම සම්බන්ධයෙන් පාරිසරික සම්මුතීන් ක්‍රියාවට නැංවීමේ දී ශ්‍රී ලංකාවේ දායකත්වය **GSP** අයදුම් පත්‍රය සඳහා ලබාදීමට කටයුතු කිරීම.
- එක්සත් ජාතීන්ගේ පාරිසරික සමුළුව **- 1** සඳහා ශ්‍රී ලංකාවෙන් යෝජනාවක් ඉදිරිපත් කිරීම **(**යෝජනාව : පරිසර හානියක දී වන්දි ලබාගන්නේ කෙසේ ද යන්න පිළිබඳව**)**.
- ස්ටොක්හෝම් සම්මුතියේ පාර්ශ්වකාර රටක් වශයෙන් වාර්ෂිකව රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය, භාවිතය පිළිබඳ ස්ටෝක්හෝම් ලේකම් කාර්යාලයට දත්ත ලබාදීම. මේ වසරේ දී මේ වන විටත් අප භාවිතයෙන් ඉවත් කරන ලද ඩී. ඩී. ටී සම්බන්ධ තොරතුරු ලබා දෙන ලදී.
- රසායනික අපද්‍රව්‍ය නීති විරෝධී ලෙස රටවලට සංසරණයවීම වැලැක්වීම පිළිබඳව **(REN)** බලාත්මකව ජාලයේ කටයුතු වලට සම්බන්ධවීම

- අන්තර් ජාතික ඕසෝන් දින සැමරුම් ජාතික උත්සවය **2015**

1995 වර්ෂයේ සිට සෑම වසරකම සැප්තැම්බර් 16 වන දින ඕසෝන් ස්ථරය සුරැකීමේ ජාත්‍යන්තර දිනය ලෙස සමරනු ලබයි. මෙලෙස වඩාත් අගනා ඕසෝන් ස්ථරය සුරැකීමේ විශේෂ දිනයක් ප්‍රකාශයට පත් කිරීම තුලින් බලාපොරොත්තුවන්නේ දැනට ඕසෝන් ස්ථරයට පවතින තර්ජනයන්ගෙන් සහ සමහර අහිතකර මානව ක්‍රියාකාරකම් වලින් ඕසෝන් ස්ථරයට සිදුවන හානි වලින් එය සුරක්ෂිතකරගැනීමටය.

2015 වර්ෂයේ අන්තර්ජාතික ඕසෝන් දින සැමරුම් ජාතික උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මොරටුව ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පරිශ්‍රයේදී පවත්වනු ලැබීය. මෙම උත්සවය සඳහා රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන වලින් මෙන්ම එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත වරුන් මෙන්ම පාසල් සහ තාක්ෂණ විද්‍යාල සිසුන් ඇතුළුව දහසකට අධික පිරිසක් සහභාගී වුහ.

අන්තර්ජාතික ඕසෝන් දින සැමරුම් ජාතික උත්සවය සහ ඊට සමගාමීව ක්‍රියාත්මක කරනු ලැබු වැඩසටහන්:

- ✓ තාක්ෂණ සහ වෘත්තීය පුහුණු ආයතනයන්හි දැනට පවතින විෂය මාලාව වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කරනු ලැබු අතර එහි පළමු පිටපත අතිගරු ජනාධිපතිතුමා වෙත මෙහිදී පිළිගන්වනු ලැබීය.
- ✓ මුළු දිවයිනම ආවරණය වන පරිදි පිහිටවීමට නියමිතව තිබූ ශීතකාරක ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන 8න් පළමුවැන්න මොරටුව ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේදී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරනු ලැබීය.
- ✓ කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමට නියමිත අල්ට්‍රා වයලට් අධීක්ෂණ මධ්‍යස්ථානය පිළිබඳව මෙම උත්සවයේදී නිල වශයෙන් දැනුම්දීම සිදු කරන ලදී.

- ජාත්‍යන්තර රැස්වීම්, සමුළු සම්මන්ත්‍රණ සඳහා සහභාගීවීම

මොන්ට්‍රියල් සන්ධානයේ පාර්ශවකරුවකු වශයෙන් ශ්‍රී ලංකාව පහත සඳහන් ජාත්‍යන්තර සමුළු, රැස්වීම් සඳහා ඉහත කාල සීමාව තුලදී සහභාගී විය.

- ✓ 2015 පෙබරවාරි 26 සිට 28 දක්වා ඉන්දියාවේ දී හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන් කළමනාකරණය පිළිබඳ වැඩමුළුවක් පවත්වනු ලැබීය.
- ✓ 2015 මාර්තු 10 සිට 13 දක්වා දකුණු කොරියාවේදී දකුණු ආසියානු, ගිණිකොණ ආසියානු සහ පැසිපික් කලාපයේ ඕසෝන් නිළධාරීන් සඳහා රැස්වීමක් පවත්වනු ලැබීය.
- ✓ 2015 අප්‍රේල් 24 තායිලන්තයේ බැංකොක් නුවරදී පාර්ශවකරුවන්ගේ 35වන රැස්වීම පවත්වනු ලැබීය.
- ✓ 2015 මැයි 20 සිට 22 දක්වා තායිලන්තයේ පතායා හිදී අත්‍යවශ්‍ය කටයුතු සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතය පිළිබඳ රැස්වීමක් පවත්වනු ලැබීය.
- ✓ මොන්ට්‍රියල් සන්ධානයේ පාර්ශවකරුවන්ගේ 27 වන රැස්වීම 2015 නොවැම්බර් මස 1-5 දින දක්වා අරාබි එක්සත් එමීර් රාජ්‍යයේදී පවත්වනු ලැබීය.

- ගෝලීය පාරිසරික පහසුකම් (GEF) සැලසීම පිළිබඳව කලාපීය වැඩමුළුව

ගෝලීය පාරිසරික පහසුකම් සැලසීම පිළිබඳව කලාපීය වැඩමුළුව (GEF ECW) ආසියානු කලාපයේ රටවල් 11 ක සහභාගිත්වයෙන් 2015 මාර්තු 17 සිට 20 දක්වා කොළඹ හිල්ටන් හෝටලයේදී සාර්ථකව පවත්වන ලදී.
මෙවැනි වැඩමුළු තුලින් ගෝලීය පාරිසරික පහසුකම් සැලසීමේ කේන්ද්‍රස්ථාන (GEF) හා ප්‍රධාන සම්මුතීන් පිළිබඳ කේන්ද්‍රස්ථාන (ජෛව විවිධත්ව, දේශගුණ විපර්යාස, කාන්තාරකරණය, දිගුකල් පවත්නා කාබනික දූෂක), සිවිල් සමාජයේ නියෝජිතයින්, GEF නියෝජිතයින් සහ GEF ලේකම් කාර්යාලයේ නියෝජිතයින් එකට එකතුවීම සිදුවේ. ජාතික කේන්ද්‍රස්ථාන වලට කලාපයේ අනෙකුත් රටවල කේන්ද්‍රස්ථාන හා GEF පාර්ශවකරුවන් මුනගැසීමට මෙමගින් අවස්ථාව උදාවන අතර ප්‍රතිපත්ති සාකච්ඡාවට හා සමාලෝචනයට බඳුන් කිරීම, GEF ව්‍යාපෘති සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම හා ඒවා ජාතික ප්‍රතිපත්ති රාමුවට ඒකාබද්ධ කිරීම පිළිබඳ අත්දැකීම් හුවමාරු කර ගැනීමට මඟ පාදයි.
මෙම වර්ෂයේ වැඩමුළුව මගින් නව GEF උපායමාර්ග සහ ඒවා ඒකාබද්ධ ප්‍රවේශයන්, GEF 6 වන චක්‍රයේ ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි, GEF 2020 හා GEF 6 වන චක්‍රය සඳහා ව්‍යාපෘති නිර්මාණය කිරීම පිළිබඳ පුහුණුවක් ලබාදීම පිළිබඳ අවධානය යොමු කරන ලදී.

- සිවිල් සමාජ සංවිධාන හා කුඩා පරිමාණ ආධාර වැඩසටහන්

සිවිල් සමාජ සාමාජිකයින් සඳහා රැස්වීමක් 2015 මාර්තු 16 වන දින පැවැත්වුණි. ආසියානු කලාපයේ රටවල් 11 කින් සිවිල් සමාජ නියෝජිතයන් 18 දෙනෙකු මේ සඳහා සහභාගී විය.

කුඩා පරිමාණ ආධාර වැඩසටහන සිවිල් සමාජ සංවිධාන වල හා දේශීය ප්‍රජාවගේ සහභාගීත්වය ලබා ගැනීමට වැදගත් ක්‍රමවේදයක් වන අතර එය තවදුරටත් පවත්වා ගැනීම වැඩිදියුණු කිරීම හා කලාපයේ සියළු රටවල් වලට ව්‍යාප්ත කලයුතු බව සහ විශාල GEF ව්‍යාපෘති හා වැඩසටහන් තුලින් සාර්ථක කුඩා පරිමාණ ව්‍යාපෘති ප්‍රවර්ධනය කර ව්‍යාප්ත කල යුතු බව මෙහිදී සහභාගීවන්නන් විසින් හඳුනාගත් කරුණු අතර විය.

- ගෝලීය පාරිසරික පහසුකම යටතේ ජාතික කාර්යය සම්පාදනය කිරීම

ගෝලීය පාරිසරික පහසුකම යටතේ ජාතික කාර්යය සම්පාදනය කිරීම සඳහා සකස් කරන ලද ලියවිල්ල, ගෝලීය පාරිසරික පහසුකම හය වන චක්‍රයෙහි අරමුදල් සඳහා වොෂිංටනයේ ගෝලීය පාරිසරික පහසුකම් සැලසීමේ ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදි. ඒ අනුව ඊළඟ චක්‍රයක් සඳහා ඩොලර් මිලියන 11.0 ක මුදල් ප්‍රතිපාදනයක් ශ්‍රී ලංකාව වෙත ලබා ගැනීමට සමත් විය. ජෛව විවිධත්ව, දේශගුණ විපර්යාස, කාන්තාරකරණය සහ තිරසාර වන කළමනාකරණය කේන්ද්‍ර කරගනිමින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා හතරක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, සොබාදහම සංරක්ෂණය සඳහා ජාත්‍යන්තර සංගමය, එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමග සහභාගීත්වය ඇතිව, ජාතික පාරිසරික ප්‍රමුඛතාවයන් ජාතික සංවර්ධන සැලසුම් සඳහා අනුප්‍රවාහගත කිරීම මෙම ව්‍යාපෘතින් හරහා සිදුකිරීමට නියමිතය.

## 4. මූල්‍ය විශ්ලේෂණය සහ ගිණුම් සාරාංශය

සාරාංශය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය – 160

| වැඩ සටහන හා ව්‍යාපෘතිය | පුනරාවර්තන වියදම් | | | ප්‍රග්ධන වියදම් | | |
|---|---|---|---|---|---|---|
| | වෙන් කිරීම් (රු.) | වියදම (රු.) | % | වෙන් කිරීම් (රු.) | වියදම (රු.) | % |
| වැඩ සටහන 01 | | | | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | 522,715,000.00 | 513,068,081.90 | 98.15 | 293,113,000.00 | 287,762,882.01 | 98.18 |
| ව්‍යාපෘතිය 01 | | | | | | |
| අමාත්‍ය කාර්යාලය | 10,700,000.00 | 8,047,274.76 | 75.21 | 44,315,000.00 | 41,563,602.80 | 93.79 |
| ව්‍යාපෘතිය 02 | | | | | | |
| අමාත්‍යාංශ පරිපාලනය | 512,015,000.00 | 505,020,807.14 | 98.63 | 248,798,000.00 | 246,199,279.21 | 98.96 |
| වැඩ සටහන 02 | | | | | | |
| ව්‍යාපෘතිය 03 | | | | | | |
| පරිසර සංරක්ෂණය | 1,346,938,000.00 | 639,323,391.51 | 47.46 | | | |
| ව්‍යාපෘතිය 04 | | | | | | |
| රාජ්‍ය ආයතන | 1,049,000,000.00 | 946,636,400.79 | 90.24 | 3,241,612,000.00 | 3,228,693,000.00 | 99.60 |
| ව්‍යාපෘතිය 05 | | | | | | |
| මහවැලි සංවර්ධනය | 29,433,450,000.00 | 23,104,978,581.90 | 78.49 | | | |
| එකතුව | 32,352,103,000.00 | 25,184,749,644.10 | 77.16 | 3,534,725,000.00 | 3,516,455,882.01 | 99.48 |

ප්‍රාග්ධන වියදම්-2015

වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

වැඩ සටහන් අංක : 1 - මෙහෙයුම් වැඩ සටහන

ව්‍යාපෘති 01- අමාත්‍ය කාර්යාලය

| වැය ශීර්ෂ අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | කාණ්ඩය/වැය ශීර්ෂය/ අයිතමය/ විස්තරය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | | | |
| 2001 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,500,000.00 | 1,446,725.00 | 96.45 |
| 2002 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000.00 | 109,270.00 | 21.85 |
| 2003 | 11 | වාහන | 3,000,000.00 | 943,099.00 | 31.44 |
| | | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | | | |
| 2101 | 11 | වාහන | 4,700,000.00 | 4,622,727.00 | 98.36 |
| 2102 | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 500,000.00 | 498,872.00 | 99.77 |
| 2103 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000.00 | 426,581.76 | 85.32 |
| | | | | | |
| | | එකතුව | 10,700,000.00 | 8,047,274.76 | 75.21 |

## ප්‍රාග්ධන වියදම් – 2015

**වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**
**වැඩ සටහන් අංක : 1 - මෙහෙයුම් වැඩ සටහන**
**ව්‍යාපෘති 02- පරිපාලන හා ආයතනික සේවා**

| වැය ශීර්ෂ අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | කාණ්ඩය/වැය ශීර්ෂය/ අයිතමය/ විස්තරය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | | | |
| **2001** | **11** | ගොඩනැගිලි හා ඉදිකිරීම් | **1,000,000.00** | **590,776.12** | **59.08** |
| **2002** | **11** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | **500,000.00** | **130,906.13** | **26.18** |
| **2003** | **11** | වාහන | **5,000,000.00** | **4,497,570.59** | **89.95** |
| | | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | | | |
| **2102** | **11** | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | **500,000.00** | **304,444.00** | **60.89** |
| **2103** | **11** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | **1,500,000.00** | **1,496,972.72** | **99.80** |
| **2104** | **11** | ගොඩනැගිලි හා ඉදිකිරීම් | **00,000,000.00** | **494,492,160.68** | **8.90** |
| | | ධාරිතා වර්ධනය | | | |
| **2401** | **11** | පුහුණු කිරීම් | **3,515,000.00** | **3,507,976.90** | **99.80** |
| | | එකතුව | **512,015,000.00** | **505,020,807.14** | **98.63** |

## පුනරාවර්තන වියදම් -2015

**වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**
**වැඩ සටහන් අංක : 1 - මෙහෙයුම් වැඩ සටහන**
**ව්‍යාපෘති 01- අමාත්‍ය කාර්යාලය**

| වැය ශීර්ෂ අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | කාණ්ඩය/වැය ශීර්ෂය/ අයිතමය/ විස්තරය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම් | | | |
| | | පුද්ගල පඩිනඩි | **19,550,000.00** | **17,788,519.24** | 90.99 |
| 1001 | | වැටුප් හා වේතන | 8,300,000.00 | 7,467,714.51 | 89.97 |
| 1002 | | අතිකාල | 2,500,000.00 | 1,832,924.88 | 73.32 |
| 1003 | | වෙනත් දීමනා | 8,750,000.00 | 8,487,879.85 | 97.00 |
| | | ගමන් වියදම් | **6,650,000.00** | **6,343,545.92** | 95.39 |
| 1101 | | දේශීය | 1,100,000.00 | 847,143.49 | 77.01 |
| 1102 | | විදේශීය | 5,550,000.00 | 5,496,402.43 | 99.03 |
| | | සැපයීම් | **8,200,000.00** | **8,072,838.81** | 98.45 |
| 1201 | | කාර්යාලීය උපකරණ | 1,400,000.00 | 1,339,445.30 | 95.67 |
| 1202 | | ඉන්ධන | 6,800,000.00 | 6,733,393.51 | 99.02 |
| | | නඩත්තු වියදම් | **5,515,000.00** | **5,284,411.31** | 95.82 |
| 1301 | | වාහන | 5,000,000.00 | 4,993,435.30 | 99.87 |
| 1302 | | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 440,000.00 | 220,910.01 | 50.21 |
| 1303 | | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 75,000.00 | 70,066.00 | 93.42 |
| | | සේවා | **4,400,000.00** | **4,074,287.52** | 92.60 |
| 1402 | | තැපැල් හා සන්නිවේදන | 1,800,000.00 | 1,621,244.60 | 90.07 |
| 1403 | | විදුලිය හා ජලය | 1,500,000.00 | 1,499,808.14 | 99.99 |
| 1404 | | බදු කුලී සහ පළාත් පාලනආයතන බදු | 50,000.00 | 29,032.26 | 58.06 |
| 1405 | | වෙනත් | 1,050,000.00 | 924,202.52 | 88.02 |
| | | එකතුව | **44,315,000.00** | **41,563,602.80** | 93.79 |

## පුනරාවර්තන වියදම් -2015

වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
වැඩ සටහන් අංක : 1 - මෙහෙයුම් වැඩ සටහන
ව්‍යාපෘති 0 2: පරිපාලන හා ආයතනික සේවා

| වැය ශීර්ෂ අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | කාණ්ඩය/වැය ශීර්ෂය/ අයිතමය/ විස්තරය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම් | | | |
| | | පුද්ගල පඩිනඩි | **151,330,000.00** | **150,532,560.49** | 99.47 |
| 1001 | | වැටුප් හා වේතන | 68,900,000.00 | 68,451,310.91 | 99.35 |
| 1002 | | අතිකාල | 3,939,000.00 | 3,893,712.94 | 98.85 |
| 1003 | | වෙනත් දීමනා | 78,491,000.00 | 78,187,536.64 | 99.61 |
| | | ගමන් වියදම් | **4,500,000.00** | **4,420,110.95** | 98.22 |
| 1101 | | දේශීය | 1,100,000.00 | 1,021,353.25 | 92.85 |
| 1102 | | විදේශීය | 3,400,000.00 | 3,398,757.70 | 99.96 |
| | | සැපයීම් | **15,240,000.00** | **14,804,941.45** | 97.15 |
| 1201 | | කාර්යාලීය උපකරණ | 5,500,000.00 | 5,491,516.06 | 99.85 |
| 1202 | | ඉන්ධන | 9,400,000.00 | 8,976,370.49 | 95.49 |
| 1203 | | ආහාරපාන හා නිල ඇඳුම් | 340,000.00 | 337,054.90 | 99.13 |
| | | නඩත්තු වියදම් | **13,430,000.00** | **13,032,237.67** | 97.04 |
| 1301 | | වාහන | 10,400,000.00 | 10,386,981.68 | 99.87 |
| 1302 | | යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | 2,780,000.00 | 2,461,881.99 | 88.56 |
| 1303 | | ගොඩනැගිලි හා ඉදි කිරීම් | 250,000.00 | 183,374.00 | 73.35 |
| | | සේවා | **40,998,000.00** | **40,252,244.81** | 98.18 |
| 1402 | | තැපැල් හා සන්නිවේදන | 5,998,000.00 | 5,732,330.78 | 95.57 |
| 1403 | | විදුලිය හා ජලය | 9,700,000.00 | 9,636,258.22 | 99.34 |
| 1404 | | බදු කුලී හා පළාත් පාලන ආයතන බදු | 16,800,000.00 | 16,650,872.70 | 99.11 |
| 1405 | | වෙනත් | 8,500,000.00 | 8,232,783.11 | 96.86 |
| | | මාරු කිරීම් | **23,300,000.00** | **23,157,183.84** | 99.39 |
| 1505 | | සම්මාදම් සහ දායක මුදල් | 20,000,000.00 | 19,999,481.24 | 100.00 |
| 1506 | | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී | 3,300,000.00 | 3,157,702.60 | 95.69 |
| | | එකතුව | **248,798,000.00** | **246,199,279.21** | 98.96 |

මූලධන වියදම් - **2015**

වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

වැඩ සටහන් අංක : **2**

ව්‍යාපෘතිය **03** - පරිසර සංරක්ෂණය

| වැය ශීර්ෂ අංකය | අයිතමය මූල්‍යකරණය | වැය ශීර්ෂය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | **1**පරිසර ප්‍රතිපත්ති සකස් කිරීම, සමාලෝචනයසහ හිඩැස් විශ්ලේෂණය | | | |
| 2502 | 11 | ආයෝජන | 3,000,000.00 | 1,978,318.65 | 65.94 |
| | | **2.**දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කිරීම සහ අනුහුරුවීම | | | |
| 2502 | 11 | ආයෝජන | 2,000,000.00 | 820,883.00 | 41.04 |
| | | **3.** ප්‍රධාන පරිසර වැඩ සටහන් සැමරීම | | | |
| 2502 | 11 | ආයෝජන | 5,000,000.00 | 4,719,107.95 | 94.38 |
| | | **4.** පරිසර අධ්‍යාපනය හා දැනුවත් කිරීම | | | |
| 2502 | 11 | ආයෝජන | 2,000,000.00 | 1,937,275.00 | 96.86 |
| | | **5.**පරිසර ආරක්ෂණය හා සංරක්ෂණය | | | |
| 2502 | 11 | ආයෝජන | 20,000,000.00 | 14,513,049.07 | 72.57 |
| | | **6 .** පාසැල් පරිසර පුහුණු වැඩ සටහන (හරිත නියමු) | | | |
| 2502 | 11 | ආයෝජන | 30,000,000.00 | 25,227,329.35 | 84.09 |
| | | **7.** මොන්ට්‍රියල් සන්ධානය ක්‍රියාත්මක කිරීම | | | |
| 2502 | 13 | ආයෝජන | 13,500,000.00 | 12,899,508.88 | 95.55 |
| 2502 | 17 | ආයෝජන | 2,000,000.00 | | |
| | | **9.** දිගුකල් පවත්නා කාබනික ධූෂක කාරක පිළිබඳ ස්ටොක්හෝම් සම්මුතියේ ජාතික ක්‍රියාත්මක සැලැස්ම යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය | | | |
| 2502 | 13 | ආයෝජන | 5,000,000.00 | 2,305,968.74 | 46.12 |
| | | 10. ගෝලීය පාරිසරික පහසුකම් සඳහා ජාතික සම්බන්ධීකරණ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම | | | |
| 2502 | 13 | ආයෝජන | 699,000.00 | 566,500.00 | 81.04 |
| | | **12.** විද්‍යුත් කසළ කළමනාකරණ ව්‍යාපෘතිය | | | |
| 2502 | 13 | ආයෝජන | 243,000.00 | 227,501.00 | 93.62 |
| | | **13.** ආක්‍රමණකාරී ආගන්තුකජීවී විශේෂ කළමනාකරණ වැඩ සටහන **(GOSL/UNDP)** | | | |
| 2401 | 13 | කාර්ය මණ්ඩල පුහුණු | 100,000,000.00 | 36,028,743.70 | 36.03 |
| | | **18.** පිළිසරු වැඩ සටහන | | | |
| 2502 | 11 | ආයෝජන | 279,474,167.00 | 173,218,237.00 | 61.98 |
| | | **21.** ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළම්නකරණය පිළිබඳ වූ වැඩ සටහන | | | |
| 2502 | 11 | ආයෝජන | 50,000,000.00 | 45,000,000.00 | 90.00 |
| | | **31.** ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පෙ ප්‍රදේශයේ කසළ කළමනාකරණ ක්‍රමය **(GOSL/Korea)** | | | |
| 2502 | 17 | ආයෝජන | 20,525,833.00 | 9,983,108.20 | 97.36 |
| | | **58.** මානව පෝෂණය හා යහපැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා ජෛව විවිධත්වය හා තිරසාර භාවිතය අනුප්‍රවාහ ගත කිරීම | | | |
| 2502 | 13 | ආයෝජන | 13,186,000.00 | 6,109,418.67 | 46.33 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | **60.** ශ්‍රී ලංකා කෘෂි පාරිසරික කලාප සංරක්ෂණය සහ දේශගුණික විපර්යාස වලට ජනයා අනුගතවීම | | | |
| 2502 | 13 | ආයෝජන | 10,817,990.00 | 10,271,930.67 | 94.95 |
| | | **63.** මධ්‍යම පරිසර අධිකාරියේ විද්‍යාගාර පහසුකම් පුළුල් කිරීම | | | |
| 2502 | 11 | ආයෝජන | 30,000,000.00 | 30,000,000.00 | 100.00 |
| | | **69.** ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ගොඩනැංවීම - අනුරාධපුර, හික්කඩුව, උඩුනුවර, පානදුර **(GOSL/Korea)** | | | |
| 2502 | 17 | ආයෝජන | 92,000,000.00 | 14,953,000.00 | 16.25 |
| | | **71.** ප්‍රජා වන කළමනාකරණ වැඩ සටහන | | | |
| 2502 | 13 | ආයෝජන | 170,000,000.00 | 120,990,914.04 | 71.17 |
| 2502 | 17 | ආයෝජන | 30,000,000.00 | 29,840,949.50 | 99.47 |
| | | **74.** වනහරණය සහ වන හායනය වැළැක්වීම සඳහා වූ වැඩ සටහන **(GOSL/UNDP)** | | | |
| 2502 | 13 | ආයෝජන | 85,000,000.00 | 13,350,476.82 | 15.71 |
| | | **75.** ජෛව විවිධාංගීකරණය සඳහා වූ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම **(GOSL/UNDP)** | | | |
| 2401 | 13 | කාර්ය මණ්ඩල පුහුණු | 10,229,000.00 | 10,144,033.71 | 99.17 |
| | | **92.** ආගන්තුක ආක්‍රමණික ජලජ වල් පැළෑටි සමෝධානික මර්දනය කිරීමේ ව්‍යාපෘතිය | | | |
| 2502 | 11 | ආයෝජන | 3,000,000.00 | - | - |
| | | **97.** ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණි ආශ්‍රිත ගොවි ජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාස වල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය **(GOSL/WFP)** | | | |
| 2502 | 13 | ආයෝජන | 186,763,010.00 | 37,026,250.28 | 19.83 |
| | | **98.** හරිත ධීවර වරාය මිරිස්ස ධීවර වරායේ ස්ථාපිත කිරීම | | | |
| 2502 | 11 | ආයෝජන | 10,000,000.00 | - | - |
| | | **100.** කසළ කළමනාකරණ ව්‍යාපෘතිය - කොටිකාවත්ත මුල්ලේරියාව**(GOSL/KOIKA)** | | | |
| 2502 | 13 | ආයෝජන | 100,000,000.00 | - | - |
| | | **101.**ප්‍රධාන ජල මූලාශ්‍ර වල ජල තත්ව ඇගයීම **(GOSL/JAPAN)** | | | |
| 2502 | 13 | ආයෝජන | 26,500,000.00 | - | - |
| 2502 | 17 | ආයෝජන | 5,000,000.00 | 5,000,000.00 | 100.00 |
| | | **102.** කුසලතා සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| 2502 | 11 | ආයෝජන | 20,000,000.00 | 2,999,879.90 | 15.00 |
| | | **104.** ජෛව විවිධත්වය සහ තිරසාර කළමනාකරණය සඳහා වූ තිරසාර කළමනාකරණය | | | |
| 2502 | 11 | ආයෝජන | 21,000,000.00 | 19,211,007.38 | 91.48 |
| | | එකතුව | **1,346,938,000.00** | **639,323,391.51** | 47.46 |

## මූලධන වියදම් - 2015

වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

වැඩ සටහන් අංක : 2

ව්‍යාපෘතිය05 - මහවැලි සංවර්ධනය

| වැය ශීර්ෂ අංකය | අයිතමය මූල්‍යකරණ | වැය ශීර්ෂය | වෙන් කිරීම් (.රු) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | **1.** මොරගහකන්ද කළුගඟ ජලාධාර ව්‍යාපෘතිය **(GOSL/China,Kuwait & Saudi)** | | | |
| 2502 | 11 | ආයෝජන | 3,500,000,000.00 | 3,479,283,006.11 | 99.41 |
| | 12 | ආයෝජන | 5,100,000,000.00 | 5,009,268,055.03 | 98.22 |
| | 14 | ආයෝජන | 1,000,000,000.00 | 587,080,713.74 | 58.71 |
| | 17 | ආයෝජන | 1,530,355,000.00 | 1,520,109,709.25 | 99.33 |
| | | **2.**වේලි ආරක්ෂණ සහ ජල සම්පත් සැළසුම් ව්‍යාපෘතිය **(GOSL/WB)** | | | |
| 2502 | 12 | ආයෝජන | 835,000,000.00 | 833,237,075.11 | 99.79 |
| 2502 | 17 | ආයෝජන | 38,000,000.00 | 36,694,228.95 | 96.56 |
| | | **3.**මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය ( බී කලාපය පුනරුත්තාපනය) | | | |
| 2001 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 500,000,000.00 | 424,859,443.05 | 84.97 |
| | | **4.**උමා ඔය හැරවීමේ ව්‍යාපෘතිය **(GOSL-Iran)** | | | |
| 2105 | 11 | ඉඩම් හා වැඩි දියුණු කිරීම් | 500,000,000.00 | 478,859,518.94 | 95.77 |
| | 12 | ඉඩම් හා වැඩි දියුණු කිරීම් | 455,000,000.00 | | - |
| | 17 | ඉඩම් හා වැඩි දියුණු කිරීම් | 12,379,645,000.00 | 7,694,251,399.18 | 62.15 |
| | | **6.**රිදීමාලියද්ද ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| 2105 | 11 | ඉඩම් හා වැඩි දියුණු කිරීම් | 140,000,000.00 | 129,407,005.63 | 92.43 |
| | | **7.**වැලිඔය ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| 2105 | 11 | ඉඩම් හා වැඩි දියුණු කිරීම් | 440,000,000.00 | 439,885,476.76 | 99.97 |
| | | **8.** බී කලාපයේ මාදුරුඔය දකුණ ඉවුර සංවර්ධනය | | | |
| 2105 | 11 | ඉඩම් හා වැඩි දියුණු කිරීම් | 235,000,000.00 | 223,070,245.17 | 94.92 |
| | | **9.**ශක්‍යතා අධ්‍යයනය | | | |
| 2502 | 11 | ආයෝජන | 212,000,000.00 | 189,770,113.99 | 89.51 |
| | | **10.**මහවැලි ගඟේ ඉවුර ආරක්ෂා කිරීම ගැටළුව | | | |
| 2502 | 11 | ආයෝජන | 60,000,000.00 | 53,203,815.00 | 88.67 |
| | | **11.**ජල සම්පත් සංවර්ධනය සඳහා වන ආයෝජන ව්‍යාපෘතිය **(GOSL/ADB)-Upper Elehera Canel, Moragahakanda, Kalugaga Transfer canel, Minipe ancicut raising & LB Rehabilitation, North Wes. Province Canal** | | | |
| 2502 | 12 | ආයෝජන | 63,450,000.00 | | - |
| | 14 | ආයෝජන | 400,000,000.00 | | - |
| | 17 | ආයෝජන | 75,000,000.00 | 71,539,015.31 | 95.39 |
| | | **12.**කාලිංගනුවර අංගමැඩිල්ල මින්නේරිය ජලය පොම්ප කිරීමේ ව්‍යාපෘතිය | | | |
| 2502 | 11 | ආයෝජන | 20,000,000.00 | 19,972,115.22 | 99.86 |
| | | **13.**වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැළසුම්කරණ ව්‍යාපෘතිය **(GOSL/W.B)** | | | |
| 2502 | 12 | ආයෝජන | 1,910,000,000.00 | 1,910,000,000.00 | 88.46 |
| | 17 | ආයෝජන | 40,000,000.00 | 4,487,645.46 | 11.22 |
| | | එකතුව | **29,433,450,000.00** | **23,104,978,581.90** | **78.49** |

## මුලධන වියදම් -2015

වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
වැඩ සටහන් අංක **2**සංවර්ධන වැඩ සටහන **:**
ව්‍යාපෘතිය **04 -** රාජ්‍ය ආයතන

| වැය ශීර්ෂ අංකය | අයිතමය මූල්‍යකරණ | වැය ශීර්ෂය | වෙන් කිරීම් (.රු) | ශුද්ධ වියදම (රු.) | **%** |
|---|---|---|---|---|---|
| | | මධ්‍යම පරිසර අධිකාරිය | | | |
| 2201 | 11 | රාජ්‍ය ආයතන | 67,000,000.00 | 50,700,000.00 | 75.67 |
| | | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | | | |
| 2201 | 11 | රාජ්‍ය ආයතන | 60,000,000.00 | 50,500,000.00 | 84.17 |
| | | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය | | | |
| 2201 | 11 | රාජ්‍ය ආයතන | 47,000,000.00 | 20,436,400.79 | 43.48 |
| | | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | | | |
| 2201 | 11 | රාජ්‍ය ආයතන | 875,000,000.00 | 825,000,000.00 | 94.29 |
| | | එකතුව | **1,049,000,000.00** | **946,636,400.79** | **90.24** |

## මුලධන වියදම් -2015

වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
වැඩ සටහන් අංක **2**සංවර්ධන වැඩ සටහන **:**
ව්‍යාපෘතිය **04 -** රාජ්‍ය ආයතන

| වැය ශීර්ෂ අංකය | අයිතමය මූල්‍යකරණය | වැය ශීර්ෂය | වෙන් කිරීම් (.රු) | ශුද්ධ වියදම (රු.) | **%** |
|---|---|---|---|---|---|
| | | මධ්‍යම පරිසර අධිකාරිය | | | |
| 1503 | 11 | රාජ්‍ය ආයතන | 528,800,000.00 | 528,800,000.00 | 100.00 |
| | | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | | | |
| 1503 | 11 | රාජ්‍ය ආයතන | 97,222,000.00 | 97,222,000.00 | 100.00 |
| | | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය | | | |
| 1503 | 11 | රාජ්‍ය ආයතන | 52,000,000.00 | 47,081,000.00 | 90.54 |
| | | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | | | |
| 1503 | 11 | රාජ්‍ය ආයතන | 2,563,590,000.00 | 2,555,590,000.00 | 99.69 |
| | | එකතුව | **3,241,612,000.00** | **3,228,693,000.00** | 99.60 |

වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
පුනරාවර්තන හා මූලධන වියදම්
මූල්‍ය ප්‍රගතිය - **2015**

රු.මිලියන

| ආයතනය | පුනරාවර්තන වියදම් | | මූලධන වියදම් | |
|---|---|---|---|---|
| | වෙන් කිරීම් (.රු) | ශුද්ධ වියදම (රු.) | වෙන් කිරීම් (.රු) | ශුද්ධ වියදම (රු.) |
| පරිසර අමාත්‍යාංශය | 293.11 | 287.76 | **6,838**.10 | **5,488.51** |
| මධ්‍යම පරිසර අධිකාරිය | 528.80 | 528.80 | 67.00 | 50.70 |
| සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | 97.22 | 97.22 | 60.00 | 50.50 |
| මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය | 52.00 | 47.08 | 47.00 | **20**.44 |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2,563.50 | 2,555.59 | 875.00 | 825.00 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 1198.585 | 1188.985 | 847.750 | 843.031 |
| වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 203.80 | 197.335 | 1910.80 | 1401.057 |
| මොරගහකන්ද /කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය | - | - | 11130.36 | 10**595.74** |
| උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | - | - | 1**3334.65** | 8**173.11** |
| එකතුව | **4937.015** | **4902.77** | **35110.66** | **27448.088** |

පරිසර අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ආදායම

රු. මිලියන

| ආයතනය | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| රාජ්‍ය දැව සංස්ථාව | 3213.00 | 3756.00 | 3986.00 |
| මධ්‍යම පරිසර අධිකාරිය | 134.38 | 220.66 | 198.80 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 1096.00 | 1510.00 | 1716.00 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 961.00 | 790.00 | 1406 .00 |
| වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 33.422 | 5.347 | 16.96 |
| සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | 13.14 | 14.66 | 15.00 |
| මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය | 4.42 | 7.55 | 6.70 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 507 | 679 | 716 |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 399.834 | 470.60 | 549.399 |
| මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය | 15131 | 13259 | 11016 |
| එකතුව | **21493.19** | **20712.16** | **19626.86** |

## 5. 2015 වර්ෂය තුල අමාත්‍යාංශය යටතේ ඇති ආයතන අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය

### 5.1 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

#### 5.1.1 හැඳින්වීම

වර්තමාන සහ අනාගත පරම්පරාවල යහපත උදෙසා වන සම්පත් ඵලදායි ලෙස සහ කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ අරමුණින් වන ආඥා පනතේ විධි විධාන වලට යටත්ව 1887 දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදි. වන විද්‍යා හා වන කළමනාකරණ, වන පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන, සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති, වන සංගණන සහ භූ විද්‍යා තොරතුරු, සැලසුම් හා ප්‍රගති පාලන, ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරිම් සහ පරිසර සංරක්ෂණ සහ කළමණාකරණ යන තාක්ෂණික අංශ හතක් යටතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරම් සංවිධානය කර තිබේ.

#### 5.1.2 ප්‍රධාන වගකීම්

- දේශගුණික තත්වයන් වඩාත් සතුටුදායක තත්වයකට පත් කිරීම, ශාක සහ සතුන් සංරක්ෂණය කිරීම, පාංශු සහ ජල සම්පත් සංරක්ෂණය කිරීම සහ සෞන්දර්යාත්මක, ඓතිහාසික, විනෝදාත්මක, සමාජ සහ ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් වන ආවරණයක් සංරක්ෂණය කිරීම සහ නඩත්තු කිරීම.
- වනාන්තර වලින් ලබා ගැනීමට හැකි ප්‍රයෝජන පිළිබඳව සලකා බලා ඒකාබද්ධ සහ බහු ආංගික ඉඩම් පරිහරණ ක්‍රම තුලින් වනාන්තර වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම තහවුරු කිරීම.
- රටේ දැව අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකිවන පරිදි වන සම්පත් වල විද්‍යාත්මක කළමනාකරණය සහ තිරසාර සංවර්ධනය තහවුරු කිරීම.
- ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි වනාන්තර හා සම්බන්ධ සියළු සංවර්ධන කටයුතු වලදී හා ඉන් ප්‍රයෝජන ලබා ගැනීමේදී පාරිසරික ආරක්ෂණ ක්‍රම වේදයන් යොදා ගැනීම.
- වනාන්තර සංරක්ෂණය සහ සංවර්ධනය ප්‍රවර්ධනය කරන ආයතන අතර සමීප සම්බන්ධතා ගොඩ නංවා ඔවුන්ගේ කටයුතු වඩාත් ඵලදායි අන්දමට සිදු කිරීමට සහාය දැක්වීම.
- ප්‍රජාමූල වන විද්‍යා වැඩසටහන් මගින් වන සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහ සංරක්ෂණය සඳහා ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.
- වනාන්තර සංරක්ෂණය සහ සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා වන විද්‍යා අධ්‍යාපන සහ ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම.

#### 5.1.3 ප්‍රධාන අභියෝග

- ජාතික වන ආවරණය වත්මන් මට්ටමේ පවත්වා ගන්නා අතරතුර එය මුළු බිම් ප්‍රමාණයෙන් 32% ක් දක්වා ඉහල නැංවීම.
- වන නීතිය කඩකරන්නන්හට විරුද්ධව වන සංරක්ෂණ පනත යටතේ නීතිය ක්‍රියාත්මක කිරීම.
- ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම.
- විවිධ ඉඩම් පරිභෝජන ක්‍රම සඳහා වනාන්තර ඉඩම් පරිවර්තනය කිරීම වැලැක්වීම.
- වන සම්පත් ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගිත්වය තහවුරු කිරීම.

## 5.1.4 ප්‍රගතිය : 2015

| පරිසර කළමනාකරණ | |
|---|---|
| සිංහරාජ, නකල්ස්, උඩවත්තකැලේ, ඔලියගන්කැලේ, කුරුළුකැලේ සහ කන්නෙලිය සංරක්ෂණ වනාන්තර නඩත්තු කරන ලදි. මෙහිදී සිදුකල ක්‍රියාකාරකම් වලට ස්වභාවික මංපෙත් විවෘත කිරීම සහ නඩත්තු කිරීම, යටි වගාව සහ නාම පුවරු ඉදි කිරීම අයත් වේ.<br>තවද ඩීස්ටන්, ඉලුක්කුඹුර, කන්නෙලිය සහ පිටදෙනිය සංරක්ෂණ මධ්‍යස්ථාන ද නඩත්තු කරන ලදි.<br>පාසැල් සිසුන්, ප්‍රජා සංවිධාන සහ ගම්වැසියන් සඳහා (සිංහරාජ, නකල්ස් සහ කන්නෙලිය සංරක්ෂණ වනාන්තර අවට වෙසෙන) වනාන්තර සංරක්ෂණය සහ පරිසර කළමනාකරණය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. | |
| අධ්‍යාපන, වන ව්‍යාප්ති | |
| වන ව්‍යාප්ති | වන සංරක්ෂණය පිළිබඳව සාමාන්‍ය මහජනයා අතර පවත්නා අවබෝධය ඉහල නැංවීම සඳහා වන ව්‍යාප්ති වැඩසටහන් 1,160 ක් සංවිධානය කරන ලදි. |
| නව ගොවි වන වගා ස්ථාපනය කිරීම | මෙම කාල පරිච්ඡේදය තුලදී ගොවි වන වගා හෙක්ටයාර 115 ක් ස්ථාපනය කරන ලදි. |
| ගෙවතු සංවර්ධනය සහ රුක් කළමනාකරණය | අදාළ කාල පරිච්ඡේදය තුලදී රුක් කළමනාකරණ වැඩසටහන් 100 ක් සඳහා බීජ පැල සහ තාක්ෂණික සහාය ලබා දෙමින් ගෙවතු 5200 ක් සංවර්ධනය කරන ලදි. |
| ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම | |
| මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය සඳහා පහත සඳහන් ක්‍රියා කාරකම් සිදු කරන ලදි.<br>මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය :<br>1. ස්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම - හෙක්ටයාර 484.3 | |
| වන ආවරණය පුළුල් කිරීම | |
| නැවත වන වගා කිරීම | හෙක්ටයාර් 125 |
| සහායලත් ස්වභාවික පුනර්ජනනය | හෙක්ටයාර් 4,600 |
| නැවත වන වගා කල ප්‍රදේශ නඩත්තු කිරීම | හෙක්ටයාර් 130 |
| සහායලත් ස්වභාවික පුනර්ජනන ප්‍රදේශ නඩත්තු කිරීම | හෙක්ටයාර් 4,144 |
| සංවේදී ප්‍රදේශ ආරක්ෂා කිරීම | හෙක්ටයාර් 165 |
| කඳු මුදුන් වගා කිරීම | හෙක්ටයාර් 42.5 ක් වගා කිරිම |
| කාර්මික වන වගා ස්ථාපනය කිරිම සහ කළමනාකරණය | |
| වන වගා වල වන විද්‍යාත්මක මෙහෙයුම් | අදාළ කාල පරිච්ඡේදය තුල තෝරාගත් වන වගා හෙක්ටයාර් 1627.85 ක වන විද්‍යාත්මක මෙහෙයුම් සිදු කරන ලදි. |
| පුනර්ජනනීය හෙලීම් සිදුකල ප්‍රදේශ වල නැවත වන වගා කිරීම | රටේ දැව අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා හෙලීම් සිදු කල වන වගා හෙක්ටයාර් 612.3 ක ආර්ථිකමය වටිනාකමකින් යුක්ත දැව විශේෂ වගා කරන ලදි. |
| පුනරුත්ථාපනය කල වන වගා නඩත්තු කිරීම | පුනරුත්ථාපනය කරන ලද වන වගා හෙක්.246.8ක් නඩත්තු කරන ලදි. |
| වන වගා කළමනාකරණය | මෙයට පෙර වසර තුනක කාලයකදී ස්ථාපනය කරන ලද නොමේරු වන වගා හෙක්ටයාර 3988.9 ක කළමනාකරණ කටයුතු අදාළ කාල පරිච්ඡේදය තුලදී සිදුකර එම ශාක වල වර්ධනය සඳහා පහසුකම් සලසා දෙන ලදි. |
| බීජ පැල නිෂ්පාදනය | |
| පැල තවාන් නඩත්තු කිරීම සහ බීජ පැල නිෂ්පාදනය | දෙපාර්තමේන්තු පැල තවාන් වල බීජ පැල 500,000 ක් නිෂ්පාදනය කරන ලදි. මෙමගින් රුක් රෝපණ වැඩසටහන් සඳහා නිරෝගී මෙන්ම මනාව නඩත්තු කල බීජ පැල තොග අඛණ්ඩව සැපයීමේ හැකියාවන් පවතී. |
| පැරණි ගොවි වන වගා නඩත්තු කිරිම. | අදාල කාල පරිච්ඡේදය තුල ගොවි වන වගා හෙක්ටයාර් 422.62ක පිරිසිදු කිරීමේ සහ වල් නෙලීමේ ක්‍රියාකාරකම් සිදු කරන ලදි. |
| පයිනස් වන වගා දේශීය, පුළුල් පත්‍ර සහිත ශාක විශේෂ සහිත වන වගා බවට පරිවර්තනය කිරිම | |
| ස්ථිපිත කිරීම | හෙක්ටයාර 27 |
| නඩත්තු කිරීම | හෙක්ටයාර 294.4 |

### 5.1.5 දෙපාර්තමේන්තු අයවැය පිළිබඳ කාර්ය සාධනය - 2015

| | විස්තරය | ප්‍රතිපාදන (රු.) 2015 | වියදම (රු) 2015 | ඉතිරිය(රු.) |
|---|---|---|---|---|
| | පුනරාවර්ථන වියදම් | 1,198,585,000.00 | 1,188,985,283.79 | 9,599,716.21 |
| | වැටුප් | 1,062,285,000.00 | 1,059,201,843.16 | 3,083,156.84 |
| | අනෙකුත් පුනරාවර්ථන | 1,363,00,000.00 | 129,783,440.63 | 6,516,559.37 |
| | ප්‍රාග්ධන වියදම් | 847,750,000.00 | 843,031,820.35 | 4,718,179.65 |
| | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම | 45,750,000.00 | 44,853,818.10 | 896,181.90 |
| 2001 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 33,750,000.00 | 33,748,829.10 | 1,170.90 |
| 2002 | යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 3,000,000.00 | 2,266,461.17 | 733,538.83 |
| 2003 | වාහන | 9,000,000.00 | 8,838,527.83 | 161,472.17 |
| | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 161,500,000.00 | 161,192,005.74 | 307,994.26 |
| 2101 | වාහන | 154,000.00 | 153,973.00 | 27.00 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 11,000,000.00 | 10,812,451.70 | 187,548.30 |
| 2103 | යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 3,346,000.00 | 3,341,838.17 | 4,161.83 |
| 2104 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 100,000,000.00 | 99,997,999.59 | 2,000.41 |
| 2105 | ඉඩම් හා ඉඩම් දියුණු කිරීම | 47,000,000.0 | 46,885,743.28 | 114,256.72 |
| | කුසලතා හැකියා වර්ධනය කිරීම | 3,800,000.00 | 3,653,645.81 | 146,354.19 |
| 2401 | පුහුණුවීම් හා හැකියාව දියුණු කිරීම | 3,800,000.00 | 3,653,645.81 | 146,354.19 |
| | අනෙකුත් ප්‍රාග්ධන වියදම් | 636,700,000.00 | 633,332,350.70 | 3,367,649.30 |
| 2502 | අනෙකුත් ආයෝජන | 636,700,000.00 | 633,332,350.70 | 3,367,649.30 |
| | ව්‍යාපෘති 01 සම්පූර්ණ වියදම | 2,046,335,000.00 | 2,032,017,104.14 | 14,317,895.86 |

### 5.1.6 ආදායම රැස් කිරීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආදායම්, ශීර්ෂ දෙකක් (02) යටතේ පහත පරිදි රැස් කරන ලදි.

**1003:07:03** පුද්ගලික ඉඩම් වලින් දැව ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු.

**2002:01:02** රජයේ කැලෑ වලින් ලැබෙන ආදායම.

| වර්ෂය | ආදායම් ශීර්ෂය | ඇස්තමේන්තුව (රු) | සත්‍ය ආදායම (රු.) |
|---|---|---|---|
| 2013 | 1003:07:03 | 65,000,000.00 | 56,743,835.73 |
| | 2002:01:02 | 974,000,000.00 | 903,956,846.26 |
| 2014 | 1003:07:03 | 60,000,000.00 | 50,101,112.48 |
| | 2002:01:02 | 2,000,000,000.00 | 739,449,271.47 |
| 2015 | 1003:07:03 | 80,000,000.00 | 87,687,148.83 |
| | 2002:01:02 | 1,100,000,000.00 | 1,318,518,534.10 |

### 5.1.7 අමාත්‍ය මණ්ඩල සංදේශ, නීති හා රෙගුලාසි

2015 වසර තුලදී විෂය පථයට අදාල නව අමාත්‍ය මණ්ඩල සංදේශ, නීති හා රෙගුලාසි සකස් කර නොමැත.

## 5.2 වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

### 5.2.1 හැඳින්වීම

කොළඹ වරාය කොමිසම යටතේ වෙරළ ආරක්ෂණ ඒකකයක් 1963 දී ස්ථාපිත කරන ලද අතර, 1978 දී ධීවර කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යාංශය යටතේ වෙරළ සංරක්ෂණ අංශය පිහිටුවන ලදී. ආර්ථික සම්පත් බහුල ශ්‍රී ලංකාවේ වෙරළ තීරය සංරක්ෂණය කිරීම මඟින් වෙරළබඩ සම්පත් මත පදනම් වූ ආරක්ෂිත හා තිරසාර සංවර්ධනයකට ඉඩ ප්‍රස්ථා සැලසීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව,වෙරළ සංරක්ෂණඅංශය,1984.01.01. දින සිට "ඒ ශ්‍රේණියේ " දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත කරන ලදී. දිවයිනේ වෙරළ තීරය සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවට ඇති වගකීම අනුව දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන වාර්ෂික ප්‍රතිපාදන වලින් වැඩි ප්‍රමාණයක් යෙදවීමට සිදුව ඇත්තේ වෙරළ තීරයේ ස්ථායිකරණ වැඩසටහන් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වේ. වෙරළ ස්ථායිකරණ වැඩසටහන් මඟින් වෙරළබඩ ක්‍රියාවලිය කළමනාකරණය කර වෙරළ කලාපයේ සිදුකරන සංවර්ධන කටයුතු වල තිරසාර බව පවත්වා ගන්නා ලෙසම වෙරළබඩ සංවර්ධන කටයුතු හා වෙරළ සම්පත් කළමනාකරණය කිරීම මඟින් පරිසරයේ ගුණාත්මක බව පවත්වා ගැනීම ද වැදගත් වන බැවින් 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත මඟින් ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයේ පරිපාලනය, පාලනය, භාරකාරීත්වය සහ කළමනාකරණය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය වෙත පවරන ලදී. 1981 අංක 57 දරණ පනත 1988 අංක 64 සහ 2011 අංක 49 පනත් මඟින් සංශෝධිත අතර, පනතේ විධිවිධාන පරිපාලනය කිරීම, වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය සඳහා වූ වැඩ යෝජනා සකස් කිරීම හා ඒවා ක්‍රියාවෙහි යෙදවීම, වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇතුලු පනතේ 4 වන වගන්තියේ සඳහන් කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත්කෙරිණි.

### 5.2.2 අරමුණු

1. වෙරළ පරිසරයේ තත්වය වැඩි දියුණු කිරීම.
2. වෙරළ තීරය සංවර්ධනය සහ කළමනාකරණය කිරීම.
3. වෙරළබඩ යටිතල පහසුකම් ආරක්ෂණය කිරීම.
4. වෙරළාශ්‍රිත සම්පත් භාවිතා කරන්නන් සහ එහි ජීවත්වන්නන්ගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම.
5. වෙරළසම්පත් මත පදනම්වූ ආර්ථික සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය හා ඒ සඳහා පහසුකම් සැපයීම

### 5.2.3 ප්‍රධාන වගකීම්

1. හදිසි වෙරළ ඛාදන තත්ත්වයන්ගේ බලපෑම අවම කිරීම.
2. දීර්ඝ කාලීන වෙරළ ආරක්ෂණ විසඳුම් ලබාදීම.
3. වෙරළතීර කළමනාකරණ ක්‍රමෝපායන් සැකසීම.
4. වෙරළ විමර්ශනය කිරීම.
5. සාගර තරංග මැනීම අධ්‍යනය කිරීම.
6. වෙරළ පර්යේෂණ ව්‍යාපෘති සකස් කිරීම.
7. අක්වෙරළ (near-shore) කලාපයේ සාගර පතුලේ වෙනස්කම් අධීක්ෂණය කිරීම.
8. වෙරළ සැලසුම් මාර්ගෝපදේශනය යාවත්කාලීන කිරීම.
9. වෙරළ අධීක්ෂණය සහ ඇගැයීම.
10. වෙරළ පරිහරණය කරන්නන්ට හිතකර තිරසාර වෙරළ ඉදිකිරීම් ඇති කිරීම.
11. වෙරළ කලාපය තුල වෙරළ ව්‍යුහ ඉදිකිරීමට මඟ පෙන්වීම.
12. වෙරළ ආපදා සිතියම් සැකසීම (සුනාමි, සාගර මට්ටම ඉහළ යාම, සුළි කුණාටු සහ වෙරළ ඛාදනය).
13. වෙරළ ආරක්ෂණ සැලසුම් බාහිර ආයතන සඳහා ලබාදීම.
14. ගංගා මුවදොර කළමනාකරණය සඳහා ව්‍යුහ සැලසුම් කිරීමට සහය වීම.
15. වෙරළ ජල තත්ත්ව අධීක්ෂණ ව්‍යාපෘතිය සිදුකිරීම.

16. වෙරළ කලාපකළමනාකරණසැලැස්ම යාවත්කාලීන කිරීම.
17. මුහුදු හිරිගල් ඉවත් කිරීම සහ මුහුදු වෙරළින් වැලි ඉවත් කිරීම පාලනය කිරීම.
18. වෙරළබඩ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් පාරිසරික තක්සේරු ලබා ගැනීම.
19. සංවර්ධන කටයුතු බලපත්‍ර වල අඩංගු කොන්දේසි වලට අනුකූල වන බව සහතික කිරීම.
20. පාඨශාලා සඳහා විෂයය මාලාවන් සංවර්ධනය කිරීම ඇතුලත්ව වෙරළබඩ ගැටළු පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම.
21. වෙරළබඩ සම්පත් කළමනාකරණයේ දී ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.
22. විශේෂ වෙරළ කලාප කළමනාකරණ සංකල්පය යටතේ වෙරළ ප්‍රජාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා සියළුදෙනාගේ සහභාගීත්වය මඟින් වෙරළබඩ කළමනාකාරීත්වය සඳහා යොමු කිරීම.
23. බලපෑමට ලක්වන ප්‍රදේශ, සංරක්‍ෂණ ප්‍රදේශ හා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම හා එම ප්‍රදේශ නිසි කලමනාකරණය කිරීම.
24. වෙරළ උද්‍යාන ඇති කිරීම.
25. වෙරළ ප්‍රවේශ සැලැස්මක් සකස් කිරීම මඟින් වෙරළ පිවිසුම් පහසු කිරීම.
26. වෙරළ කලාපයේ අනවසර ඉදිකිරීම් හා අනවසර ඉඩම් හෝ ජලස්කන්ධ ගොඩකිරීම් පාලනය කිරීම.

### 5.2.4 ප්‍රධාන අභියෝග

1. කාලගුණික වෙනස්වීම් හේතුවෙන් සිදුවන වෙරළ ඛාදනය සඳහා ක්ෂණිකව පිළියම්යෙදීම.
2. වෙරළ කලාපයේ සිදු කරන සංවර්ධන ක්‍රියා හේතුවෙන් සිදුවන පාරිසරික බලපෑම් පාලනය කිරීම.

### 5.2.5 ප්‍රධාන කාර්යය සාධනය : 2015 ජනවාරි – 2015 දෙසැම්බර් දක්වා

| ක්‍රියාකාරකම පිළිබඳ විස්තරය | ප්‍රධාන කාර්යය සාධනය | 2015 වසරේ අවසාන ගිණුම (රු.) |
|---|---|---|
| වෙරළ ආරක්‍ෂක දෘඪ ව්‍යුහ ඉදිකිරීම<br>වෙරළ කලාපයේ තිරසාර ඉඩම් කළමනාකරණය සඳහා ඇති එක විකල්ප ක්‍රමවේදයක් වනුයේ කළු ගල් වැනි දැඩි ද්‍රව්‍ය භාවිතා කර දෘඩ වෙරළ ආරක්‍ෂක ව්‍යුහ ඉදිකිරීම වේ.<br>මේ ආකාරයට වෙරළට යාබදව ආරක්‍ෂා කර ඇති හෝ සුදුසු බිම්කඩවල්හි ස්වාභාවිකත්වය සහ අලංකාරය වැඩිදියුණු වන පරිදි වෙරළ උද්‍යාන ඉදිකිරීම හෝ දැනට ඇති වෙරළ උද්‍යාන වැඩිදියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.<br>වෙරළ වැලි පෝෂණ ව්‍යාපෘති වලට සාපේක්‍ෂව දෘඩ වෙරළ ආරක්‍ෂක ව්‍යුහ ඉදිකිරීම සඳහා යන වියදම අඩුවුවද, මෙවන් බොහෝ ඉදිකිරීම් වලට පසු ඉදිකරනු ලබන දෘඩව්‍යුහයේ ගැටී පරාවර්තනය වන රළු රළ මඟින් යාබද වෙරළ තීර වලට සිදුවන ඛාදනය සහ වෙරළබඩ වැලි ප්‍රවාහය මඟින් සපයනු ලබන වැලි එම වෙරළ ආරක්ෂක ව්‍යුහ මඟින් රඳවා ගැනීමෙන් යාබද වෙරළ තීරයන්ට වැලි හිඟ වීම, දෘඩ වෙරළ ආරක්‍ෂක ව්‍යුහ ඉදිකිරීමෙන් සිදුවන අවාසියකි. | • ලන්සියවත්ත, තල්දියවත්ත, අහංගම සහ මාතර වෙරළ තීර 04ක ආරක්ෂාව සඳහා රිවට්මන්ට් බැම් මීටර් 1021.25ක් ඉදි කර අවසන් කරන ලදි.<br>• වැලිපටන්විල මීටර් 200ක රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කළුගල් වලින් 90%ක් සපයා අවසන් කර ඇත. | 25,995,999.69 |
| | • ඔලුවිල් වරාය ඉදිකිරීමෙන් පසු වරායෙන් උතුරු පස(lee side) වෙරළ තීරයේ ඇති අධික වෙරළ ඛාදන තත්ත්වයට ඔරොත්තු දීම සඳහා මීටර් 175ක ග්‍රොයිනයක (fishtail Groin) 80%ක ඉදිකිරීම් සම්පූර්ණ කරන ලද අතර, තවදුරටත් ගල් ද්‍රව්‍ය සපයමින් පවතී. | 31,037,550.12 |
| | • අරිප්පු, පයාගල, මුදුකටුව ස්ථාන 02ක්, එගොඩඋයන ස්ථාන 02ක් සහ මුතූර් ස්ථාන 03ක් වශයෙන් වෙරළ තීර 05ක් ආරක්ෂා කිරීම සඳහා දියකඩන බැම් 09ක් ඉදිකරන ලදි.<br>සම්පූර්ණ කරන ලද දියකඩන බැම් වල මුළු දිග මීටර් 604කි. | 188,056,522.20 |
| | • අරිප්පු සහ කහව වෙරළ තීර ආරක්‍ෂාව සඳහා ගේබියන් රිවට්මන්ට් බැම් ඉදිකරන ලදි.<br>සම්පූර්ණ කරන ලද මුළු දිග මීටර් 330කි.<br>• වැලිගම, කප්පරතොට වෙරළ ආරක්ෂාව සඳහා ගේබියන් මීටර් 100ක ඉදිකිරීම් කටයුතු කරමින් පවතී. | 6,861,623.52 |
| | • සීතගල්ල වෙරළ උද්‍යානය සහ සාගර තටාකය ඉදිකිරීම් අවසන් කර ඇත.<br>• වැලිගම වෙරළ උද්‍යානයේ ඉදිකිරීම් කරමින් පවතී | 19,034,646.80 |
| | • පල්ලිකුඩාව-තංගල්ල මීටර් 220ක් වූ වෙරළ ආරක්ෂිතය සහ ඇවිදින මංතීරුව සම්පූර්ණ කරන ලදි. | 12,322,636.77 |
| | මෙම වැඩසටහන සඳහා වැය වූ මුළු වියදම රු. 283,308,979.09 කි. | |
| වෙරළ ආරක්ෂක මෘදු විසඳුම් වශයෙන් වැලි පෝෂණය කිරීම.<br>වෙරළ ඉංජිනේරුමය සිද්ධාන්ත අනුව වෙරළ ඛාදනය සඳහා අනර්ඝතම වූ පරිසර හිතකාමී විසඳුම වනුයේ ගැඹුරු මුහුදේ වැලි මඟින් වෙරළ වැලි පෝෂණය කිරීමයි. | • උණවටුන වෙරළ වැලි පෝෂණය කර ඛාදනයෙන් ආරක්ෂා කිරීම සඳහා ගැඹුරු මුහුදෙන් වැලි මීටර් කියුබ් 200,000ක් පොම්ප කරන ලදි.<br>• මාරවිල වෙරළ තීරය සඳහා වැලි පෝෂණ II අදියර ව්‍යාපෘති යෝජනාව පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබුන උපදෙස් අනුව වෙරළ සංරක්ෂණ තිරසාර විසඳුමක් යෝජනා කිරීම සඳහා විශේෂඥ කමිටුවක් නම් කරන ලදි. | 795,358,701.80 |

| ක්‍රියාකාරකම පිළිබඳ විස්තරය | ප්‍රධාන කාර්යය සාධනය | 2015 වසරේ අවසාන ගිණුම (රු.) |
|---|---|---|
| වෙරළ කලාපයේ ඇති ආර්ථික කටයුතු වන ධීවර, සංචාරක, වරාය,බලශක්ති, වෙනත් යටිතල සංවර්ධන ව්‍යාපෘති සහ ඉඩම් වල වටිනාකම පිළිබඳව සැළකිලිමත් වූ විට වෙරළ වැලි පෝෂණය සඳහා යන වියදම( එක් වරක් හෝ කීප වරක්) සාධ්‍ය **(feasible)** වේ.<br>එබැවින් වෙරළ වැලි පෝෂණය පාරිසරික වශයෙන් පමණක් නොව ආර්ථික වශයෙන් සහ සාමාජීය වශයෙන්ද අනර්ඝතම විසඳුම වේ. | | |
| හදිසි වෙරළ ආරක්ෂක ව්‍යුහ පිළියම්.<br>කාළගුණ වෙනස්වීම් අනුව සිදුවන රළ රළුවීම්, කුණාටු තත්ව හේතුවෙන්ජල මට්ටම වැඩිවීම නිසා වන කැළඹීම මගින් හා පාරිසරිකව වන අන්තගාමී වෙනස්වීම් නිසා සිදුවන හදිසි බාදන තත්ව වලින් ආරක්ෂාව සඳහා කරන ඉදිකිරීම්/පිළියම් | තලවිල උතුර ස්ථාන 02ක්, මාරවිල - තලවිල, පානම, ඔලුවිල්, මුතුපංතිය, උණවටුන, පයාගල- ඇතගම, බලපිටිය, කාන්තන්කුඩි වශයෙන් වෙරළ තීර 10ක් ආරක්‍ෂා කරන ලදි. | **25,359,902.37** |
| <u>වෙරළ ආරක්‍ෂක ව්‍යුහ නඩත්තු කිරීම</u><br>වෙරළ කලාපයේ තිරසාර ඉඩම් කළමනාකරණය සඳහා දැනට පවතින වෙරළ ආරක්‍ෂක ව්‍යුහ වල ක්‍රියාකාරීත්වය සහ පවත්නා තත්ත්වය අධීක්‍ෂණය කිරීමේ සහ දෙපාර්තමේන්තුව මගින් අදාල නඩත්තු කටයුතු සහ පුනරුත්ථාපන කටයුතු කිරීම. | වෙරළ ආරක්‍ෂක ව්‍යුහ 11ක් නඩත්තු කරන ලදි.<br>• දූව, අකුරල සහ බණ්ඩාරමුල්ල රිවට්මන්ට් බැම් මීටර් 236ක් රු. 21,202,050 ක වියදමින් අවසන් කරන ලදි.<br>• පයාගල ග්‍රොයින 02ක් සහ මැඩිල්ල- තංගල්ල ග්‍රොයිනයක් රු.13,488,410ක වියදමින් අවසන් කරන ලදි. පුනරුත්ථාපනය කල සම්පූර්ණ ග්‍රොයින දිග මී. 200 ක් වේ.<br>• රු.13,107,480 ක වියදමින් කටුනේරිය මීටර් 45ක් දිග ග්‍රොයිනයක්, මීටර් 80 ක දියකඩනයක් ලෙස පරිවර්තනය කිරීම සහ වෙරළ උද්‍යානය වැඩිදියුණු කරන ලදි.<br>• උල්හිටිය, කටුනේරිය සහ මාරවිල දියකඩන 03ක් රු.10,190,160 ක වියදමින් පුනරුත්ථාපනය කරන ලදි. දියකඩන වල සම්පූර්ණ දිග මීටර් 240 ක් වේ.<br>• මහමෝදර මීටර් 246ක් වූ දියකඩනය පුනරුත්ථාපනය සහ ඒ මත ඇවිදින මංතීරුවේ ඉදිකිරීම් කටයුතු රු.944,850 ක වියදමින් නිම කරන ලදි. | **58,932,936.85** |
| <u>වෙරළ විමර්ෂණ සහ පර්යේෂණ</u><br>විශේෂයෙන් වෙරළ ඉංජිනේරුමය ව්‍යාපෘති සැළසුම් සඳහා අදාල අධ්‍යන සහ විමර්ෂණ පවත්වාගෙන යනු ලැබේ.<br>ප්‍රාදේශීය සුළං සහ රළ තරංග වල කාළගුණික රටාවන්<br>ජලයේ අනිකුත් ගතික තත්ත්ව වල ප්‍රමාණ පිළිබඳ තොරතුරු<br>මුහුදු පත්ල සහ වෙරළ හරස්කඩ වෙනස්වීම් අවසාධිත ප්‍රවාහනය පිළිබඳ අධ්‍යන<br>මුහුදු පත්ලේ අවසාධිත වල ගති ලක්ෂණ | • ගාල්ල සමුද්‍ර මාවතට යාබද, උණවටුන, ඊසානදිග වෙරළතීරයන්හි අදාල අධ්‍යන සම්පූර්ණ කරන ලදි.<br>• මාරවිල මුහුදු පතුලේ මිනුම් කටයුතු සම්පූර්ණ කරන ලදි.<br>• දැනට ස්ථාවර කර ඇති වෙරළ තීරයන්හි අධීක්‍ෂණ කටයතු පවත්වාගෙන යන ලදි.<br>• නැගෙනහිර වෙරළෙහි අවධානම තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. | **3,373,216.49** |
| <u>වෙරළ සැළසුම්</u> | • කොරළවැල්ල - එගොඩඋයන, මුතූර්, මුතුපංතිය, ගිංතොට, මුදුකටුව-මාරවිල, පයාගල , වෙඩිතල්තිවු - මන්නාරම සහ ඔලුවිල් වෙරළ ආරක්‍ෂක සඳහා සැළසුම් 08 ක් සම්පූර්ණ කරන ලදි.<br>වර්ෂ 2015 සඳහා වැඩසටහන්ගතකර සුදානම් කරන ලද වෙරළ සැළසුම් සියල්ල සම්පූර්ණ කර අවසන් කරන ලදී. | **672,790.17** |
| <u>වෙරළබඩ ජලයේ ගුණාත්මක තත්ත්වය අධීක්‍ෂණ වැඩසටහන</u><br>මුහුදු ජලයේ සහ මුහුදට සම්බන්ධිත ජලාශ වලට සිදුවන පාරිසරික දූෂණය පාලනය කිරීම අරමුණ වේ. | ගල්කිස්ස, නිලාවැලි, ආරුගම්බේ, පොල්හේන , උණවටුන සහ හික්කඩුව වෙරළ තීරයන්හි ජලයේ ගුණාත්මක තත්ත්වය අධීක්‍ෂණ කටයුතු පවත්වාගෙන යනු ලැබේ. | **1,327,611.17** |
| <u>වෙරළ ඉංජිනේරු සම්මේලනය</u><br>වෙරළ ඉංජිනේරුමය සහ පාරිසරික ක්ෂේත්‍ර වල දැනුම අලුත් කිරීම සහ වැඩිදියුණු කිරීම. | ‘‘කාළගුණික අවදානම් අඩු කිරීම සඳහා වෙරළ ඉංජිනේරු ක්ෂේත්‍රය’’ තේමාව යටතේ වෙරළ ඉංජිනෙරු සම්මේලනය 2015 නොවැම්බර් 06 දින බත්තරමුල්ල‘‘වෝටර්ස් එජ්’’ හෝටලයේදී පවත්වන ලදි. | **283,910.00** |

| ක්‍රියාකාරකම පිළිබඳ විස්තරය | ප්‍රධාන කාර්යය සාධනය | 2015 වසරේ අවසාන ගිණුම (රු.) |
|---|---|---|
| වෙරළ කලාප කළමනාකරණ වැඩසටහන වෙරළ කලාපයේ තිරසාර ඉඩම් කළමනාකරණය සහ සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් සිදුවන පාරිසරික දූෂණය පාලනය කිරීම සඳහා හරිත වෙරළ තීරය ස්ථාපිත කිරීම, වෙරළ පිවිසුම් මාර්ග වැඩ සටහන, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ වැඩසටහන සහ පාරිසරික බලපෑම් තක්සේරුව ඇතුලත් වන පරිදි සංවර්ධන කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයපරිදි වෙරළ කලාප කළමනාකරණ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. | • හික්කඩුව සහ ගොඩගම සඳහා කිලෝමීටර් 03 ක හරිත වෙරළ තීරයක් සම්පූර්ණ කර පවත්වාගෙන යනු ලැබේ. මේ සඳහා රු. 2,219,000 ක් වැය විය.<br>• කල්පිටිය වෙරළ තීර පිවිසුම් වැඩසටහනේ ඉදිකිරීම් කරනු ලැබේ. වියදම රු. 5,941,189 ක් විය.<br>• අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීමේ නියෝග 350ක් නිකුත් කර ඇත. තංගල්ල දෙමහල් නිවසක් සහ වැලිගම වෙරළ තීරයේ ස්ථිර සහ තාවකාලික ගොඩනැගිලි 12 ක් වැඩසටහන් 04ක් යටතේ ඉවත් කරන ලදි. සමාජීක ප්‍රශ්ණ හේතුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අපහසුතා පවතී. වියදම රු.1,500,856.60 කි.<br>• සංවර්ධන ව්‍යාපෘති සඳහා බලපත්‍ර ඉල්ලීම් 1794ක් ඇගයීම් කටයුතු කර හැකි ස්ථාන සඳහා බලපත්‍ර ලබා දෙන ලදි. අවශ්‍ය ස්ථාන සඳහා පාරිසරික බලපෑම් තක්සේරු කරන ලදි. 2015 දෙසැම්බර් 31 වන විට පාරිසරික අධ්‍යන 20ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. සම්පූර්ණ වියදම රු. 6,099,748 කි.<br>• වෙරළ කළමනාකරණ සැලැස්ම යාවත්කාලීන කිරීම සහ ගැසට් කිරීම - 2016 (CZMP 2016). වෙරළ කළමනාකරණ සැලැස්මේ පරිච්ඡේද 05සඳහා මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් සහ ඒ ඒ අංශ පිළිබඳ විද්වතුන්ගෙන් යුතු කමිටු 05ක් පත් කරන ලදි. ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයට අයත් දිස්ත්‍රික්ක 14හි රාජ්‍ය නිලධාරීන් සහ දෙපාර්තමේන්තුවේ උපදේශක සභාව දැනුවත් කිරීම් වැඩසටහන් පවත්වා වාර්තාවේ කෙටුම්පත සංස්කරණය කිරීම | 15,760,793.60 |
| පාරිසරික අධ්‍යාපන වැඩසටහන<br><br>පාසල් ශිෂ්‍යයින් සහ මහජනතාව දැනුවත් කිරීම. | • වැඩසටහන් 02ක් පවත්වන ලදි. පුවත්පත් වාර්තා පලකිරීම්සහ දැනුවත් කිරීමේ පුවරු 16ක් සවිකරන ලදි.<br>• කළුතර දිස්ත්‍රික්කයේ පාසල් ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණයක් සහ මාදුගඟ, හික්කඩුව සහ ගාල්ල අධ්‍යන චාරිකාවක් පැවැත්විය.<br>• අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහය ඇතුව, පාසල් ගුරුවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක්, පානම සහ ආරුගම්බේ අධ්‍යන චාරිකාවක් පවත්වන ලදි.<br>• තංගල්ල සහ දෙවුන්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලදී එම ප්‍රදේශ වලට අයත් රජයේ නිලධාරීන් සඳහා වැඩමුළු 02ක් පවත්වන ලදි.<br>• වෙරළ ප්‍රදේශ කළමනාකරණය සඳහා පුවත්පත් දැන්වීම් පළකරන ලදි.<br>• ලෝක පරිසර දිනය සඳහා මැදිරිගිරිය - පොළොන්නරුව පැවැත්වූ වැඩසහන් සහ ප්‍රදර්ශණය සඳහා සහභාගී විය. ත්‍රිකුණාමලයේ පැවති ප්‍රදර්ශණයක් සඳහා සහභාගී විය. | 1,095,512.14 |
| 2015 වර්ෂයේ ලබාගන්නාලද උක්ත ප්‍රගතීන් සඳහා රු. 1,185,474,353.68 ක් වැය විය. ඒ සඳහා ලබා දුන්රජයේඅයවැය ප්‍රතිපාදනවලට සාපේක්ෂව මූල්‍ය ප්‍රගතිය 75.82% ක් විය. 2015 අප්‍රේල් සිට දෙසැම්බර් අවසානය දක්වාම වෙරළ සංරක්ෂණ ඉදිකිරීම් සහ සමහරක් වෙරළ විමර්ශණ කටයුතු සඳහා අයහපත් කාළගුණික තත්ත්වයේ බලපෑම් නිරතුරුවඇති විය | | |

## 5.2.6 කැබිනට් පත්‍රිකා

| කැබිනට් පත්‍රිකා අංකය සහ දිනය | මාතෘකාව | කැබිනට් තීරණ | වර්තමාන තත්වය |
|---|---|---|---|
| අංක 15/1516/704/008<br>දිනය – 2015/09/18 | මාරවිල-තල්විල වෙරළ තීරයේ වැලි පෝෂණ ව්‍යාපෘතිය (දෙවන අදියර) | මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණ සැලකිල්ලට ගෙන, ඒ අනුව ක්‍රියාකරන ලෙස මහවැලි සංවර්ධන හා පරිසර අමත්‍යාංශ ලේකම්වරයාට නියම කිරීම.<br>වෙරළ ඛාදනය වැළැක්වීම පිළිබඳ පුළුල්, විද්‍යානුකූල හා තිරසාර විසඳුමක් සෙවීම ජාතික අවශ්‍යතාවයක් බැවින් ඒ සඳහා සුදුසු නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් තාක්‍ෂණික වාර්තාවක් අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කිරීම සුදුසු බව නිරීක්ෂණය කිරීම. | අදාල තීරණය පරිදි මහවැලි සංවර්ධන හා පරිසර අමත්‍යාංශ ලේකම් විසින් අට පුද්ගල කමිටුවක් 2016-01-01 දින පත්කර ඇත. |

## 5.3 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

### *5.3.1 සමස්ත මූල්‍ය ප්‍රගතිය*

මහවැලි සංවර්ධන විශේෂ ආධාර සැපයීම් ව්‍යාපෘති ඇතුළුව 2015 වර්ෂය සඳහා ලැබුණු මුළු ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදන (සංශෝධිත) රු.මි.28,281.64ක් වන අතර 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

| විස්තරය | අයවැය ප්‍රතිපාදන රු.මි. | නිදහස් කරන ලද මුදල රු.මි. (2015 දෙසැම්බර් අවසානය දක්වා) | වියදම රු.මි. (2015 දෙසැම්බර් අවසානය දක්වා) |
|---|---|---|---|
| *මහවැලි ව්‍යාපෘති* | 27,406.64 | 21,921.29 | 21,701.71 |
| *මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය* | 500.*00* | 475.*00* | 424.86 |
| *බී කලාපයේ මාදුරුඔය ගංගා ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය* | 235.*00* | 271.*00* | 223.07 |
| *රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය* | 140.00 | 140.00 | 129.41 |
| *වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - L කලාපය* | 440.00 | 440.00 | 439.88 |
| *මහවැලි ගැටඹේ ගං ඉවුර ආරක්ෂාකිරීමේ වැඩසටහන* | 60.00 | 60.00 | 53.20 |
| *හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම* | 150.00 | 145.00 | 91.07 |
| **මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය* | 11,000.00 | 10,757.25 | 10,707.19 |
| **වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය සඳහා අතිරේක අරමුදල් සැපයීම* | 955.00 | 869.93 | 869.93 |
| **උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය* | 13,334.64 | 8,173.11 | 8,173.11 |
| ***කාලගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (මහවැලි කොටස)* | 592.00 | 590.00 | 590.00 |
| *පරිපාලනය හා නඩත්තු* | 875.00 | 825.00 | 854.66 |
| *එකතුව* | 28,281.64 | 22,746.29 | 22,556.37 |

* මෙම ව්‍යාපෘතීන් මහවැලි සංවර්ධන ප්‍රදේශවල ක්‍රියාවට නැංවෙන අතර මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය මගින් අධීක්ෂණය කරනු ලැබේ. මෙම ව්‍යාපෘතීන් අවසන් කළ පසුව ඒවා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත භාර දෙනු ඇත.

** මෙම ව්‍යාපෘතිය වාරි මාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර මහවැලි ප්‍රදේශවල කොටස් වශයෙන් ක්‍රියාත්මක වේ.

### 5.3.2 මහවැලි ව්‍යාපෘති

#### 5.3.2.1 මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය

මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය 2007 වර්ෂයේ දී වාර් ජලය සුරක්ෂිත කර කෘෂි ආර්ථිකය නැංවීම හරහා මාදුරු ඔය වම් ඉවුර ප්‍රදේශයේ වෙසෙන ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය සංවර්ධනය කිරීම අරමුණ කර ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියට (අ). වාර්මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ කි. මී. 52 ක් වන ප්‍රධාන ඇල කි. මී.ටර් 65 ක් වන ශාඛා ඇලවල් කි. මී 459 ක් වන බෙදා හැරීමේ ඇලවල් කි.මී 1138 ක් වන කෙත් ඇලවල් කි.මී 54 ක් වන පරිවහන ඇලවල් කි.මී. 80 ක් වන මෙහෙයුම් හා නඩත්තු මාර්ග හා කුඩා වැව් ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළුව ජල කළමනාකරණය සඳහා මාදුරුඔය වම් ඉවුරේ 1982 – 1986 කාලය තුල ඉදි කරන ලද වාරි මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම (ආ) ග්‍රාමීය ස්වයං ආධාරක ව්‍යාපෘති

යටතේ ගොඩනගන ලද තෝරාගත් ජල සැලයුම් සේවා විධිමත් කර ප්‍රවර්ධනය කිරීම (ඇ) කෘෂිකාර්මික සංවර්ධනය උපකාරී වීම හා ගොවි සංවිධාන ශක්තිමත් කිරීම මෙන්ම (ඈ) පාරිසරික සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (සංශෝධිත) රු.මි. 4,910ක් වේ.

2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු.මි. 500ක් වන අතර 2015 වර්ෂය තුළදී රු. මි. 424.85 ක් භාවිතා කර ඇත. 2015 වර්ෂය තුළ බෙදුම් ඇල කි.මී. 5 ක් ද බෙදුම් ඇල නිර්මිත 06 ක් ද ප්‍රතිසංස්කරණය කරන ලද අතර කෙත් ඇලවල් කි.මී. 45.8 ක් හා පරිවහන ඇලවල් කි.මී. 38 ක් ප්‍රතිසංස්කරණය කර නවීකරණය කර ඇත. විජයභාපුර මහවැලි ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථානයේ ජල සැපයුම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ද අවසන් කර ඇත. තවද 2015 වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය යටතේ අරලගන්විල ගොවිපලේ සංවර්ධන කටයුතු සඳහාද මූල්‍ය ප්‍රතිපාදන ලබාදී ඇත.



*මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය*

## 5.3.2.2 බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය

මහවැලිතැන්න ඒකකය හා මල්වැන්න ඒකක පොළොන්නරුව හා මඩකලපුව දිස්ත්‍රික්කවලට අයත් මහවැලි බී කලාපයේ සිංහපුර කොට්ඨාසයේ ඉහළ කොටසේ පිහිටා ඇත. එම ප්‍රදේශය තුළ පැතිර පැවති අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් එම ප්‍රදේශයේ විසූ බොහෝ නිවැසියන් අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් එසේ අවතැන් වූ 1200 කට අධික පුද්ගලයින් සංඛ්‍යාවක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඔවුන්ගේ මුල් පදිංචි ස්ථාන කරා නැවත හරවා යවා ඇත. පැවති අර්බුදකාරී වාතාවරණයෙන් අනතුරුව 2014 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචිකිරීමේ හා ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කෙරිණ.
එහෙත් සාමය උදාවීමත් සමග නැවත පදිංචි කිරීම සහ වාරිමාර්ග පුනරුත්ථාපන කටයුතු ආරම්භ කළ අතර ව්‍යාපෘතිය හරහා පවුල් 859 ක් වාරි ඉඩම් ලබාදෙමින් සිංහපුර කොට්ඨාසයේ මල්වැන්න හා මහවැලිතැන්න ඉතිරි කෘෂි සංවර්ධන කටයුතු ආරම්භ කෙරිණි. මෙහිදී සිංහපුර කොටසේ මහවැලිතැන්න හා මල්වැන්න ඒකකවල ගෙවතු ඉඩම් 859ක් හා වාරි ඉඩම් 859 සංවර්ධනය සංවර්ධනය කිරීමට යෝජනා විය. ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් වශයෙන් (අ) පවුල් 859 ක් සිංහපුර කොටසේ නැවත පදිංචි කිරීම හා පදිංචිය ස්ථාපිත කිරීම (ආ) හෙක්ටයාර 521 ක් පමණ වූ දැනට පවත්නා වාරි පදනම් වූ කෘෂිකර්මාන්තය සඳහා සංවර්ධනය කිරීම (ඇ) හෙක්ටයාර් 174 ක් වූ ගෙවතු ඉඩම් සංවර්ධනය සහ ඈ (මහවැලිතැන්න වැව හා වාරි පද්ධතිය ඉදි කිරීම දක්වා ඇත. ව්‍යපෘතියේ මුලු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 935.49 කි.

2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු.මි. 235 ක් වන අතර ඉන් රු.මි. 223.07 ක් වියදම් කර ඇත. වර්ෂය තුළදී හෙක්ටයාර 65ක කැලෑ එළි කිරීම් සහ රළු මට්ටම් කිරීමේ වැඩ කටයුතු මෙන්ම

**පරිවහන ඇල කි.මී 3.62 ක් හා බෙදුම් ඇල කි.මී 2.9 ක් ඉදි කිරීම් ද අවසන් කර ඇත. එමෙන්ම බහුකාර්ය ගොඩනැගිලි 4ක් හා කි.මී. 15 මාර්ග ඉදිකිරිමේ කටයුතු ද අවසන් කර ඇත.**



*බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය*

## 5.3.2.3 රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යපෘතිය

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඉතා දුර බැහැර පිහිටි මෙන්ම වඩාත් දරිද්‍රතාවයෙන් යුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වශයෙන් හඳුනාගෙන ඇත. එබැවින් ඉහත ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අරමුණින් 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පස් අවුරුදු ආයෝජන සැලැස්මක් සකස් කරන ලදි. මෙම ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පදිංචි කරවූවන් සඳහා කෘෂිකර්මය මත පදනම් වූ ඵලදායී මෙන්ම තිරසාර ආර්ථික ප්‍රවේශයන් විවර කරදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු විය. මේ යටතේ (අ) වාණිජ බෝග නිෂ්පාදනය වැඩිදියුණු කිරීම (ආ) පශු සම්පත් සංවර්ධනය (ඇ) ව්‍යවසායකත්ව සංවර්ධනය කෙරෙහි මූලික ලෙස අවධානය යොමු කෙරේ. ව්‍යපෘතිය සඳහා මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 1,100 කි.**

**2015 වර්ෂය සඳහා මූලා‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු.මිලියන 140 ක් වන අතර 2015 දෙසැම්බර් මස අවසාන වන විට ඉන් රු. මිලියන 129.40 ක් වියදම් කිරීමට හැකි වී ඇත. මෙහි වෙසෙන ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවන අතරම 2015 වර්ෂය තුළදී පවුල් 166 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීමට හැකියාව ලැබී ඇත. පොදු යටිතල පහසුකම් සංවර්ධනය යටතේ මාර්ග කි.මී. 6.2 ක්, පොදු ගොඩනැගිලි 07 ක් (ප්‍රජා ශාලා, පාසල් ගොඩනැගිලි, වෛද්‍ය මධ්‍යස්ථාන හා නිල නිවාස ආදිය) මෙන්ම ජල සැපයුම් ව්‍යාපෘති 03ක් ද ඉදිකර ඇත. මීට අමතරව පානීය ළිං 40 ක් සහ කෘෂි ළිං 15 ක් ඉදි කිරීමද 2015 වර්ෂය තුළදී අවසන් කර ඇත. එමෙන්ම ව්‍යාපෘති ප්‍රදේශය තුළ වෙසෙන 5000 ටත් වඩා වැඩි ප්‍රමාණයක් වූ ජනතාවගේ දක්ෂතාවන් හා හැකියාවන් ඉහළ නැංවීම සඳහා විවිධ විෂයයන් ඔස්සේ පුහුණු වැඩසටහන් 105 ක් පවත්වා ඇත.**



**රිදීමාලියද්දඒකාබද්ධසංවර්ධන ව්‍යාපෘතිය**

## 5.3.2.4 වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - *L* කලාපය

මෙම ව්‍යාපෘතිය අනුරාධපුරය, වවුනියා, ත්‍රිකුණාමලය හා මුලතිව් යන දිස්ත්‍රික්කවලට අයත් හෙක්ටයාර 62,000 කට වඩා වැඩි භූමි ප්‍රමාණයක පැතිර පවත්නා මහවැලි එල් කලාපයේ සංවර්ධන කටයුතු ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරයි. ව්‍යාපෘති ප්‍රදේශය කලාප 09 කින් සමන්විත වන අතර 1981 වර්ෂයේදී පවුල් 3,100 පදිංචිකරවමින් 4 සහ 5 කලාප කලාපවල මූලික යටිතල පහසුකම් සැපයීම සම්පූර්ණ කර ඇත. 1980 මැද භාගයේ සිට නැගෙනහිර පළාතේ පැතිරී තිබූ අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට නොහැකි විය.

ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට දැඩි ලෙස බලපාන අයුරින් ග්‍රාමීය වැව්, වාරි පද්ධතිය, මාර්ග ජාලය මෙන්ම පොදු ගොඩනැගිලි ද ත්‍රස්තවාදී කටයුතු හේතුවෙන් දැඩි ලෙස හානියට පත් විය. මෙම කරුණු හේතු කොට ගෙන ඉහත ව්‍යාපෘතිය මගින් (අ) පවුල් 6,900 ක් පමණ නැවත පදිංචි කරවීම හා (ආ) එම ප්‍රදේශයේ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම රු.මි. 3,957 ක ඇස්තමේන්තුගත පිරිවැයක් දරා සිදු කිරීමට සැලසුම් කරන ලදි.

මෙම ව්‍යාපෘතියට 2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු. මිලියන 440 කි. එමගින් ගෙවතු සැළසුම් වැඩ සටහන යටතේ බීජ ඇසුරුම් 30,000 ක් බෙදා දීමට හා කි.මීටර් 8ක කෙත් ඇලවල් සහ කි.මීටර් 7 ක බෙදුම් ඇලවල් ඉදි කිරීම සඳහා රු. මිලියන 439.88 ක් වර්ෂය තුලදී භාවිතා කර ඇත.

තවද, කෘෂි ළිං 10 ක් ඉදි කරන ලද අතර ඝන මීටර 2103 කින් යුත් බැම්ම සහ වැව් සංවර්ධනය කරන ලදී. මීට අමතරව මෙම වර්ෂය තුළදී මාර්ග කි.මී 60 ක් සමතලා කරන ලද අතර කි.මී 10 බොරළු අතුරා සකස් කරන ලදි.



වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - L කලාපය

## 5.3.2.5 මහවැලි ගැටඹේ ගං ඉවුර ආරක්ෂාකිරීමේ වැඩසටහන

ගැටඹේ ප්‍රදේශයේ ගංගා ඉවුරු ආශ්‍රිතව පැවති දැඩි පාංශු ඛාදනය හේතු කොට ගෙන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවේ සිට මහින්ද රාජපක්ෂ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පරිශ්‍රය දක්වා මී. 15 ක උසින් යුත් මීටර 49 දිගට ගේබියන් බැම්මක් ඉදි කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේදී ආරම්භ කෙරිණ. මෙම ව්‍යාපෘතියේ සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය (සංශෝධිත) රු.මි. 698.97 කි.මෙම ව්‍යාපෘතියට 2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු.මි. 60 ක් වන අතර ඉන් රු.මි.53.20ක් යෝජිත ගේබියන් බැම්මේ මීටර 55 ක් තැනිම සඳහා 2015 වර්ෂයේදී භාවිත කර ඇත.




*මහවැලි ගැටඹේ ගං ඉවුරේ ගේබියන් බැම්ම ඉදි කිරීම*

## 5.3.2.6 හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම

(අ) මූලික වැඩ හා ජලාශ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම (ආ) වාරි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම හා (ඇ) උඩවලව, හුරුලුවැව, කලාප බී, සී, එච්, එල් හා මූලික වැඩ පාලන ක්‍රියා කරවුම් නඩත්තු හා මෙහෙයුම් අංශය යටතේ වන කාර්යය භාර ඉංජිනේරු අංශවල වාරි බෙදුම් ඇලවල් අතර ඉදි කිරීම් හා ප්‍රතිසංස්කරණය අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ සමස්ථ ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 825 කි.

මෙම ව්‍යාපෘතියට 2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු.මි .150 ක් වන අතර ඉන් රු.මි.91.06 ක් භාවිත කරමින් බෙදුම් ඇලවල් 46 ක් සංවර්ධනය කිරීම, පිළිසකර කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම අවසන් කර ඇති අතර හුරුලුවැව කලාපයේ කි.මී. 1.19 හා උඩවලව කලාපයේ කි.මී 22.53 ක දිගින් යුත් ගේබියන් බැම්මක් ඉදි කෙරෙමින් පවතී. තවද මෙම ව්‍යාපෘතිය යටතේ ජලාශ 06 ක (කොත්මලේ, වික්ටෝරියා, බෝවතැන්න, රන්දෙනිගල-රන්ටැඹේ, මාදුරුඔය සහ පොල්ගොල්ල) සාමාන්‍ය නඩත්තු කටයුතු සිදු කරනු ලැබේ.




එප්පාවල වැවට සිදු වූ හානිය

### *5.3.3* නඩත්තු සහ සංවර්ධනය

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව කෘෂි කර්මාන්තය සංවර්ධන කිරීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එහි කලාප 10 තුළ හෙක්10 .7, 157ක් වන වාරි ඉඩම් සඳහා ජල සැපයුම තහවුරු කරනු වස් විශාල, මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ ජලාශ 333 කින් සමන්විත කි.මී. 10,721 ක් වූ වාරි මාර්ග ජාලයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් වගකීම දරන ආයතනය වේ. මේ අතර ගොවි පවුල් 132,763 ක් ඇතුළුව පවුල් 239,416 කට ප්‍රතිලාභ සපයනු වස් මහවැලි ප්‍රදේශවල කි.මී 4004 ක් පමණ වූ මාර්ග පද්ධතිය හා අනෙකුත් යටිතල පහසුකම් නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම ද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතට ගැනෙන කාර්යයන් වේ.

තවද, ප්‍රදේශය තුළ දැනට වෙසෙන හා ඉදිරි පරම්පරාවේ ප්‍රතිලාභය උදෙසා ඉඩම් පරිපාලනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, පරිසර සංරක්ෂණය සහ ආයතනික සංවර්ධන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යයන් වේ. මේ සඳහා **2015** වසරට සංශෝධිත අය වැය ප්‍රතිපාදන රු.මි. **875** ක් වන අතර **2015**වර්ෂය තුළදී රු.මි. **854.66** ක මුදලක් එම ප්‍රදේශයේ ජනතාවට පහසුකම් සැලසීම සඳහා යොදවා ඇත.

### 5.3.3.1 වාරිමාර්ග පද්ධතිය නඩත්තුව

වාරිමාර්ග පද්ධතිය නඩත්තුව යටතේ වාරිමාර්ග ඇල පද්ධතියෙහි රොන්මඩ ඉවත් කිරීම, වාරි මාර්ග පද්ධතිය හා නිර්මිත අළුත්වැඩියාව සහ සංවර්ධනය, මාර්ග බොරළු ඇතිරීම ආදිය මහවැලි වාරිමාර්ග පද්ධතිය නඩත්තු කටයුතු යටතට ගැනේ. **2015** වසර සඳහා රු.මි. **272.48**ක් වාරිමාර්ග පද්ධතිය නඩත්තු කටයුතු වෙනුවෙන් වෙන්කර ඇති අතර ඉහත කාර්යයන් සාක්ෂාත් කර ගනු වස් ඉන් රු.මි. **240.80** ක් **2015** වර්ෂය තුළදී වියදම් කර ඇත.

මහවැලි කලාපය තුළ ගොවි සංවිධාන **975**ක් පිහිටුවා ඇති අතර **2015** අවසාන වන විට බෙදාහැරීමේ ඇල පද්ධති **789** ක මෙහෙයුම් කටයුතු හා නඩත්තු ගොවි සංවිධාන වෙත පවරා දී ඇත. එමෙන්ම ගොවි සංවිධාන **95** ක් ප්‍රදර්ශන මට්ටමටත්, ගොවි සංවිධාන **36** වාණිජ මට්ටමටත් ඉහළ නැංවීම **2015** ජනවාරි - දෙසැම්බර් කාල පරිච්ඡේදය තුළ ආයතනික සංවර්ධන අංශයේ නායකත්වය යටතේ සිදුවිය.

### 5.3.3.2 ඉඩම් ප්‍රදානය

**2015** වර්ෂය තුළ රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිවාස සඳහා ඉඩම් කට්ටි **19** ක්, වාණිජ ඉඩම් කට්ටි **01** ක් හා ආයෝජන ව්‍යාපෘති වෙනුවෙන් ඉඩම් කට්ටි **01**ද නිකුත් කර ඇත. තවද මෙම කාලය තුළ ඉඩම් සංවර්ධන බලපත්‍ර **6425**ක් සහ රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාර්ෂික බලපත්‍ර **653** ක් නිකුත් කර ඇත. මෙම වර්ෂ තුළදී ප්‍රදාන පත්‍ර **9038** ක් නිකුත් කර ඇති අතර ජනපදිකයින්ගේ ඉඩම් ප්‍රදාන පත්‍ර ලබාදීම කඩිනම් කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ලියාපදිංචි කල මිනින්දොරුවන් විසින් විශේෂ ඉඩම් මැනීමේ සහ ලකුණු කිරීමේ වැඩ සටහනක් මෙම වසර තුලදීත් ක්‍රියාත්මක කරන ලදී . මෙම වසර තුල ඉඩම් ප්‍රදාන වැඩ සටහන යටතේ ඉඩම් කට්ටි**20,589** ක මැණුම් කටයුතු සහ ඉඩම් ලකුණු කිරීමේ කටයුතු අවසන් වී ඇත. වර්ෂය සඳහා වාර්ෂික බදු කුලී අය කිරීම් ඉලක්කය රු. මිලියන **863 .94** ක් වූ අතර ඉන් රු.මිලියන **218.19** ක් **2015** වර්ෂය තුලදී අයකර ගෙන ඇත.

### 5.3.3.3 කෘෂි කාර්මික හා පශු සම්පත් සංවර්ධනය

- කෘෂි කාර්මික ඵලදායීතා සංවර්ධන වැඩසටහන

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව දේශීය ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම,කෘෂිකාර්මික ආනයන අවම කිරීම,වැඩි ඵලදායී භෝග වගා හා සත්ව නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම වැඩ සටහන ආරම්භ කර තිබේ. අනෙකුත් භෝග වගාව ප්‍රවර්ධනය කිරීම, දෙමුහුන් බිත්තර වී නිෂ්පාදනය හඳුන්වාදීම, කාබනික පොහොර භාවිතය වැඩි දියුණු කිරීම, ගොවිපලවල් හා පැල තවාන් ස්ථාපිත කිරීම මෙන්ම සුවඳැල් වැනි පාරම්පරික දේශීය සහල් වර්ග වගා කිරීම දිරි ගැන්වීම වැනි වැඩ සටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදි. එමෙන්ම පශු සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ කිරිගව කළමනාකරණ, කුකුළු ගොවිපල පාලනය,මිරිදිය හා විසිතුරු මත්ස්‍ය කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් හා වැඩමුළු ක්‍රියාත්මක කරන ලදි .

- කෘෂිකාර්මික භෝග වගාව

මහවැලි ප්‍රදේශවල වී වගා කර ඇති භූමි ප්‍රමාණය හෙක්ටයාර **97,567** ක් වන අතර **2014/2015** මහ කන්නයේ වී නිෂ්පාදනය මෙ.ටො. **545,578** ක් විය. **2014/2015** මහ කන්නයේ සාමාන්‍ය වී අස්වැන්න හෙක්ටයාරයකට මෙ.ටො. **5.9** ක් විය. ඉහළම සාමාන්‍ය වී අස්වැන්න හෙක්ටයාරයකට මෙ.ටො. **6.48** එච් කලාපයෙන් වාර්තා වී ඇත. **2015** වසරේ යල කන්නයේ වී අස්වැන්න හෙක්ටයාර **83,303** කට මෙ.ටො. **460,116** ක් විය. **2015** වර්ෂයේ මහවැලි කලාපයේ සමස්ත වී අස්වැන්න මෙ.ටො. **1,005,694** ක් විය.
අනෙකුත් බෝග වගා කිරීම හෙක්. **33,627** ක් වූ අතර එය සෝයා බෝංචි හෙක්. **3,385** ක්ද, බඩ ඉරිඟු හෙක්. **3,884** ක්ද, ලොකු ළූණු හෙක්. **2,215** ක්ද මිරිස් හෙක්. **812** ක්ද, කළු කවුපි හෙක්. **438** ක්ද, කවුපි හෙක්. **911** ක්ද, රට කජු හෙක්. **583** වශයෙන් සමන්විත විය. තවද, **2015** වර්ෂය තුළදී කෙසෙල් හෙක්. **8,162** ක්ද වගා කරන ලදි.







- කිරිගව සංවර්ධන වැඩ සටහන

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශය හරහා මහවැලි ප්‍රදේශ වල අතිරේක ආදායම් මාර්ග හඳුන්වාදීම හා මහවැලි ජනපදිකයින්ගේ පෝෂ්‍ය තත්වය ඉහළ නැංවීම අරමුණු කරගෙන කිරිගව පාලනය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාකරනු ලැබේ. සෑම මහවැලි ප්‍රදේශයකම කිරි නිෂ්පාදනයේ සංවර්ධන කටයුතු සිදු කිරීම සහ මෙහෙයවීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වගකීම වේ.
**2015** වර්ෂයේදී මහවැලි ප්‍රදේශවල **108,549** මුළු ගව ගහනයක් වාර්තා වූ අතර කිරි ලීටර් මිලියන **28**ක් නිෂ්පාදනය කර ඇත.
මෙම කාල පරිච්ඡේදය තුළ කිරි ගොවීන් **4522** ක් පුහුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් **152** ක් සංවිධානය කරන ලදි. **2015** වසර තුළදී කිරි රැස්කිරීමේ මධ්‍යස්ථාන **164** ක් කිරි ශීතකිරීමේ මධ්‍යස්ථාන **74** ක් මහවැලි ප්‍රදේශය තුළ ස්ථාපනය කරන ලදි. තවද මහවැලි කලාපයේ දරුවන් අතර නැවුම් කිරි භාවිතය දිරි ගැන්වීම සඳහා ˝කිරි සතිය˝ වැඩ සටහන යටතේ වැඩමුළු **44** ක් පැවැත්වීමට කටයුතු කරන ලදි




කිරිගව සංවර්ධන වැඩ සටහන

- මිරිදිය මත්ස්‍ය හා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය නංවාලීම

මහවැලි ජනපදිකයින්ගේ පෝෂණය හා ආර්ථික තත්ත්වය නැංවීමෙහිලා මහවැලි ජලාශවල මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රධාන කාර්යයක් වේ. **2015** දෙසැම්බර් මස වන විට මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො. **11.316** ක් ලෙස වාර්තා වී ඇත. මේ අතර මහවැලි කලාපවල වෙසෙන දෙවන සහ තුන්වන පරම්පරාවට ස්ථිර ආදායම් මාර්ග සපයා දෙමින් විසිතුරු මතස්‍ය ගොවිපල **783** ක් හා පොකුණු **1263** ක් ස්ථාපනය කරන ලදි.





- මහවැලි ගොවිපල

මහවැලි සංවර්ධිත ඉඩම්වල ඵලදායීතාවය කාර්යක්ෂම කිරීම,මහවැලි සංවර්ධන ප්‍රදේශයන්හි බීජ හා පැල අවශ්‍යතාවය සපුරාලීම,ජල ඵලදායිතාව වැඩි කිරීම හා වැඩි රැකියා අවස්ථාවන් ජනනය කිරීමේ අරමුණ ඇතිව මහවැලි ප්‍රදේශවල ගොවිපල **18** ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ස්ථාපනය කර ඇත.

මහවැලි ගොවිපල කළමනාකරණය මූලික අරමුණු **6**ක් යටතේ සිදුකෙරේ .

- ✓ නිලධාරීන්ට සහ ගොවීන්ගේ පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යෑමෙ
- ✓ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යෑම
- ✓ කලාපීය බීජ අවශ්‍යතාවය සපුරාලීම
- ✓ යහකෘෂිකාර්මික භාවිතා මධ්‍යස්ථානයක් වීම
- ✓ පරිසර හිතකාමී දේශීය සංචාරක නිකේතනයක් ලෙස පවත්වාගෙන යෑම
- ✓ උපරිම වාණිජමය ආර්ථික ලාභයක් ලබන ඒකකයක් ලෙස පිහිටුවීම

පහත දැක්වෙන පරිදි **2015** දෙසැම්බර් මස අවසන් වන විට අස්වද්දා ඇති මුළු ගොවිපල බිම් ප්‍රමාණය අක්කර ***1,484*** කි.

### 5.3.3.4 ආයතනික සංවර්ධනය

ව්‍යවසායකත්ව අවස්ථා, පුද්ගල සංවර්ධනය ,ආයතනික සවිබල ගැන්වීම, කාන්තාව සවිබලගැන්වීම, සමාජ හා සංස්කෘතික සංවර්ධනය ජනපදිකයන් වෙත ලබා දෙමින් මහවැලි පදිංචිකරුවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම ඔවුන් පදිංචි කරවීමේ පශ්චාත් සමයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යන් වේ. ඒ අනුව පදිංචි කරුවන්ගේ දෙවන හා තුන්වන පරම්පරාවල අභිවෘද්ධිය තකා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආයතනික සංවර්ධන අංශය ඉහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විවධ වැඩ සටහන් හා වැඩමුළු සංවිධානය කරන ලදි. ගොවි සංවිධාන සවිබල ගැන්වෙන සේ වැඩසටහන් **12**ක්, ප්‍රජා සංවර්ධනය, සමාජ සෞඛ්‍යය හා අධ්‍යාපනය පාදක කරගත් වැඩසටහන් **22** ක් **2015** වර්ෂය තුළදී සංවිධානය කිරීමට හැකි විය. තවද පහත වැඩසටහන් **2015** වර්ෂය තුළදී සංවිධානය කිරීමට හැකිවිය.

- "සුජාත දරුවෝ" මහවැලි ආදර්ශ ගම්මාන වැඩසටහන **2015** - බී, සී, ජී සහ එල් කලාපවල වැඩසටහන් **25** ක් සංවිධානය කරන ලදි
- මෙම කාල පරිච්ඡේදය තුළ වාරි පද්ධති කලමනාකරණ ක්‍රියාකාරකම් **15** ක් පවත්වන ලදි.

මහවැලි දරුවන්ගේ සංස්කෘතික හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා 2015 වසර අවසානයේදී 'ප්‍රතිභා සංස්කෘතික වැඩසටහන" පවත්වන ලදි. මෙම වැඩසටහන මගින් උපයා ගන්නා ලද මුදල් පදිංචි කරුවන්ගේ දරුවන්ගේ ශිෂ්‍යත්ව අරමුදල ඉහළ නැංවීමට උපකාරී විය. 2015 වර්ෂය තුළදී මෙම ශිෂ්‍යත්ව වැඩසටහන මගින් මහවැලි ප්‍රදේශවල දරුවන්ට ශිෂ්‍යත්ව 71ක් පිරිනැමීමට හැකියාව ලැබුණි.

### 5.3.3.5 වන හා පරිසරය


- පරිසර හා වන සංරක්ෂණය

පරිසර අංශය විසින් මහවැලි ප්‍රදේශවල පාරිසරික කටයුතු කළමනාකරණය හා සම්බන්ධීකරණය සිදු කරනු ලබයි. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතීන්හි පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තා වලට අනුකූලව පාරිසරික කළමනාකරණ සැලසුම ක්‍රියාත්මක කිරීම මේ වසර තුළදී ප්‍රමුඛතාවය දී ඇති අතර එහි ඉදිරි පියවර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිසර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.

පරිසර හා වන සංරක්ෂණය සඳහා වාර්ෂික ප්‍රතිපාදන රු.මි .10 ක් වන අතර ඉන් රු.මි. 8.28 ක් 2015 වර්ෂය තුළදී භාවිත කර ඇත. ස්වභාවික සම්පත් සංරක්ෂණය යටතේ මහවැලි ගඟේ රොන්මඩ එක්රැස් වීම වළක්වනු පිණිස මීටර 800 ක් දිග ජෛව පාංශු බැම්මක් සකස් කරන ලදි. කි.මී. 16 ක් දිග අලි වැටක් සකස් කරන ලදි. මහවැලි ප්‍රදේශවල ජලයෙහි ගුණාත්මක බව සහතික කරනු වස් ජල තත්ත්ව අධීක්ෂණ වැඩසටහන යටතේ ජල සාම්පල 76 ක් පරීක්ෂා කරන ලදි. පැල තවාන් කළමනාකරණ හා පැල නිෂ්පාදන වැඩසටහන යටතේ පැල 228,256 ක් සපයන ලද අතර රුක් රෝපණ වැඩසටහන් 32 ක් යටතේ පැල 42,835 ක් රෝපණය කරන ලදි. 2015 වර්ෂය තුළදී පාසල් ළමුන්ගේ සහභාගිත්වයෙන් පාරිසරික අධ්‍යාපන වැඩසටහන් 83 ක් ද මෙහෙයවන ලදි. මහවැලි කලාපවල ජෛව විවධත්වය සංරක්ෂණය කරනු වස් මෙම වර්ෂය තුළදී ආක්‍රමණික විජාතික ශාක විශේෂ මැලීමේ වැඩසටහන් 14 ක්ද පවත්වන ලදි.

- කුඩා ජල විදුලිබල ව්‍යාපෘති

මහවැලි ප්‍රදේශයන්හි කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතීන් *19* ක් ඉදි කිරීම තුළින් මෙ.වො .*59.3* ක සමස්ත ජල විදුලි බල ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ .මෙයින් ව්‍යාපෘතීන් 17 ක් සඳහා පාරිසරික තක්සේරු වාර්තා අනුමැතිය ලබාදී ඇති අතර 2015 දෙසැම්බර් අවසානය වනවිට ඉන් ව්‍යාපෘතීන් 10 ක වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කර ඇත.



කුඩා ජල විදුලිබල ව්‍යාපෘති

### 5.3.3.6 ව්‍යාපාර සංවර්ධනය

- පරිසර හිතකාමී සංචාරක කර්මාන්ත

මහවැලි ප්‍රදේශවල පවතින පාරිසරික විභවතාවයන් සංචාරක කරමාන්තයේ දියුණුව සඳහා යොදා ගැනීමේ ශක්‍යතා අධ්‍යයන කටයුත ආරම්භ කර ඇත. මහවැලි ජලාශවල බෝට්ටු සේවා ආරම්භ කිරීම ප්‍රදේශයන්හි පරිසර සංචාරක හිතකාමී සංචාරක අවස්ථා වැඩිදියුණු කිරීම සඳහා මහවැලි ජලාශ ආශ්‍රිත ප්‍රදේශයන් සම්බන්ධ කොටගෙන උද්‍යාන අලංකරණ හා සැලසුම් කටයුතු සිදු කරන ලදි. ගෘහස්ථව සිට සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා එච් කලාපයේ (අවුකන) පවුල් 15 හඳුනාගෙන ඇත.

- ඉඩම් ආයෝජන

මහවැලි සංවර්ධනය තුළින් පුද්ගලික අංශයේ ආයෝජන දිරිගැන්වීම අරමුණින් ඉහළ ඵලදායී කෘෂි ව්‍යාපෘතීන් සඳහා මහවැලි සංවර්ධිත ඉඩම් ලබාදීම සිදු කෙරේ. 2015 දෙසැම්බර් මස අවසන් වන විට වාණිජ / කෘෂි ව්‍යාපෘති සඳහා ආයෝජන 543 කට ඉඩම් ලබා දී ඇත.

- කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර ප්‍රවර්ධනය

2015 වර්ෂය තුළදී රු. මිලියන 323 කට අධික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වැඩසටහන් 2035ක් මහජන බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සහයෝගය ඇතිව මහවැලි ප්‍රදේශයන්හි සංවිධානය කෙරිණ.

## *5.3.4* කාර්ය සාධක දර්ශක

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ජාතියට වඩා යහපත් සේවාවක් සැපයීමේ අරමුණින් කාර්යය දර්ශක පහක් ඔස්සේ එහි සේවාවන් සපයනු ලැබේ. (ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යය සාධනය මෙහෙයවනු ලබන වැදගත් මූලධර්ම ලෙස හඳුනාගෙන ඇත) මෙම දර්ශක සියල්ල ප්‍රමාණාත්මක වන අතර සෑම වර්ෂයක් අවසානයේදීම ඇගයීමට ලක් කරනු ලැබේ.

- මහවැලි හා ආශ්‍රිත ඉවුරුවල මතුපිට ජල ගබඩා ධාරිතාවය ඉහළ නැංවීම
- මහවැලි ප්‍රදේශවල මුළු වාරිබිම් ප්‍රමාණය ඉහළ නැංවීම (හෙක්.)
- වගා තීව්‍රතාවය ඉහළ නැංවීම
- භෝග විවිධාංගීකරණ භූමි ප්‍රමාණය ඉහළ නැංවීම
- මහජනතාවගේ පැමිණිලි හා දුක්ගැනවිලි පිළිබඳ කඩිනම් ප්‍රතිචාර දැක්වීම
- මතුපිට ජල ගබඩා ධාරිතාව ඝන මීටර් මිලියන 2,980 සිට 3,882 ක් දක්වා ඉහළ නැංවීම

උතුරු පලාතේ සංවර්ධන කටයුතු සඳහා අත්‍යවශ්‍ය නමුත් ප්‍රමාණවත් පමණින් නොමැති ජල සම්පතට කිවුල්ඔය ජලාශයේ ඉදිකිරීම් 2015 වර්ෂයේදී අවසන් කිරීමත් සමග ඝන මීටර් මිලියන 66ක් එකතු කිරීමට යෝජිතය. කෙසේ වුවද පාරිසරික ඇගයීම් වාර්තාවට අනුමැතිය ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදයන් හේතු කොට ගෙන 2015 දෙසැම්බර් දක්වා මේ සමබන්ධයෙන් කිසිදු ප්‍රගතියක් වාර්තා වී නොමැත. වසර 2015 දී මොරගහකන්ද ව්‍යාපෘතිය මගින් ඝන මීටර් මිලියන 570 ක් ද කළුගඟ ව්‍යාපෘතිය මගින් ඝන මීටර් මිලිය න 266 ක ජල ධාරිතාවයක්ද එකතු වේ. වර්තමානය වන විට මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සාර්ථක අයුරින් සිදු කෙරේ.

- මහවැලි ප්‍රදේශ වල මුලු වාරිබිම් ප්‍රමාණය හෙක්. 107,157 සිට 121,725 දක්වාඉහළ නැංවීම

මොරගහකන්ද කළුගඟ ජලාශ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමත් සමග මහවැලි ප්‍රදේශවල මුළු වාරිබිම් ප්‍රමාණය වර්ධනය කරනු ඇත.

- වගා තීව්‍රතාවය 192 සිට 195 දක්වා ඉහළ නැංවීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් වගා තීව්‍රතාවය ඉහළ නැංවීම හා එය පවත්වා ගැනීම සඳහා කටයුතු කරමින් සිටියි. වර්තමානය වන විට වගා තීව්‍රතාවය 192 ක් වන අතර කෘෂිකාර්මික ඵලදායිතා වැඩසටහන් මගින් ඉදිරි වසර 2 තුළ වගා තීව්‍රතාවය 195 දක්වා නංවාලීමට අපේක්ෂිතයි.

- භෝග විවිධාංගීකරණය හෙක්. 33,627 සිට හෙක්. 48,557 දක්වා ඉහළ නැංවීම

භෝග විවිධාංගීකරණ වැඩසටහන යටතේ ඉදිරි වසර 03 ඇතුළත භෝග විවිධාංගීකරණ භූමි ප්‍රමාණය ක්‍රමයෙන් ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම අවශ්‍ය පහසුකම් ලබාදීම මගින් සෝයා බෝංචි, බඩ ඉරිඟු, ලොකු ළූණු සහ මිරිස්වල වගා ප්‍රමාණය ඉහළ නැංවීමට යෝජනා වී ඇත.

- මහජනතාවගේ පැමිණිලි හා දුක්ගැනවිලි පිළිබඳ කඩිනම් ප්‍රතිචාර දැක්වීම

මහජනතාවගේ පැමිණිලි සහ දුක්ගැනවිලි පිළිබඳ කඩිනමින් ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සැලසුම් හා මෙහෙයුම් අංශය මගින් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන ගැටළුවලට කඩිනම් පිළිතුරු සැපයීමද සිදු කරමින් මහජන පැමිණිලි, පුවත්පත් සහ අනෙකුත් මාධ්‍ය වාර්තා මගින් සටහන් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරයි. 2015 වසරේදී පැමිණිලි 14,935 ක් වාර්තා කර ඇති අතර ඊට අදාල සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලදි.

### *5.3.5* 2016 වසර සඳහා සංවර්ධන ප්‍රමුඛතා

1. වාරිමාර්ග පද්ධතිය මෙහෙයුම් හා නඩත්තු කිරීම
2. කෘෂිකාර්මික සංවර්ධනය
3. පශු සම්පත් සංවර්ධනය
4. හදිසි යටිතල පහසුකම් ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම
5. මහවැලි-ගැටඹේ ගංගා ඉවුරු ආරක්ෂා කිරීමට යාන්ත්‍රණයක් ක්‍රියාවට නැංවීම
6. ජල සම්පත් සංවර්ධනය
7. මහවැලි ප්‍රදේශවල යටිතල පහසුකම් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම

### *5.3.6* 2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන

රු. මි

| විස්තරය | 2016 වසර සඳහා අයවැය ප්‍රතිපාදන |
|---|---|
| මහවැලි ව්‍යාපෘති | **41,888.00** |
| මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය | **500.00** |
| බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය | **300.00** |
| රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය | **150.00** |
| වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යපෘතිය - *L* කලාපය | **500.00** |
| මහවැලි ගැටඹේ ගං ඉවුර ආරක්ෂාකිරීමේ වැඩසටහන | **125.00** |
| හදිසි යටිතල පහසුකම් ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යපෘති ප්‍රතිසංස්කරණය කිරීම | **200.00** |
| මොරගහ කන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | **16,550.00** |
| වෙලි ආරක්ෂණ හා ජල සමපත් සැලසුම් ව්‍යාපෘතිය සඳහා අතිරේක අරමුදල් සැපයීම | **3,750.00** |
| උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | **19,373.00** |
| කාලගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (මහවැලි කොටස) | **440.00** |
| පරිපාලනය හා නඩත්තු | **2,000.00** |
| මුළු ප්‍රාග්ධනය | **43,888.00** |

## 5.4 මධ්‍යම පරිසර අධිකාරිය

### 5.4.1 පරිසර බලපෑම් ඇගයීම / මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

"පුනරුදය " ජාතික පාරිසරික සංරක්ෂණ වැඩ සටහනේ අරමුණු අංක 06 අනුව, මධ්‍යම පරිසර අධිකාරිය එහි ප්‍රධාන නියාමන කාර්ය භාරයක් වශයෙන් පාරිසරික බලපෑම් අවම කිරීමේ අදහසින් ලැයිස්තුගත ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ පරිපාලන ක්‍රියාදාමය පවත්වාගෙන යනු ලබයි. මෙම පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලියට විෂය ප්‍රමාණය කිරීමේ රැස්වීම් සහ තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම්, පරිසර බලපෑම් ඇගයීමේ වාර්තා ඇගයීමට සහ මහජන සහභාගීත්වය සඳහා අවකාශ ලබාදීම හා ඉන් අනතුරුව අනුමැතිය ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ පසුවිපරම් කටයුතු කිරීම යන කරුණු ඇතුලත් වේ.

මීට අමතරව සංකීර්ණ පාරිසරික ගැටළු රහිත තෝරාගත් නියමිත ව්‍යාපෘති සඳහා මූලික පාරිසරික පරික්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිමට මධ්‍යම පරිසර අධිකාරියේ පලාත් කාර්යාල වෙත බලය පවරා ඇත. මෙම ව්‍යාපෘතිවලට අදාල කටයුතු කරගෙනයාමේදී අවශ්‍ය සහාය සහ මග පෙන්වීම පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මගින් ලබාදෙනු ලැබේ.

තවද, අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරිමේ ආයතන වෙත, පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය යටතේ ව්‍යාපෘති අනුමත කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදෙනු ලැබේ.

2015 වසර තුළ පාරිසරික බලපෑම් ඇගයීමේ රෙගුලාසි යටතේ ව්‍යාපෘති 03 ක් සඳහා අනුමැතිය ලබාදෙන ලද අතර, මූලික පාරිසරික ඇගයීම් ක්‍රියාවලිය යටතේ ව්‍යාපෘති 339 ක් සඳහා අනුමැතිය ලබා දී ඇත.

අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන සඳහා තාක්ෂණික සහාය ලබාදීම යටතේ ව්‍යාපෘති 19 ක් සඳහා තාක්ෂණික සහාය ලබාදෙන ලදි.

### 5.4.2 ස්වභාවික සම්පත් කළමනාකරණය

මධ්‍යම පරිසර අධිකාරිය අනෙකුත් අදාල ආයතන, අධිකාරියේ පළාත් හා දිස්ත්‍රික් කාර්යාලයන්ගේ සම්බන්ධීකරණය යටතේ, රටෙහි ස්වභාවික සම්පත් කළමනාකරණය කිරීමේ වගකීම දරනු ලබයි. රෙගුලාසි සැකසීම, ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාල මාර්ගෝපදේශ සැකසීම, පාරිසරික ආරක්ෂිත කලාප සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම, ජාතික තෙත්බිම් ප්‍රතිපත්ති අනුව එහි ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ ස්වභාවික සම්පත් කළමනාකරණය, පාරිසරික ආරක්ෂිත කලාප, තෙත්බිම් ක්‍රියාකාරකම් වලට අදාල තොරතුරු මූර්ත සැකසීම, ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාල මධ්‍යම පරිසර අධිකාරිය සතු අනෙකුත් කාර්යයන් වේ.

- ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම

"පුනරුදය " වැඩ සටහනේ අරමුණු අංක 03 අනුව, ශ්‍රී ලංකාව පුරා විසිරී ඇතිපාරිසරික වශයෙන් වැදගත්කමක් ඇති ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජාතික පාරිසරික පනත යටතේ පැවරී ඇති බලතල යටතේ එම පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ තිරසාරව කළමනාකරණය කිරීමේ අරමුණින් පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමේ වගකීම ක්‍රියාත්මක කරනු ලැබේ. යම් ප්‍රදේශයක් පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව, එම ප්‍රදේශයන්හි භෞතික සැලසුම් පිළියෙල කිරීම හා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය වගකීම උසුලනු ලබයි.

**2015 වසර තුල, පාරිසරික ආරක්ෂිත කලාප ලෙසනම් කල කලාප 07 ක් පසුවිපරම් කරන ලද අතර, පන්සලාතැන්න, දැඩිගමුව කන්ද සහ ගිං ඔය පරිසර ආරක්ෂණ ප්‍රදේශ ලෙස නම් කිරීම සඳහා ගැසට් පත්‍ර කෙටුම්පත් කරන ලදි.**

### 5.4.3 තෙත්බිම් කළමනාකරණය සහ ලෝක තෙත් බිම් දිනය සැමරීම

**රටෙහි පවත්නා තෙත්බිම් පරිසර කලාප මනා ලෙස කළමනාකරණය කිරීමේ අරමුණ ඇතිව මධ්‍යම පරිසර අධිකාරිය ජාතික තෙත්බිම් ප්‍රතිපත්ති හා උපාය මාර්ග ක්‍රියාත්මක කරනු ලබයි.**

**පෙබරවාරි 02 වන දිනට යෙදුන ලෝක තෙත්බිම් දිනය සැමරීම 2015 වසර සඳහා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ විල්පත්තු ජාතික උද්‍යානයේ දී සමරන ලදි.**

**ශ්‍රී ලංකාව තුල ඇති දිය ඇලි සංරක්ෂණ තත්වයන් හඳුනාගැනීම සඳහා දිය ඇලි සමීක්ෂණයක් සිදුකරන ලද අතර, ඒ අනුව වාර්තාගත දියඇලි 387 ක් සහ නව දිය ඇලි 129 ක් හඳුනා ගන්නා ලදි.**

**අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ජාතික තෙත්බිම් මෙහෙයුම් කමිටුවේ 20 සහ 21 වන සැසි වාරයන් 2015 ජූලි 16, දෙසැම්බර් 08 යන දිනයන්හි දී මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දී පවත්වන ලදි.**

**තෙත්බිම් සඟරාව ප්‍රකාශයට පත්කිරීම 2013 දී ආරම්භ කරන ලද අතර, 2015 සඳහා ද ක්‍රියාත්මක කරන ලදි.**

### 5.4.4 කැළණි ගංගා ද්‍රෝණිය කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය

**කැළණි ගංගා ද්‍රෝණිය ආරක්ෂා කිරීම සියළු පාර්ශවකරුවන්ගේ මැදිහත්වීමක් තුලින් සිදුකළ යුතු කාලීන අවශ්‍යතාවයක් ලෙස හඳුනාගත් මධ්‍යම පරිසර අධිකාරිය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන ඒකාබද්ධව කැළණි ගංගා ද්‍රෝණිය කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය දියත් කරන ලදි. මෙය පුනරුදය ජාතික පාරිසරික වැඩ සටහනෙහි විශේෂ පාරිසරික ගැටළුවක් වන ඉඩම් හායනය අවම කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ගයක් ලෙස සැලකිය හැකිය.**

**2015 වසර තුල කැළණි ගංගා ද්‍රෝණිය කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතියට අදාල ප්‍රධාන සැලැස්ම සැකසීම සඳහා උපදේශක වැඩමුළු 2015 ජූලි 02 හා සැප්තැම්බර් 29 යන දිනයන්හිදී පවත්වන ලදි. මීට අමතරව, ප්‍රශ්ණාවලි සමීක්ෂණයක් හා පත්‍රිකා නිෂ්පාදනය සිදු කර ඇත.**

### 5.4.5 දිස්ත්‍රික් පාරිසරික පැතිකඩ නිර්මාණය

**"පුනරුදය " ජාතික පාරිසරික වැඩ සටහනේ අරමුණු අංක 05 ට අනුව, මධ්‍යම පරිසර අධිකාරිය ස්වභාවික සම්පත්, පරිපාලන සීමා, සමාජ - ආර්ථික, ජනවිකාෂ, පුරා විද්‍යා දත්ත යන තොරතුරු ඇතුලත් මධ්‍යගත ස්ථානීය දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි. විද්‍යුත් පාරිසරික පැතිකඩ නිර්මාණය මෙම පවතින දත්ත පද්ධතිය මූලික කරගෙන සිදුකරනු ලැබේ.**

**ඒ අනුව, සිතියම් සහිත සංයුක්ත තැටි (CD) , ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් නිෂ්පාදනය කරනු ලැබේ. 2015 වසර තුල දිස්ත්‍රික් පාරිසරික පැතිකඩ ගාල්ල, මාතර, පොළොන්නරුව හා නුවරඑළිය දිස්ත්‍රික්ක සඳහා නිෂ්පාදනය කර ඇත.**

### 5.4.6 ශ්‍රී ලංකාව තුල මදුරුවන් පාලනය සඳහා නව විකල්ප සෙවීම

මධ්‍යම පරිසර අධිකාරිය, රටෙහි මදුරු උවදුර පාලනය කිරීමට විසඳුම් සෙවීම සඳහා ඒ සම්බන්ධ විද්වතුන් රැස්කොට සාකච්ඡා කිරීමට තීරණය කරන ලදි. එහි පළමු පියවර වශයෙන්, මෙම ක්ෂේත්‍රයේ නිපුනයන් හට ආරාධනා කොට සාකච්ඡා පවත්වා, ඒ මත ගත් තීරණයක් අනුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බල ප්‍රදේශය තුල මදුරු පාලනය සඳහා, නියමු ව්‍යාපෘතියක් ලෙස ප්‍රදාන සැලැස්මක් සෑදීමට තීරණය කරන ලදි.

මදුරු උවදුර දිනෙන් දින මානව සෞඛ්‍යට මෙන්ම රටෙහි සමාජ ආර්ථික තත්ත්වයන්ට තර්ජනාත්මක බලපෑමක් සිදුකරමින් පැතිරීම හේතුවෙන්, නව පාලන කාරකයන්/ ක්‍රමෝපායන් ඇතුලත් අනෙකුත් පරිසර හිතකාමී සහ කාර්යක්ෂම වාහක පාලන ප්‍රතිපත්ති තුලින් විශේෂයෙන් ඩෙංගු වාහක මදුරුවන් පාලනයට වැඩි අවධානයක් යොමුකළ යුතුව ඇත. මෙම තත්වය සැලකිල්ලට ගනිමින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්ෂේත්‍රයට අදාල විශේෂඥයින් / විද්‍යාඥයින් හා නියාමකයින් ඇතුලත් පාර්ශවකරුවන් සඳහා ශ්‍රී ලංකාවේ විද්‍යාඥයින් අතර මෑත කාලීනව කතාබහට ලක් වූ නව ජීව විද්‍යාත්මක පාලන ක්‍රමවේදයක් වන පිරිමි මදුරුවන් අතර වෝල්බැචියා (wolbachia) බැක්ටීරියාව පැතිරවීමේ පර්යේෂණ පිළිබඳව අවධානය යොමු කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාව තුල ඩෙංගු උවදුර පාලනය සඳහා වෝල්බැචියා බැක්ටීරියාව යොදාගැනීම පිළිබඳ වැඩමුළුවක් 2015.04.09 වන දින මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි.

### 5.4.7 ජාත්‍යන්තර පරිසර ඉගෙනුම් මධ්‍යස්ථානය

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය යටතේ විවිධ ඉලක්කගත කණ්ඩායම් සඳහා විවිධ තේමා අනුව, වැඩ සටහන් පවත්වාගෙන යාම සඳහා ජාත්‍යන්තර පරිසර ඉගෙනුම් මධ්‍යස්ථානය පිහිටුවන ලදි. 2015 වසර තුල, සහභාගිකයන් 37 දෙනෙක් සඳහා " පරිසර දූෂණ පාලන හා කළමනාකරණය " යන සහතික පත්‍ර පාඨමාලාව පවත්වන ලදි.

### 5.4.8 පාරිසරික කළමනාකරණය හා සැලසුම්කරණය සඳහා වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

මධ්‍යම පරිසර අධිකාරියට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර්ජාතිකව ලබාගන්නා වූ නැවුම් අත්දැකීම් හා පළපුරුදු සඳහා සම්මන්ත්‍රණ ඉතා වැදගත් වනු ඇත. ඒ අනුව, 2015 පෙබරවාරි 23 හා 24 යන දෙදින තුල පරිසර සංරක්ෂණය හා කළමනාකරණය සඳහා වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය බත්තරමුල්ල "වොටර්එජ් " හිදී පවත්වන ලදි. මෙහි ප්‍රධාන අරමුණ වූයේ පරිසර සංරක්ෂණය හා කළමනාකරණයට අදාල විද්‍යාඥයන් හා පර්යේෂකයන් එක් කොට ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් හා පළපුරුද්ද හා පාරිසරික අදහස් හුවමාරු කරගැනීමයි. ඒ අනුව, මෙම සම්මන්ත්‍රණය තුලදී පර්යේෂකයන් හා පරිසර වේදීන්ට ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් හා පළපුරුද්ද ඉදිරිපත් කිරීමට හා හුවමාරු කරගැනීමට අවස්ථාව උදා කරදෙනු ලැබීය. මෙම සම්මන්ත්‍රණයේ පර්යේෂණ පත්‍රිකා ඇතුලත් ජර්නලය පිළියෙල කරමින් පවතී.

### 5.4.9 නව කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම

මධ්‍යම පරිසර අධිකාරියේ නව කර්මාන්ත ස්ථානගත කිරීමේ ක්‍රියාවලිය තුලින් කර්මාන්තයන් නුසුදුසු ස්ථානයන්හි ස්ථානගත නොකිරීමට අවස්ථාව ලැබීම මෙන්ම වෙනත් ප්‍රතිලාභ ද අත්කරගෙන ඇත. අතීතයේ නුසුදුසු ස්ථානවල කර්මාන්ත ස්ථානගත කිරීම නිසා කර්මාන්ත සඳහා මෙන්ම, අවට පදිංචි ජනතාවට ගැටළු වලට මුහුණපෑමට සිදු වූ අවස්ථා ඇත.

2015 වසර තුල නව කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා පරිසර නිර්දේශ 1,278 ක් ලබාදී ඇත.

### **5.4.10 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

**2008.01.25 දිනැති හා 16/1533 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කර ඇති ලැයිස්තුගත ක්‍රියාකාරකම් පවත්වා ගැනීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමේ ක්‍රමවේදය මධ්‍යම පරිසර අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.**

**කර්මාන්ත මඟින් සිදුවන පරිසර දූෂණ තත්වයන් ප්‍රායෝගිකව අධ්‍යනය කිරීමෙන් අනතුරුව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගතයුතු නියමිත ක්‍රියාකාරකම් ගැසට් නිවේදනයේ කාණ්ඩ ''අ'' , ''ආ'' හා ''ඇ'' වශයෙන් ලැයිස්තු ගත කර ඇත. ඒ අනුව ''අ'' ඛණ්ඩයට අයත් මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත ද ''ආ'' ඛාණ්ඩයට අයත් මධ්‍ය පරිමාණ දූෂ්‍ය කාරක කර්මාන්ත ද ''ඇ'' ඛාණ්ඩයට අයත් සුළු පරිමාණ දූෂ්‍ය කාරක කර්මාන්තයන්ගෙන් ද මෙම ලැයිස්තුව සමන්විත වේ. ''අ'' සහ ''ආ'' ඛාණ්ඩයන්ට අයත් කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල මගින් ක්‍රියාත්මක වන අතර ''ඇ'' ඛාණ්ඩයට අයත් කර්මාන්ත සඳහා එම ක්‍රියාවලිය පළාත් පාලන ආයතන මගින් සිදු කරයි. ''අ'' සහ ''ආ'' ඛාණ්ඩවලට අයත් කර්මාන්තවල දත්ත පද්ධතිය ප්‍රාදේශීය කාර්යාල මගින් පවත්වා ගෙන යන අතර පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලියේ ලිපිගොනු හා බලපත්‍ර මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර ආරක්ෂණ පාලන අංශය මගින් පවත්වාගෙන යනු ලබයි.**

**2015 වසර සඳහා 'අ' කාණ්ඩයේ බලපත්‍ර 1549 ක් ද, 'ආ' කාණ්ඩයේ බලපත්‍ර 1274 ක් ද නිකුත් කර ඇත. තවද, 'අ' කාණ්ඩයේ බලපත්‍ර අළුත් කිරීම් 4,637 ක් ද, 'ආ' කාණ්ඩයේ බලපත්‍ර අළුත් කිරීම් 1,114 ක් ද නිකුත් කර ඇත.**

### **5.4.11 ලැයිස්තුගත කොට නැති ක්‍රියාකාරකම් සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම**

**''පුනරුදය '' ජාතික පාරිසරික වැඩ සටහනේ අරමුණු අංක 06 ට අනුව, ජාතික පාරිසරික පනතේ ලැයිස්තුගත කොට නැති ඒ අනුව, EIA / IEE අවශ්‍ය නොවන ව්‍යාපෘති සඳහා පරිසර නිර්දේශ නිකුත් කරනු ලැබේ. ව්‍යාපෘති යෝජකයින්ගේ ඉල්ලීම මත, අහිතර පාරිසරික බලපෑම් අවම කිරීමේ තත්වයන්ට යටත්ව, ලැයිස්තුගත කොට නැති ව්‍යාපෘති සඳහා පරිසර නිර්දේශ නිකුත් කරනු ලැබේ. ඒ අනුව, 2015 වසර තුල හෝටල්, දැව හෙලීම් හා ඉඩම් කට්ටි කිරීම ආදී වශයෙන් වූ ව්‍යාපෘතීන් 5,276 ක් සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කර ඇත.**

### **5.4.12 ජාතික හරිත සම්මාන වැඩ සටහන**

**" ජාතික හරිත සම්මාන " මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පරිසර හිතකාමී ලෙස කටයුතු කරන ව්‍යවසායකයන් හට පිරිනමනු ලබන එකම සම්මානය වේ. පරිසර හිතකාමී ලෙස පවත්වාගෙන යනු ලබන පුද්ගලික සහ රාජ්‍ය අංශයේ ව්‍යවසායකයන් ඇගයීම මෙම වැඩ සටහනේ මුඛ්‍ය පරමාර්ථය වේ. මෙම වැඩ සටහන හරිත ශ්‍රී ලංකාවක් කරා යන ගමනට මහඟු පිටිවහලක් වන අතර, කර්මාන්ත ප්‍රජාව පරිසර සුරැකීමේ මහඟු සත්කාරයට දායක කර ගැනීමේ ප්‍රායෝගික ක්‍රමයක් ද වේ. මෙහි මූලික පරමාර්ථය කර්මාන්තකරුවන් හා විවිධ සේවා සපයන්නන් පසුවිපරම් මත පදනම් වූ පරිසර දූෂණය පාලනය හා පරිසර කළමනාකරණ ක්‍රමෝපායන් සඳහා දිරිගැන්වීමත්, එමගින් පාරිසරික ප්‍රමිති හා උපමාන කරා ළඟාවීම මෙන්ම තිරසාර පරිසරයක් කරා කර්මාන්ත ප්‍රජාව රැගෙන යාමත් ය. 2015 ජාතික හරිත සම්මාන වැඩ සටහන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සිදුකරන ලදී. මෙහිදී රන් සම්මාන 06, රිදී සම්මාන 18, ලෝකඩ සම්මාන 13 ක් සහ කුසලතා සම්මාන 07 ක් ලබාදෙන ලදී.**

### 5.4.13 උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාලව රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ අංක 1534/18 හා 2008.02.01 හා 2008 අංක 01 දරණ රෙගුලාසි අනුව බලපත්‍ර 137 ක් 2015 වසර තුල නිකුත් කර ඇත.

- විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය

"පුනරුදය " ජාතික පාරිසරික වැඩ සටහනේ අංක 01 ලෙස හඳුනාගෙන ඇති විශේෂ පාරිසරික ගැටළුව අවම කිරීමේ ක්‍රියාවලියක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන 2009 වසරේ ආරම්භ කරන ලදි. ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපාංග සඳහා ඉහල ඉල්ලුමක් රට තුල පවතින නිසා එහි ප්‍රතිඵලයක් ලෙස විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සැලකිය යුතු මට්ටමකින් ඉහලයාමක් පසුගිය වසර කිහිපය තුල දී දක්නට ලැබිණි. මෙම අපද්‍රව්‍ය තුල අන්තරායකාරී ද්‍රව්‍ය ඇතුලත් වන බැවින් ඒවා පිළිබඳව නිසි අවධානයක් යොමුකළ යුතු වෙයි.

දිවයින තුල මෙම අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විවිධ ක්‍රියාමාර්ගයන් ආරම්භ කිරීමට පසුගිය වසර පහ තුලදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් පියවර ගෙන ඇත. රාජ්‍ය හා පෞද්ගලික අංශය එක්ව පැවති ජාතික විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන් හා විවිධ අංශ පදනම් කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන් මෙම පියවරයන්ට ඇතුලත් වෙයි.

විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම යටතේ 2015 වසර තුල ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩ සටහන් 04 ක් පැවැත්වූ අතර, මෙට්‍රික් ටොන් 06 කට අධික අපද්‍රව්‍ය ප්‍රමාණයක් එකතු කරන ලදි.

### 5.4.14 විමෝචන දත්ත ලේඛනය සැකසීම හා යාවත්කාලීන කිරීම

වාහන මඟින් සිදුවන වායු දූෂණය පාලනය කිරීම සඳහා වාහන මඟින් සිදුවන විමෝචන තත්වයන් පරීක්ෂා කිරීමේ වැඩ සටහන ආරම්භ කරන ලදි. මධ්‍යම පරිසර අධිකාරී නිලධාරීන් මාර්ග දෙපස විමෝචන තත්වයන් පසුවිපරම් කිරීම යම් යම් අවස්ථාවල සිදුකරනු ලබයි. මීට අමතරව, වාහන මඟින් සිදුවන වායු දූෂණය පාලනය සඳහා වාහන විමෝචන පරීක්ෂා කිරීමේ වැඩ සටහන හා වාහන දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන පසුවිපරම් කිරීම නිරන්තරයෙන් සිදුකරනු ලබයි.

වායු සම්පත් කළමනාකරණය කිරීමේ මූලික මෙවලම විමෝචන දත්ත ලේඛනය වන අතර, මධ්‍යම පරිසර අධිකාරිය 2011 වසර සඳහා විමෝචන දත්ත ලේඛනය 2014 වසර තුල පිළියෙල කරන ලදි. විමෝචන තත්වයන් පාලනය කිරීම සඳහා විමෝචන ප්‍රමාණය පාදක කරගෙන සියළු උප ඒකක සඳහා ප්‍රමුඛ ප්‍රභවයන් හඳුනාගෙන ඇත. 2011 විමෝචන දත්ත ලේඛනයේ ප්‍රබල වායු දූෂණ ප්‍රභවයන් පාලනය කිරීම සඳහා 2015 වසරේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කරන ලදි. තවද, 2015 වසර තුල විමෝචන ප්‍රමිතීන් සකසා අවසන් කරන ලදි.

### 5.4.15 ජල තත්ව පසුවිපරම් කිරීම

මධ්‍යම පරිසර අධිකාරිය රට පුරා පිහිටි කර්මාන්ත වල කාර්මික අපසන්දන පසුවිපරම් කිරීම, විශ්ලේෂණය කිරීම හා වාර්තා කිරීම කරනු ලබයි.

2015 වසර තුල මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය, පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය යටතේ, වානිජ කටයුතු යටතේ, දෛනික පසුවිපරම් යටතේ, නීතිමය අවශ්‍යතා මත මෙන්ම මතුපිට හා භූගත ජල තත්වයන් පරීක්ෂා කිරීම යටතේ නියැදි එකතු කර විශ්ලේෂණය කර ඇත. රට තුල පිහිටි කර්මාන්ත

පරීක්ෂා කරන ලද අතර, 2015 වසර තුල එක් එක් අවශ්‍යතා සඳහා නියැදි පරීක්ෂා කිරීම පහත වගුවේ පෙන්වයි.

| නියැදි රැස්කිරීමේ අරමුණ | රැස්කල නියැදි ගණන |
|---|---|
| නව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම / අළුත් කිරීම | **181** |
| නීතිමය අවශ්‍යතා සඳහා | **51** |
| පැමිණිලි විභාග කිරීම සඳහා | **123** |
| පසුවිපරම් කිරීම සඳහා | **128** |
| වෙනත් | **33** |
| වාණිජමය | **39** |
| මුළු | **447** |

- ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA) ආධාර මත ක්‍රියාත්මක වන ජල තත්ව පසුවිපරම් කිරීමේ ව්‍යාපෘතිය

මධ්‍යම පරිසර අධිකාරිය, පරිසරය ආරක්ෂා කිරීම හා කළමනාකරණය සඳහා ඇති ප්‍රධාන නියාමන ආයතනය ලෙස කැළණි ගඟ සඳහා ජල තත්ව පසුවිපරම් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ මූල්‍ය ආධාර ලබාගෙන ඇත.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ, ජල තත්ව මත පදනම්ව කැළණි ගඟ වර්ගීකරණයට ලක් කිරීම, දූෂණ ප්‍රභවයන් හඳුනා ගැනීම, දූෂණ ප්‍රභව දත්ත ලේඛනය (Pollution source Inventory) පිළියෙල කිරීම හා ජල තත්ව පසුවිපරම් කිරීමට අදාල මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීමයි.

2015 වසර තුල, මෙම ව්‍යාපෘතියට අදාල නියැදි සහ පරීක්ෂණ මාර්ගෝපදේශ සකස් කර ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් 12 ක් සඳහා " ජල තත්ව කළමනාකරණය'' සම්බන්ධ විදේශීය පුහුණුවක් ලබාදී ඇත.

- මතුපිට ජල තත්ව පසුවිපරම් කිරීම

මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය ජල තත්ව පසුවිපරම් කිරීම සිදුකරනු ලබයි. මා ඔය, දඹුගම් ඔය, බෙන්තොට ගඟ හා කැළණි ගඟ යන ජල ප්‍රභවයන්ගෙන් නියැදි ලබාගත් අතර, එකී නියැදීන්ගේ භෞතික, රසායනික හා ජෛවීය ගුණාංග පරීක්ෂා කරනු ලබයි. 2015 වසර තුල එක් එක් ජල ප්‍රභවයන්ගෙන් ලබාගත් නියැදි පිළිබඳ විස්තර පහත වගුවෙන් දැක්වේ.

| ජල ප්‍රභවයේ නම | නියැදි පිහිටීම් ගණන | 2015 වසර තුල ලබාගත් නියැදි ගණන |
|---|---|---|
| මා ඔය | **08** | **74** |
| දඹුගම් ඔය | **06** | **71** |
| බෙන්තොට ගඟ | **06** | **70** |
| කැළණි ගඟ | **12** | **146** |

### 5.4.16 ජාතික රුක්රෝපණ වැඩ සටහන "වනරෝපා "

"පුනරුදය" අරමුණු අංක 02 අනුව, වන සම්පත් හා එහි සංවර්ධනය රටෙහි තිරසාර පැවැත්ම සඳහා වැදගත්ය. ඒ අනුව, "වනරෝපා " රුක්රෝපණ වැඩ සටහන යටතේ දිවයිනේ සියළු පාසල් වල පළතුරු පැල සිටුවන ලදි. තවද, පොළොන්නරුව, මැදිරිගිරිය ජාතික පාසලෙහි පැල 400 ක් සහිත අක්කරයක වන ප්‍රදේශයක් ඇතිකරන ලදී.

### 5.4.17 ලෝක පරිසර දිනය සැමරීම

2015 ලෝක පරිසර දිනය 2015 ජුනි 05 වන දින පොළොන්නරුව වටදාගෙහි දී " තිරසර පරිසරය - සුරකී මිහිතලය" යන තේමාව යටතේ සමරන ලදි. මීට සමාන්තරව මැදිරිගිරිය රාජකීය විද්‍යාලයේ දී ප්‍රදර්ශනයක් පවත්වන ලදි.

### 5.4.18 පැමිණිලි මෙහෙයවීම

මධ්‍යම පරිසර අධිකාරිය ලබාදෙන සේවාවන් සම්බන්ධව හෝ පැමිණිලි මෙහෙයවීමේ ක්‍රියාමාර්ග සම්බන්ධව ප්‍රජාවක සාමාජිකයෙකු / සාමාජිකයින් දක්වන අකමැත්ත පැමිණිල්ලක් ලෙස හැඳින්විය හැකිය.

2015 වසර තුල පැමිණිලි මෙහෙයවීමේ මෘදුකාංගය හා මහජන පැමිණිලි විසඳීමේ ඵලදායිතාව දියුණු කිරීමේ ක්‍රමවේදය පිළිබඳ අධ්‍යයනයක් සිදුකරන ලදි. ඒ අනුව, මධ්‍යම පරිසර අධිකාරිය පැමිණිලි මෙහෙයවීමේ ඵලදායිතාව සහ දායකත්වය වැඩි කිරීම සඳහා පුනරුදය ජාතික පාරිසරික ආරක්ෂණ වැඩ සටහන අනුව, ජාලගත පැමිණිලි ක්‍රමවේදයක් ආරම්භ කර ඇත.

2015 වසර තුල මධ්‍යම පරිසර අධිකාරියට පැමිණිලි 2,722 ක් ලැබී ඇති තර, එයින්, 1,747 කට විසඳුම් ලබා දී ඇත.

### 5.4.19 " පිළිසරු" ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය

මෙය "පුනරුදය" ජාතික පරිසර සංරක්ෂණ වැඩ සටහනේ අරමුණු අංක 01 හා බැඳේ.

මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පළාත් පාලන ආයතන සඳහා රටතුල නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය ඵලදායීව හා කාර්යක්ෂමව ආරම්භ කර ප්‍රවර්ධනය කිරීමේ පහසුකම් සැපයීමේ අරමුණින් පිළිසරු ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය 2008 වසරේදී ආරම්භ කරන ලදි.

2015 වසර තුල පිළිසරු වැඩ සටහන යටතේ කැළණිය හා රුහුණු විශ්ව විද්‍යාල භූමියන්හි කොම්පෝස්ට් අංගන දෙකක් ඉදි කරන ලදි. තවද, දඹුල්ල, වැලිමඩ, මාතලේ හා කල්මුණේ යන පළාත් පාලන ආයතනයන් හි කොම්පෝස්ට් අංගන ඉදි කිරීම් ආරම්භ කර ඇත. මාතලේ නගර සභාව යටතේ කසළ දාහකයක් ද ඉදි කරමින් පවතියි.

වැලිමඩ, හොරකැලේ, මල්බෙරි තැන්න යන ජාතික පසු සම්පත් මණ්ඩලයට අයත් ගොවිපල භූමියන්හි සහ මාටින් ගොවිපල පුත්තලම, තලෙයිමන්නාරම නාවික හමුදා කඳවුර හා තබුත්තේගම මහවැලි ගොවිපල යන ස්ථාන 06 හි ජීව වායු ඒකක ඉදිකිරීම ආරම්භ කර ඇත.

බස්නාහිර පළාතෙහි මහජන සෞඛ්‍ය පරීක්ෂණ කාර්යාල 125 ක් සඳහා ''සම්පත් පියස'' නම් කසළ එකතු කිරීමේ ඒකක 125 ක් ලබා දෙන ලදි. තවද, 2015 වසර තුල මධ්‍යම පරිසර අධිකාරිය ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධන ආයතනය හා එක්ව වැඩිදියුණු කළ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් බස්නාහිර පළාත තුල ආරම්භ කරන ලදි.

### 5.4.20 ''ග්‍රීන් පාක්'' කසළ කළමනාකරණ මධ්‍යස්ථානය

කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය මඟින් ''ග්‍රීන් පාක්'' සනීපාරක්ෂක බිම් පිරවුමක් මාලිගාවත්ත කිරිදිවල ආරම්භ කර ඇත. මෙම බිම් පිරවුම දෛනිකව දොම්පේ ප්‍රාදේශීය සභාවේ මෙ.ටො. 5 – 90 දක්වා කසළ ප්‍රමාණයක් බැහිර කිරීමට සැලසුම් කර ඇත. මෙම බිම් පිරවුමට අමතරව, පිළිසරු ව්‍යාපෘතියේ මූල්‍ය හා තාක්ෂණික ආධාර මත කොම්පෝස්ට් අංගනයක් ද එහි ඉදිකර ඇත.

2015 මැයි සිට දෙසැම්බර් දක්වා මෙ.ටො. 1500 කට ආසන්න කසළ ප්‍රමාණයක් ග්‍රීන් පාක් වෙත ලැබී ඇති අතර එමඟින් දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මෙතෙක් පැවති අක්‍රමවත් කසළ බැහැර කිරීමට පිළියම් ලබා දී ඇත.

### 5.4.21 පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

ප්ලාස්ටික් / පොලිතීන් නිසි ලෙස බැහිර කිරීම විදිමත් කිරීම තුලින් රටෙහි හරිත පාරිසරික දර්ශන ලඟා කර ගැනීමට ජතික පසු භාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.

මහනුවර ගොහාගොඩ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය 2015 ඔක්තෝම්බර් 12 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදි.

2015 වසර තුල, සහභාගිකයන් කසළ කළමනාකරණය සම්බන්ධව දිරිමත් කිරීමේ අරමුණින් දැනුවත් කිරීමේ වැඩ සටහන් 72 ක් පවත්වා ඇති අතර, ඒ සඳහා පාසල් සිසුන්, රාජ්‍ය හා පළාත් පාලන ආයතනයන්හි කාර්ය මණ්ඩල නියෝජිතයන් හා කසළ එකතු කරන්නන් සහභාගී වී ඇත. මෙම දැනුවත් කිරීමේ වැඩ සටහන් තුල පත්‍රිකා 60,000 ක්, සටහන් පත්‍ර (Dockets) 50,000 ක් බෙදා දී ඇත.

ප්ලාස්ටික් අපද්‍රව්‍ය ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ ඉදිකර ඇත.

තවද, ශ්‍රී පාද, කතරගම, තලවිල හා අනුරාධපුර සංස්කෘතික අවස්ථාවන්හිදී කසළ කළමනාකරණ වැඩ සටහන් පවත්වා ඇත.

නුවරඑළිය නගර සභාවෙහි ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ආදර්ශනයක් ඉදිකර ඇති අතර යාපනය ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය ඉදි කරමින් පවතී. තවද ප්ලාස්ටික් අපද්‍රව්‍ය කැබලි කිරීමේ යන්ත්‍ර ද, පොලිතීන් කැබලි කිරීමේ යන්ත්‍ර ද නුවරඑළිය හා යාපනය නගර සභා සඳහා ලබා දී ඇත.

### 5.4.22 ජාතික පරිසර නියමු වැඩ සටහන

මෙය ''පුනරුදය'' ජාතික පරිසර සංරක්ෂණ වැඩ සටහනෙහි අරමුණු අංක 05 හා සම්බන්ධවය.

මධ්‍යම පරිසර අධිකාරිය විවිධ පාරිසරික වැඩ සටහන් සංවිධානය කරන අතර, ඒවා පාසල් ළමුන් සඳහා හඳුන්වා දෙනු ලබයි. ජාතික පරිසර නියමු වැඩ සටහන මේ සම්බන්ධව ඇති ප්‍රධාන වැඩ සටහනක්ය. පරිසර නියමු වැඩ සටහන පිරිසිදු හා හරිත පරිසරයක් වෙනුවෙන් පාසල් ළමුන් සඳහා අගයන්, හැසිරීම

සහ ආකල්ප වැඩි දියුණු කිරීම වෙනුවෙන් හඳුන්වා දී ඇත. පරිසර නියමුවන්, පරිසරය සුරකීම හා සංරක්ෂණයේ ක්‍රියාකාරී මැදිහත්වීම ඉතා වැදගත් වේ.

ජාතික පරිසර නියමු වැඩ සටහන යටතේ ජනාධිපති පදක්කම් ප්‍රධානෝත්සවය 2015 ඔක්තෝබර් 22 දින අතිගරු ජනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති මන්දිරයේ දී පවත්වන ලදි.

2015 වසර සඳහා ජනාධිපති පදක්කම් 37 ක්ද ස්වර්ණ 267 ක්ද රජත පදක්කම් 1,337 ක්ද හරිත පදක්කම් 5,229 ක්ද පරිසර නියමු පදක්කම් 20,463 ක්ද ඔවුන්ගේ පාරිසරික ලගා කර ගැනීම් වෙනුවෙන් පිරිනමා ඇත.තවද, ජනාධිපති පදක්කම්ලාභීන් 16 දෙනෙකු සඳහා විදේශීය පුහුණුවක් ඉන්දියාවේදී ලබාදෙන ලදි.

### 5.4.23 මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය ශක්තිමත් කිරීම

පළාත් මට්ටමින් රසායනාගාර සේවාවන් ලබා දීමටත් කාර්මික අපවාහන පරීක්ෂා කිරීමටත්, ඌව, උතුරුමැද, වයඹ, උතුර, දකුණ යන පළාත් තුල සහ ගම්පහ දිස්ත්‍රික්කය තුල රසායනාගාර ස්ථාපනය කරන ලදි.

"පුනරුදය" විෂය අංක 6, ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම හා සංවර්ධනය යටතේ ප්‍රාදේශීය රසායනාගාර සඳහා උපකරණ බෙදාදෙන ලදි.

## 5.4.24 අමාත්‍ය මණ්ඩල සංදේශ - 2015

| අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය (යොමුකළ දිනය) | ශීර්ෂය | අමාත්‍ය මණ්ඩල තීරණය | වර්තමාන තත්වය |
|---|---|---|---|
| අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය 15/1727/704/010<br><br>දිනය 2015.10.14 | ජාතික පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය 2016 – 2018 දක්වා දීර්ඝ කිරීම | (i) මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණ සැලකිල්ලට ගෙන, එහි සඳහන් පරිදි, ප්‍රථම කොට,ව්‍යාපෘතිය පිළිබඳ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කොට එහි ප්‍රතිඵල, සලකා බැලීම පිණිස, ඇමතිතුමා මාර්ගයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් දීම ;<br><br>(ii) ප්ලාස්ටික් ආනයනය මත පනවා ඇති සෙස් බදු ආදායමෙන් යම් ප්‍රතිශතයක්, කාබනික පොහොර ව්‍යාපෘති ඇතුළුව, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින කුඩා පරිමාණ කසළ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘති වැඩි දියුණු කිරීමට සහ එවැනි ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා යොදා ගැනීම පිණිස පළාත් පාලන ආයතන වලට වෙන් කරදීමේ හැකියාව සොයා බලන ලෙස මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටීම ; සහ<br><br>(iii) පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමාගේ ද සහාය ඇතිව, ඉහත (ii) හි සඳහන් පරිදි පළාත් පාලන ආයතන විසින් නිපදවන කාබනික පොහොර, රජයේ පොහොර සහනාධාර වැඩ සටහන යටතේ ගොවීන් වෙත ලබාදීමේ හැකියාව සොයා බලන ලෙස කෘෂිකර්ම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටීම. | තීරණ අංක 01 අනුව, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් ආරම්භ කර ඇත. |

## 5.4.25 මූල්‍ය ඇස්තමේන්තුව සහ ප්‍රගතිය - 2015

රු. 000'

| | මූල්‍ය ඇස්තමේන්තුව 2015 | 2015.12.31 දක්වා වියදම | % |
|---|---|---|---|
| පුවරාවර්තන | භාණ්ඩාගාර 528,800<br>ම.ප.අ. ආදායම 198,899 | 709,678 | 98% |
| ප්‍රාග්ධන | 66,000 | 50,640 | 77% |
| ව්‍යාපෘති | | | |
| පිළිසරු ව්‍යාපෘතිය | 279,475 | 173,218 | 62% |
| පසුභාවිත ප්ලාස්ටික් ව්‍යාපෘතිය | 50,000 | 45,361 | 91% |
| පරිසර නියමු වැඩ සටහන | 30,000 | 25,226 | 84% |
| මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | 30,000 | 30,008 | 100% |
| ජල තත්ව පසුවිපරම් ව්‍යාපෘතිය (JICA) | 31,500 (දේශීය5,000, විදේශීය 26,500) | 21,385 | 68% |
| EDCF ව්‍යාපෘතිය | 392,000 (දේශීය 92,000 විදේශීය 300,000) | 15,681 | 17% |

## 5.5 සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

### 5.5.1 ආයතනයේ ධාරිතා වර්ධනය

දින 100 වැඩසටහන යටතේ යාපනය දිස්ත්‍රික්කය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය 2015 දී ආරම්භ කරන ලදී. ඒ අනුව ආයතනයේ ප්‍රාදේශිය කාර්යාල සංඛ්‍යාව 10 දක්වා වර්ධනය වී ඇති අතර ආයතනයේ කටයුතු ශ්‍රී ලංකාවේ වෙරළබඩ දිස්ත්‍රික්ක 14න් 10කම මේවනවිට ක්‍රියාත්මක වේ.

### 5.5.2 හදිසි තෙල් විසිරීම පිළිබඳ ජාතික සැලැස්ම ක්‍රියාවට නැංවීම

ශ්‍රී ලංකා ජල තීරයේ සිදුවන හදිසි තෙල් විසිරීම් වලින් වන පාරිසරික හානිය අවම කර ගනිමින් කඩිනම් ප්‍රතිචාර දැක්වීම සඳහා හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැලැස්ම, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. 2015 වසරේදී මෙහි අඩංගු තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් රැස්වීම් සංවිධානය කරන ලදී.
2015 මැයි 14, 15 දින වල හදිසි තෙල් විසිරීමකදී හා රසායනික ද්‍රව්‍ය විසිරීමකදී ප්‍රතිචාර දැක්වීම පිළිබඳ දෙදින වැඩමුළුවක් තෙල් හා රසායන ද්‍රව්‍ය වලට අදාළ ආයතනයන් හා තෙල් විසිරීම් පාලනය සඳහා කටයුතු කරන ආයතන වල නිලධාරීන් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේදී පවත්වන ලදී.
2015 ඔක්තෝම්බර් 28,29 හා 30 දින වල හදිසි තෙල් විසිරීමේ ජාතික සැලැස්මට අදාළ සිද්ධි කළමණාකරන කමිටු සාමාජිකයින් සඳහා සිද්ධි විධාන පද්ධතිය පිළිබඳ තෙදින වැඩමළුවක් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී.





සිද්ධි කළමණාකරන කමිටු සාමාජිකයින්සඳහා සිද්ධි විධාන පද්ධතිය පිළිබඳ වැඩමළුව

### 5.5.3 සමුද්‍ර දූෂණය අවම කිරීම


- නැව් වලින් ජනනය වන අපද්‍රව්‍ය ඉවත් කිරීම

නැව් වලින් ජනනය වන දැවි තෙල් හා අපද්‍රව්‍ය නිසි පරිදි අපහරණය කිරීම සඳහා ඉවත් කිරීම 2015 වසර පුරාවට කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය හා හම්බන්තොට වාණිජ වරායන් වලදී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අධීක්ෂණය යටතේ ලියාපදිංචි ආයතන 28ක් මගින් සිදු කරන ලදී. 2015 වසර තුල නෞකා 1308 ක අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය බලපත්‍ර නිකුත් කර ඇත.





2014 හා 2015 වසර වල බලපත්‍ර නිකුත් කිරීම

| වර්ගය | ප්‍රමාණය ($m^3$) |
|---|---|
| දැවිතෙල් | 24,911.547 |
| ඝණ අපද්‍රව්‍ය | 6,441.438 |
| මළ අපද්‍රව්‍ය | 125 |





2015 ඉවත් කල අපද්‍රව්‍ය ප්‍රමාණය




2014 හා 2015 දී බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම

නැව් වලින් තවත් නැව් වලට ඉන්ධන සැපයීම (බංකරින්)සේවාව සැපයීමේදී සිදුවිය හැකි සමුද්‍ර දූෂණය අවම කිරීම සඳහා එම ආයතන ලියාපදිංචි කර අදාළ මඟ පෙන්වීම මත ආයතනයේ රෙගුලාසි වලට අනුව එම සේවාව සැපයීම සිදු කිරීමට කටයුතු කරනු ලබයි. 2015 වසරේදී මේ සඳහා ආයතන 08ක් ලියාපදිංචි විය.




**2014 හා 2015 වසර වල සිදුකර ඇති බංකර මෙහෙයුම් ප්‍රමාණය**

- **මුහුදට අපද්‍රව්‍ය ඉවත දැමීම සඳහා අවසරපත් නිකුත් කිරීම**

**මුහුද ආශ්‍රිත කර්මාන්ත ශාලා, හෝටල් වැනි ආයතන මගින් මුහුදට අපජලය මුදා හැරීම නිසා සිදුවන සමුද්‍ර දූෂණය පාලනය සඳහා එම අපද්‍රව්‍ය අධිකාරියේ රෙගුලාසි වලට අනුකූල වන පරිදි පිරිපහදු කිරීමෙන් පසු පමණක් මුහුදට මුදා හැරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සිදුකරනු ලබයි. මේ සඳහා වසර පුරා අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබන අතර 2015 දී බලපත් 40ක් නිකුත් කර ඇත.**



**මුහුදට පිටකරන අපජලයේ සාම්පල් ලබා ගැනීම**

- **මාර්පෝල් (MARPOL) ඇමුණුම් 5 හා 6 පිළිබඳ වැඩමුළු පැවැත්වීම**

**නැව් වලින් සිදුවන සමුද්‍ර දූෂණය සඳහා වන ජාත්‍යන්තර සම්මුතියක් වන MARPOL සම්මුතියේ 5වන ඇමුණුම වන නැව් වලින් ජනනය වන අපද්‍රව්‍ය වලින් වන දූෂණය අවම කිරීම පිළිබඳ දෙදින වැඩමුළුවක් 2015 ඔක්තෝම්බර් මස 5 හා 6 දින වල සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සංවිධානයෙන් පවත්වන ලදී. මේ සඳහා ශ්‍රී ලංකාවේ අදාළ සියළුම පාර්ශවකරුවන් සහභාගී විය.**




නැව් වලින් සිදුවන වායු දූෂණයට අදාළMARPOL සම්මුතියේ 6 වන ඇමුණුම පිළිබඳ කලාපීයසමුළුවක් අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානයේ (IMO) සහයෝගීතාවය මත 2015 ජූනි මස 16,17 සහ 18 දිනවල කොළඹදී පවත්වන ලදී. ඒ සඳහා ඉන්දියාව, බංගලාදේශය, පකිස්ථානය, ඉරානය, ෂී ෂෙල්ස්, මොරිෂස් හා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නියෝජිතයන් සහභාගී විය.

- දැනුවත් කිරීමේ වැඩසටහන්

සමුද්‍ර පරිසරයේ වැදගත්කම හා එය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් වසර පුරා පවත්වන ලදී.

දිවයින වටා වෙරළබඩ කලාපයේ ස්ථාපිත කර ඇති පාසල් සමුද්‍ර කණ්ඩායම් 245ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 185ක් 2015 වසරේදී පවත්වන ලදී. නිල් සයුරින් මතුවන නිල් ආර්ථිකය යන තේමාව යටතේ දීප ව්‍යාප්තව පාසල් සිසුන් සඳහා පවත් වනලද ගද්‍ය රචනා, පද්‍ය රචනා සහ චිත්‍ර තරඟය සංවිධානය කර ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග සහ සහතික පත් ප්‍රධානය කරන ලදී. ත්‍රෛමාසිකව ප්‍රකාශයට පත් කරනු ලබන සමුදුරු පුවත් සඟරාව හා වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන සත් සමුදුර සඟරාව ද 2015 වසරේදී ද ප්‍රකාශයට පත් කරන ලදී.



ජූනි 08 වන දිනට යෙදුන ජගත් සාගර දිනය සැමරීමේ ජාතික උත්සවය 2015 ජූනි 08 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී අධිකාරියේ සංවිධානය යටතේ පවත්වන ලද අතර එහිදී ද ජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදු කරන ලදී.




ජගත් සාගර දිනය 2015

වසර දෙකකට වරක් පවත්වන ජාතික සමුද්‍ර පාරිසරික විද්වත් සමුළුව 2015 නොවැම්බර් 18 හා 19 දින වල ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සංවිධානයෙන් සමුද්‍රය සම්බන්ධ විද්වතුන් රාශියකගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. වැදගත් පර්යේෂණ පත්‍රිකා රාශියක් මෙහිදී ප්‍රකාශයට පත් කරන ලද අතර සාගර පරිසරය ආශ්‍රිත පර්යේෂකයින්ගේ එකමුතුවන් ඇති කිරීමේ වැඩපිළිවෙලක් ද මෙහිදී ආරම්භ විය.




විද්වත් සමුළුවේ අවස්ථාවක්

- අන්තර්ජාතික වෙරළ පිරිසිදු කිරීමේ දිනය

අන්තර්ජාතික වෙරළ පිරිසිදු කිරීමේ දිනය සෑම වසරකම සැප්තැම්බර් මස තුන්වන සෙනසුරාදා පැවැත්වෙන අතර 2015 වසර සඳහා ශ්‍රී ලංකාව වටා සියළු වෙරළබඩ දිස්ත්‍රික්ක 14 ක්ආවරණය වන පරිදි දින පහක් පුරා පැවැත්වීමට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය කටයුතු සංවිධානය කරන ලදී. 2015 සැප්තැම්බර් 19 වන දින ප්‍රධාන උත්සවය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගාලු මුවදොරදී පැවැත්වුන අතර අනෙක් පළාත් මට්ටමින් වැඩසටහන් පහත දින වල පවත්වන ලදී.

| දිනය | පළාත |
|---|---|
| සැප්තැම්බර් 19 | බස්නාහිර පළාත |
| සැප්තැම්බර් 20 | වයඹ පළාත |
| සැප්තැම්බර් 21 | උතුරු පළාත |
| සැප්තැම්බර් 22 | නැගෙනහිර පළාත |
| සැප්තැම්බර් 23 | දකුණු පළාත |

## **5.5.4** මූල්‍ය වෙන් කිරීම සහ ප්‍රගතිය – *2015*

| | මූල්‍ය ප්‍රතිපාදන- 2015 | සත්‍ය වියදම | ප්‍රතිශතය |
|---|---|---|---|
| | | | |
| පුනරාවර්තන | 127,684 | 115,172 | 90% |
| ප්‍රාග්ධන | 60,000 | 27,505 | 46% |
| ව්‍යාපෘති | | | |
| හරිත ධීවර වරාය ව්‍යාපෘති | 10,000 | 0 | 0 |
| බැලැස්ට් ජල කළමනාකරණ ව්‍යාපෘති | 3000 | 0 | 0 |





වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනේ අවස්ථා

## 5.6 ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

### 5.6.1 පරිසර හිතකාමී මැණික් ගැරීමේ ක්‍රමවේදයන් පවත්වා ගෙන යාම.

මැණික් ගැරීම සඳහා පහත නම් සඳහන් භූමි වෙන්දේසි කර ඇත

- හුණුවල දෙමළ විද්‍යාලයීය ඉඩම
- කොකිස් අච්චු පාලම් ටෙන්ඩරය
- මාඔය පොට්ටනියාර ඉඩම් වෙන්දේසිය
- දඹුල්ල මයිලැත්තැව ටෙන්ඩරය.
- බගවන්තලාව ඉඩම් වෙන්දේසිය

අතිශය පාරිසරික සංවේදී ස්ථාන වල නිධිගතව ඇති මැණික් සම්පතට ආර්ථික වටිනාකමක් ලබා දීම සඳහා විශේෂ මැණික් ගැරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම යටතේ ,

- පොරණුවත්ත මැණික් ඉඩම් වෙන්දේසිය

| වෙන්දේසි ආදායම රු.මිලියන | අධිකාරි ආදායම රු.මිලියන |
|---|---|
| 3,800,000.00 | 2,117,759.92 |

- බගවන්තලාව මැණික් ඉඩම් වෙන්දේසිය

| වෙන්දේසි ආදායම රු . මිලියන | අධිකාරි ආදායම රු . මිලියන |
|---|---|
| 237,280,000.00 | 141,457,323.15 |

- ✓ පරිසර හිතකාමී මැණික් පතල් කැපීම සම්බන්ධ දැනුවත් කිරිමේ වැඩ සටහන් පැවැත්වීම.
- ✓ තිරසාර මැණික් පතල් කර්මාන්තයක් හඳුන්වා දෙනු වස් සිදුකරනු ලබන පර්යේෂණ සහ තක්ෂණික නව්‍යතාවයන් හඳුන්වා දීම යටතේ මැණික් පතල් ආශ්‍රිත ප්‍ර දේශ වල මදුරුවන් මඟින් බෝවන රෝග ව්‍යාප්තිය සම්බන්ධන පර්යේෂණයක් පැවැත්විම.
- ✓ කතරගම තම්මැන්නාව ප්‍රදේශයේ මැණික් පතල් කැපීම නිසා හානි වි ඇති ප්‍රදේශ යථා තත්වයට පත් කිරිම සහ පතල්වලවල් වැසීම.

### 5.6.2 මැණික් සහ ස්වර්ණාභරණ සඳහා ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත වෙළඳපළ අවස්ථා ජය ගැනීම දැනුවත් කිරිමේ වැඩ සටහන් හා ප්‍රදර්ශන



- ජාත්‍යන්තර ප්‍රදර්ශන.

1. චීනයේ බිජිං නුවර පැවැති ජාත්‍යන්තර ස්වර්ණාභරණ වෙළඳ ප්‍රදර්ශනය සඳහා නොවැම්බර් 13 සිට 17 දක්වා සහභාගි වීම
2. 2015 ජනවාරි මස 21 – 24 දක්වා ලන්ඩන් නුවර පැවති ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය සඳහා සහභාගිවීම
3. 2015 මැයි 6-10 දක්වා චීනයේ ෂැංහයි නුවර පැවති වෙළඳ ප්‍රදර්ශනය සඳහා සහභාගිවීම
4. 2015 මැයි 29 සිට ජූනි 1 දක්වා JCK ලාස්වේගාස් ප්‍රදර්ශනය සඳහා සහභාගිවීම
5. 2015 ජූලි 2 – 5 දක්වා සිංගප්පූරුවේ පැවති ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය සඳහා සහභාගිවීම




දේශීය ප්‍රදර්ශන

1. 2015 පරිසර දිනයට සමගාමීව පොළොන්නරුව මැදිරිගිරිය මධ්‍ය මහා විද්‍යාලයේ පැවැති පරිසර දින ප්‍රදර්ශනය සඳහා සහභාගි වීම .
2. ජාත්‍යන්තර වර්ණ මැණික් ගල් සංගමයේ වාර්ෂික සමුළු රැස්වීමට සමගාමී ලෙස ප්‍රදර්ශනයක් සංවිධානය කිරිම .

### *5.6.3 ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් සහ උසස් තාක්ෂණයෙන් යුතු මැණික් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.*

I. කොළඹ ස්ථාපිත කරන ලද රන් මධ්‍යස්ථානයේ විකුණන ලබන මැණික් සහතික කිරිම මඟින් පාරිභෝගික විශ්වාසය ඉහළ නංවමින් පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරිමත් අරමුණු කරගනිමින් නව රසායනාගාරයක් රන් මධ්‍යස්ථානයේ ස්ථාපිත කිරිම සහ එහි සේවාවන් ආරම්භ කිරිම.

II. චීනයේ පවත්වනු ලබන මැණික් ප්‍රදර්ශන වලදී ශ්‍රී ලාංකික මැණික් වලට ඇති ඉල්ලුම ඉහළ නැංවීම සහ පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරිමේ අරමුණින් එම ප්‍රදර්ශනවල රසායනාගාර සේවාවන් පවත්වා ගෙන යාම.

III. ජාත්‍යන්තර මට්ටමේ මැණික් පරික්ෂා කිරිමේ සහ සහතික පත්‍ර නිකුත් කිරිමේ රසායනාගාරයක් ආරම්භ කිරිමට අදාල භාණ්ඩ මිලදි ගැනිම් සහ සේවක මණ්ඩල පුහුණු කිරිම් සිදු කිරිම.

IV. රසායනාගාර සහතික පත්වල ගුණාත්මකභාවය ඉහළ නැංවිමේ අරමුණින් FTIR යන්ත්‍රය භාවිතා කරමින් කුරුවින්ද කුලයේ මැණික් ගල් සඳහා තාප පිරියම් කල/නොකල බව සඳහන් කරමින් සහතික පත් නිකුත් කිරිමට ආරම්භ කිරිම.

V. දින 100 වැඩ සටහනට සමගාමී ලෙස මැණික් පරීක්ෂා කිරීමේ කාර්යය සංග්‍රහයක් සකස් කිරීම





### 5.6.4 විදේශිය වෙළඳපලට පිවිසිමට අපේක්ෂිත ආයෝජකයින් සඳහා අත දීම.

**1.** 2015 වර්ෂයේ මැයි මස 16 වන දින සිට 19 වන දක්වා කාලය තුල වර්ණ මැණික් ගල් සංගමයේ වාර්ෂික සමුළුව ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී

**2.**පහත සඳහන් සඟරාවන් තුළ දැන්වීම් පළ කර ඇත.

- සෙරන්ඩිබ්
- "රීඩ් ලංකා" සඟරාව
- SLT රේනෝබෝ පේජස් -සංචාරක නාමාවලිය

**3.**ස්වර්ණාභරණ නිශ්පාදනවල රන් ප්‍රමාණය නිශ්වය කිරීම තුළින් ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රමිතීන් වැඩි දියුණු කළ හැකි පරිදි නෛතිකව බලාත්මක කල හැකි ක්‍රමවේදයක් අත්පත් කර ගැනීම.




- ✓ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) සමඟ සාකච්ඡා පැවැත්වීම සහ එම යෝජනා මත ප්‍රමිතින් දියුණු කිරීම සඳහා පියවර ගෙන ඇත.
- ✓ දින100 වැඩසටහන යටතේ ශ්‍රහස්ථ පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම
- ✓ ස්වර්ණාභරණ වෙළඳසලක් පවත්වා ගෙන යායුතු ප්‍රමිතිය සම්බන්ධව මාර්ගෝපදේශ මාලාවක් සකස් කරන ලදී .
- ✓ වටිනා ලෝහ පිළිබඳ පාරිභෝගික ආරක්ෂණය තහවුරු කිරිම

**4.** කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් සහ සුළු කර්මාන්ත

16 වන ජාත්‍යන්තර වර්ණ මැණික්ගල් කොංග්‍රස් වාර්ෂික මහා සභා රැස්වීමට සමගාමීව පවත්වන ලද ජුවෙල්ස් ප්‍රදර්ශනයේ දී කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් සඳහා ප්‍රදර්ශන කුටි 30 ක් ලබා දෙන ලදී

### *5.6.7* ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ගිණුම් *:*

රු.මි

| වර්ෂය | ආදායම | වියදම | බදුවලට පෙර ලාභය |
|---|---|---|---|
| **2010** | 228 | 262 | -34 |
| **2011** | 250 | 222 | 28 |
| **2012** | 612 | 261 | 351 |
| **2013** | 507 | 386 | 121 |
| **2014** | 679 | 364 | 315 |
| **2015** | 716 | 372 | 344 |

## 5.7 රාජ්‍ය දැව සංස්ථාව

### 5.7.1 වාර්ෂික ප්‍රගති සමාලෝචන වාර්තාව සහ ගිණුම් - 2015

| | අයවැය ගත රු. | තථ්‍ය රු. | % |
|---|---|---|---|
| ශුද්ධ ආදායම | 3,860,305,000 | 3,986,338,322 | 3.3 |
| වියදම | 3,756,745,000 | 3,502,836,280 | (6.8) |
| ප්‍රාග්ධන වියදම | 237,231,000 | 226,475,071 | (4.5) |

භෞතික ප්‍රගතිය

| | ඒකකය | අයවැයගත | තථ්‍ය | % |
|---|---|---|---|---|
| කඳන් | ඝ.මී | 115,651 | 126,465 | 9.4 |
| ඉරූ දැව | ඝ.මී | 5,431 | 4,044 | (25.5) |
| ආනයනික දැව | ඝ.මී | 3,000 | 518 | (82.7) |
| විදුලි සම්ප්‍රේෂණ කණු | සංඛ්‍යාව | 33,120 | 21,636 | (34.7) |
| සිල්පර | සංඛ්‍යාව | 42,950 | 21,919 | (49.0) |
| වටකණු | සංඛ්‍යාව | 89,200 | 89,927 | 0.8 |
| වැටකණු | සංඛ්‍යාව | 70,425 | 65,748 | (6.6) |
| දර | ඝ.මී | 72,205 | 87,159 | 20.7 |
| අලිවැටකණු | සංඛ්‍යාව | 70,670 | 76,061 | 7.6 |
| ගෘහභාණ්ඩ/ෆින්ගර්ජොයින්ට් | රු.මිලියන | **294.4** | 255.6 | (13.2) |

**මූල්‍ය ප්‍රගතිය (රු)**

| | අයවැයගත | තථ්‍ය | % |
|---|---|---|---|
| කඳන් | **2,030,357,000** | **2,890,482,193** | **42.4** |
| ඉරුදැව | **295,925,600** | **214,221,019** | **(27.6)** |
| ආනයනික දැව | **362,250,000** | **52,603,610** | **(85.5)** |
| විදුලි සම්ප්රේෂණ කණු | **330,537,600** | **259,571,493** | **(21.5)** |
| සිල්පර | **386,120,500** | **196,233,081** | **(49.2)** |
| අපනයන - තෙල් කවන ලද සිල්පර | | **54,237,353** | |
| වට කණු | **6,840,000** | **11,296,865** | **65.2** |
| වැට කණු | **4,225,500** | **9,596,244** | **127.1** |
| දර | **26,155,000** | **56,149,212** | **114.7** |
| අලි වැට කණු | **177,530,100** | **250,176,597** | **40.9** |
| ගෘහභාණ්ඩ/ෆින්ගර්ජොයින්ට් | **370,800,000** | **297,359,036** | **(19.8)** |
| වෙනත් | **60,000** | **5,507,338** | |

### 5.7.2 වෙනත් වැඩ සටහන්

- හෙක්ටයාර් 25කින් යුතු මින්නේරිය ජෛවවිවිධත්ව උද්‍යානය නඩත්තු කිරීම
- රාජ්‍ය දැව සංස්ථාවේ පැල තවාන්වල, වඳවී යන ශාක (කළුවර වැනි) බීජ පැල නිෂ්පාදනය කිරීම

## 5.8 භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය

### 5.8.1 භූ විද්‍යා සිතියම් මුද්‍රණය කිරීම:

සමස්ථ ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි භූ විද්‍යා සිතියම් ප්‍රකාශයට පත් කිරීම කාර්යාංශයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි. භූමි ප්‍රදේශය සම්බන්ධ භූ තොරතුරු ඇතුළත් භූ විද්‍යා සිතියම් ඛණිජ සහ භූ ජල ගවේෂණයන්, ප්‍රධාන ඉදිකිරීම් සහ සිවිල් ඉංජිනේරු කටයුතු, නායයාම් අනතුරු සිතියම් සකස් කිරීම වැනි ක්‍රියාකාරකම් විශාල පරාසයක කටයුතු සඳහා යොදා ගනියි. භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය සමස්ථ රටම ආවරණය වන පරිදි 2014 දී භූ විද්‍යා සිතියම් 21 (1: 100,000) මුද්‍රණය කිරීම අවසන් කළ අතර 1: 50 000 පරිමාණය සහ 1: 250 000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති 1: 100,000 සිතියම් පදනම් කරගෙන සකස් කිරීමට සැළසුම් කර ඇත. මූලාරම්භයක් වශයෙන් 1: 250,000 සිතියම් හතරක් මුද්‍රණය කිරීමට සැළසුම් කර ඇති අතර මෙම සිතියම් හතර සකස් කිරීම 2015 දී සම්පූර්ණ කළ අතර ඒවා මුද්‍රණය කිරීම 2016 මුල් කාළය තුළදී සිදු කෙරෙනු ඇත.

### 5.8.2 චාතුර්ථික සිතියම් ( වෙරළබඩ කළාපය) වැඩසටහන

භූ විද්‍යා කාළය අනුව චාතුර්ථික කාළ පරාසය අවුරුදු මිලියන දෙකකට පෙර කාළයේ සිට වර්තමානය දක්වා දිවෙයි. ශ්‍රී ලංකාවේ චාතුර්ථික භූමි සංස්ථානය වෙරළාශ්‍රිත අවසාදිත වලට සහ පිටාර තැනි වල ඇති දියළු අවසාදිත වලට ප්‍රධාන වශයෙන් සීමා වන අතර පාංශු භූමි සංස්ථානයන් ද ඇතුළත් වේ. මෙම භූමි සංස්ථානයන් ඉතාම වැදගත් වන්නේ ඒවායෙහි ආර්ථිකමය වශයෙන් වටිනාකමක් ඇති මැටි, වැලි නිධි, කොරල් නිධි, සාරවත් පස් තට්ටු සහ භූගත ජල මූලාශ්‍ර ඇතුළත් වන නිසාය. භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය'චාතුර්ථික භූ විද්‍යා සිතියම්කරණය' යනුවෙන් ව්‍යාපෘතියක් 2008 වසරේ දියත් කරන ලදී.
1: 50000 චාතුර්ථික සිතියම් සකස් කිරීම මාතර, කළුතර සහ අම්බලන්ගොඩ - බලපිටියද ඇතුළත්ව පසුගිය වසරේ සම්පූර්ණ කළ අතර මෙම සිතියම් මුද්‍රණය කිරීම සඳහා 2015 මුල කාර්තුවේදී මිල ගණන් කැඳවන ලදී. මෙම මිලගණන් විශ්ලේෂණය දැනට සිදුවෙමින් පවතියි. පුත්තලම, කල්පිටිය, හම්බන්තොට - තංගල්ල යන ස්ථරවල සිතියම් සකස් කිරීම ද දැනට අවසන් වි තිබේ. ගාල්ල, යාල, හලාවත බත්තුළුඔය සහ සිලාවතුර ප්‍රදේශවල ක්ෂේත්‍ර වැඩ අවසන් වී ඇති අතර විල්පත්තු ස්ථරයේ 75% ක ක්ෂේත්‍ර වැඩ පමණක් නිම කිරීමට තිබේ.

### 5.8.3 පාංශු භූ රසායන සිතියම් වැඩසටහන

පසේ භූ රසායන ලක්ෂණ අධ්‍යනය කිරීම සඳහා පාංශු භූ රසායන සිතියම් වැඩසටහන 2008 වසරේදී ආරම්භ කරන ලදී. මෙම සිතියම් ඛණිජ ද්‍රව්‍ය ගවේෂණයේදී, පාරිසරික අධීක්ෂණ කටයුතු වලදී සහ කෘෂිකාර්මික පර්යේෂණ සහ භූ සෞඛ්‍ය ආපදා අධ්‍යනවලදී ප්‍රයෝජනවත් වේ. මොරවක, රක්වාන, තිඹොල්කැටිය, හම්බන්තොට, මාතර සහ තංගල්ල ස්ථර වල අවසන් කිරීමේ කටයුතු පසුගිය මාස කිහිපය තුළ සිදු කළ අතර බදුල්ල, අනුරාධපුර, මැදවච්චිය, සහ හොරොවුපතාන යන තලවල රසායනාගාර විශ්ලේෂණ කටයුතු සිදු කර ඇත. පොළොන්නරුව, කවුඩුල්ල ස්ථර වල ක්ෂේත්‍ර වැඩකටයුතු අවසන් කර ඇති අතර 2015 වසර තුළ කැකිරාව ස්ථරයේ ද ක්ෂේත්‍ර වැඩකටයුතු සිදු කරනු ඇත.

### 5.8.4 වාර්ෂික ඛණිජ ග්‍රන්ථය - 2014 සහ 2015

දත්ත ලබා ගැනීමේ අපහසුව සහ අදාළ නිළධාරීන් වෙනත් කාර්යයන්හි නියැලීම නිසා 2014 වාර්ෂික ඛණිජ ග්‍රන්ථය සකස් කිරීමේ ප්‍රමාදයක් සිදුවිය. නමුත් 2014 වාර්ෂික ඛණිජ ග්‍රන්ථය 2015 ප්‍රථම කාර්තුව අවසන්

වන විට ක්‍රමයෙන් අවසන් කළ අතර 2015 වාර්ෂික ඛණිජ ග්‍රන්ථය සඳහා වන දත්ත රැස් කිරීම 2015 වසර තුළදී සිදු කරන ලදී.

### 5.8.5 පළාත් ඛණිජ සමීක්ෂණ සහ පළාත් ඛණිජ සිතියම්

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය අරමුදල් සපයන සබරගමුව පළාතේ ඛණිජ සමීක්ෂණය වෙනුවට ශ්‍රී ලංකාවේ සෙරමික් සභාව සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව සෙරමික් අමුද්‍රව්‍ය සමීක්ෂණයක් මධ්‍යම සහ ඌව පළාත් වල දියත් කරන ලදී. සබරගමුව පළාතේ ඛණිජ සමීක්ෂණය 2015 තුන්වන කාර්තුවේදී ආරම්භ කළ අතර එය 2016 වසර දක්වා දිවෙයි. පවතින දත්ත උපයෝගී කරගෙන මධ්‍යම සහ ඌව පළාත් සඳහා ඛණිජ සිතියම් සකස් කිරීම දැනට බොහෝදුරට සම්පූර්ණ කර ඇති අතර ඒවා මුද්‍රණය සඳහා සූදානම් මට්ටමේ පවතියි. උතුරු මැද පළාත සඳහා වන ඛණිජ සිතියම 2015 අවසානය වන තෙක් සකස් කෙරෙමින් තිබිණි.
ගැමා කිරණ සහ ක්‍රමවත් නියැදීම් කටයුතු සඳහා මීනුම් අවිස්සාවේල්ල ආසන්නයේ මිටිපොල, සහ ඊසාන වෙරළේ 2014 සහ 2015 වසර කාළය තුළ සිදු කෙරිණි. මෙම ක්ෂේත්‍ර කටයුතු නිමකර ඇති අතර මාතලේ, දඹුල්ල, ඇලහැර සහ පල්ලේගම ප්‍රදේශවල ක්ෂේත්‍ර වැඩ 2015 දෙවන භාගයේදී ආරම්භ කරන ලදී. රසායනාගාරවල නියැදි විශ්ලේෂණය සිදු කෙරෙන අතරතුර අන්තර්වාර වාර්තා ඉදිරිපත් කර තිබේ. රත්නපුර ප්‍රදේශයේ බඹරකොටුව තෝරියම් සහ යුරේනියම් හමුවීම සම්බන්ධයෙන් ගවේෂණය කිරීම සඳහා වන මූලික ක්ෂේත්‍ර චාරිකාව සිදු කර ඇත. IAEA විසින් කොටසක් ප්‍රධානය කරන ලද XRF ස්පෙක්ටොමීටර යටතේ මෝටර් වාහන වලින් නිකුත් කෙරෙන විකිරණ අනාවරණය කිරීම 2015 වසරේදී සිදු කරන ලදී.
භූ කම්පන දත්ත සහ සුනාමි අනතුරු ඇඟවීම මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සහ භූ කම්පන පොළවල් තුන නඩත්තු කිරීම.
සුළු ගැටළු කිහිපයක් තිබුණ ද භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය විසින් අනෙකුත් ආධාර දෙන නියෝජිතායතන වල සහාය සහිතව ස්ථාපනය කරන ලද භූ කම්පන පොළවල් තුන ඉතා හොඳින් ක්‍රියාත්මක වන අතර මෙම පොළවලින් ලබාගන්නා දත්ත භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ දත්ත මධ්‍යස්ථානය වෙත සම්ප්‍රේෂණය කරනු ලබයි. භූ කම්පන , භූමියේ චලනයන් සහ ඉන්දීය සාගරයේ භූ කම්පන වැනි දේ සම්බන්ධයෙන් 2015 වසරේදී පවා දත්ත මධ්‍යස්ථානය සාර්ථකව ප්‍රතිචාර දක්වා තිබේ.
PALK භූ කම්පන පොළට අයත් විසඳුම් සෙවීමේ ක්‍රියාකාරකම් වලට 1) බැක් අප් බැටරි පද්ධතිය නැවත සවි කිරීම. 2) IDA ව්‍යාපෘතිය සහ CTBTO පද්ධතිය අතර සන්නිවේද සම්බන්ධය ප්‍රතිෂ්ටාපනය කිරීම සහ අලුත්වැඩියා කිරීම 3) PALK භූ කම්පන පොළෙහි තිබෙන හානි වූ සර්ජන ආරක්ෂකය ප්‍රතිෂ්ටාපනය කිරීම 4) PALK භූමි භාගයේ පිහිටි ජී පී එස් පද්ධතිය ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම සහ 5) අකුණුවැදීමක් සිදුවූ PALK 00 ඩිජිටයිසරය නැවත සවි කිරීම ඇතුළත් වේ. PALK භූමි භාගය තුළ අකුණු ආරක්ෂණ ක්‍රමයක් තිබුණද එය තවමත් අකුණු වලින් දරුණු ලෙස පීඩාවට පත්වේ. MALK භූ කම්පන පොළහිද නිරන්තරයෙන් බල පද්ධතිය සම්බන්ධයෙන් ගැටළු පවතින අතර 2016 වසරේදී GFZ සහාය සහිතව එය විසඳීමට හැකි වනු ඇත.

### 5.8.6 අබලන් වූ විදුම් පෙට්ටි ප්‍රකෘතියට පත්කිරීම සහ ගබඩා කිරීම

යක්කල ගබඩාවේ අබලන් විදුම් පෙට්ටිවල ගබඩා කොට ඇති පාෂාණ විදුම් ප්‍රකෘති තත්ත්වයට පත්කිරීමට සැළසුම් කර තිබේ. මෙම විදුම් පෙට්ටි අබලන් තත්ත්වයෙන් පවතින අතර ඉන් නිවැරදි තොරතුරු සහිතව ප්‍රකෘතියට පත් කළ හැකි වන්නේ 60% ක් පමණි. යථා තත්ත්වයට පත් කරන ලද විදුම් 2013, 2014 සහ 2015 වසර වලදී ගැල්වනයිස් විදුම් පෙට්ටි 900 ක පමණ ගබඩා කර තබා ඇත. මෙම ව්‍යාපෘතිය 2015

අවසන් වන විට බොහෝදුරට අවසන් වී තිබුණ අතර අවසන් කටයුතු සහ නිමකිරීමේ කටයුතු 2016 පළමු කාර්තුව දක්වා දීර්ඝ වනු ඇත.

### 5.8.7 භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ පුස්තකාලය වැඩිදියුණු කිරීම

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ පුස්තකාලය ආයතනික කෝෂ්ඨාගාර ජාතික ජාලයේ සාමාජිකයෙක් වශයෙන් තෝරාගෙන තිබේ. NSF මගින් අරමුදල් සපයන ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය යටතේ පුස්තකාලය වැඩිදියුණු කිරීමේ කටයුතු ඉදිරියට කරගෙන යනු ලබයි. NSF මගින් සපයන පහසුකම් අතර පොත්පත් එකතු ඩිජිටල්කරණය කිරීම, ඊ - කෝෂ්ටාගාර සංවර්ධනය, පුහුණු සහ දත්ත පදනම් කළමනාකරණය සහ පරිපාලනය, වර්තමාන දත්ත පදනම් Dspace බවට පත්කිරීම, උපකරණ සහ දත්ත පදනම් සම්බන්ධ කටයුතු, දත්ත ඇතුලත් කිරිම, ගැටළු වලට විසඳුම් සෙවීම සඳහා තාක්ෂණික සහාය සඳහා තාවකාලික කාර්ය මණ්ඩලය ලබා දීම වැනි දේ ඇතුළත් වේ. 2015 වසර තුළ ඩිජිටල්කරණ ව්‍යාපෘතියේ 75%ක් පමණ අවසන් කර තිබේ.

### 5.8.8 පාෂාණවිද්‍යා රසායනාගාරය

වාණිජ පදනම මත පිටස්තර වැඩකටයුතු සිදු කරනවාට අමතරව රසායනාගාර කාර්ය මණ්ඩලය IAEA සහාය සහිතව අමුද්‍රව්‍ය සමීක්ෂණ සහ ජාතික රන් සමීක්ෂණ වලට සම්බන්ධ ඛණිජ විද්‍යාත්මක විශ්ලේෂණ සිදු කරයි.

### 5.8.9 විශ්ලේෂණාත්මක රසායනාගාරය

විශ්ලේෂණාත්මක රසායනාගාරයේ කාර්ය මණ්ඩලය භූ රසායනික සිතියම් වැඩසටහන්, පර්යේෂණ වැඩසටහන් සහ බාහිර සේවාදායකයන් සඳහා විශ්ලේෂණාත්මක වැඩසටහන් වල නියැලී සිටියි.

### 5.8.10 පර්යේෂණ වැඩසටහන්

එදිනෙදා සිදුකරන වැඩකටයුතු වලට අමතරව භූ විද්‍යා අංශය පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍යාන්ට සහ භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තම පර්යේෂණ කටයුතු සිදුකරගෙන යාම සඳහා පහසුකම් සපයයි.

### 5.8.11 සේවාදායක ප්‍රතිචාර ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් ( ආදායම් උත්පාදක)

1 වගුව : 2015 වසරේ විවිධ ව්‍යාපෘති වලින් ලබාගත් ආදායමේ සාරාංශය

| සේවා දායකයා | ව්‍යාපෘතිය | 2015 සඳහා වැට් සහ එන් බී ටී රහිත ආදායම (රු.) |
|---|---|---|
| සෙරමික් කවුන්සිලය | වේන් ක්වාර්ට්ස්, ෆෙල්ඩ්ස්පාර්, කෙයොලින්, සහ කැල්සයිට් මාතලේ සහ නුවර එළිය දිස්ත්‍රික්කවලින් හමුවීම | 3,458,527.58 |
| සෙරමික් කවුන්සිලය | බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කවල සෙරමික් අමුද්‍රව්‍ය සමීක්ෂණ | |
| | මා ඔය අසළ නව මැටි වර්ගයක් හමුවීම | 1,412,456.81 |
| එම් ආර් එල් ග්‍රැෆයිට් සීමාසහිත සමාගම | අලුකැටිය ප්‍රදේශයේ ග්‍රැෆයිට් සඳහා කැණීම් සමීක්ෂණ | 6,304,530.25 |

| | | |
|---|---|---|
| ටෝකියෝ සිමෙන්ට් සීමාසහිත සමාගම. | වල්ලියිපාඩු/ මන්නාරම ප්‍රදේශයේ හුණුගල් තට්ටු පිළිබඳ රක්ෂිත ඇස්තමේන්තුව | 3,667,107.85 |
| ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම | බැර ඛණිජ වැලි සහ කෝකිලායි කලපුවේ සිට කි. මී. 3 ක් කොක්කුතුඩුවායි සහ දකුණු නයාරු සා මුලතිව් දිස්ත්‍රික්කයේ වෙන්නමායි දක්වා වෙරළ කළාපය විහිදීම සම්බන්ධයේන භූ විද්‍යා ගවේෂණ. | 1,825,878.25 |
| බෝරා බොරා පුද්ගලික සමාගම | මැල්සිරිපුර මිනිරන් ස්ථානයේ කැණීම් ව්‍යාපෘතිය | 12,267,381.70 |
| මහවැලි උපදේශන කාර්යංශය | එන් සී පී උමං ව්‍යාපෘතිය | |
| එම් ආර් එල් ග්‍රැෆයිට් පුද්ගලික සමාගම | වරකාපොල මිනිරන් සමීක්ෂණය සඳහා කැණීම් ව්‍යාපෘතිය | 3,080,110.00 |
| කර්මාන්ත තාක්ෂණ ආයතනය | චුන්නාකම් බල ශක්ති උත්පාදන සංකීර්ණයේ සහ ඒ අවට කැණීම් සහ නියැදි ව්‍යාපෘතිය | 833,371.14 |
| තිරසාර බලශක්ති අධිකාරිය | බත්තරමුල්ල කැණීම් වැඩසටහන | 543,127.50 |
| පුස්තකාලය | | 561,118.00 |
| විශ්ලේෂණ විද්‍යාගාරය | | 2,577,000.00 |
| පාෂාණ විද්‍යා විද්‍යාගාරය | | 872,210.00 |

### 5.8.12 අනෙකුත් ක්‍රියාකාරකම්

- දින 100 වැඩසටහන - දීපව්‍යාප්ත කඩිනම් වැලි සමීක්ෂණය
  පළාත් පදනම් කරගත් වැලි සමීක්ෂණ වැඩ සටහනක් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි කණ්ඩායම් නවයක සහභාගිත්වයෙන් සෑම කණ්ඩායමක්ම භූ විද්‍යාඥයෙකුගේ මෙහෙයවීම යටතේ 2015 මුල් කාළයේදී සිදු කරන ලදී. අවසන් වාර්තාව මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයට භාර දෙන ලදී.
- දින 100 වැඩසටහන - උතුරු මැද පළාතේ ආසනික් පර්යේෂණ වැඩසටහන
  අනුරාධපුර සහ පොළොන්නරුව ප්දේශවලින් ජලය, පස්, පාෂාණ සහ වී නියැදි එකතු කර එම නියැදි සැකසුම් කර විශ්ලේෂණය කොට ආසනික් සහ අනෙකුත් බැර ලෝහ අන්තර්ගතය සොයාගැනීමට කටයුතු කරන ලදී.
- OSI කළාපීය හඳුන්වාදීමේ වැඩසටහන සංවිධානය කිරීම
- මා ඔය සඳහා කළමනාකරණ සැළසුමක් සකස් කිරීම
- ගිං ගඟේ වැලි සමීක්ෂණය
- උමා ඔය ව්‍යාපෘතියට උපදේශන කටයුතු සැපයීම
- භූ භෞතික සමීක්ෂණ
  - ✓ හබරණ- මොරගහකන්ද උමං මාර්ගයේ භූ භෞතික සමීක්ෂණ සහ තිරුක්කෝවිල් හි භූ භෞතික සමීක්ෂණ සිදු කෙරෙමින් පවතියි.
  - ✓ පදියතලාව භූ භෞතික සමීක්ෂණ ( චුම්බක සමීක්ෂණ) ඩොලරයිට් ඩයික් සඳහා ගවේෂණ
  - ✓ ඩොලරයිට් ඩයික් සඳහා පදියතලාව භූ භෞතික සමීක්ෂණ
  - ✓ FCID සමඟ මඩකලපුව ප්‍රදේශයේ භූ භෞතික සමීක්ෂණ
  - ✓ ත්‍රිකුණාමලයේ උප්පුවේලි ප්‍රදේශයේ සහ නිලාවැලි පොලිස් බල ප්‍රදේශයේ භූ භෞතික
  - ✓ සමීක්ෂණ
  - ✓ ගම්පහ, වයික්කාල, පුත්තලම, මැදවච්චිය , එප්පාවල සහ අම්බලන්ගොඩ ප්‍රදේශවල
  - ✓ මිනිරන් බාදනය සම්බන්ධ සමීක්ෂණය
  - ✓ කච්චතිව්, කයිට්ස් , ඩෙල්ෆ්ට් දූපත්වල භූ භෞතික සමීක්ෂණ

**5.8.13** මූල්‍ය කාර්ය සාධනය

| | 2015<br>තථ්‍ය<br>රු. | 2015<br>අයවැය<br>රු. |
|---|---|---|
| රාජ්‍යභාගය | **1,293,433,031.76** | **1,128,064,000.00** |
| බලපත්‍ර ගාස්තු | **80,002,819.08** | **76,461,000.00** |
| පරීක්ෂණ ගාස්තු | **182,943,929.26** | **156,475,000.00** |
| රසායනාගාර අදායම | **3,568,174.29** | **550,000.00** |
| ව්‍යාපෘති ආදායම | **30,429,845.06** | **28,000,000.00** |
| අනෙකුත් ආදායම් | **125,426,991.71** | **82,850,000.00** |
| මුළු ආදායම | **1,715,804,791.16** | **1,472,400,000.00** |
| භූවිද්‍යා | **60,936,938.27** | **52,011,000.00** |
| සිතියම් | **8,201,413.15** | **27,500,000.00** |
| ව්‍යාපෘති | **13,308,901.10** | **14,000,000.00** |
| කළාප | **167,317,920.49** | **152,155,000.00** |
| කැණීම | **37,795,642.21** | **41,301,000.00** |
| පරිපාලන | **391,150,105.52** | **363,839,500.00** |
| වසර සඳහා අතිරික්තය | **1,037,093,870.42** | **821,593,500.00** |


## 5.9 මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

- මැණික් ක්ෂේත්‍රයේ පර්යේෂණ ප්‍රගතිය
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලා ප්‍රගතිය
- මානව සම්පත් අංශයේ සංවර්ධනය
- මූල්‍ය ප්‍රතිපාදන හා වියදම්


### 5.9.1 මැණික් කේෂ්ත්‍රයේ පර්යේෂණ ප්‍රගතිය

- ව්‍යාපෘතිය 01 - මැණික් නිධි ගවේෂණය හා සිතියම්ගත කිරීම

මැණික් නිධි සොයා ගැනීමේ අරමුණින් මේ වන විට මුළු ලංකාවම ආවරණය වන පරිදි සිතියම් ගත කිරිම ආරම්භ කර ඇත. මේ වන විට බඩල් කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හා මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සිතියම් නිම කර ඇත. (රූපසටහන 01 හා 02)




රූපසටහන 01බඩල් කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශමැණික් විභව සිතියම





රූප සටහන 02-මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැණික් විභව සිතියම

මෙම සිතියම් වල මැණික් පැවතීමේ ස්වභාවය අනුව උපරිම සාමාන්‍ය හා අවම වශයෙන් දක්වා ඇති බැවින් මැණික් ඉඩම් වෙන්දේසියේදි මහගු පිටුවහලක් වේ.
සිතියම් ඇදිම සදහා GIS තාක්ෂණය උපයෝගී කර ඇති ඕනෑම තැනක් බණ්ඩාංකයක් ඇසුරෙන් පහසුවෙන් හඳුනා ගත හැකිය.




රූප සටහන්හි ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු වලදී ලබාගත් ඡායා රූප එකතුවකි (a) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විදුම් සාම්පල ලබා ගැනීම. (b) මැදගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල විද්‍යාත්මක සිතියම් නිර්මාණය, (c) මැදගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු පරික්ෂා කිරිම, (d) ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු සත්‍යාපනය බඩල්කුඹුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය (e) සහ (f) රසායනාගාරයේ නියැදි සැකසීම හා ඛණිජ විද්‍යාත්මක අධ්‍යනය පෙන්වා දිය හැක.




රූප සටහන් 03- රසායනාගාර විශ්ලේෂණ දත්ත සැකසීම හා විද්‍යාත්මක ආදර්ශණය

- ව්‍යාපෘතිය-02 -තිරසාර සංවර්ධනයක් උදෙසා මැණික් පතල් ක්‍රම හඳුන්වා දීම

මැණික් නිධි කැණීම් ක්‍රම මගින් පාරිසරික හා සමාජීය වශයෙන් ඇති වන ගැටළු වලට විසඳුමක් ලෙස පරිසර හිතකාමී මැණික් පතල් කැණීම් ක්‍රම හඳුන්වා දීමේ ව්‍යාපෘතිය සඳහන් කල හැකිය. එබැවින් අදාල ප්‍රදේශයන් වල ස්වාභාවික විපත්, දේශගුණික තත්වයන්, භූ විද්‍යාත්මක තත්වය හා පස යන පාරිසරික සංවේදිතාවයන්ද සැලකිල්ලට ගෙන මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මකව පවතින අතර මේ යටතේ බදුල්ල හා රත්නපුර යන දිස්ත්‍රික්ක වල ක්ෂේත්‍ර ගවේෂණ වලට අදාලව පර්යේෂණ පත්‍රිකා තුනක් ප්‍රකාශයට පත් කර ඇත. වර්තමාන කැණීම් තත්වයන් හා රෙගුලාසි අධ්‍යනයන් සඳහා ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු සිදුකිරීමෙන් අනතුරුව ඒවා පාලනය කිරිමට කටයුතු සිදු කෙරේ. ඒ අනුව කැණීම් හේතුවෙන් ඇති වූ හානිදායක තත්වයන් ලිහිල් කිරිම සඳහා නිර්දේශයන් දෙනු ලැබේ. මේවනවිට බදුල්ල දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු හා අවසන් වාර්තාව නිම කර ඇත.

- ව්‍යාපෘතිය 03- ශ්‍රී ලංකාවේ රත්‍රං නිධි ගවේෂණ හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වුයේ ගංගා පෝෂක ප්‍රදේශවල පිහිටි රත්‍රං නිධි පිහිටීම සහ රත්‍රං නිධි ආශ්‍රිත ඛණිජ විද්‍යාත්මක හා භූ රසායන විද්‍යාත්මක ලක්ෂණ යාන්ත්‍රණය අධ්‍යනයත් සහ ආර්ථිකමය වටිනාකම තීරණය කිරීමත් ය . 2013 වසරේ මෙම සමාලෝචිත කාලය තුල කැළණිගඟ පෝෂක ප්‍රදේශයට අදාළව ක්ෂේත්‍ර සමීක්ෂණ, නියැදි එකතු කිරීම් සහ රසායනාගාර පරීක්ෂණ සිදුකර ඇත. මෙම රත්‍රං නිධි ලෙස ගංගාවල් වල දියළු ප්‍රදේශවල පවතින බවය.

ක්ෂේත්‍ර හා රසායනාගාර විශ්ලේෂණයන්ට අනුව කැළණිය ආශ්‍රිත ප්‍රදේශයේ ද්විතියික මැණික් තැන්පතු ආශ්‍රිතව රත්‍රං පතුරු වශයෙන් පවතින බව හඳුනාගන්නා ලදී. එනමුත් එම රත්‍රං පැවතීම ආර්ථිකමය වශයෙන් වටිනාකමක් ඇති රත්‍රං නිධිනොවන බවට ව්‍යාපෘතියේ අවසන් නිගමනය විය.

- ව්‍යාපෘතිය 04- පුද්ගලික ඉඩම් වල මැණික් ගවේෂණය

මෙම ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය වතු සමාගම්වල හා පුද්ගලික ඉඩම්වල මැණික් නිධි ගවේෂණය සිදුකර ඊට අදාලව විස්තරාත්මක විද්‍යාත්මක විශ්ලේෂණාත්මක වර්තාවක් හා අදාල සිතියම් නිර්මාණය කර දෙනු ලැබේ.

මේ යටතේ මාතලේ, හොරණ හා අකුරැස්ස යන ප්‍රදේශවල පුද්ගලික ඉඩම් හිමියන්ගේ පහත දැක්වෙන පුද්ගලයින්ගේ ඉඩම් හිමියන්ගේ පහත දැක්වෙන පුද්ගලයින්ගේ ඉඩම්වල ගවේෂණ සිදුකර ඇත.

- ටී.ඒ. වික්‍රමසිංහ මයා - ගමහේන වතුයාය ,විල්පිට , අකුරැස්ස
- කේ.ඩී. සේනානායක මයා - අංක 96/4 , රජමාවත, නුවර
- කුමාර උක්වත්ත මයා - 83/සී , පුහුල්වල හන්දිය, දඹහැර, මීවනපලාන

## 5.9.2 පුහුණු ක්‍රියාකාරකම්හි ප්‍රගතිය

ශ්‍රී ලංකාව තුළ මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය ආශ්‍රිත පුහුණු කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා තීරණාත්මක හා සාර්ථක පියවර රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මෙම වර්ෂය තුළත් ආයතනය විසින් හඳුන්වා දෙන මැණික් හා ස්වර්ණාභරණ පාඨමාලා හැදෑරීම සඳහා සහභාගී වන ශිෂ්‍ය සංඛ්‍යාවෙහි වර්ධනයක් වාර්තා හැකි විය.
මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ කාලානුරූපිව විශාල ඉල්ලුමක් පවතින හඳුනාගත් විෂය ආශ්‍රිත කර්මාන්ත ගණනාවක් ආවරණය වන පරිදි පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම පාඨමාලා තුලින් කර්මාන්තයේ දී අවැසි කුසලතා හා තාක්ෂණ හැකියාවන් ගොඩනගා ගත හැකි පරිදි සියළු පාඨමාලා නිර්මාණය කොට ඇත. සියළුම පුහුණු වැඩ සටහන් සඳහා සහභාගිවන්නන්ගේ ඉහළ ප්‍රතිචාර හිමි වූ අතර පුහුණුව ලැබූ හැකියාවන් හා කුසලතාවයන් වලින් සපිරි පුහුණුලාභීන් මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය පිණිස ක්‍රියාකරනු ඇත. මෙම පුහුණු තුලින් අප ආයතනය ලෝකයේ මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ පිළිගත් සම්මතයන්ට අනුව නඟා සිටුවීමට හැකිවනු ඇත.

- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රාදේශීයව පවතින පුහුණු ඉල්ලුම සපුරාලීම සඳහා පුහුණු මධ්‍යස්ථාන 07 ක් පහත සඳහන් ප්‍රදේශවල ස්ථාපිත කර ඇත.
    - ✓ රත්නපුර
    - ✓ කොළඹ
    - ✓ නුවර
    - ✓ ගාල්ල
    - ✓ කිංගිරිය
    - ✓ සූරියවැව
    - ✓ පොළොන්නරුව

- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ නිපුණ ශිල්පීන්ගේ පවතින විශාල හිඟය මගහරවා ගැනීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI) හා ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමය (GJASL) ඒකාබද්ධව තරුණ තරුණියන්හට මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ආශ්‍රිත පුහුණුවක් ලබා දීමේ විශේෂ පුහුණු රැකියා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී.

- අඩු ආදායම් ලබන සමාජ කණ්ඩායම් සඳහා අතදීමක් වශයෙන් ඔවුන් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ පුහුණුවක් ලබාදී රැකියාගත කිරීමේ වැඩපිළිවෙලක් භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රතිපාදන මත ආරම්භ කරන ලද තවත් එක් පුහුණු ව්‍යාපෘතියක් වශයෙන් කොළඹ, රත්නපුර, සූරියවැව, බිංගිරිය, ගාල්ල, සූරියවැව හා පොළොන්නනරුව ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රියාත්මක කරන ලදී.

- රජය විසින් ක්‍රියාත්මක කරන ලද දින 100 වැඩසටහනේ එක් ක්‍රියාකාරකමක්ලෙස මැණික් කැපීමේ හා ඔප දැමීමේ ශිල්පීන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පොළොන්නරුවේ ආරම්භ කරන ලද අතර මේ වන විට එම මධ්‍යස්ථානය ඒ තුළින් අපේක්ෂිත ඉල්ලකයන් සපුරා ගනිමින් ඉතා සතුටුදායක අන්දමින් ක්‍රියාත්මක වේ.

- ආයතනය විසින් ස්වර්ණාභරණ විෂය සඳහා ඩිප්ලෝමා සහතික ප්‍රදානය කිරීම සඳහා ස්වර්ණාභරණ නිර්මාණ හා නිෂ්පාදන තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ විෂය නිර්දේශය තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) සම්මතයන්ට අනුකූලව ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටම (NVQ5 ) දක්වා සංවර්ධනය කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කොට ඇත. එමෙන්ම මැණික් කැපීම හා ඔප දැමීම පාඨමාලාවේ විෂය නිර්දේශය ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ4) සම්මතයන්ට අනුකූලව සංවර්ධනය කිරීමට අවශ්‍ය කරන මූලික කටයුතු ද ආරම්භ කරන ලදී. ඒ අනුව 2016 පමණ වන විට එම පාඨමාලා සඳහා සහභාගි වන සිසුන්ට ජාත්‍යන්තරව පිළිගත් සහතික ලබාගැනීමට හැකි වනු ඇත.

- පුහුණු වැඩමුළු තුළින් හා ආයතනයේ විද්‍යාගාර තුළින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා නව මැණික් හඳුනා ගැනීමේ උපකරණ ආදී නව මැණික් කැපීමේ හා ඔප දැමීමේ උපකරණ ආදී නවීන තාක්ෂණික භාවිතාවන් හඳුන්වා දෙන ලදී


- වර්ෂයේ සිසුන් පුහුණු කිරීමේ ප්‍රගතිය

**2015 වර්ෂයේ බඳවා ගැනීම්**

| පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| රත්න විද්‍යාව | 134 |
| ගෙවුඩ තාප පිරියම් කිරීම | 96 |
| මැණික් කැපීම හා ඔප දැමීම | 190 |
| මැණික් වර්ණ ශ්‍රේණිගත කිරීම හා අලෙවිකරණය | 157 |
| ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය | 37 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය | 42 |
| විලාසිතා ආභරණ නිෂ්පාදනය | 18 |
| මුළු එකතුව | **674** |

- අවසන් වසර 5 තුල වාර්තාගත ශිෂ්‍ය කාර්ය සාධනය

| පාඨමාලාව | වර්ෂය සහ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|
| | **2010** | **2011** | **2012** | **2013** | **2014** | **2015** |
| රත්න විද්‍යාව | 25 | 13 | 30 | 43 | 105 | 134 |
| ගෙවුඩ තාප පිරියම් කිරීම | 21 | 25 | 51 | 64 | 84 | 96 |
| මැණික් කැපීම හා ඔප දැමීම | 59 | 43 | 61 | 76 | 109 | 190 |
| මැණික්වර්ණ ශ්‍රේණිගත කිරීම හා අලෙවිකරණය | 16 | 72 | 48 | 118 | 175 | 157 |
| ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය | 13 | 30 | 16 | 44 | 18 | 37 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය | 31 | 21 | 37 | 40 | 49 | 42 |
| විලාසිතා ආභරණ නිෂ්පාදනය | - | | - | 21 | - | - |
| ආභරණ සඳහා ගල් බැදීම | - | 8 | - | 9 | - | 18 |
| එකතුව | **165** | **212** | **243** | **415** | **540** | **674** |




| | නම | තනතුර | වැඩමුළුව / පාඨමාලාව | ආයතනය |
|---|---|---|---|---|
| 1 | ධනුෂ්ක රවීන්ද්‍රසිංහ මයා | පර්යේෂණ නිලධාරි | Bussiness Proposal Writing | National Science Foundation |
| 2 | ජී.ජී.එම්.එස්.වික්‍රමසිංහ මයා | පර්යේෂණ නිලධාරි | Bussiness Proposal Writing | National Science Foundation |
| 3 | සමුද්‍රා විජේවර්ධන මෙනෙවිය | පර්යේෂණ නිලධාරි | Bussiness Proposal Writing | National Science Foundation |
| 4 | ඩබ්.ජී.ජේ.සෙනෙවිරත්න මිය | වැඩසටහන් නිලධාරී | Bussiness Proposal Writing | National Science Foundation |
| 5 | එච්.එල්.එස්.යූ මදනායක මෙය | කළමණාකරණ සහකාර | Attitudes and skills Development | Institute of Human Resourse Advancement |
| 6 | පී.කේ.වික්‍රමආරච්චි මෙය | කළමණාකරණ සහකාර | Attitudes and skills Development | Institute of Human Resourse Advancement |
| 7 | කේ.ජී.එච්.එස්.ජයසේකර මෙය | කළමණාකරණ සහකාර | Attitudes and skills Development | Institute of Human Resourse Advancement |
| 8 | ජේ.පී.කේ.සංදීප් මයා | කළමණාකරණ සහකාර | Attitudes and skills Development | Institute of Human Resourse Advancement |
| 09 | එස්.කේ.විතානගේ මෙය | කළමණාකරණ සහකාර | Attitudes and skills Development | Institute of Human Resourse Advancement |
| 10 | එච්.එල්.එල්.ජනිත්‍රි මෙය | කළමණාකරණ සහකාර | Attitudes and skills Development | Institute of Human Resourse Advancement |
| 11 | පී.ඒ.කේ.එන්.පෙරේරා මෙය | කළමණාකරණ සහකාර | Attitudes and skills Development | Institute of Human Resourse Advancement |
| 12 | එන්.කේ.ආර්.ප්‍රසාදිකා මිය | කළමණාකරණ සහකාර | Attitudes and skills Development | Institute of Human Resourse Advancement |
| 13 | එස්.එල්.ජේ.මුහන්දිරම් මයා | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | Exeptional Leadership & Authentic Image Mg | Skill Development Fund Ltd |
| 14 | ජේ.පී.කේ.සංදීප් මයා | කළමණාකරණ සහකාර | Practical Aspect of Bid Evalution | Skill Development Fund Ltd |
| 15 | එච්.මාපලගම මයා | පුහුණු නිලධාරී | Training of Training | Skill Development Fund Ltd |
| 16 | ඒ.එස්.සමරවීර මයා | පුහුණු නිලධාරී | Training of Training | Skill Development Fund Ltd |
| 17 | නදීෂා නිවන්ති මිය | කළමණාකරණ සහකාර | Event Management | Skill Development Fund Ltd |

## 5.9.3 මානව සම්පත් අංශයේ ප්‍රගතිය

## 5.9.4 මුල්‍ය ප්‍රතිපාදන හා වියදම්

| | මුල්‍ය ප්‍රතිපාදන **2015** | වියදම් **2015** | % |
|---|---:|---:|---:|
| පුනරාවර්ථන භාණ්ඩාගාර 52,000,000.00<br>පාඨමාලා ආදායම - 6,070,000.00 | 58,070,000.00 | 53,775,910.51 | 92.60% |
| ප්‍රග්ධන | 47,000,000.00 | 4355872.37 | 9.27% |
| තිරසාර පරිසර සංවර්ධනය සඳහා පරිසර හිතකාමී කැණීම් ක්‍රම හඳුන්වාදීම | 400,000.00 | 22,360.00 | 5.59% |
| අනුග්‍රහක පුහුණු පාඨමාලා | 3,000,000.00 | 148,260.00 | 4.9% |
| වැඩමුළු හා සම්මන්ත්‍රණ | 2,200,000.00 | 767,000.00 | 34.8% |
| මානව සම්පත් සංවර්ධනය | 1,500,000.00 | 534,440.00 | 35.6% |
| කාර්යාල උපකරණ | 1,840,000.00 | 91930.00 | 4.9% |
| පර්යේෂණ උපකරණ | 19,090,500.00 | 6000.00 | 0.03% |
| පුහුණු උපකරණ | 3,000,000.00 | 79,960.00 | 2.66 % |
| පරිගණක හා මෘදුකාංග | 1,719,500.00 | 102,340.00 | 5.95% |
| ගොඩනැගිලි අත්පත්කර ගැනීම | 500,000.00 | - | - |
| පර්යේෂණ ව්‍යාපෘති -මැණික් නිධි ගවේෂණ | 9,000,000.00 | 1,984,082.37 | 22% |
| ප්‍රග්ධන වත්කම් වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය | **2,250,000.00** | **619,500**.00 | **27.53%** |
| ගෙවුඩ තාප පිරියම් | **2,500,000.00** | **-** | - |

## 5.10 ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

### 5.10.1 මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය - 2015

| | | | 2014 | 2015 (කෙටුම්පත) |
|---|---|---|---|---|
| මුළු ආදායම | | රු.මි. | 13,259 | 11,016 |
| මෙහෙයුම් ලාභය | | රු.මි. | 408 | 394 |
| වෙනත් ආදායම් | | රු.මි. | 314 | 307 |
| මුළු වියදම | | රු.මි. | 13,038 | 10,812 |
| පොළී සහ බදු පෙර ශුද්ධ ලාභය | | රු.මි. | 536 | 511 |
| ජංගම නොවන වත්කම් | | රු.මි. | 2,940 | 2,841 |
| ජංගම වත්කම් | | රු.මි. | 14,086 | 14,331 |
| ණය ගැතියන් | | රු.මි. | 4,813 | 4,918 |
| ජංගම නොවන බැරකම් | | රු.මි. | 182 | 204 |
| ජංගම බැරකම් | | රු.මි. | 12,458 | 12,103 |
| ණය ගැතියන් | | රු.මි. | 4,671 | 4,698 |
| ස්කන්ධය | | රු.මි. | 4,386 | 4,865 |
| මුළු වත්කම් | | රු.මි. | 17,027 | 17,173 |

| | | | | |
|---|---|---|---|---|
| ජංගම අනුපාතය | | | 1.13 | 1.18 |
| ROA | | | 3% | 3% |
| ROCE | | | 29% | 25% |

## 5.10.2 උපදේශක අංශය

- උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය **(NRRP)**

| පැකේජය/විස්තරය | | ව්‍යාපෘතියේ මුළු වටිනාකම - ශ්‍රීලරු | සමස්ත භෞතික ප්‍රගතිය-% | සටහන් |
|---|---|---|---|---|
| C1A | මහනුවර - යාපනය මාර්ගය (A009) ගල්කුලම සහ කි.මී. 230 කණුව අතර | **62,948,750,000.00** | **94.83** | ව්‍යාපෘතිය සිදු කෙරෙමින් පවතී |
| C1B | මහනුවර - යාපනය මාර්ගය (A009) ගල්කුලම සහ කි.මී. 230 කණුව අතර | | | |
| C2 | නාවට්කුලි-කාරතිව්-මන්නාරම මාර්ගය (A032) | | | |
| C3 | පුත්තගම-මරිච්චිකඩේ-මන්නාරම මාර්ගය | | | |
| C7 | යාපනයෙහි AB16, AB18, AB20 සහ AB32 මාර්ග | | | |
| C11 | පරන්තන් - මුලතිව් මාර්ගය (A035) | | | |
| C11A | මුලතිව්-කොකිලායි-පුල්මුඩේ මාර්ගය (B297) | | | |
| C11B | ඔඩ්ඩුසුඩාන් - නැදුන්කර්නි මාර්ගය (B334) සහ මුලතිවු - පුලියන්කුලම මාර්ගය (B296) | | | |

- දේශීය බැංකු අරමුදල් ලැබූ මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය **(LBFP)**

| පැකේජය/විස්තරය | | ව්‍යාපෘතියේ මුළු වටිනාකම - ශ්‍රී ල රු | සමස්ත භෞතික ප්‍රගතිය-% | සටහන් |
|---|---|---|---|---|
| C1 | නාගොඩ-නෑබොඩ සහ අවිත්තාව - ලෙවන්දුව මාර්ග | **12,784,173,027.90** | **82** | ව්‍යාපෘතිය සිදු කෙරෙමින් පවතී |
| C2 | නාඋල-ඇලහැර-පල්ලෙගම-හෙට්ටිපොළ සහ හසලක-හඳුන්ගමුව මාර්ග | | | |
| C3 | හපුතලේ-බොරලන්ද-කැප්පෙටිපොළ මාර්ග | | | |
| C4 | බෝදාගම-හම්බෙගමුව-කල්තොටමාර්ගය | | | |

- දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම

| පැකේජය/විස්තරය | ව්‍යාපෘතියේ මුළු වටිනාකම - ශ්‍රීලරු | සමස්ත භෞතික ප්‍රගතිය-% | සටහන් |
|---|---|---|---|
| මාතර සිට බෙලිඅත්ත සහ මත්තල සිට හම්බන්තොට | **255,280,000,000.00** | **8.34** | ව්‍යාපෘතිය සිදු කෙරෙමින් පවතී |

- උතුරු දුම්රිය මාර්ග නැවත ඉදිකිරීම

| පැකේජය/විස්තරය | කාර්යයන්වල මුළු පිරිවැය රු බිලියන | භෞතික ප්‍රගතිය-% |
|---|---|---|
| මැදවච්චිය සිට මඩු පාර | 10.6 | 100 |
| ඕමන්ත සිට පලාලි | 24.0 | 100 |
| මඩු පාර සිට තලෙයිමන්නාරම | 19.5 | 99 |
| පලාලි සිට කන්කසන්තුරය | 19.4 | 99 |
| සංඥා සහ විදුලි සංදේශ ව්‍යාපෘතිය | 11.2 | 99 |

- මාතර- කතරගම දුම්රිය මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය

මාතර-බෙලිඅත්ත කොටස: 71%ක් සම්පූර්ණ කර ඇත. කාර්යයන්වල මුළු පිරිවැය රු.බිලියන 36කි.

- අකුරගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය(DHQC)

මුළු පිරිවැය රු.බි. 77ක් වන මෙම අතිවිශාල ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරු, ප්‍රමාණ සමීක්ෂණ සහ ඉදිකිරීම් කළමනාකරණ සේවාවන් සැපයීම සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වගකිව යුතු වේ. 2015 වර්ෂය අවසානයට සාක්ෂාත් කර ගන්නා ලද ප්‍රගතිය 77%කි.

- ඉහළ කළුගඟ කාර්යයන් සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය රු.මි. 12,723කි. 2015 වර්ෂය අවසානයට සාක්ෂාත් කරගෙන ඇති ප්‍රගතිය 15%කි.

- බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියෙහි ඉදිකිරීම්වල සැලසුම් සහ අධීක්ෂණය සමාලෝචනය කිරීම මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය වෙත පවරා ඇත. මෙම ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය රු.මි. 11,480 කි. සාක්ෂාත් කරගෙන ඇති ප්‍රගතිය 6%කි.

- ත්‍රිකුණාමලය නාවික වරායෙහි ජැටියක් සැලසුම් කිරීම

රු.මි. 1000ක් වන මෙම ව්‍යාපෘතියෙහි 2015 වර්ෂය අවසානයට සාක්ෂාත් කරගෙන ඇති ප්‍රගතිය 40%කි.

- කොළඹ 03, AVICනේවාසික ව්‍යාපෘතිය ඉදිකිරීම

රු.බි.25ක මෙම ව්‍යාපෘතියෙහි ලේඛන සමාලෝචනය සහ නේවාසික අධීක්ෂණය සඳහා සැලසුම් කාර්යාලයෙන් තාක්ෂණික සහාය ලබාගැනීම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වගකිව යුතු වේ. සේවාදායකයා 'ඇවික් හොටෙල්ස් ලංකා සමාගම' වේ.

- රත්මලාන ගුවන් හමුදා කඳවුරෙහි පිහිනුම් තටාකයක් ඉදිකිරීම

පිහිනුම් තරඟ සහ වෝටර් පෝලෝ ක්‍රීඩාව සඳහා භාවිතා කිරීමේ අරමුණින් ජාත්‍යන්තර මට්ටමේ කිමිදුම් පහසුකම් සහිත මීටර් 50ක් දිග මීටර් 25ක් පළල (වැනල 10) පිහිනුම් තටාකයක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ. ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය රු.මි.192කි. මෙම ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කර ඇත.

## 5.10.3 ඉදිකිරීම් අංශය

- හම්බන්තොට, මහ රෝහල ඉදිකිරීම

පෞද්ගලික සමාගම් සමඟ සිදුකරන ලද තරඟකාරී ලංසු තුලින් මහල් 10ක ඇඳන් 850ක රෝහලක් ඉදිකිරීම සඳහා වන මෙම කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකි වී ඇත. මුළු ව්‍යාපෘති පිරිවැය රු.මි. 1,654කි. එහි ඉලක්ක සාක්ෂාත් කරගනිමින් ව්‍යාපෘතිය සාර්ථකව සිදුකරමින් පවතී. 2015 වර්ෂය අවසානයට සාක්ෂාත් කරගෙන ඇති භෞතික ප්‍රගතිය 95%කි.

- රත්මලාන, ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙහි උපාධිධාරී අධ්‍යයන පීඨය සඳහා අධ්‍යයන ගොඩනැගිලි ඉදිකිරීම

මෙම ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සාර්ථකව සම්පූර්ණ කර ඇත. මුළු ඉදිකිරීම් පිරිවැය රු.මි. 690කි.

- කොළඹ, මහල් 10කින් යුත් දන්ත රෝහල් ගොඩනැගිල්ලක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම

සාක්ෂාත් කරගත් ප්‍රගතිය 99%. මුළු පිරිවැය රු.මි. 624 කි.

- මොරාන ජලාශය ඉදිකිරීම

සාක්ෂාත් කරගත් ප්‍රගතිය 31%. මෙම ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය රු.මි.1008කි.

- රත්මලාන ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලයෙහි ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථානය (බස්නාහිර-දකුණ) සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම

මෙම ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය රු.මි. 338කි. මෙම ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කර ඇත.

- පොළොන්නරුව මහ රෝහල සඳහා සිව් මහල් වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම

රු.මි.352ක මෙම ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කර ඇත.

- බත්තරමුල්ල ජාතික පරිසර මහ ලේකම් කාර්යාලයක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම - හරිත ඉදිකිරීම් ව්‍යාපෘතියකි

මෙම ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය රු.මි. 1126කි. සාක්ෂාත් කර ඇති ප්‍රගතිය 22%.

## 5.10.4 අන්තර්ජාතික අංශය

- මැලේසියාවේ ක්වාලාලම්පූර් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් නිල නිවස අළුත්වැඩියා කිරීම

මෙම කාර්යයයෙහි මුළු පිරිවැය රු.මි.63කි. 2015 වර්ෂය අවසානයට සාක්ෂාත් කර ඇති ප්‍රගතිය 2%කි. කාර්යය සිදු කරමින් පවතී.

- මියන්මාරයේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය නිල නිවස අළුත්වැඩියා කිරීම

මෙම කාර්යයෙහි මුළු පිරිවැය රු.මි. 42 කි. වර්ෂය අවසානයට සාක්ෂාත් කර ඇති ප්‍රගතිය 90%කි.

## 5.10.5 සම්මාන

2015 වර්ෂය සඳහා ආයතන සඳහා "ඉංජිනේරු විශිෂ්ටතා"සම්මානය- උපදේශක සේවාවන් සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිරිනමන කුසලතා සහතිකය.

## 5.11මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය

### හැඳින්වීම

මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය පළමු වන පියවරේ සංවර්ධන කටයුතු පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම්වලින් සමන්විත වේ.

1. අඹන් ගඟ හරහා ඉදි වන මොරගහකන්ද ජලාශය ප්‍රධාන බැම්මක්, සැදලි වේලි දෙකක්, වාන් දොරටුවක් EMC සොරොව්වක්. UEC සොරොව්වක් , මෙගා වොට් 25 ක ජල විදුලි බලාගාරයක් සහ 16 Km ක් දුරට දිවෙන විදුලි සම්ප්‍රේෂණයකින් සමන්විත වේ.

2. කළුගඟ අඹන්ගඟේ ප්‍රධාන අතු ගංඟාවකි. වන කළුගඟ හරහා ඉදි වන කළු ගඟ ජලාශ ව්‍යාපෘතිය ගලින් පුරවන ලද වේලි දෙකකින්, LB සහ RB ඇළවල් සඳහා සොරොව් දෙකකින් යුත් වානකින් ද ඇළ මාර්ගයකට සහ උමගකට සම්බන්ධවන තවත් සොරොව්වකින් සමන්විත වේ.

3. EMC සොරොව්ව සමඟ සම්බන්ධවන අනුරාධපුර මහකනදරාව දක්වා වූ 78 Km ක් දිග ඉහල ඇළහැර ඇළ මාර්ගය ඉදිකිරීම සහ UEC සොරොව්ව සමඟ සම්බන්ධවන හුවමාරු උමගකින් සහ ඇළකින් යුත් ඉදිකිරීම් ( මෙය වෙනම ව්‍යාපෘතියක් ලෙස සම්පූර්ණ කිරීමට නියමිතය.)

4. පහත දැක්වෙන නැවත පදිංචි කිරීමේ ප්‍රදේශවල සමාජ යටිතල පහසුකම් හා වාරි මාර්ග සංවර්ධනය කිරීම.

   i. කළුගඟ ජලාශ ව්‍යාපෘතියට අයත් F කලාපය - (වම් ඉවුර හෙක්ටයාර් 1900 දකුණු ඉවුර හෙක්ටයාර් 1700)
   ii. කවුඩුල්ල වම් ඉවුර විශාල කිරීමේ ව්‍යාපෘතිය යටතේ සිදු වන සංවර්ධන කලාපය - D (හෙක්ටයාර් 2000)

5. ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු නිසා සිදු වන ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ කටයුතු - (ආසන්න වශයෙන් පවුල් 3000 ක් පමණ)

6. මොරගහකන්ද - කළුගඟ ජලාශ ව්‍යාපෘතිවලට අදාල පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා EIA වාර්තා මගින් යෝජිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.

සංවර්ධන ක්‍රියාවලිය වර්ෂ 2007 දී ආරම්භ වූ අතර ඒ හා සම්බන්ධ පහත සඳහන් ක්‍රියාවලි 2015 වර්ෂය දක්වා ක්‍රියාත්මක විය.

### 5.11.1 මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියට අදාල මූලික කාර්යයන්

කලු ගලින් පුරවන ලද වේල්ලක් සහ RCC වේල්ලක් වශයෙන් වේලි 02 ක්, අනෙකුත් නිර්මිතයන් ඉදිකිරීම සඳහා EPC ක්‍රමය යටතේ චීන, සිනෝහයිඩ්‍රෝ සමාගමට කොන්ත්‍රාත්තුවක් පිරිනමා ඇත. කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 252.3 කි. එයින් 85% ක් අරමුදල් චීන සංවර්ධන බැංකුවෙන් ලැබෙන අතර ඉතිරි 15% ශ්‍රී ලංකා රජය මගින් සපයනු ලබයි.

මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියේ ප්‍රධාන නිර්මිතයන්ට අදාල විස්තර පහත දැක්වේ.

| අයිතමය | වැඩ විස්තරය | 2015 වර්ෂයතුළදී අවසන් කර ඇති කාර්යය ප්‍රමාණය (%) | 2015 වර්ෂය අවසානය දක්වා අවසන් කරන ලද සමුච්චිත කාර්යය ප්‍රමාණය (%) | 2015 වර්ෂය තුළ මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| 1.0 | ප්‍රධාන වේල්ල ඉදි කිරීම | 19.0 | 37.9 | 4764.88 |
| 2.0 | සෑදලි වේලි 1 (EMC,EUC, බලාගාරය, වාන් මාර්ග වැනි ඉදි කිරීම්ද ඇතුලත්ව) | 33.1 | 66.6 | |
| 3.0 | සෑඳලි වේල්ල 1 | 2010 **වසරේ** අවසන් කර ඇත. | | |

## 5.11.2 කළුගඟ ජලාශ ව්‍යාපෘතියේ ප්‍රධාන නිර්මිතයන්

මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් සපයනු ලබන්නේ අරාබි සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල, සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල සහ ශ්‍රී ලංකා ජනරජය මගිනි.

කළුගඟ ජලාශ ඉදි කිරීමේ ව්‍යාපෘතිය කොන්ත්‍රාත්තුව චීන සිනෝහයිඩ්‍රෝ සමාගම වෙත වර්ෂ 2014 මාර්තු මස 12 වන දින පිරිනමා ඇත. අදාල ව්‍යාපෘතිය සඳහා වන කොන්ත්‍රාත් වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 124.94 ක් වන අතර වැඩ ආරම්භය වර්ෂ 2014 අප්‍රේල් මස 02 වන දින සිදු කරන ලදි.

කළුගඟ ජලාශ ව්‍යාපෘතියේ ප්‍රධාන නිර්මිතයන්ට අදාල විස්තර පහත දැක්වේ.

| අයිතමය | වැඩ විස්තරය | 2015 වර්ෂයතුළ දී අවසන් කර ඇති කාර්යය ප්‍රමාණය (%) | 2015 වර්ෂය අවසානය දක්වා අවසන් කරන ලද සමුච්චිත කාර්යය ප්‍රමාණය (%) | 2015 වර්ෂය තුළ මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| 1.0 | ප්‍රාථමික සහ අනෙකුත් සාමාන්‍ය කටයුතු | 25.1 | 69.1 | 2486.74 |
| 2.0 | ප්‍රධාන වේල්ල ඉදි කිරීම | 13.1 | 14.1 | |
| 3.0 | සෑදලි වේල්ල | 5.7 | 6.7 | |

- **පහළ නිම්න ප්‍රදේශයේ සංවර්ධන කටයුතු**

කළුගඟ පහළ නිම්න ප්‍රදේශයේ F කලාපය තුළ ඉඩම් හෙක්ටයාර් 3600 ක් වන අතර, කවුඩුල්ල වම් ඉවුර ඇළ මාර්ගය පුළුල් කිරීම යටතේ ඉඩම් හෙක්ටයාර් 2000 ක් වශයෙන් දේශීය අරමුදල් යටතේ සංවර්ධනය කර ඇත. එයට අදාල විස්තර පහත පරිදි වේ.

- **මිනුම් කටයුතු**

✓ කළුගඟ දකුණු ඉවුර

  - ගුරුවෙල සහ ලග්ගල නව නගරයට සම්බන්ධ මාර්ග ජාලයේ මිනුම් කටයුතු අවසන් වී ඇත.
  - ඇළ මාර්ග සම්බන්ධ මිනුම් කටයුතු 50% ක් අවසන් කර ඇත.

- ✓ කළුගඟ වම් ඉවුර
    - ○ මා ඔය තෝරපිටිය සහ වැල්ලේවෙල කුඩා ගම් සම්බන්ධයෙන් වන මිනුම් කටයුතු 75% ක් අවසන් කර ඇත.
    - ○ ඇළ මාර්ග සම්බන්ධයෙන් වන මිනුම් කටයුතු 60% ක් අවසන් කර ඇත.

- ✓ මැදිරිගිරිය සංවර්ධන ප්‍රදේශය - D
    - ○ ඇළ මාර්ග සම්බන්ධයෙන් වන මිනුම් කටයුතු 30% ක් අවසන් කර ඇත.

- **ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු**

- ✓ කළුගඟ දකුණු ඉවුර
    - ○ 2015 ව**සරේ** දී අලුතින් පොදු සේවා ගොඩනැගිලි 14 ක් ඉදි කිරීම ආරම්භ කර ඇත.
    - ○ 2015 වසර වන විට ඉදිකිරීම් ආරම්භ කර තිබූ ගොඩනැගිලි 22 කින් ගොඩනැගිලි 04 ක වැඩ කටයුතු අවසන් කිරීම.
- ✓ කළුගඟ වම් ඉවුර (මොරගහකන්ද)
    - ○ 2015 වර්ෂයේ දී අලුතින් ගොඩනැගිලි 07 ක කටයුතු ආරම්භ කර ඇත.
    - ○ කළුගඟ වම් ඉවුර ප්‍රදේශයේ ගොඩනැගිලි 20 ක් ඉදි කෙරෙමින් පැවති අතර ඉන් ගොඩනැගිලි 07 ක වැඩ කටයුතු 2015 වර්ෂය තුළ දී අවසන් කර ඇත.

- ✓ මැදිරිගිරිය සංවර්ධන ප්‍රදේශය - D
    - ○ මැදිරිගිරිය ප්‍රදේශයේ ගොඩනැගිලි 06 ක් ඉදි කෙරෙමින් පැවති අතර එම සියලුම ගොඩනැගිලිවල ඉදි කිරීම් 2015 වර්ෂය තුළ දී අවසන් කර ඇත.

- **මාර්ග ඉදිකිරීම්**
- ✓ කළුගඟ දකුණු ඉවුර
    - ○ ප්‍රධාන මාර්ගය (කාපට් අතුරන ලද 10 Km ක් සහිතව) 65% ක් අවසන් කර ඇත.
    - ○ අතුරු මාර්ග ( 04 Km) 65% ක් අවසන් කර ඇත.
    - ○ කුඩා ගම්වල මාර්ග ( 22.159 Km) 74% ක් අවසන් කර ඇත.

- ✓ කළුගඟ වම් ඉවුර (මොරගහකන්ද)
    - ○ ප්‍රධාන මාර්ගය ( කාපට් අතුරන ලද 28.82 Km ක් සහිතව) 50% ක් අවසන් කර ඇත.
    - ○ කුඩා ගම්වල මාර්ග ( 19.4 Km) අවසන් කර ඇත.

- ✓ මැදිරිගිරිය සංවර්ධන ප්‍රදේශය - D
    - ○ ප්‍රධාන මාර්ගය (බොරලු අතුරා 8.5 Km ක් සහිතව) සම්පූර්ණ කර ඇත.

- **වාරිමාර්ග සංවර්ධන කටයුතු**

- ✓ කළුගඟ දකුණු ඉවුර
    - ○ ඇළ මාර්ග ( 29.67 Km) 81% අවසන් කර ඇත.

- ✓ කළුගඟ වම් ඉවුර
    - ○ ඇළ මාර්ග ( 36.29 Km) සම්පූර්ණ කර ඇත.
    - ○ පුවක්වල්පොත LC වැව සම්පූර්ණ කර ඇත.

✓ මැදිරිගිරිය සංවර්ධන ප්‍රදේශය - D
  - ප්‍රධාන ඇළ මාර්ගය පුළුල් කිරීම 90% ක් සම්පූර්ණ කර ඇත.
  - වම් ඉවුර ඇළ මාර්ගය පුළුල් කිරීම (1.3Km - 8.0 Km) 70% ක් සම්පූර්ණ කර ඇත.

- **ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම**

සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව මොරගහකන්ද සහ කළුගඟ සංවර්ධන ව්‍යාපෘති දෙක හේතුවෙන් පවුල් 2874 කට පමණ බලපෑම් ලක්වන බවට ගණන් බලා ඇත. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය දැනටමත් සකස් කර ඇති අතර එය බලපෑමට ලක් වූ පවුල් අතර බෙදා දී ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී.

නැවත පදිංචිකිරීමේ සැලැස්ම - 2015 මොරගහකන්ද ජලාශය

| **ග්‍රාම නිළධාරී වසම** | **2015 වර්ෂය අවසානය වන විට නැවත පදිංචි කර ඇති පවුල් ගණන (සමුච්චිත වශයෙන්)** | **2015 වර්ෂය තුලදී නැවත පදිංචි කර ඇති පවුල් ගණන** | **ඉඩම්ලාභීන් සඳහා ගොඩ හා වාරි ඉඩම් වෙනුවට 1,600,000.00 ක මුදල ලබා දෙන ලද පවුල් ගණන** | **ඉඩම්ලාභීන් සඳහා වාරි ඉඩම වෙනුවට රු. 1,200,000.00 ක මුදල ලබා දෙන ලද පවුල් ගණන** |
|---|---|---|---|---|
| තලාගොඩ | 236 | 20 | 26 | 36 |
| කඩවත | 162 | | 14 | 47 |
| කඹරව | 195 | 195 | 34 | |
| ගල්පෝරුගොල්ල | 82 | 82 | 32 | 3 |
| ඇලගමුව | 40 | 40 | 38 | 1 |
| මැදපිහිල්ල | 02 | 02 | 51 | 2 |
| එකතුව | 717 | 339 | 195 | 89 |

නැවත පදිංචිකිරීමේ සැලැස්ම - 2015 කළුගඟ ජලාශය

| **ග්‍රාම නිළධාරී වසම** | **2015 වර්ෂය අවසානය වන විට නැවත පදිංචි කරන ලද පවුල් ගණන (සමුච්චිත වශයෙන්)** | **2015 වර්ෂය තුලදී නැවත පදිංචි කරන ලද පවුල් ගණන** |
|---|---|---|
| කරඳමුල්ල | 175 | 13 |
| ගුරුවෙල | 10 | |
| හල්මිනිය | 01 | |
| මිණිරන්කැටිය | 01 | |
| අකරහැඩිය | 04 | |
| එකතුව | 191 | 13 |

- **ඉඩම් අත් පත් කර ගැනීම සහ වන්දි ගෙවීම**

2015 වර්ෂය තුලදී එක් එක් සංවර්ධන ප්‍රදේශ සඳහා ගෙවන ලද වන්දි මුදල් පහත දැක්වේ.

මොරගහකන්ද - රුපියල් මිලියන 451.30 ( ඉඩම් කැබලි 724 ක් සඳහා)
කළුගඟ - රුපියල් මිලියන 121 ( ඉඩම් කැබලි 326 ක් සඳහා)
මැදිරිගිරිය - රුපියල් මිලියන 45 ( ඉඩම් කැබලි 150 ක් සඳහා)

- **පාරිසරික නිදහස් කිරීම සහ බලපෑම් අවම කිරීමේ කටයුතු**

මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියට අදාල පාරිසරික වාර්තා මගින් දක්වා ඇති පාරිසරික බලපෑම් අවම කිරීමට අදාල නිර්දේශිත ක්‍රියාකාරකම් 2007 වර්ෂයේ සිට සියලුම ඉදිකිරීම් කටයුතුවලට සමගාමීව ක්‍රියාවට නංවා ඇත.
මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව පාරිසරික වාර්තා මත පදනම්ව පාරිසරික කළමනාකරණ ක්‍රියාවලියක් ව්‍යාපෘති දෙක සඳහාම සකස් කර ඇත.

පහත දැක්වෙන ක්‍රියාකාරකම් 2015 වර්ෂයතුලදී ක්‍රියාවට නංවා ඇත.

## 5.11.3 මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය

- ස්වාරක්ෂිත කලාපය සංවර්ධනය

ජලාශය පිරෙන උපරිම මට්ටමේ 100 m දක්වා වූ ස්වාරක්ෂිත කලාපය තුල රුක් රෝපණය කිරීම 2014 සිට 2015 දක්වා 02 Km ක ස්වාරක්ෂිත කලාපයේ ගස් නඩත්තු කිරීම

- වන සංරක්ෂණ වැඩසටහන්

✓ ජල පෝෂක ප්‍රදේශවලවල වන ආවරණය වැඩි දියුණු කිරීම.

- මොරගහකන්ද ජල පෝෂක ප්‍රදේශය ආවරණය කරන කැලෑ ප්‍රදේශය තුල එකිනෙකට වෙනත් ස්ථාන හයක රුක් රෝපණය කිරීමෙන් පාර දෙපස වැඩි දියුණු කිරීම.
- පාර දෙපස රුක් රෝපණය සහ ගඟ දෙපස ගස් සිටුවීම - කොන්ගහවෙල ඇළහැර මාර්ගය දෙපස මුඩු ප්‍රදේශයේ රුක් රෝපණය (10 Km) සහ මාඔය ගඟ දෙපස කුඹුක් පැළ 1000 ක් සිටුවීම.
- කාබනික පොහොර පමණක් භාවිතා කරමින් සාම්ප්‍රදායික එළවලු වර්ග 15 ක් වගා කරන ආදර්ශ කාබනික ගෙවතු ස්ථාපිත කිරීම සහ පලතුරු වගා කිරීමේ ගෙවතු වැඩි දියුණු කිරීම යටතේ පලතුරු පැළ 8864 ක් බෙදා දීම.
- මේ යටතේ දේශීය ඖෂධ පැල වර්ග 500 ක් ආවේණික පැල වර්ග 32 ක් හා ඒකදේශික ශාක උද්‍යානය තුල 2014 වර්ෂයේ ආරම්භ කර 2015 වර්ෂයේ ද පවත්වාගෙන යෑම.
- ශ්‍රී ලංකාවට ආවේණික ලෙඩ සුව කිරීම සඳහා යොදා ගන්නා කුළු බඩු වර්ග ඇතුලත් ආයුර්වේද උයන් සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම. ශ්‍රී ලංකාවට ආවේණික කුළු බඩු වර්ග 32 ක් රෝපණය කිරීම.
- කුණු රොඩු පිරි ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සහ ජලාශවල පත්ල පිරිසිදු කිරීම. - මොරගහකන්ද ජල පෝෂක ප්‍රදේශයේ කුණු රොඩු සහිත ස්ථාන දෙකක වැඩ කටයුතු අවසන් කර ඇත. ජලාශවලට යටවන ප්‍රදේශ පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය යටතේ ශාක 46,000 ක් ලැයිස්තු ගත කර ඇති අතර ඒවා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය දැව සංස්ථාව මගින් ඉවත් කර ඇත.
- මොරගහකන්ද ජලාධාර ප්‍රදේශයේ ග්‍රාමීය පැළ තවාන් ස්ථාපිත කිරීම. - මොරගහකන්ද ජල ධාරා ප්‍රදේශයේ ග්‍රාමීය පැල තවාන් 06 ක් ස්ථාපිත කර ඇත. (රජාවෙල, සේනාගම, ඕපල්ගල, නාඋල සහ පුබ්බිලිය). ජල පෝෂක ප්‍රදේශවල රෝපණය සඳහා පැළ 8810 ක් නිකුත් කර ඇත.

- වන සංවර්ධන වැඩ සටහන - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

කැලෑ ප්‍රදේශ සාරවත් කිරීමට, ආරක්ෂිත ප්‍රදේශය සංවර්ධනය කිරීමට, විදුලි වැට ඉදි කිරීමට, සීමා මායිම් කිරීමට, දිය පහරවල් සංරක්ෂණය කිරීමට සහ කැලෑව නඩත්තු කිරීම සඳහා රුපියල් මිලියන 10.87 ක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට MASL සහ FD අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම මත ලබා දී ඇත.

- මධ්‍යම පැළ තවානේ පැළ නිෂ්පාදනය

2015 වර්ෂය තුලදී පැළ 29,386 ක් නිෂ්පාදනය කර ඇති අතර ඉන් පැළ 15,000 ක් මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද රුක් රෝපණය කිරීමේ ව්‍යාපෘතියකට නිකුත් කර ඇත.

- පාංශු සංරක්ෂණය කිරීමේ ක්‍රියා මාර්ග

පාංශු සංරක්ෂණය කිරීමේ ක්‍රියාවලිය යටතේ මොරගහකන්ද ජල පෝෂක ප්‍රදේශයේ ඇති ආදාවල සහ උඩගම ප්‍රදේශවල ගෙවතු 05 ක් සංවර්ධනය කර ඇත.

- වන ජීවී සංරක්ෂණ වැඩ සටහන

වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ මොරගහකන්ද ව්‍යාපෘතිය වෙනුවෙන් මහවැලි අධිකාරිය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව රුපියල් මිලියන 04 ක් වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව සපයා ඇති අතර එමගින් පහත සඳහන් කටයුතු අවසන් කර ඇත.

- ✓ කුමාරගල කන්ද විදුලි වැට ඉදි කිරීම. - වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 26.40 ක් 2014 වර්ෂයේදී ලබා දී ඇත.
- ✓ ගම්මාන තුල අඩි පාරවල් **කි. මී.** 25 ක් සකස් කිරීම 2015 වර්ෂයේ අවසන් කර ඇත.
- ✓ අතරගල්ලෑව විදුලි වැට ඉදි කිරීම.- වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 10 ක් 2014 වර්ෂයේදී ලබා දී ඇත.
- ✓ අතුරු මාර්ග **කි. මී.** 15 ක් සකස් කිරීම 2015 වර්ෂයේ අවසන් කර ඇති අතර ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇත.
- ✓ ජීව වැට ස්ථාපිත කිරීම. - විදුලි වැටට සමගාමීව බෝගන්විලා සහ පැගිරි කුලයේ ශාක වලින් ස්ථිර වැටක් ඉදි කිරීම ස්ථාපිත කර ඇත.
- ✓ විදුලි වැට නඩත්තු කිරීම.- අලි වැටවල් දෙකක නඩත්තු කටයුතු සිදු කරනු ලැබේ. ( සදවාසල කන්ද සිට පුබ්බිලිය දක්වා විදුලි වැට සහ සීගිරිය සිට වෑවල දක්වා විදුලි වැට)

- ජෛව විවිධත්ව සංරක්ෂණ වැඩ සටහන

මොරගහකන්ද ප්‍රධාන වේල්ල ඉදි කිරීම් කටයුතු හේතුවෙන් අඹන් ගඟ හැරවීමේදී ජලය නොමැති වීමෙන් ජලජ ජීවීන් මුදවා ගැනීමේ ක්‍රියාවලිය ICUN නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් අවසන් කර ඇත. මසුන් සහ අනෙකුත් සත්ව විශේෂ අඹන් ගඟේ වියලි ප්‍රදේශවල සිට මුදවාගෙන ගඟේ ඉහල ප්‍රදේශවලට මුදවා හැර ඇත.

- කුඩා ප්‍රමාණයේ ජලසම්පාදන ව්‍යාපෘති පු**නරු**ත්**ථා**පනය සහ ජල පෝෂක ප්‍රදේශවල ජීවත් වන ප්‍රජා වගේ ජීවන තත්වය උසස් කිරීමේ වැඩසටහන්
- ✓ ඕපල්ගල විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම.
- ✓ කඹරව මාර්ගයේ **කි.මී** 5 ක්, ගලබොඩ මාර්ගයේ **කි. මී** 5.4 ක්, සොහොන් කනත්ත මා**ර්ගයේ කි.මී** 01 ක්, **සහ** පුබ්බිලිය මාර්ගයේ **කී.මී** 0.75 ක් බොරළු යොදා ප්‍රතිසංස්කරණය කිරීම.

- ගොවි නිෂ්පාදන සහ ආදායම උපයා ගැනීමේ ක්‍රියාවලීන්

ජල පෝෂක ප්‍රදේශවල පිහිටි ගෙවතු වගා 04 ක් කජු හා ගම්මිරිස් වගා කරමින් සංවර්ධනය කිරීම.

- නිළධාරීන්ගේ පුහුණුව සහ ධාරිතා වර්ධනය කිරීම.

දැනුවත් කිරීමේ වැඩ සටහන් 06 ක් අවසන් කර ඇත. තවද විශ්ව විද්‍යාල සිසුන් සඳහා පුහුණු වැඩ සටහන් 02 ක් ද, පාසල් ළමුන් සඳහා පුහුණු වැඩ සටහන් 05 ක් ද අවසන් කර ඇත.

- පුරාවිද්‍යාත්මක සංරක්ෂණය

මැදකිඳ වෙහෙර ගොඩැල්ල, තලාගොඩ දාගැබ සහ තලාගොඩ පැරණි නටඹුන් සහිත පන්සල් භූමිය වැනි පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන 03 ක කැනීම් කටයුතු පුරාවිද්‍යාත්මක දෙපාර්තමේන්තුව මගින් අවසන් කර ඇත. මෙම ස්ථානය සහ රජාවෙල පුරාවිද්‍යාත්මක ස්ථානයේ පුරාවිද්‍යාත්මක සංරක්ෂණය අවසන් කර ඇත.

**මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේම සියලු පුරාවිද්‍යාත්මක සංරක්ෂණ කටයුතු අවසන් කර ඇත.**

## 5.11.4 කළුගඟ ව්‍යාපෘතිය

- ස්වාරක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය කිරීම.

කළුගඟ ජලාශ ව්‍යාපෘතියේ 100 m රක්ෂිත ප්‍රදේශයේ පැළ 1380 ක් රෝපණය කර ඇත. අංක 07 සහ 09 දරණ වැව්වලට අයත් 50 m වැව් රක්ෂියේ රුක් රෝපණය අවසන් කර ඇත.(පැළ 7360 ක්)

- පැළ රෝපණය කිරීමේ වැඩ සටහන
  - ✓ ව්‍යාපෘතිය මගින් ක්‍රියාවට නැංවීම.

- ගංගා රක්ෂිතයේ රුක් රෝපණය - නිකවතුරු ඔය සහ කළු ගඟ 60 m රක්ෂිතය තුල උණ පැළ 2068 ක් රෝපණය කර ඇත.
- මග දෙපස රුක් රෝපණය, ශාක රෝපණය සහ ප්‍රසිද්ධ ස්ථාන මිනුම්ගත කර වෙන් කිරීම, වැල්ලවෙල ගුරුවෙල නව මාර්ගයේ සහ නව රනමුරේ මාර්ගයේ ශාක රෝපණය, පොලිස් ස්ථානයේ, නිල නිවාස සහ කාර්යාල ස්ථානවල සහ නිල නිවාස අනෙකුත් ප්‍රසිද්ධ ස්ථානවල රුක් රෝපණය සහ භූමිය සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇත.
- ග්‍රාමීය පැල තවාන් ස්ථාපිත කිරීම - ග්‍රාමීය පැල තවාන් 07 ක් ස්ථාපිත කර ඇති අතර පැළ 18630 ක් බෙදා හැර ඇත.

  - ✓ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාවට නැන්වීම.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව කැලෑ සංවර්ධනය කිරීම සඳහා, කැලෑ නඩත්තු කිරීම සඳහා, සීමා මායිම් ළකුණු කිරීම සඳහා, විදුලි වැට ඉදි කිරීම සඳහා සහ ආරක්ෂිත කලාප සංවර්ධනය කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 14.73 ක් සපයා දී ඇත.

- මධ්‍යම පැළ තවානේ පැළ නිෂ්පාදනය

2015 වර්ෂයතුලදී පැළ 34,907 ක් නිෂ්පාදනය කර ඇති අතර ඉන් පැළ 20,000 ක් කළු ගඟ ජල පෝෂක ප්‍රදේශවල ක්‍රියාත්මක කරන ලද රුක් රෝපණ ව්‍යාපෘතියකට නිකුත් කර ඇත.

- පාංශු සංරක්ෂණය කිරීමේ ක්‍රියා මාර්ගය

පාංශු සංරක්ෂණය කිරීමේ ක්‍රියාවලිය යටතේ කළු ගඟ ජල පෝෂක ප්‍රදේශයේ ඇති ගෙවතු 04 ක් සංවර්ධනය කර ඇත. ( අක්කර 08 ක්)

- කුඩා ප්‍රමාණයේ ජලසම්පාදන ව්‍යාපෘති පුණරුත්තාපනය සහ ජල පෝෂක ප්‍රදේශවල ජීවත්වන ප්‍රජාවගේ ජීවන තත්වය උසස් කිරීමේ වැඩසටහන්

2015 වර්ෂයතුලදී අමුණු 07 ක් සහ කොන්ගමුව වාරි මාර්ග ඇළ, එගොඩ කුඹුර වාරි මාර්ග ඇළ, පන්නලපිටිය අමුණ සහ වාරි මාර්ග ඇළ, පිටවල පහල ඉහල අමුණ සහ වාරි මාර්ග ඇළ, රත්තින්ද ගල්කැටිය අමුණ සහ වාරි මාර්ග ඇළ, මාවාල අමුණ සහ වාරි මාර්ග ඇළ සහ ගුරුවෙල මාස්වෙල වාරි මාර්ග ඇළ ඇතුලු වාරි මාර්ග ඇලවල් ප්‍රතිසංස්කරණය කරන ලදි. එසේම කළු ගඟ ජල පෝෂක ප්‍රදේශයේ පිහිටි කෘෂිකාර්මික පාරවල් 05 ක් ද 2015 වර්ෂය තුලදී ප්‍රතිසංස්කරණය කරන ලදි. (3Km)

- වන සත්ව සංරක්ෂණ වැඩ සටහන

වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ කළු ගඟ ව්‍යාපෘතිය සඳහා වන මහවැලි අධිකාරිය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව 2015 වර්ෂයේ රුපියල් මිලියන 40 ක් වනජීවි දෙපාර්තමේන්තුවට සපයා ඇත.

- ✓ ජීව වැට ස්ථාපිත කිරීම. - විදුලි වැටට සමගාමීව බෝගන්විලා සහ පැගිරි කුලයේ ශාක වලින් ස්ථිර වැටක් ඉදි කිරීම ස්ථාපිත කර ඇත.
- ✓ අලි ඇතුන් සඳහා වන කළම**නාකරණ** මධ්‍යස්ථානයක් පහත සඳහන් පහසුකම් සහිතව ගුරුවෙල ප්‍රදේශයේ ස්ථාපිත කර ඇත.
    - මසකට ඉන්ධන ලීටර් 300 ක් සමඟ වන ජීවී දෙපා**ර්තමේ**න්තුවට වාහනයක් ලබා දීම
    - අලිවෙඩි ලබා දීම
    - නවාතැන් පහසුකම් සපයා දීම.
    - දුරකතන සහ විදුලි පහසුකම් ආදිය සපයා දීම.
    - වන ජීවි නිළධාරීන්ගේ යැපුම් අවශ්‍යතා සපයා දීම.

- වන අලි ඇතුන් කළමනාකරණ ඒකකයක් පහත සඳහන් පහ**සු**කම් සහිතව පිහිටුවීම.- ලග්ගල පල්ලේගම, කරඳමුල්ල, කජු වත්ත, කහගල සහ පිටවල අලි ඇතු**න්** සංරක්ෂණ කමිටු 04 ක් ස්ථාපිත කර ඇත.
- විදුලි වැට නඩත්තු කරන පුද්ගලයන් සඳහා නවාතැන් පහසුකම් සහ ආරක්ෂිත කුටි ඉදි කිරීම. නවාතැන් ගැනීම සඳහා කාමර 02 ක් සහ ආරක්ෂිත කුටි 05 ක් ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ලබාදී ඇති අතර ඇති ඒවා ඉදි කිරීම් කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.
- සිවිල් ආරක්ෂක බලකාය සඳහා තාවකාලික කුටි ස්ථාපිත කිරීම. - 60 km ක් දක්වා දිවෙන විදුලි වැටේ නඩත්තු කටයුතු සඳහා අතවශ්‍ය පහසුකම් සහිතව තාවකාලික කුටි ස්ථාපිත කර ඇත.
- ජෛව විවිධත්ව සංරක්ෂණ වැඩ සටහන

ව්‍යාපෘති ප්‍රදේශවල ඇති ආක්‍රමණික ශාක වර්ග ඉවත් කිරීම. - සංවර්ධන ප්‍රදේශවල ඇති යෝධ නිදිකුම්බා ශාක සම්පූර්ණයෙන් ඉවත් කර ඇත.

- ගොවි නිෂ්පාදන සහ ආදායම උපයා ගැනීමේ ක්‍රියාවලීන්

    - ✓ ජල පෝෂක ප්‍රදේශවල ගොවීන් විසි දෙනෙක් අතරේ ''පැරසුට් තැටි'' 3000 ක් බෙදා හැර ඇත.
    - ✓ වාණිජ මට්ටමේ ආදර්ශනයක් ලෙස අනෝදා පැළ 1500 ක් වගා කර ඇත.

- නිළධාරීන්ගේ පුහුණුව සහ ධාරිතාවය වර්ධනය කිරීම.

    - ✓ පස සංරක්ෂණය සහ පැළ තවාන් කළමණාකරනයද ඇතුලත් දැනුවත් කිරීමේ වැඩ සටහන් 05 ක් අවසන් කර ඇත.
    - ✓ පාසැල් ළමුන් සඳහා පරිසර සංරක්ෂණය සහ ගෙවතු කළම**නාකරණය** පිළිබඳ පුහුණු වැඩ සටහන් 03 ක් පවත්වා ඇත.
    - ✓ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීමේ තේමාව යටතේ 'ජල පෝෂක ප්‍රදේශවල පිහිටි පාසැල් 20 ක සිසු දරු දැරියන්ගේ සහභාගිත්වයෙන් චිත්‍ර තරගයක් පවත්වන ලදි.

- පාංශු කළම**නාකරණ**ය සහ අනෙකුත් පරිසර සංරක්ෂණ කටයුතු

තෙලිගමු ඔය, පිටවල පතන වැනි නකල්ස් කලාපයට අයත් ප්‍රදේශවල පස සෝදා යෑම වලක්වා සංරක්ෂණය කිරීමේ වැඩ සටහන් 12 ක් පවත්වා ඇත.

## 5.11.5 මූල්‍ය ක්‍රියාකාරිත්වය

| මූල්‍ය අයිතමය | 2015 අය වැය | සංශෝධිත අය වැය | වියදම |
|---|---|---|---|
| DF -11 | 2000.00 | 3500.00 | 3500.00 |
| DFA 12 | 5100.00 | 5100.00 | 4998.01 |
| RFA 14 | 1000.00 | 1000.00 | 587.08 |
| FARDF 17 | 1000.00 | 1530.36 | 1520.011 |

- මූල්‍ය සහ භෞතික ක්‍රියාකාරකම් පිළිබඳ වැඩිදුර කරුණු අඩංගු වාර්තාව

| අංකය | ක්‍රියාකාරකම | වෙන් කල මුදල | වියදම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **1.0** | වේල්ල පරීක්ෂාව සහ ඉදි කිරීම් | | | |
| | DF (11) | 146.42 | 146.42 | 100.00 |
| | DFA (12) | 5,100.00 | 4,998.01 | 98.00 |
| | RFA (14) | 1,000.00 | 587.08 | 58.71 |
| | FARDF (17) | 1,530.36 | 1,520.11 | 99.33 |
| 1.1 | අතුරු වේල්ලේ ඉතිරි ඉදි කිරීම් | 0.03 | 0.30 | 100 |
| | **උප එකතුව** | **7,776.81** | **7,251.65** | **93.25** |
| **2.0** | ගඟ දෙපස සංවර්ධනය | | | |
| 2.1 | මැණුම් කටයුතු DF (11) | 3.12 | 3.12 | 100.00 |
| 2.2 | ගොඩනැගිලි DF (11) | 418.47 | 418.47 | 100.00 |
| 2.3 | මාර්ග DF (11) | 772.05 | 772.05 | 100.00 |
| 2.4 | වාරි මාර්ග යටිතල පහසුකම් DF (11) | 320.10 | 320.10 | 100.00 |
| | **උප එකතුව** | **1,513.74** | **1,513.74** | **100.00** |
| **3.0** | ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම DF (11) | 1,229.97 | 1,229.97 | 100.00 |
| **4.0** | පාරිසරික ලිහිල් කිරීම DF (11) | 145.95 | 145.95 | 100.00 |
| **5.0** | සම්පාදනය | 88.06 | 88.06 | 100.00 |
| 5.1 | උපකරණ සම්පාදනය DF (11) | 19.73 | 19.73 | 100.00 |
| 5.2 | යන්ත්‍ර සූත්‍ර සම්පාදනය DF (11) | 68.33 | 68.33 | 100.00 |
| **6.0** | සාමාන්‍ය කටයුතුවලදී අරමුදලේ වියදම් | 375.83 | 375.83 | 100.00 |
| **එකතුව** | | **11,130.36** | **10,605.20** | |

## 5.11.6 කැබිනට් තීරණ

2015 වර්ෂයතුලදී පහත සඳහන් තීරණ කැබිනට් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

| කැබිනට් පත්‍රිකාවේ අංකය සහ ඉදිරිපත් කල දිනය | මාතෘකාව | කැබිනට් තීරණය | වර්තමාන තත්වය |
|---|---|---|---|
| 15/1468/704/005<br>2015.10.12 | මොරගහකන්ද කළුගඟ බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය සඳහා අත්පත් කරගත් ප්‍රදේශවල පිහිටි ආගමික ස්ථාන නැවත පදිංචි කිරීමේ ප්‍රදේශවල ගොඩනැගීමේදී ද්‍රව්‍යමය ආධාර ලබා දීම. | අංක 09/1013/315/050 දරණ සංශෝධිත අතුරු කැබිනට් තීරණයට අනුව උපරිමය රු 1,500,000/= කට යටත්ව එක් විහාරස්ථානයක් සඳහා ද්‍රව්‍යමය ආධාර ලබාදීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත. | ක්‍රියාවට නන්වමින් පවතී |
| 15/1145/604/010<br>2015.07.20 | මොරගහකන්ද කළු ගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ඉඩම් අත් පත් කර ගැනීම හේතුවෙන් හානියට පත් පවුල් නැවත පදිංචි කිරීම<br>-ව්‍යාපෘතිය කල්ගත වීම හේතුවෙන් හානියට පත් පවුල් සඳහා ප්‍රතිලාභ වැඩි කිරීමේ විකල්ප යෝජනාවන් | 1. හපුගස්පිටිය ප්‍රදේශයෙන් අක්කර 400 ක් ලබා ගැනීම සහ ඕපල්ගල ප්‍රදේශයෙන් අක්කර 100 ක් ලබා ගැනීම සහ<br>2. නාඋල නගරයෙන් අක්කර 23 ක් ලබා ගැනීම<br>3. අක්කර භාගයක බිම් ප්‍රමාණයක් ලබා ගනිමින් පදිංචි වීමට බලාපොරොත්තු වන අක්කර එක හමාරක විකල්ප වාරිමාර්ග ඉඩම් ඇති පවුල් 100 ක් සඳහා එකී වාරිමාර්ග ඉඩමට හිලව් වීම පිණිස රුපියල් 1,200,000/= ක් ප්‍රදානය කිරීම.<br>4. අක්කර භාගයක ගොඩ ඉඩම් ප්‍රමාණයක් සහ අක්කර එක හමාරක වාරි මාර්ග පහසුකම් සහිත ඉඩම් ලබා දීමට යෝජිත හානියට පත් පවුල් 350 කට පමණ ආසන්න ප්‍රමාණයකට සඳහා රුපියල් 1,600,000/= බැගින් ප්‍රදානය කිරීම.<br>5. මැදිරිගිරිය ප්‍රදේශයේ නැවත පදිංචි වීමට අපේක්ෂා කරන පවුල් 300 කට රුපියල් 50,000/= සිට රුපියල් 200,000/= දක්වා අමතර දිරි දීමනාවක් වැඩි කර ලබා දීමට යෝජනා කිරීම.<br>6. පදිංචි ස්ථාන තාවකාලික පදිංචි ස්ථානවල ගොඩනැගිලි සහ සනීපාරක්ෂක පහසුකම් සඳහා වන ගෙවීම රුපියල් 35,000 සිට 50,000/= දක්වා වැඩි කිරීම.<br>7. අවම වන්දි මුදල රුපියල් 200,000/= ක් විය යුතු බව (පවුල් 450 ක් සඳහා)<br>8. ඉහත සඳහන් 5,6 සහ 7 යෝජනා දැනටමත් නැවත පදිංචි වී සිටින පවුල් සඳහාද අදාල විය යුතු බව<br>9. ඉහත කැබිනට් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රුපියල් මිලියන 854 ක මූල්‍ය ප්‍රතිපාදනයක් මහා භාණ්ඩාගරයෙන් ලබා ගැනීම | ක්‍රියාත්මක වෙමින් පවතී |

## 5.12 උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය- (පෙර ආර වැඩ - Head works)

### 5.12.1 හැඳින්වීම

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ, ඝන මීටර් දශ ලක්ෂ 145 ක් උමා ඔය නිම්නයේ පරිසරය හා ජල අවශ්‍යතා බලපෑමට ලක් නොවන අයුරින් ජල ඌනතාවයෙන් පෙලෙන දක්ෂිණ කලාපයේ ජග හිඟයට පිළියමක් වශයෙන් ජලය උමා ඔය නිම්නයේ සිට කිරිඳි ඔය නිම්නයට හරවා යැවීමත් මෙම හැරවීමේදී ඇති වන භූමික මට්ටම් වෙනස උපයෝගී කරගෙන 231 GWh විදුලි ශක්තියක් නිපදවීමත්ය.

උමා ඔයබහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේම පෙර ආර වැඩට (Head works) ජලාශ දෙකක් ඉදිකිරීම ඇතුලත් වන අතර උමා ඔය හරහා මීටර 34 උසැති වේල්ලක් සමඟ ජලාශයක් පුහුල්පොල හිද, අනෙක මාතැටිල්ල හරහා මීටර 50 ක් උසැති වේල්ලක් සමග ජලාශයක් ඩයරබා හිද, ජලාශ දෙකක් සම්බන්ධ වන අයුරින් මීටර් 3718 ක් දිග උමඟක් ද, ඩයරබා සිට රන්දෙණිය දක්වා මීටර 15,466 දිග පෙර ආර උමඟක්ද (Head race tunnel), මීටර 618 ක් උස සිරස් පීඩන උමඟක්ද, මීටර් 150 ක් උස කැලඹුම් ළිදක් ද, භූගත විදුලි බලාගාරයක්ද, මීටර 3,428 ක් දිග පසු ආර උමඟක්ද (Tailrace Tunnel), යතුරු පුවරු අංගනයක් සමඟ බදුල්ල විදුලි උපපොල දක්වා දිවෙන කි.මී. 23 දිග කි. වොල්ට් 132 විදුලි සම්ප්‍රේෂණ මාර්ගයක්ද සමන්විතයි.

ව්‍යාපෘතියේ යටිතල පහසුකම් වන්නේ, කි.මී.14 දිග ප්‍රවේශ මාර්ග නවාතැන් කඳවුරු ඉදකිරීම, කන්තෝරු සංකීර්ණ ඉදිකිරීම, වැඩ බිම් විද්‍යාගාර සහ අනෙකුත් පහසුකම්ය.

කොන්ත්‍රාත් ආරම්භක දිනය 2010 මාර්තු 10 දින අතර 2015 නොවැම්බර් 15 දින ඉදිකිරීම් වැඩ නිම කිරීමට සැලසුම් කරන ලදි. 2017 දෙසැම්බර් 31 දක්වා වැඩ බිම නිම කිරීමට කාලය දීර්ඝ කර ඇත. 2011 අප්‍රේල් 12 වන දින මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික අධ්‍යන වාර්තාව අනුමත කරන ලදි.

### 5.12.2 ප්‍රධාන අභිලාශයන් -2015

1. පුහුල්පොල, ඩයරබා සහ අලිකොට ආර ජලාශ ඉදිකිරීම කටයුතු නිසා බලපෑමට ලක් වූ පවුල් අතුරු මාර්ග, විදුලිය, නල ජලය ඇතුළු යටිතල පහසුකම් සමඟ නැවත පදිංචි කිරීමේ ගම්මාන හතරකදී නැවත පදිංචි කරන ලදි. නැවත පදිංචි කිරීමේ කඳවුරු වල සිටින පවුල් වල සංඛ්‍යාව පහත පරිදි වේ.

| නැවත පදිංචි කිරීමේ වැඩ බිම | මුළු පවුල් සංඛ්‍යාව | අතුරු පවුල් සංඛ්‍යාව | මුළු පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|
| මීරහවත්ත | 50 | 14 | 64 |
| කැට කැල්ල (ඩයරබා ස්ටේට්) | 23 | 10 | 33 |
| මොරගොල්ල | 60 | 14 | 74 |
| හඳපානාගල | 05 | | 05 |
| එකතුව | 138 | 38 | 176 |

2. භූගත විදුලි හලාගාරය කුටීරය සහ ට්‍රාන්ස්ෆෝමර් කුටීරය කැනීම් කටයුතු අවසන් කර ඇත.

3. පෙර ආර (Tailrace) උමඟයේ ඇති කැනීම් කටයුතු සහ පෙර සවි ඇතුරුම් අවසන් කර ඇත.

**2015 දෙසැම්බර් 31 දිනට පෙර ආර (Head works) වැඩවල මුළු භෞතික ප්‍රගතිය 52.89% කි.**

## 5.12.3 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා

| අමාත්‍ය මණ්ඩල සංදේශ අංක සහ යොමු කරන ලද දිනය | මාතෘකාව | අමාත්‍ය මණ්ඩල තීරණ | වර්තමාන තත්වය |
|---|---|---|---|
| ගරු ජනාධිපතිතුමා විසින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා ලෙස ඉදිරිපත් කරන ලද CB/15/0311/604/002 2015-03-23 | පෙර ආර (Head works) වැඩඋමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය - ඉදිරි ක්‍රියාමාර්ග | යෝජනා (i), (ii),(iii) හා (iv) හි අනුමැතිය ලැබුණු අතර යෝජනා අංක (v) හි (a),(b),(c) වල කරුණු පරීක්ෂා කර බැලීමට අමාත්‍ය මණ්ඩල කමිටුවක් පත් කරන ලදි. | (i) තක්සේරු දෙපාර්තුමේන්තුව හානියට පත් වූ ගෙවල් වලට වන්දි ගෙවීම සඳහා වාර්තාවක් සකස් කිරීම. PMU විසින් 31.12.2015 දක්වා ගෙවල් 531 සඳහා ලැබීම් වාර්තා වීම.<br>මුළු වන්දි මුදල රු. 88,798,867/= කි. කොන්ත්‍රාත්කරු වන්දි ගෙවීමට එකඟත්වය පල කරන ලදි.<br>(ii) ජාතික ජල සම්පාදන ජල ප්‍රවාහන මණ්ඩලය සහ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය විසින් කුරුඳුගොල්ල, මකුල් ඇල්ල, වෙහෙරගල තැන්න ජල යෝජනා ක්‍රමයන් හි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.<br>(iii) - එම -<br>(iv) භාණ්ඩාගාරය විසින් 2015.12.31 දක්වා කොන්ත්‍රාත්කරුගේ ගෙවීමට ඇති ගෙවීම් සමතයට පත් කිරීම සඳහා අරමුදල් සම්පාදනය කර ඇත.<br>(v) අමාත්‍ය කමිටුවේ මුලසුන හෙබ වූ ගරු මුදල් අමාත්‍ය විසින් කමිටුව පිහිටුවීම. |
| ගරු මුදල් අමාත්‍ය විසින් ඉදිරිපත් කරන ලද CB/15/0311/604/002 2015-04-29 | පෙර ආර (Head works) වැඩ උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය- ඉදිරි ක්‍රියාමාර්ග | අමාත්‍ය කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම | a) කොන්ත්‍රාත්කරුට නිකුත් කර තිබූ තාවකාලික වැඩ නැවත්වීමේ නියෝගය ඉවත් කිරීම සඳහා<br>b) මධ්‍යම පරිසර අධිකාරියේ විද්වත් කණ්ඩායමේ නිර්දේශ අනුගත කරමින් ඉදිකිරීම් කටයුතු කරගෙන යාම<br>c) ශ්‍රී ලංකා රජයේ අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ඇත. |

## 5.13 මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

### 5.13.1 හැඳින්වීම

ශ්‍රී ලංකා රජයේ වත්මන් ප්‍රමුඛතා සහ ආයෝජන වැඩසටහන තුළින් වාරිමාර්ග හා ජල සම්පත් අංශය වෙත විශේෂ අවධානයක් යොමුකර ඇත. ජල සම්පත් කළමනාකරණය ඵලදායීතාවය ඉහළ නැංවීම, වාරි ජලය භාවිතය කාර්යක්ෂම කිරීම හා ජලය හිග ප්‍රදේශ වලට ජලය ගෙන යාම සඳහා අන්තර් ද්‍රෝණි ඇළ මාර්ග සැකසීම මගින් වැඩිවන ජල ඉල්ලුම සැපයීම සඳහා ප්‍රමාණවත් තරම් වාරි ජලය සැපයීම සහතික කෙරේ. යාවත්කාලීන කරන ලද මහවැලි සංවර්ධන වැඩසටහන (MDP ) මගින් උතුරු මැද පළාත් ඇළ (NCPCP) ඉදිකිරීමට ප්‍රමුඛත්වයක් දෙනු ලබන අතර, එය මහවැලි සංවර්ධන වැඩ සටහන (MDP ) යටතේ නොකෙරුණු අංගයකි. උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතිය අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක වන අතර, පළමු වන අදියරේදී මහවැලි ගංගා ද්‍රෝණියේ ජලය මධ්‍යම, උතුරු මැද සහ වයඹ පළාත්වල දැනට පවතින ජලාශ වෙත හරවා යවන අතර, දෙවන අදියරේදී උතුරුමැද පළාත් වැව්වල සිට උතුරු පළාතේ දැනට තිබෙන වැව් වෙත හරවා යවනු ලැබේ. අවසානයේදී යාපනය සහ කිළිනොච්චි ප්‍රදේශවල බීමට ගන්නා ජල සැපයුම වර්ධනය කිරීමට බලාපොරොත්තු වේ.

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) මගින් පළමු අදියර යටතේ උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) බහුණය වාරික මූල්‍ය සම්පාදන ක්‍රමය (MFF) යටතේ ක්‍රියාත්මක කරනු ඇත. බදු සහ ණය පහසුකම් ගාස්තු සමඟ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන සඳහා මුළු ඇස්තමේන්තු ගත මුදල ඇ.ඩො. මිලියන 675ක් වේ. ආසියානු සංවර්ධන බැංකුවේ ණය වශයෙන් සාමාන්‍ය ප්‍රාග්ධන අරමුදලින් (OCR) ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇ.ඩො.මි. 262 ක් ද විශේෂ ප්‍රාග්ධන අරමුදලින් (ADF) ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇ.ඩො.මිලියන 191 ක් ද ලෙස ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇ.ඩො.මිලියන 453 ක මුදලක්ද විවිධ සහකාර - පාර්ශවකරුවන් විසින් ඇ.ඩො.මිලියන 114 ක් ද ශ්‍රී ලංකා රජයෙන් ඇ.ඩො.මිලියන 108 ක මුදලක්ද යොදවා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවනු ලැබේ.

### 5.13.2 උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතිය : අදියර - 1 (NCPCPPhase 1)

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන මඟින් දැනට පවතින හෙක්ටයාර් 32,800 ක වී නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වගා තීව්‍රතාවය 130% සිට 180% දක්වා වැඩි කිරීම මඟින් අස්වැන්න හෙක්ටයාරයකට ටොන් තුනේ සිට හය දක්වා වැඩි වෙනු ඇත.

භෝග විවිධාංගීකරණය, අඩු ජල පරිභෝජනය හා මිල අධික භෝග වගාව කෙරෙහි පොළඹවනු ලබන, ජල පරිභෝජන කාර්යක්ෂමතාවය හඳුනා ගැනීමේ පැකේජයෙන් (ISEWP) පසුව වගා තීව්‍රතාවය, ඵලදාව හා වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය තවදුරටත් වැඩි කිරීමට හැකි වනු ඇත. තවද උතුරු පළාත් ඇල මාර්ගය ඔස්සේ කෘෂිකාර්මික නොවන අවශ්‍යතා සඳහා වාර්ෂිකව ජලය ඝන මීටර් මිලියන 92 ක් පළමුවන අදියර යටතේ මුදා හරිනු ලැබේ.

උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතියේ පළමුවන අදියර ව්‍යාපෘති තුනකින් සමන්විත වේ. පහත සඳහන් ව්‍යාපෘති මහවැලි ජල සුරක්ෂිතතා අයෝජන වැඩ සටහන යටතේ ඇති ණය අදියර කිහිපයක් යටතේ ඉදි කෙරෙනු ඇත.

i. ඉහළ ඇලහැර ඇළ ව්‍යාපෘතිය (UECP)
ii. වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය (NWPCP)
iii. මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය ( MLBCRP)

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ තවත් උපදේශන පැකේජ දෙකක් මඟින් තවත් ප්‍රධාන අංශ දෙකක් පිළිබඳව අවධානය යොමු කෙරේ.

(අ) . පද්ධති කාර්යක්ෂමතාවය හා ජල ඵලදායීතාවය වැඩි දියුණු කිරීම. (ISEWP)

(ආ). ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම. (SIWRM)

### 5.13.3 උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතිය : අදියර – 2(NWPCP Phase 2)

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ පූර්ණ ප්‍රතිලාභ ළඟා කර ගත හැකි වන්නේ උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතියේ දෙවන අදියර සම්පූර්ණ වූ පසුව පමණි. දැනට පවතින එල්ලංගා පද්ධතියේ පහත් වතුර එම පද්ධතියේ පහළ වසන ජනතාවට භාවිතා කිරීමට ලැබීම අමතර වාසියකි. උතුරු මැද පළාත් ඇළ අදියර දෙකකින් ක්‍රියාත්මක වීමෙන් පසුව ජලය සැපයිය හැකි වගා ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 103,400 දක්වා ඉහළ යනු ඇත.

තවද උතුරු මැද පළාත් අදියර 2 යටතේ කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා ජලය ඝන මීටර් මිලියන 70 ක් උතුරු පළාතට ගෙන යනු ලැබේ. මෙම අදියර යටතේ ඉදිවන නව විදුලි බලාගාර තුනක් මඟින් ජල විදුලිය පහසුකම්ද ලැබෙනු ඇත. එමඟින් විදුලිය ඉල්ලුම වැඩිම අවස්ථාවලදී මහවැලි පද්ධතියේ දැනට පවතින හා සැලසුම් කර ඇති විදුලි බලය නිපදවීමේ ක්‍රියාවලිය ප්‍රශස්තිකරණය වනු ඇත. මෙම අදියරේදී මහවැලි ගඟේ සිට මොරගහකන්ද දක්වා අතිරික්ත ජලය වසරකට ඝන මීටර් මිලියන 555 ක් හැරවීමට ඉඩ ලැබෙනු ඇත. එම ජලය මොරගහකන්දේ සිට ඉහළ ඇලහැර ඇළ ඔස්සේ යෝජිත උතුරු මැද පළාත් ඇළ වෙත ගෙන යනු ලැබේ. උතුරු මැද පළාත් ඇළ මඟින් එම පළාතේ දැනට පවතින එල්ලංගා වාරි පද්ධති වල හෙක්ටයාර 87,000 ක් සඳහා ජලය ඝන මීටර් මිලියන 640 ක් වෙම්මාඩුකුලම් ජලාශය දක්වා ගෙන යනු ලැබේ. එතැන් සිට ස්වාභාවික ජල මාර්ග ඔස්සේ වසරකට ජලය ඝන මීටර් මිලියන 100 ක් පමණ දැනට පවතින ඉරණමඩු ජලාශයට ගලා යැමෙන් මෙම ප්‍රදේශයේ ජනතාවට වාරි කටයුතු වලට හා බීමට ප්‍රමාණවත් තරම් ජලය ලැබේ.

වැඩසටහන් කළමනාකරණය, සැළසුම් කිරීම හා අධීක්ෂණය කිරීමේ උපදේශන සභාව(PMDSC) විසින් උතුරු මැද පළාත් ඇල සඳහා විකල්ප ඇල මාර්ග 2 ක් සමාලෝචනය කිරීමෙන් පසුව වඩා සුදුසු ඇල මාර්ගය සඳහා සක්‍යතා අධ්‍යන වාර්තා පිළියෙළ කරණු ලැබේ.

a) 1 වන විකල්පය - රන්දෙනිගල ජලාශයේ සිට කළු ගඟ ජලාශය දක්වා ජලය රැගෙන යාමට ඇල මාර්ගයක් (RKTC) ඔස්සේ ජලය හරවා යැවීම.

b) 2 වන විකල්පය -පොල්ගොල්ල හරස් අමුණේ සිට සුදු ගඟ දක්වා නව උමං මාර්ගයකින් සහ එතැන් සිට අවශ්‍ය පරිදි ඇල මාර්ග විශාල කර බෝවතැන්න ජලාශය හරහා මොරගහකන්ද ජලාශය වෙත ජලය හරවා යැවීම.

උතුරු මැද පළාත් ඇල - 2 වන අදියර යටතේ පහත සඳහන් පරිදි ව්‍යාපෘති 2ක් ක්‍රියාත්මක වේ.

i. මීටර් 75 ක් උස රෝලර්-සම්පීඩන කොන්ක්‍රීට් වේල්ලක් සහිත පහළ උමාඔය ජලාශය හා එහි සිට රන්දෙනිගල ජලාශය දක්වා දිවෙන කි.මී.6ක් දිග උමගක්.

ii. ඉහළ ඇලහැර ඇලේ සිට උතුරු පළාතේ පිහිටි වෙම්මාඩුකුලම් වැව දක්වා දිවෙන කි.මී.80ක් දිග විවෘත ඇළ මාර්ගය.

උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ ආධාර නොලැබේ. දෙවන අදියර සඳහා ආසියානු සංවර්ධන බැංකුව මගින් වෙනත් වැඩසටහනක් යටතේ ආධාර ලබාදීමට සලකා බලනු ඇත.

## 5.13. 4 ව්‍යාපෘති අංග පිළිබඳ කෙටි විස්තරයක් (Project Activities)

(අ) මිනිපේ වම් ඉවුරු ඇල පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (MLBCRP)
(ආ) ඉහළ ඇළහැර ඇල ව්‍යාපෘතිය (UECP)
(ඇ) වයඹ පළාත් ඇල ව්‍යාපෘතිය (NWPCP)
(ඈ) උපදේශන සේවා (PMDSC,ISEWP සහ විශේෂඥ මණ්ඩලය)
(ඉ) වැඩසටහන් කළමනාකරණ ඒකකයේ (PMU) සහ ව්‍යාපෘති ඉදිකිරීම් ඒකක වල (PIU) මෙහෙයුම් හා නඩත්තු වැඩ.

- මිනිපේ වම් ඉවුරු ඇල පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය **(MLBCRP)**

මිනිපේ වම් ඉවුරු ඇල පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය රන්ටැඹේ ජලාශයට පහළින් පිහිටි මිනිපේ අමුණ ප්‍රතිසංස්කරණය කිරීමෙන් ආරම්භ වේ. එමගින්,
අ). මිනිපේ අමුණ මීටර් 3.5කින් ඉහළ නැංවීම මගින් ඉහත්තාවේ ජලය රැදීමේ ධාරිතාව ඉහළ නැංවීම.
ආ). වම් ඉවුරු ඇළ සඳහා ස්වයංක්‍රීය ජල පාලන ගේට්ටු සවි කිරීම.
ඇ). වම් ඉවුරු ඇළ හා දකුණු ඉවුරු ඇළ සඳහා වැඩි ජලය පිට කිරීමට ස්වයංක්‍රීය හදිසි වාන් දොරටු සවි කිරීම.
ඈ). ජල පාලන දොරටු හා පිටවාන නිර්මිත අළුත් වැඩියා කර කි.මී.74 ක් දිග වම් ඉවුරු ඇල පුනරුත්ථාපනය කිරීම මගින් ජලය ගලායෑම වැඩිදියුණු කිරීම හා ජල සැපයුමේ විශ්වාසනීය බව වැඩි දියුණු කිරීම සිදු කෙරේ. මෙහි උප කටයුතු පහත පරිදි හඳුනාගෙන ඇත.

i. අදියර 1 - මිනිපේ වම් ඉවුරු ඇල (0+000Km සිට 30+140Km)
ii. අදියර 2 - මිනිපේ වම් ඉවුරු ඇල (30+140Km සිට 49+820Km)
iii. අදියර 3 - මිනිපේ වම් ඉවුරු ඇල (49+820Km සිට 63+650Km)
iv. අදියර 4 - මිනිපේ වම් ඉවුරු ඇල (63+650Km සිට 73+960Km)
v. අරීය ගේට්ටු සහිත වාන් 8 ක් අළුත්වැඩියා කර විදුලිබලයෙන් ක්‍රියාත්මක කරවීමට සැලැස්වීම හා ජල පාලන ගේට්ටු සහිත ඉදිකිරීම් දෙකක් අළුත්වැඩියාව.
vi. මිනිපේ අමුණේ මට්ටම එසවීම සහ වම් හා දකුණු ඉවුරු ඇලවල් වල ජල පාලන හා පිටවන ජලය ප්‍රමාණය මැනීමේ පහසුකම් සැකසීම.

- ඉහළ ඇළහැර ඇල ව්‍යාපෘතිය **(UECP)**

ඉහළ ඇළහැර ඇල ව්‍යාපෘතිය ප්‍රධාන සංරචක දෙකකින් යුක්තවේ. පළමු සංරචකය දැනට ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින කළු ගඟ හා මොරගහකන්ද ජලාශ අතර, වාර්ෂිකව ජලය ඝන මීටර් මිලියන 771 ක් දක්වා ගෙන යා හැකි කි.මී.9 ක දිගකින් යුතු කළු ගඟ හා මොරගහකන්ද යා කෙරෙන ඇල මාර්ගය ඉදි කිරීම වන අතර, මෙයින් කි.මී.08ක පමණ දිග ප්‍රමාණයක් උමගක් ලෙස ඉදි කෙරේ.
දෙවන සංරචකය මොරගහකන්ද ජලාශයේ සිට පවතින හුරුළුවැව ජලාශය දක්වා වාර්ෂිකව උතුරු දෙසට ජලය ඝන මීටර් මිලියන 974 ක් දක්වා ගෙන යා හැකි ඉහළ ඇළහැර ඇළ (UEC) සහ දැනට පවතින මානන්කට්ටිය, එරුවැව හා මහකනදරාව යන ජලාශ වලට තව දුරටත් ජලය සැපයීමට හැකි කි.මී. 16.7 ක් පමණ වූ ඇල මාර්ගයේ ඉදිකිරීම මෙම ජලාශ මගින් පවතින වාරිමාර්ග හා ජල සම්පාදන ක්‍රමයන්ට ජලය සපයනු ලැබේ.

මෙහි උප කටයුතු පහත සදහන් පරිදි හදුනාගෙන ඇත.

i. ඉහළ ඇලහැර ඇළ ඉදිකිරීම. (0+100Km සිට 6+266Km) දක්වා
ii. ඉහළ ඇලහැර ඇළ ඉදිකිරීම. (27+509Km සිට 54+249Km) සහ
කළු ගඟ මොරගහකන්ද සැපයුම් ඇළ (0+ 292 Km සිට 9+161Km) දක්වා
iii. ඉහළ ඇලහැර ඇළ ඉදිකිරීම. (6+226Km සිට 27+509Km) දක්වා
iv. ඉහළ ඇලහැර ඇළ ඉදිකිරීම. (54+249Km සිට 65+500Km) දක්වා
v. ඉහළ ඇලහැර ඇළේ සිට මානන්කට්ටිය- එරුවැව දිය අගල දක්වා පෝෂණ ඇලක් ඉදිකිරීම සහ එරුවැව -මහකනදරාව දිය අගල පුළුල් කිරීම.

- වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය ( **NWPCP)**

වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය මගින් දැනට පවතින හා අළුතින් ඉදිකෙරෙන කි.මී. 96 ක් දිග ඇල මාර්ගයක්ද එයින් මීටර් 940 ක දිග ප්‍රමාණයේ උමගක් ඉදි කිරිමද, සිදු කෙරේ. තවද උතුරු මැද පළාතේ දැනට පවතින වාරිමාර්ග හා පානීය ජලය ලබාගන්නා ජලාශ පෝෂණය කිරීම සදහා නාලන්දා ජලාශයේ සිට වැමැඩිල්ල ජලාශය හරහා හා දඹුලු ඔයෙන් වාර්ෂිකව ජලය ඝන මීටර් මිලියන 130 ක් ලබාගෙන රදවා තබා ගත හැකි උස මීටර් 25 ක් වන වැව් බැමි (පස් වේලි) ඉදි කිරීමෙන් මහ කිරුල හා මහ කිතුල ජලාශ නිම කිරිමද සිදුකෙරේ. මෙමගින් උතුරු මැද පළාතේ පිහිටි වාරිමාර්ග හා පානීය ජලය සැපයෙන වැව් සදහා ජලය සැපයේ.

මෙහි උප කටයුතු පහත සදහන් පරිදි හදුනාගෙන ඇත.

i. වැ මැඩිල්ල වම් ඉවුරු ඇළේ සිට නැබඩගහවත්ත වැව (0+000Km සිට 5+250Km) දක්වා ප්‍රධාන ඇළක් ඉදිකිරීම සහ නව සොරොව්වක් හා ඇළක් (0+000Km සිට 600Km) ඉදිකිරීම.
ii. මහ කිතුල උමඟ, මහ කිතුල හා මහ කිරුල ජලාශ, සහ මහ කිතුල සිට මහ කිරුල දක්වා පෝෂක ඇළ (දිග 3.66Km) ඉදිකිරීම.
iii. නැබඩගහවත්ත වැවේ සිට මහ කිතුල ජලාශය දක්වා (5+250Km සිට 22+460Km) උමඟ ඉදිකිරීම.
iv. මහ කිරුල සිට ගල්ගිරියාව (0+000Km සිට 13+731Km) දක්වා මී ඔය දකුණු ඉවුරු-1 ඇළ ඉදිකිරීම.
v. ගල්ගිරියාව සිට කදුරුවැව (13+731Km සිට 21+232Km) දක්වා මී ඔය දකුණු ඉවුරු -2 ප්‍රධාන ඇළ ඉදිකිරීම.
vi. මහ කිතුල ජලාශයේ සිට පොතුවිල වැව දක්වා (0+000Km සිට 1+491Km) ප්‍රධාන ඇළක් ඉදිකිරීම හා පොතුවිල වැවේ සිට ඉහළ මැදියාව (0+000Km සිට 19+980Km)දක්වා ප්‍රධාන ඇළක් ඉදිකිරිම.
vii. මැදියාව ඇළේ සිට යාපහුව ඇළ ඉදිකිරීම (0+000Km සිට 11+200Km)
viii. දඹුලු ඔයේ හැරවුම් අමුණක් සාදා එහි සිට වැමැඩිල්ල වම් ඉවුරු ප්‍රධාන ඇළ දක්වා ප්‍රධාන ඇළක් ඉදිකිරීම. (0+000Km සිට 8+590Km)

- උපදේශන සේවා (**PMDSC, ISEWP** සහ විශේෂඥ මණ්ඩල)

උපදේශන සේවා පහත සදහන් පරිදි හදුනාගෙන ඇත.

අ). වැඩ සටහන් කළමනාකරණය, සැළසුම් කිරීම හා අධීක්ෂණය සදහා උපදේශනය (PMDSC)
ආ). පද්ධති කාර්යක්ෂමතාවය හා ජල ඵලදායිතාවය වැඩි දියුණු කිරීම (ISEWP)

ඇ). විශේෂඥ මණ්ඩලය හා අවශ්‍ය පරිදි විශේෂඥයකුගේ සහය ලබා ගැනීම.

- වැඩ සටහන් කළමනාකරණය, සැලසුම් කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා උපදේශනය **(PMDSC)**

මෙම උපදේශන සභාව (PMDSC) පළමු වන ණය වාරිකය යටතේ වසර 05 ක කාලයක් සඳහා වැඩසටහන් කළමනාකරණ ඒකකයට (PMU) සහය වන අතර, පහත සඳහන් වගකීම් සඳහා බැඳී සිටී.

I. ව්‍යාපෘති 1, ව්‍යාපෘති 2 හා ව්‍යාපෘති 3 යටතේ ඇති කොන්ත්‍රාත්තු සඳහා සැළසුම් හා ලංසු ලේඛන පිළියෙළ කිරීම.
II. ව්‍යාපෘති 1, ව්‍යාපෘති 2 හා ව්‍යාපෘති 3 ආරම්භකර කොන්ත්‍රාත්කරුවන් කළමනාකරණය කිරීම.
III. (ISEWP) උපදේශන සේවා පැකේජය සඳහා නිර්ණායකයන් තීරණය කිරීම, උපදේශන සේවාව බඳවා ගැනිම හා කළමනාකරණය කිරීම.
IV. SIWRM උපදේශන සේවා පැකේජය සඳහා නිර්ණායකයන් තීරණය කිරීම, උපදේශන සේවාව බඳවා ගැනිම හා කළමනාකරණය කිරීම.
V. සියළුම සිවිල් වැඩ කළමනාකරණය, අධීක්ෂණය හා උපදේශන සේවාව ලෙස කටයුතු කිරීම.
VI. දෙවන අදියර සඳහා ආයෝජන වැඩ සටහන හා අවශ්‍ය ආසියානු සංවර්ධන බැංකු මූල්‍ය ලේඛන සැකසීම.
VII. අවශ්‍ය පරිදි තාක්ෂණික හා කළමනාකරණ උපදෙස් සැපයිම.
VIII. ආයෝජන වැඩ සටහන කළමනාකරණය කිරීම හා පාලනය කිරීම.
IX. ආසියානු සංවර්ධන බැංකුවට ඉදිරිපත් කිරීමට ණය වාරික සඳහා අවශ්‍ය ඉල්ලීම් කිරීමට මූල්‍යමය වාර්තා සකස් කිරීම හා අවශ්‍ය කාල වලදී ඉදිරිපත් කළයුතු වාර්තා සැකසීම.

තවද PMDSC විසින් MMDE වෙත ආසියානු සංවර්ධන බැංකු නිළධාරීන් හා ආයෝජන හා සේවා නිරීක්ෂණ කණ්ඩායම් අවශ්‍ය ව්‍යාපෘති කටයුතු සඳහා පැමිණීමේදී අවශ්‍ය පහසුකම් සැපයිමට සහය දෙයි. PMDSC මගින් පුද්ගල - මාස 1420ක් සැපයිය යුත් අතර, එයින් පුද්ගල - මාස 260ක් ජාත්‍යාන්තර විශේෂඥයින් වන අතර, පුද්ගල මාස 1160 ක් ශ්‍රී ලාංකික විශේෂඥයින් වේ.

- ✓ පද්ධති කාර්යක්ෂමතාවය හා ජල ඵලදායිතාවය වැඩි දියුණු කිරීම. **(ISEWP)** සඳහා වූ උපදේශනය.

මෙමගින් දැනට පවතින ජල කළමනාකරණ හා සැපයුම් විධි අධ්‍යයනයෙන් පසු වැඩි දියුණු කළ යුතු අංශ හඳුනාගෙන උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘති ප්‍රදේශය තුල පද්ධති කාර්යක්ෂමතාවය හා ජල ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සිදු කෙරේ. මෙම ආයෝජන වැඩ සටහන මගින් දැනට පවතින එල්ලංගා වාරි පද්ධති සඳහා ජලය සැපයිමට ප්‍රධාන වාරි මාර්ග පද්ධති සකස් කෙරේ. ඒල්ලංගා පද්ධති විශාල වැව් හා කුඩා වැව් වලින්ද සැපයීම් හා බෙදා හැරීම් සිදුකරන ඇල මාර්ග වලින්ද සමන්විත වන අතර මෙම පද්ධති පළාත් සභා හා ගොවි සංවිධාන මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම පද්ධති ප්‍රධාන වශයෙන් වී වගාව සඳහාම සකස් වී ඇති අතර හෙක්ටයාර් එකක් සඳහා වසරකට ඝන මීටර් 30,000 ක් පමණ යොදවන අතර, බෙදා හැරීමේ කාර්යක්ෂමතාවය 50% ක් පමණ වේ. මෙම උපදේශන පැකේජය මගින් එල්ලංගා පද්ධති තුල යටිතල පහසුකම් හා ජල කළමනාකරණය පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ.

- විශේෂඥ මණ්ඩල හා වෙනත් විශේෂඥයින්ගේ සහය අවශ්‍ය පරිදි යොදා ගැනීම.

ආසියානු සංවර්ධන බැංකුවේ නිර්දේශ වලට අනුව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් මෙම අයෝජන වැඩසටහනේ විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් කොන්ත්‍රාත් ලිපි ලේඛන හා වේලි හා උමං

මාර්ග ස්ථාපනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව මගින් පිළිගනු ලබන සුදුසුකම් හා පළපුරුද්ද සහිත විශේෂඥ මණ්ඩල හා වෙනත් විශේෂඥයින් බඳවාගෙන සේවයේ යොදවනු ලැබේ.

- වැඩසටහන් කළමනාකරණ ඒකකයේ (PMU) සහ වෙනත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක (PIU) වල මෙහෙයුම් නඩත්තු

මේ යටතේ පහත පරිදි ක්‍රියාකාරකම් සඳහා හඳුනාගෙන ඇත.

✓ උපයෝගීතා මාරු කිරීම.

මේ යටතේ තරගකාරී කොන්ත්‍රාත් මගින් කර ගත නොහැකි විදුලි හා දුරකථන කණු මාරු කිරීම්, ජල නල, ජලාපවාහන, මාර්ග ප්‍රතිසංස්කරණය හා ගස් ඉවත් කිරීම ආදිය දැනට පවතින රජයේ මිල ගණන් යටතේ සිදු කරනු ලැබේ.

✓ ප්‍රජා කොන්ත්‍රාත්තු

දැනට පවතින රජයේ මිල ගණන් යටතේ මෙම ව්‍යාපෘතියට අදාල සුළු කොන්ත්‍රාත් වැඩ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල ප්‍රජා සංවිධාන හා සිවිල් සංවිධාන වලට ඍජුවම ප්‍රදානය කරනු ලැබේ.

✓ ක්ෂේත්‍ර කාර්යාල වැඩ

මේ යටතේ කොළඹ පිහිටි වැඩසටහන් කළමනාකරණ ඒකකය හා  වැඩසටහන් කළමනාකරණය සැලසුම් හා අධීක්ෂණ උපදේශන සභාව සඳහා කාර්යාල වලට හා ඉහළ ඇළහැර ඇළ, වයඹ පළාත් ඇළ හා මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය යන වැඩ බිම් වල කාර්යාල සඳහා වායු සමීකරණය කරන ලද කාර්යාල පහසුකම් සපයා දෙනු ලැබේ.

✓ කාර්යාල ගෘහ භාණ්ඩ, තොරතුරු තාක්ෂණ උපකරණ හා මෘදුකාංග

මේ යටතේ පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර,GPS උපකරණ ආදිය ව්‍යාපෘති කාර්යාල සඳහා ප්‍රසම්පාදනය කරනු ලැබේ.

✓ වාහන

මේ යටතේ ව්‍යාපෘති කාර්යය මණ්ඩල වලට වැඩ බිම් අධික්ෂණයට හා රැස්වීම් වලට යාමට ඒමට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා වාහන මිලදී ගැනීම සිදු කෙරේ.

✓ පාරිසරික හා සමාජයීය බලපෑම් අවම කිරීම.

මේ යටතේ උප කටයුතු පහත පරිදි වේ.

i. කොන්ත්‍රාත්කරුවන් විසින් පාරිසරික හා සමාජයීය බලපෑම් අවම කිරීමේ පිළියම් හා පියවර ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම.
ii. පාරිසරික ප්‍රතිපත්ති මාර්ගෝපදේශ හා පාරිසරික හොඳපුරුදු පිළියෙළ කිරිම.
iii. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මතුවන පාරිසරික ගැටළු විසඳීම සඳහා පරිසර ආයතන සම්බන්ධ කර ගැනිම හා උපකාර ලබා ගැනීම.
iv. වැඩ සටහනට සම්බන්ධ පාරිසරික හා සමාජික ගැටළු සඳහා දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහන් පැවැත්වීම.
v. ආසියානු සංවර්ධන බැංකුවේ අවශ්‍යතාවයන් අනුව මාස 06 කට වරක් පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තා හා වසරකට වරක් මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා පිළියෙළ කිරීම.

✓ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU ) සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIU) සඳහා වැටුප් ගෙවීම.

✓ ව්‍යාපෘති සන්නිවේදන සැලැස්ම

ආයෝජන වැඩ සටහනට අදාළ සන්නිවේදන ලිපි ලේඛන හා වීඩියෝ පටි ප්‍රකාශයට පත් කිරීම හා වෙබ් අඩවිය සංවර්ධනය කිරීම හා පළ කිරීම.

✓ **PMU සහ PIU පුහුණු වැඩසටහන්**

ආසියානු සංවර්ධන බැංකුවේ මුදල් පරිහරණය කිරීමේ ප්‍රතිපත්ති, ක්‍රමවේදයන්,මාර්ගෝපදේශ , භාරකාර පාලනය, ප්‍රසම්පාදන කටයුතු, කොන්ත්‍රාත් කළමනාකරණය සහ මෙම වැඩ සටහන හා සම්බන්ධ පාරිසරික හා සමාජයීය ගැටළු පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු සැසි PMU/PIU, MMDE, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (MASL)හා වාරිමාර්ග නිළධාරීන්ට ලබාදිමට නියමිතය.

✓ උපකරණ මෙහෙයුම් හා නඩත්තු

MWSIP කටයුතු සඳහා මිලදී ගන්නා උපකරණ ක්‍රියා කරවීම සහ නඩත්තු කිරීම සඳහා යන පුනරාවර්ථන වියදම මේ යටතට වැටේ.

## 5.13.5 ව්‍යාපෘති කටයුතු 2015 දී ලබාගත් ප්‍රගතිය

- මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (**MLBCRP)**

✓ මහවැලි සංවර්ධන අධිකාරිය හා අනුබද්ධ මහවැලි උපදේශන සේවා කාර්යාංශය (පෞද්ගලික) සමාගම (MCB) විසින් MLBCRP හි සවිස්තර සැලසුම් වාර්තාව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

✓ මිනිපේ වම් ඉවුර ඇළ පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියෙහි ප්‍රථම අදියරෙහි ( 0+000 Km සිට 30+140 Km දක්වා) ටෙන්ඩර් ලිපි ලේඛන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හා ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කිරීමෙන් අනතුරුව 2015 දෙසැම්බර් මස 07 වන දින සිට ලංසුකරුවන් සඳහා විවෘත කරන ලදී.

✓ මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතියට අදාලව පහත සඳහන් අදියරයන්හි ටෙන්ඩර් ලිපි ලේඛන වල අවසන් සංස්කරණ කටයුතු නිම කරන ලදී.

  - අදියර - 2 මිනිපේ වම් ඉවුරු ඇල (30+140Km සිට 49+820 Km) පුනරුත්ථාපනය,
  - අදියර - 3 මිනිපේ වම් ඉවුරු ඇල (49-820 ක් පමණ 63+650Km) පුනරුත්ථාපනය,
  - අදියර - 4 මිනිපේ වම් ඉවුරු ඇල (63+650 Km ,73+960Km) පුනරුත්ථාපනය,

✓ අරීය ගේට්ටු සහිත ඉදිකිරීම් 8 ක් පුනරුත්ථාපනය හා විද්‍යුතනය කිරීම හා මිනිපේ ඇලෙහි වූ හරස් නියාමන 2ක් වැඩි දියුණු කිරීම.

✓ මිනිපේ අමුණේ මට්ටම ඉහළ නැංවීම හා මිනිපේ වම් ඉවුරු හා දකුණු ඉවුරු ඇල මාර්ග වල ජල පාලනය විධිමත් කිරීම හා මිනුම් පහසුකම් සැපයීම.

- ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය (**UECP)**

✓ මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පෞද්ගලික) සමාගම (MCB) විසින් ඉහළ ඇළහැර ව්‍යාපෘතියේ විස්තරාත්මක සැලසුම් වාර්තාව සම්පූර්ණ කොට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත භාරදී ඇත.

✓ ඉහළ ඇළහැර ඉදිකිරීමේ 0+100Km සිට 6+226Km සඳහා වූ ලංසු ලේඛනයේ අවසන් පිටපත ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කොට අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

- වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය (**NWPCP**)

✓ සම්පූර්ණ කරන ලද වයඹ පළාත් ඇළ ව්‍යාපෘතියෙහි සවිස්තර සැලසුම් වාර්තාව මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පෞද්ගලික) සමාගම (MCB) විසින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

✓ වැමැඩිල්ල වම් ඉවුරු ප්‍රධාන ඇල මාර්ගයේ සිට නැබඩගහවත්ත වැව (0+ 000Km + 5+250Km) දක්වා වූ ඉදිකිරීම් හා නව සොරොව්ව සහ ඇල මාර්ගයෙහි (0+000Km, 0+600Km) ඉදිකිරීම සඳහා ලංසු ලේඛන වල අවසන් අනුවාදය ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලද අතර, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

✓ වයඹ පළාත් ඇළ ව්‍යාපෘතියට අදාළව පහත සඳහන් අදියරයන්හි ටෙන්ඩර් ලිපි ලේඛන වල අවසන් සංස්කරණ කටයුතු නිම කරන ලදී.

✓ මහකිතුල පිවිසුම් උමං මාර්ගය, කි.මී. 3.66 ක දිගින් යුතුවූ මහකිතුල සිට මහකිරුල දක්වා වූ පෝෂණ ඇළ මාර්ගය ඉදිකිරීම හා මහකිතුල හා මහකිරුල ජලාශ ඉදිකිරීම.

✓ නැබඩගහවත්ත වැව සිට මහකිතුල ජලාශයේ පිවිසුම් උමං මාර්ගය දක්වා වූ ප්‍රධාන ඇළ (5+250Km සිට 22 + 460Km) ඉදිකිරීම.

- උපදේශන සේවා (**PMDSC, ISEWP** සහ විශේෂඥ මණ්ඩල)

✓ වැඩ සටහන කළමනාකරණය, සැලසුම් සහ අධීක්ෂණ උපදේශන සේවාව(**PMDSC**)
කොන්ත්‍රාත් ගිවිසුම 2015 නොවැම්බර් මස 16 වන දින අත්සන් කරන ලද අතර 2015 දෙසැම්බර් 01 වන දින සිට කාර්යයන් සඳහා බලමුළු ගැන්විණි.

✓ පද්ධති කාර්යක්ෂමතාව හා ජල ඵලදායිතාව ඉහළ නැංවීම උපදේශන සේවාව

✓ විශේෂඥ මණ්ඩලයක් හා වෙනත් විශේෂිත ආධාර

- වැඩසටහන් කළමනාකරණ ඒකකයේ (PMU) හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIU) වල මෙහෙයුම් හා නඩත්තු.

✓ රජය සතු ආයතන විසින් උපයෝගීතා මාරු කිරීම හා සම්බන්ධ ක්‍රියා

✓ ප්‍රජා කොන්ත්‍රාත් වැඩ

✓ ක්ෂේත්‍ර කාර්යාල කටයුතු

✓ කොළඹ පිහිටි කාර්යාල,
කොළඹ PMU හා PMDSC කාර්යාලය ගොඩනැගිල්ල පිහිටුවීය.

✓ ඉහළ ඇළහැර ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කාර්යාල
ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතියේ ව්‍යාපෘති මෙහෙයුම් ඒකක කාර්ය මණ්ඩලය සඳහා ගොඩනැගිලි 2 ක් සහ PMU/PIU කාර්ය මණ්ඩලයට නවාතැන් පහසුකම් සැපයීමට ගොඩනැගිලි 02 ක් ස්ථාපිත කර ඇත.

ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතියේ ඇළහැර පිහිටි PMDSC කාර්යාල ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු 40% ක් සම්පූර්ණ කොට ඇත.

✓ මිනිපේ වම් ඉවුරු ඇල ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ කාර්යාල
මිනිපේ PIU සහ PMDSC කාර්ය මණ්ඩලය සඳහා වූ හසලක පිහිටි ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු 80% සම්පූර්ණ කර ඇත.

✓ වයඹ පළාත් ඇළ ඉදි කිරීම් ව්‍යාපෘතියේ කාර්යාල

- වයඹ පළාත් ඇළ ව්‍යාපෘතියේ (NWPCP) ඉදි කිරීමේ ඒකකයේ (PIU)කුරුණෑගල පිහිටි කාර්යාල ගොඩනැගිල්ලෙහි නවීකරණ කටයුතු නිම කරන ලදී.

- වයඹ පළාත් ඇළ ව්‍යාපෘතියේ PIU සහ PMDSC කාර්ය මණ්ඩලය සඳහා වූ පොල්පිතිගම පිහිටි ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු 50% කින් අවසන් කර ඇත.

- විවිධ ඉදිකිරීම් පැකේජ අනුව, ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු කරන ස්ථාන වලට පහසුවෙන් ළඟා විය හැකි පරිදි වයඹ ඇළ ව්‍යාපෘතියේ PIU කාර්ය මණ්ඩලයට අනාගතයේදී භාවිතා කිරීමට දඹුල්ල, ගල්ගමුව හා හිරියාල ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල තුනක නවීකරණ කටයුතු නිම කරන ලදී.

✓ කාර්යාල, ගෘහ භාණ්ඩ, තොරතුරු තාක්ෂණ උපකරණ සහ මෘදුකාංග

කොළඹ PMU සහ PMDSC කාර්යාල සඳහා ගෘහ භාණ්ඩ හා තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගන්නා ලදී.

✓ වාහන

ලංසු ලිපි ලේඛන අනුමැතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙත යොමු කරන ලදි.

✓ පාරිසරික හා සමාජයීය ගැටළු අවම කිරීම.

- මිනිපේ වම් ඉවුර ඇල පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (MLBCRP)

2015 අප්‍රේල් මස මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවේ (IEE)අවසන් වාර්තාවෙහි සිංහල, ඉංග්‍රීසි හා දෙමළ පිටපත් සම්පූර්ණ කර මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී. අවසන් IEE වාර්තාව ආසියානු සංවර්ධන බැංකුව විසින් 2015 සැප්තැම්බර් මස 17 වන දින අනුමත කරන ලද අතර, මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2015 ඔක්තෝම්බර් 17 වන දින අනුමත කරන ලදී.

- ඉහළ ඇලහැර ඇළ (UECP)

a. 2015 ජුනි මස අවසන් පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවේ (EIA) සිංහල, ඉංග්‍රීසි හා දෙමළ පිටපත් සම්පූර්ණ කොට මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී.

b. 2015 සැප්තැම්බර් මස 17 වන දින අවසාන පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලදී.

c. පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව 2015 ඔක්තෝම්බර් පළමු සතියේ සිට වැඩ කරන දින 30 ක් මහජන අදහස් විමසීම සඳහා ඉදිරිපත් කරන ලදී. මහජන අදහස් විමසීම 2015 නොවැම්බර් මස 23 වන දින අවසන් කරන ලදි.

d. නැවත පදිංචි කිරීම ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් සැලැස්මේ (RIP) අවසන් වාර්තාව -2015 පෙබරවාරි මස ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලදි.

e. ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය මගින් (PIU) ඉහළ ඇළහැර ඇල ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වලදී බලපෑම් ඇතිවන පුද්ගලයන්ගේ භූමි ප්‍රමාණයන්, දේපල සීමා මැන විස්තර සකස් කොට ඇත.

f. තවද ඉහත තොරතුරු ඇතුලත් අත්පත් කරගැනීමේ අයදුම්පත් ඉඩම් අමාත්‍යාංශයට භාර දී ඇති අතර, ඉඩම් අමාත්‍යාංශය විසින් අත්පත් කර ගැනිමේ මැනුම් කටයුතු සිදු කරගෙන යාමට 'දෙවන කොටස ' (Section-2) යටතේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවට නියෝග කර තිබේ.

- වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය (NWPCP)

2015 ජුනි මස පාරිසරික බලපෑම් ඇගයීමේ අවසන් වාර්තාව (EIA) සිංහල, ඉංග්‍රීසි හා දෙමළ පිටපත් වලින් සම්පූර්ණ කර මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී.

a. 2015 සැප්තැම්බර් මස 17 වන දින පාරිසරික බලපෑම් ඇගයීම් අවසන් වාර්තාව ( ජුනි 2015) ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලදි.

b. පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව 2015 ඔක්තෝම්බර් පළමු වන සතියේ සිට වැඩ කරන දින 30 ක් මහජන අදහස් විමසිම සඳහා විවෘත කරන ලද අතර, මහජන අදහස් විමසීම 2015 නොවැම්බර් මස 23 වන දින අවසන් විය.

c. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම 2014 - නොවැම්බර් (RIP) ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලදි.

d. ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය (වයඹ පලාත් ඇළ ව්‍යාපෘතිය) විසින් එම ව්‍යාපෘතියෙහි පළමු අදියරෙහි ඉදිකිරීම් හේතුවෙන් බලපෑම් ඇතිවන පුද්ගලයන්ගේ භූමි ප්‍රමාණයන් හා දේපල සීමා යන ආදිය මැන සවිස්තර වාර්තාවක් සකස් කොට ඇත.

e. තවද ඉහත තොරතුරු ඇතුලත් අත්පත් කර ගැනීමේ අයදුම්පත් ඉඩම් අමාත්‍යාශයට භාරදී ඇති අතර, ඉඩම් අමාත්‍යාශය විසින් අත්පත් කර ගැනිමේ මැනුම් කටයුතු සිදු කරගෙන යාමට 'දෙවන කොටස ' (Section-2) යටතේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවට නියෝග කර තිබේ.

✓ ව්‍යාපෘති කළමනාකරණ/ ව්‍යාපෘති ඉදිකිරීමේ ඒකකයන්හි වැටුප් නගා සිටුවීම.
- ව්‍යාපෘතියේ වත්මන් තත්වය අනුව ව්‍යාපෘති කළමනාකරණ/ ඉදිකිරිම් ඒකකයන් සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගෙන ඇත. කාර්ය මණ්ඩලය සඳහා මාසික වේතනයන් ද ගෙවන ලදී.

✓ සන්නිවේදන සැලැස්ම - 2015 දී අවශ්‍ය නොවීය.

✓ පුහුණු වැඩසටහන් - (ව්‍යාපෘති කළමනාකරණ ඒකකය/ ව්‍යාපෘති ඉදිකිරීම් ඒකකය)
- ආසියානු සංවර්ධන බැංකුව මගින් ප්‍රසම්පාදන පටිපාටි පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- ආසියානු සංවර්ධන බැංකුව, පාරිසරික සහ සමාජ ආරක්ෂණ පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- "Microsoft Project" වෘත්තීය මෘදුකාංගය පිළිබඳ වැඩසටහන පවත්වන ලදී.

✓ උපකරණ මෙහෙයුම් හා නඩත්තු

කාර්යාලීය උපකරණවල අවශ්‍ය නඩත්තු කටයුතු සිදු කරන ලදී.

## 5.13.6 කැබිනට් පත්‍රිකා

| සංදේශ අංකය හා දිනය | කැබිනට් පත්‍රිකාව | කැබිනට් තිරණය | වර්තමාන තත්වය |
|---|---|---|---|
| 15/0469/604/005<br>2015.04.22 | උතුරු මැද පළාත් ඇළ සංවර්ධන ව්‍යාපෘතිය අදියර-1 ඉදිකිරීම ක්‍රියාත්මක කිරීම. | යෝජනාව අනුමත විය | මහවැලි ජල සුරක්ෂිතතා හා ආයෝජන වැඩ සටහනෙහි - අදියර-1 කාර්යයන් ක්‍රියාවට නංවමින් පවතී. |
| 15/0450/605/024<br>2015.04.10 | මහවැලි ජල සුරක්ෂිතතා අයෝජන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ණය ආධාර | යෝජනාව අනුමත විය | මහවැලි ජල සුරක්ෂිතතා හා ආයෝජන වැඩ සටහනෙහි - අදියර-1 ණය ගිවිසුමට අත්සන් තැබිණි. |
| 15/228/609/012<br>2015.08.07 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබද මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත "සැලසුම් හා ඉදිකිරීම්" කොන්ත්‍රාත්තු පිරි නැමීම. | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය හා අමාත්‍යාශ ප්‍රසම්පාදන කමිටුව යටතේ පිහිටුවා ඇති තාක්ෂණික ඇගයීමේ කමිටුව විසින් මිල අනුපාත අනුමත කරන්නේ නම් අනුමැතිය ලබාදිමට තීරණය කරන ලදි. | ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදී. |
| 15/1496/704/007/TBR<br>2015.10.14 | මහවැලි ජල සුරක්ෂිතතා අයෝජන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපාති වැඩසටහන් කළමනාකරණය, සැලසුම් හා අධික්ෂණ උපදේශන පිළිබද කොන්ත්‍රාත්තුව පිරි නැමීම ආසියානු සංවර්ධන බැංකු ණය අංක 3267- SRI සහ-3268- SRI (SF) | | ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදී. |

## 5.13.7 අවසාන ගිණුම්

| අංකය | ක්‍රියාකාරකම් | 2015 අවසානයේදී ක්‍රියාකාරකම් සඳහා වූ මුළු වියදම (රුපියල් මිලියන) |
|---|---|---|
| 1 | මිනිපේ වම් ඉවුර ඇල පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (MLBCRP) | 0.00 |
| 2 | ඉහළ ඇළහැර ව්‍යාපෘතිය (UECP) | 0.00 |
| 3 | වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය (NWPCP) | 0.00 |
| 4 | උපදේශන සේවා | 54.83 |
| 5 | ව්‍යාපෘති කළමනාකරණ සහ ඉදිකිරීම් ඒකකයන් වල මෙහෙයුම් හා නඩත්තු | 17.94 |
| | එකතුව | **72.77** |